184 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 184 - இல. 4
**Volume 184 - No. 4**

2009 ඔක්තෝබර් 21 වන බදාදා
2009 ஒக்ரோபர் 21, புதன்கிழமை
**Wednesday, 21st October, 2009**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

**OFFICIAL REPORT**

(අශෝධිත පිටපත/பிழை திருத்தப்படாதது/**Uncorrected**)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :**
- රාජ්‍ය සේවක වැටුප් මත බදු පැනවීම
- රැකියා විරහිත උපාධිධාරීන්

**නොපැමිණීමේ අවසරය :**
- ගරු එස්. කනගරත්නම් මහතා

**වරප්‍රසාද :**
- පොලීසිවලින් පැමිණිලි භාර නොගැනීම

**ග්‍රාමෝදය මණ්ඩල අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත:**
- පළමු වන වර කියවන ලදී

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් :**
- අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) – [ගරු ලලිත් දිසානායක මහතා]- පළමු වන වර කියවන ලදී
- බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) - [ගරු ලලිත් දිසානායක මහතා]- පළමු වන වර කියවන ලදී

**පරිපූරක මුදල :**
- ලුනාව පරිසර ප්‍රවර්ධන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය
- විදේශාධාර ව්‍යාපෘති
- ද්විතීයික නගර හා ග්‍රාමීය ප්‍රජාමූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය
- ප්‍රවාහන හා ගමනාගමන අවශ්‍යතා සපුරාලීම සහ දියුණු කිරීම

**කල් තැබීමේ යෝජනාව:**
- තඹ සහ පිත්තල හිඟය නිසා දේශීය වාත්තු කර්මාන්තකරුවන් මුහුණ දී ඇති ගැටලු

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු**


---

# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா**
- அரச ஊழியர்களின் வேதனத்தில் வரி விதிப்பு
- தொழிலற்ற பட்டதாரிகள்

**வராதிருக்க அனுமதி:**
- மாண்புமிகு எஸ். கனகரத்தினம்

**சிறப்புரிமை:**
- பொலிஸாரால் முறைப்பாடுகள் ஏற்றுக்கொள்ளாமை

**கிராமோதய சபை நிதியம் (திருத்தம்) சட்டமூலம்:**
- முதன்முறை மதிப்பிடப்பட்டது

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
- அநுராதபுரம் ஸ்ரீ புஷ்பதான அபிவிருத்தி தர்ம ஸ்தாபனம் (கூட்டிணைத்தல்) -- [மாண்புமிகு லலித் திசாநாயக்க] – முதன்முறை மதிப்பிடப்பட்டது
- பலன புத்தர் சிலை அமைப்புச் சபை (கூட்டிணைத்தல்) -- [மாண்புமிகு லலித் திசாநாயக்க] – முதன்முறை மதிப்பிடப்பட்டது

**குறைநிரப்புத் தொகை:**
- லுனாவ சுற்றாடல் மேம்பாட்டு, சமூக அபிவிருத்திச் செயற்றிட்டம்
- வெளிநாட்டுதவிக் கருத்திட்டங்கள்
- இரண்டாந்தர நகரங்கள் மற்றும் கிராமிய சமூக அடிப்படையிலான நீர் வழங்கல் மற்றும் துப்பரவேற்பாட்டுச் செயற்றிட்டம்
- கொண்டுசெல்லல் மற்றும் போக்குவரத்துத் தேவைகளின் ஈடேற்றலும் விருத்தியும்

**ஒத்திவைப்புப் பிரேரணை:**
- செம்பு, பித்தளை என்பவற்றின் தட்டுப்பாட்டினால் உள்நாட்டு வார்ப்புக் கைத்தொழிலாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்**


---

# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
- Imposition of Taxes on Public Servants' Salaries
- Unemployed Graduates

LEAVE OF ABSENCE:
- Hon. S. Kanagaratnam

PRIVILEGE:
- Non-acceptance of Complaints by Police

GRAMODAYA MANDALA FUND (AMENDMENT) BILL:
- Read the First time

PRIVATE MEMBERS' BILLS:
- Anuradhapura Sri Pushpadana Development Foundation (Incorporation) Bill – [The Hon. Lalith Dissanayake] – Read the First time
- Organization for the Creation of Balana Buddha Statue (Incorporation) Bill – [The Hon. Lalith Dissanayake] – Read the First time

SUPPLEMENTARY SUPPLY:
- Lunawa Environment Improvement and Community Development Project
- Foreign-funded Projects
- Secondary Towns and Rural Community-based Water Supply and Sanitation Project
- Fulfilment and Development of Transportation and Mobility Requirements

ADJOURNMENT MOTION:
- Problems Faced by Local Moulding Craftsmen due to Shortage of Copper and Brass

WRITTEN ANSWERS TO QUESTIONS


2 — PL 004490 — 1,150 — (2009/10)

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

**2009 ඔක්තෝබර් 21 වන බදාදා**
2009 ஒக்ரோபர் 21, புதன்கிழமை
*Wednesday, 21st October, 2009*

*පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු ඩබ්.ජේ.එම්. ලොකුබණ්ඩාර මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு டபிள்யு. ஜே. எம். லொக்குபண்டார] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 9.30 a.m.,* MR . SPEAKER [THE HON. W.J. M. LOKUBANDARA] *in the Chair.*

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2009 අංක 24 දරන පරිපූරක ඇස්තමේන්තුව.-[අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු රත්නසිරි වික්‍රමනායක මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

# උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - சிறுவர் அபிவிருத்தி, பெண்கள் வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Child Development and Women's Empowerment)

ගරු කථානායකතුමනි, මම 2006 වර්ෂය සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சுதேச மருத்துவத்துறை அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Indigenous Medicine)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම 2007 වර්ෂය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් සම්බන්ධයෙන් පළාත් පාලන හා පළාත් සභා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

# පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා - පැමිණ නැත.

**ගරු ලයනල් ප්‍රේමසිරි මහතා (සමාජ සේවා හා සමාජ සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லயனல் பிரேமசிறி - சமூக சேவைகள், சமூக நலனோம்புகை பிரதி அமைச்சர்)
(The Hon. Lionel Premasiri - Deputy Minister of Social Services and Social Welfare)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(i) ගාල්ල, උළුවිටිකේ, නාවින්න පාර, ගොඩවත්ත, අංක 24/2 දරන ලිපිනයෙහි පදිංචි එස්. ඥානසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;
(ii) ගාල්ල, වැකුණුගොඩ පාර, අංක 53 දරන ලිපිනයෙහි පදිංචි රංජනී හේවාවිතාරණ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ
(iii) ඇත්කඳුර, මැද්දෙවෙල, අක්කර 20 ලිපිනයෙහි පදිංචි එම්.එච්. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම හැඳුනුවැව, කලපිටිය, වීරසේකරපුර පදිංචි ඩබ්ලිව්.ඒ.එච්. වීරසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු චන්ද්‍රසේන විජේසිංහ මහතා**
(மாண்புமிகு சந்திரசேன விஜேசிங்ஹ)
(The Hon. Chandrasena Wijesinghe)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පෙත්සම් 05 පිළිගන්වමි.

(1) බෙලිඅත්ත, දම්මුල්ල, වීරකැටිය පාර, "සුමුදු" නිවසෙහි පදිංචි ගීතානීලමනී හේවා හක්මනගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම;
(2) ගාල්ල, කරාපිටිය, මාඉට්පේ 3 වන පටුමග, අංක 7බී./7 දරන ලිපිනයෙහි පදිංචි පී.එච්. පේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;
(3) දික්වැල්ල, වත්තේගම, ආචාරිගේ වත්ත පදිංචි අමා තරංගා කුමාරසේන මහත්මියගෙන් ලැබුණු පෙත්සම;
(4) ගාල්ල, රිච්මන්ඩ් කන්ද, ගල්කැටිය පාර, අංක 01 දරන ලිපිනයෙහි පදිංචි කේ.කේ.ඊ. විමලරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(5) ගාල්ල, වටරැක නැහෙනහිර, "සසිරි විලා" නිවසෙහි පදිංචි ඩබ්ලිව්.ඩී. ගල්ගොඩැල්ල මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා - පැමිණ නැත.

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்சித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, මම මහඔය, කැකිරිහේන, හරස්ගල, අංක 220 දරන ලිපිනයෙහි පදිංචි එම්.ජී.ඩී. හේමලතා ඩැනියෙල් මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මම මාකෙහෙල්වල, මීපිටිවල, ගනහේන පදිංචි ඒ.පී.ජී. නිමල් ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අචල ජාගොඩගේ මහතා - පැමිණ නැත.
ගරු සජිත් ප්‍රේමදාස මහතා - පැමිණ නැත.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, මම දොලොස්බාගේ, මියනගොල්ල, "ලුම්බිණි" අංක 98 බී. දරන ලිපිනයෙහි පදිංචි ජේ.එම්.පී.එල්. ජයසුන්දර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 1 - 0015/'09 - (2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நகர அபிவிருத்தி, புனித பகுதிகள் அபிவிருத்தி அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena-Minister of Urban Development and Sacred Area Development and Chief Government Whip)
ගරු කථානායකතුමනි, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2 - 0084/'09 - (1), ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய - அரச இறைவரி, நிதி அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Revenue and Finance and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)
ගරු කථානායකතුමනි, ඊයේත් මේ ප්‍රශ්නය වුණා. ආණ්ඩුව පැත්තෙන් දැන් දිගින් දිගටම මේ ප්‍රශ්නවලට කල් ගන්නවා. ආණ්ඩුව පැත්තෙන් විවිධ වග කිව යුතු ඇමතිවරු පවා කියා තිබෙනවා මහ මැතිවරණයකට යන්නත් ඉඩ තිබෙනවා කියලා. ඒ නිසා දැන් අපේ ප්‍රශ්නවලට හරියට උත්තර ලැබුණේ නැත්නම් ඒක මන්ත්‍රීවරුන් හැටියට අපට වන අසාධාරණයක්. ඒ නිසා මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා මේ පිළිබඳව සලකා බලලා මේ ප්‍රශ්නවලට ඉක්මනින් උත්තර ලබා දීම සඳහා ආණ්ඩුවේ අවධානය යොමු කරවන්න කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ආණ්ඩුවේ අවධානයට යොමු කරනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

# ස්වාධීන රූපවාහිනිය : මැතිවරණ දැන්වීම්
## சுயாதீன தொலைக்காட்சி : தேர்தல் விளம்பரங்கள்
## INDEPENDENT TELEVISION NETWORK : ELECTION ADVERTISEMENTS

0095/'09

3. **ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர்.பீ.ஏ. ரணவீர பத்திரண)
(The Hon. R.P.A. Ranaweera Pathirana)

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (4):

(අ) ස්වාධීන රූපවාහිනිය මගින් 2005, 2006, 2007 සහ 2008 වර්ෂවලදී පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරණය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ පූර්ව මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදීමෙන් ඒ ඒ දේශපාලන පක්ෂවලින්, ආයතන හා පුද්ගලයින්ගෙන් එක් එක් වර්ෂයේදී ඉහත ආයතනය උපයා ගෙන ඇති මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පූර්ව මැතිවරණ කටයුතුවල යෙදීම හේතුවෙන් අය කර ගැනීමට ඇති මුදල කොපමණද;

(ii) ඒ කවර පක්ෂයකින්, කවර ආයතනයකින් සහ කවර පුද්ගලයෙකුගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

மக்கள் தொடர்பாடல், தகவல் அமைச்சரும் தொழில்முயற்சி அபிவிருத்தி, முதலீட்டு ஊக்குவிப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) 2005, 2006, 2007 மற்றும் 2008 ஆகிய ஆண்டுகளில் சுயாதீன தொலைக்காட்சி தேர்தல் பிரச்சார விளம்பரங்களை செய்தது என்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி தேர்தல் பிரச்சார நடவடிக்கைகளில் ஈடுபட்டதன்மூலம் மேற்படி நிறுவனம் ஒவ்வொரு அரசியல் கட்சியிடமிருந்தும், நிறுவனங்கள் மற்றும் ஆட்களிடமிருந்தும் மேலுள்ள ஆண்டுகளில் ஈட்டியுள்ள தொகை எவ்வளவென்பதை அவர் இச்சபைக்குக் குறிப்பிடுவாரா?

(இ (i) மேற்படி தேர்தல் பிரச்சார நடவடிக்கைகளில் ஈடுபட்டதன் விளைவாக அறவிடப்படவேண்டியுள்ள தொகை எவ்வளவென்பதையும்,

(ii) இது எந்த கட்சியிடமிருந்து, எந்த நிறுவனத்திடமிருந்து மற்றும் எந்த நபரினது பிரசார நடவடிக்கைகள் சார்பாக என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Information and Minister of Enterprise Development and Investment Promotion :

(*a*) Is he aware that election propaganda advertisements were telecast by the Independent Television Network in the years 2005, 2006, 2007 and 2008?

(*b*) Will he submit to this House, the amount of money earned by the above establishment from each political party, institution and person in each of the aforesaid years by engaging in election propaganda activities?

(*c*) Will he state-

(i) the amount of money to be recovered from them for engaging in the above mentioned pre election activities; and

(ii) the name of the political party, or the institution from which money to be so recovered and the name of the person on whose propaganda activities that amount of money is due?

(*d*) If not, why?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - மக்கள் தொடர்பாடல், தகவல் அமைச்சரும் தொழில்முயற்சி அபிவிருத்தி, முதலீட்டு ஊக்குவிப்பு அமைச்சரும்)

(The Hon. Anura Priyadharshana Yapa - Minister of Mass Media and Information and Minister of Entreprise Development and Envestment Promotion)

(අ) ඔව්.

2005 වසරේ ජනාධිපතිවරණය සහ 2006 වසරේ පළාත් පාලන ආයතන සඳහා මැතිවරණ පවත්වා ඇති අතර ස්වාධීන රූපවාහිනී සේවය මගින් පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරය කර ඇත.

2007 වසරේ මැතිවරණ පවත්වා නැති හෙයින් පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරය කිරීමේ අවශ්‍යතාවක් ඇති වී නැත.

2008 වසරේ පළාත් සභා දෙකක් සඳහා මැතිවරණ පවත්වා ඇති අතර ප්‍රධාන දේශපාලන පක්ෂ විසින් පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරය කර ඇත.

(ආ) සී/ස. ස්වාධීන රූපවාහිනී සේවය මගින් 2005, 2006 සහ 2008 යන වර්ෂවලදී පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරය කිරීමෙන් උපයා ඇති ආදායම් විස්තර :

| වර්ෂය | සේවා දායක | උපයා ඇති මුදල | එකතුව |
|---|---|---|---|
| 2005 | එක්සත් ජාතික පක්ෂය | 3,480,446.25 | 14,158,861.86 |
| | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 3,971,074.36 | |
| | එක්සත් ජාතික පක්ෂය | 3,575,206.25 | |
| | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 3,132,135.00 | |
| 2006 | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 1,240,843.25 | 5,251,685.35 |
| | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 1,449,822.00 | |
| | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 244,375.00 | |
| | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 325,680.00 | |
| | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 1,990,965.10 | |
| 2008 | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 988,310.00 | 988,310.00 |

(ඇ) (i) තවදුරටත් අයකර ගැනීමට ඇති මුදල් ප්‍රමාණය රු. 5,251,685.35 කි.

(ii) එම මුදල ලැබිය යුත්තේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රචාරක කටයුතු කළ ආයතනයෙනි.

(ඈ) ස්වාධීන රූපවාහිනී සේවය වාණිජ ආයතනයකි. ණය පදනම මත සේවා සැපයීම එහි සාමාන්‍ය වෙළෙඳ ප්‍රතිපත්තියකි. ඒ අනුව ඉහත (ඇ) (i) හි සඳහන් මුදල් ද ඉදිරියේදී අයකර ගැනීමට ක්‍රියා කරන බව එම ආයතනය අප වෙත දන්වා ඇත.

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**

(மாண்புமிகு ஆர்.பீ.ஏ. ரணவீர பத்திரண)

(The Hon. R. P. A. Ranaweera Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මේකයි. එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් මිලියන පහක් අය කර ගන්න තිබෙනවා. අය කර ගන්න කටයුතු කරනවා කියලා ඇමතිතුමන්ලාගේ පැත්තෙන් කියනවා. විගණකාධිපතිතුමාගේ විගණකාධිපති වාර්තාවෙන් සහ ස්වාධීන රූපවාහිනියේ වාර්ෂික වාර්තාවෙන් මේක පෙන්නලා දීලා මේ වන කොට වසරකට වඩා ගත වෙලා තිබෙනවා. රාජ්‍ය ආයතනයක් වෙච්ච ස්වාධීන රූපවාහිනී ආයතනය මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින් යැපෙන ආයතනයක්. මේ ආයතනය තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ප්‍රචාරක කටයුතු සඳහා නොමිලේ පාවිච්චි කරනවා කියන එකද තමුන්නාන්සේලා කියන්නේ? ඒක මැතිවරණ නීතියට පටහැනි නොවන්නේද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**

(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)

(The Hon. Anura Priyadharshana Yapa)

නැහැ, ගරු කථානායකතුමනි, පළමු වන කාරණාව තමයි ස්වාධීන රූපවාහිනිය සම්පූර්ණයෙන්ම වාණිජ පදනම මත ක්‍රියාත්මක වන ආයතනයක්. රජයෙන් කිසිම අරමුදලක් ලැබෙන්නේ නැහැ. අපි සාමාන්‍යයෙන් අවුරුද්දකට මිලියන ගණනක ප්‍රචාරක දැන්වීම් කරනවා. [බාධා කිරීමක්] සමා වන්න. මෙතුමාගේ ප්‍රශ්නයට උත්තර දීලා ඉන්නම් කෝ. අපි ඒ ප්‍රචාරක දැන්වීම් කිරීමේදී හුඟක් වෙලාවට නියෝජිත ආයතන හරහා ණය පදනම මත තමයි ඒ කටයුත්ත කරන්නේ. මේ මුදල

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

අය කර ගන්න තිබෙන බව අපට දන්වා තිබෙනවා. ඒ මුදල ලබා දීමට ඒ අය කැමැත්ත පළ කර තිබෙනවා. එපමණයි මට කියන්න තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවට ආවේ හතර වන වතාවටයි. සාමාන්‍යයෙන් ගත්තොත් මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා අවුරුද්දකට වැඩි කාලයක් වනවා. ඒ වාගේම විගණන වාර්තාවලින් කරුණු ඉදිරිපත් කර තිබෙනවා මෙවැනි මුදලක් අය විය යුතුයි කියලා. ගරු ඇමතිතුමනි, ලක්ෂ පනහකට වැඩි මුදලක් තමුන්නාන්සේලාගේ පක්ෂයේ ප්‍රචාරක කටයුතු සඳහා - තමුන්නාන්සේලාගේ ඡන්ද ව්‍යාපාරවලට - විවිධ වර්ගයේ දැන්වීම් හදමින් අනික් දේශපාලන ව්‍යාපාරවලට අපහාස වන, අනික් දේශපාලන ව්‍යාපාර අපහසුතාවට පත් කරන වැඩසටහන් පමණක් නොවෙයි, - [බාධා කිරීමක්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඔබතුමා ප්‍රශ්නයක් අහන්න. මම උත්තර දෙන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔව්. ප්‍රශ්නයක් අහනවා. වැඩසටහන් පමණක් නොවෙයි ප්‍රචාරක දැන්වීම් පවා තමුන්නාන්සේලා හදලා තිබෙනවා. දැන් මේ ඔක්කෝම කරලා තිබෙන්නේ ණයට නේ. ඒ තරමටම හිඟා කන පක්ෂයක්ද ඕක? ලජ්ජා නැද්ද? නමුත් අපට පෙන්නුම් කරන්නේ තුනෙන් දෙකක් තිබෙනවා, මහා අමාත්‍යවරු ඉන්නවා, මහා ජයග්‍රහණ අත් පත් කර ගන්නවා, මහා ජනාධිපතිවරු ඉන්නවා, අමාත්‍ය මණ්ඩල තිබෙනවා, මේක දැවැන්ත එකක්, තුනෙන් දෙකක් දිනනවා, සියයට 85කින් දිනනවා කියලායි. ලජ්ජයි. [බාධා කිරීම්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඒක වෙනම කථාවක්. ඒක වෙනම ප්‍රශ්නයක් නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

තමුන්නාන්සේලා ගැන ලජ්ජයි. ආණ්ඩුව ණයයි නේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඒක වෙනම ප්‍රශ්නයක්. අපට අයිතියක් තිබෙනවා, ප්‍රචාරය ලබා ගන්න,- [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඡන්ද කරන්නේ එහෙම. ලජ්ජයි. ඔය ගොල්ලන් පෙන්වන්නේ, තුනෙන් දෙකක් තිබෙනවා, මහා ජනාධිපතිවරු ඉන්නවා, මෙච්චර ඡන්ද දිනනවා, තව තව ඡන්ද තිබෙනවා,- [බාධා කිරීම්] මේ ඔක්කෝම පෙන්වනවා නේ. පෙන්වූවාට ලජ්ජයි නේ. [බාධා කිරීම්] ලජ්ජයි නේ. [බාධා කිරීම්] තමුන්නාන්සේලාගේ පක්ෂය රටට ණයයි. ලජ්ජා වන්න ඕනෑ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

2005 අවුරුද්දේ ඔබතුමන්ලාත් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සාමාජිකයන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මේ ආණ්ඩුව, මේ පක්ෂය ණයයි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

එහෙනම් 2005 අවුරුද්දේ තමුන්නාන්සේලාත් ණයයි. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

කවුද නායකයා? එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයා කවුද? එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයා අපේ රටේ ජනාධිපතිතුමා. ජනාධිපතිතුමාගේ පක්ෂයේ,-[බාධා කිරීම්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු කථානායකතුමනි, එතකොට ජනතා විමුක්ති පෙරමුණත් මෙහි කොටස්කාරයෝ. දැන් මේ කථා කෙරුවාට.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ලජ්ජයි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මොකක්ද ලජ්ජාව? කිසි ලජ්ජාවක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් තුන් වන අතුරු ප්‍රශ්නය. [බාධා කිරීම්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මොකක්ද ලජ්ජාව? මොකක්ද ලජ්ජාව? අපි ණය ගෙවනවා කියලා තිබෙනවා නේ. ලජ්ජාවක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් තුන් වන අතුරු ප්‍රශ්නය. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, ජනමාධ්‍ය ඇමතිතුමා විධියට ඔබතුමාගෙන්, - [බාධා කිරීම්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු කථානායකතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඒ ගොල්ලෝත් සිටියා. එතකොට ඒ ගොල්ලෝත් වෙලාවට ණය ගෙවලා නැහැ, දැන් කථා කෙරුවාට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් තුන් වන අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් තුන් වන අතුරු ප්‍රශ්නය අහනවා. "මාතා" නමින් චිත්‍රපටයක් ඔබතුමන්ලාගේ රූපවාහිනී සංස්ථාවේ සභාපතිතුමාගේ -

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඒක අයිටීඑන් එක සම්බන්ධ ප්‍රශ්නයක් නේ. මට ඕකට උත්තර දෙන්න බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මාධ්‍ය ඇමතිතුමා විධියට. [බාධා කිරීම්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
අදාළ නැහැ, අදාළ නැහැ. [බාධා කිරීම්] ඒක අදාළ නැහැ. [බාධා කිරීම්] අදාළ නැහැ ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා කැමැති නම් විතරයි පිළිතුරු දෙන්නේ. ගරු ඇමතිතුමා කැමැති නම් පිළිතුරු දෙන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මාධ්‍ය ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මාධ්‍ය ඇමතිතුමාගෙන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරක් නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉතින් අහන්නේ ඒකයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරක් නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අයිටීඑන් එකේ සභාපතිතුමා - [බාධා කිරීම්] මා අහන්නේ - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරක් නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අයිටීඑන් එක ගැන තමයි මේ අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක හරි. පිළිතුරක් නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ස්වාධීන රූපවාහිනියේ සභාපතිතුමා, එහෙම නැත්නම් ස්වාධීන රූපවාහිනියෙන් "මාතා" කියලා චිත්‍රපටයක් හදනවාද, ඒකට වියදම කොච්චර යනවාද කියලා කරුණාකර මට දැන ගන්න පුළුවන්ද ඇමතිතුමනි?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඒ ප්‍රශ්නය මගෙන් වෙනම අහන්න. එතකොට මම උත්තර දෙන්නම්. මාතා ද, මාතා නොවන ද කියා මා දන්නේ නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4, ගරු පේමසිරි මානගේ මහතා. [බාධා කිරීම්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඇමතිතුමනි,- [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අර විධියටද මන්ත්‍රීවරයකු එක්ක කථා කරන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම හැසිරෙන්න හොඳ නැහැ. ඒ එකක්වත් හැන්සාඩ් වාර්තාවේ පළ වන්නේ නැහැ. මයික් දෙන්නේ නැහැ. [බාධා කිරීම්] මොකවත් නැහැ. [බාධා කිරීම්] එපා. මයික් එක දීලා නැහැ. මොකවත් නැහැ. [බාධා කිරීම්] ඒක තමයි- [බාධා කිරීම්] කරුණාකර සංවරව හැසිරෙන්න.

## විදේශ ධීවර යාත්‍රා: ශ්‍රේණිගත මාළු

**வெளிநாட்டு மீன்பிடிப் படகுகள் : தரப்படுத்தப்பட்ட மீன்**
FOREIGN FISHING VESSELS : GRADED FISH

0205/'09

4. **ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) විදේශ ධීවර යාත්‍රා මඟින් මාළු ගොඩ බෑමේදී මාළු ශ්‍රේණිගත කිරීමක් සිදු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

[ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා]

(ආ) 2005 සැප්තැම්බර් මාසයේදී, 2006 මැයි මාසයේදී සහ 2008 දෙසැම්බර් මාසයේදී විදේශ ධීවර යාත්‍රා මඟින් මාළු ගොඩ බෑමේදී, තුන් වැනි ශ්‍රේණියේ මාළු කිලෝග්‍රෑම් එකක් සඳහා ලංකා ධීවර සංස්ථාව අය කරනු ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரகவளமூலங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) வெளிநாட்டு மீன்பிடிப்படகுகளினால் மீன்கள் இறக்கப்படும்போது மீன்கள் தரப்படுத்தப்படுகின்றதா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2005 செப்டம்பர் மாதத்திலும் 2006 மே மாதத்திலும் 2008 டிசம்பர் மாதத்திலும் வெளிநாட்டு மீன்பிடிப் படகுகளினால் மீன்கள் இறக்கப்படுகையில் மூன்றாம் தர மீன் ஒரு கிலோகிராமுக்கு கடற்றொழில் கூட்டுத்தாபனம் அறவிட்ட தொகை யாதென்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources :

(a) Will he inform this House whether fish is graded when unloading fish from the foreign fishing vessels?

(b) Will he state the amount of money charged per kilogram of grade III fish by the Ceylon Fisheries Corporation when unloading fish from the foreign fishing vessels in September 2005, in May 2006 and in December 2008?

(c) If not, why?

**ගරු පීලික්ස් පෙරේරා මහතා (ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - கடற்றொழில், நீரக வளமூலங்கள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Fisheries and Aquatic Resources)

(අ) ඔව්.
(ආ) ලංකා ධීවර සංස්ථාව මුදල් අය කොට නැත.
(ඇ) ලංකා ධීවර සංස්ථාව III ශ්‍රේණියේ මාළු මිලදී ගනී.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ගරු කථානායකතුමනි, ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් අහන්න මට අවස්ථාව ලබා දෙන්න. ගරු ඇමතිතුමනි, මේ මාසයේ මුල් සතියේ ඉඳලා අපේ ධීවරයෝ විශාල මසුන් ප්‍රමාණයක් අල්ලා ගෙන ගොඩ බිමට ගෙනැල්ලා තිබෙනවා. විශාල මසුන් අස්වැන්නක්. මේ වන කොට අලගොඩුවා කිලෝ එකේ මිල රුපියල් 50 දක්වාත් අඩු වෙලා තිබෙනවා; බලයා කිලෝ එකේ මිල රුපියල් 80 දක්වාත් පහත බැහැලා තිබෙනවා. විශාල මසුන් අස්වැන්නක්. මේ තත්ත්වය තිබියදී පසු ගිය 17 වන දා විදේශ නැවකින් මෙට්‍රික් ටොන් 43ක් මිල දී ගෙන තිබෙනවා. ඒ මසුන් ප්‍රමාණය මේ වන විට මෝදර ධීවර වරායේ ශීතාගාරවල තැන්පත් කර තිබෙන්නේ. මම ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, මෙතරම් විශාල මසුන් අස්වැන්නක් තිබියදී අපේ ධීවරයන්ගෙන් මසුන් මිල දී ගන්නේ නැතිව ඒ විදේශ ධීවර යාත්‍රාවලින් මසුන් මිල දී ගත්තේ ඇයි ද යන්න. ඊ ළඟ ප්‍රශ්නය තමයි -

**ගරු පීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඉන්න. ඉන්න. උත්තර දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න දෙකක්ද? එක ප්‍රශ්නයක් අහලා ඊ ළඟ ප්‍රශ්නය අහන්න.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ඊ ළඟ ප්‍රශ්නය තමයි මේ මෝදර ධීවර වරායේ ශීතාගාරවල තැන්පත් කර තිබෙන මෙට්‍රික් ටොන් 43

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මාළුද? එහෙම නැත්නම් ධීවර සංස්ථාව සතු මාළුද?

**ගරු පීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මන්ත්‍රීතුමාට මම උත්තරයක් දෙන්නම්. ගරු කථානායකතුමනි, මේ මසුන් විදේශ යාත්‍රාවකින් මිල දී ගත්තා. විදේශ යාත්‍රාවලින් අපට ලාභයට හම්බ වුණොත් අපි ගන්නවා. අපි කෙලවල්ලෝ කිලෝ එකක් ගත්තේ රුපියල් 185 ගණනේ. සාමාන්‍ය market එකේ export කරන්නේ ඒ මිල. ධීවරයන්ගෙන් කෙලවල්ලෝ කිලෝ එකක් මේ වන විට රුපියල් 1,100ට ගන්නවා. මන්ත්‍රීතුමා දන්නවා. [බාධා කිරීමක්] ඉන්න. ඉන්න. ගිය සුමානයේ ගත්තා රුපියල් 1,100ට. [බාධා කිරීමක්] ඉන්න. පළමු වන ශ්‍රේණියේ sachet market එකට රුපියල් 1,100ට ගත්තා. සාමාන්‍යයෙන් මේ දවස්වල රුපියල් 600ට, රුපියල් 700ට පිට රට යැවීමට ධීවරයන්ගෙන් මාළු මිල දී ගන්නවා. ඒ වාගේ ගුණාත්මක හොඳ මාළු ප්‍රමාණයක් ධීවර යාත්‍රාවෙන් අපි ගත්තේ කිලෝ එකක් රුපියල් 185කට. මොකද, අපි stock එකක් තියා ගන්නවා. නත්තල් එනවා. උත්සව සමය ඉස්සරහට එනවා. ඒ නිසා stock එකක් maintain කර ගන්න මාළු කිලෝ එකක් රුපියල් 185කට ගැනීම වරදක් නොවෙයි නේ. ලාභයට හම්බ වෙච්ච වෙලාවට අපි මිලදී ගන්නවා. ඒ වාගේම පොඩි මාළු ටික - යාපනෙන් එන මාළු - ගැනීමට වැඩ පිළිවෙළක් අපි හදලා තිබෙනවා. මේ දවස්වල cold store එකේත් පොඩි repair එකක් තිබෙනවා. ඒ repair එක කළාම අපි stock එකක් maintain කරනවා. සාමාන්‍යයෙන් ටොන් 300ක, 400ක stock එකක් maintain කරනවා. කෙළවල්ලා කිලෝ එකක වෙළෙඳ පොළේ මිල කීයද කියලා ඔබතුමාගේ පැත්තෙන් වුණත් අහන්න. කෙළවල්ලා කිලෝ එකක මිල අඩු තරමින් තිබෙන්නේ රුපියල් තුන්සීයට, හාරසීයට. කෙළවල්ලා කිලෝ එකක් රුපියල් 185ට අරගෙන රුපියල් 210ට, 215ට ඒක පාරිභෝගිකයාට විකුණන්නයි කියලා මම කිව්වා. ඒකෙන් මිල උච්චාවචනය වන එක අඩු කර ගන්න පුළුවන්. ඒ නිසා මෙතැන කිසි අගතියක් වෙලා නැහැ. සද්භාවයෙන් මෙය කරලා තිබෙන්නේ. ඕනෑම දෙයක් අඩු මුදලකට ලැබුණොත් අපි ගන්නවා. මොකද, ධීවර සංස්ථාවේ සේවකයන්ට වැටුප් ගෙවන්න මහා භාණ්ඩාගාරයෙන් මුදල් නොදෙන නිසා අපි විසින්ම ආදායම් උපද වන මාර්ග නිර්මාණය කර ගෙන ඒ මුදල් අපි විසින්ම සොයා ගෙන ගෙවන්න වෙනවා. ඉතින් ඒකේ කොහේද වරදක් තිබෙන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න දෙකක් එතැන.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ගරු ඇමතිතුමා, මම ඔබතුමා වෙත යොමු කළ ප්‍රශ්නය මෙන්න මේක. අපේ ධීවරයෝ අල්ලා ගන්නා මාළු මිලදී ගන්න ධීවර සංස්ථාව කැමැති නැහැ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
නැහැ, එහෙම එකක් නැහැ.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
පොඩ්ඩක් ඉන්නකෝ. අපේ ධීවරයන්ගේ මාළු දැන් වළ දමන්න සිද්ධ වෙලා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
නැහැ, නැහැ.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
කිලෝ එකක් රුපියල් 50යි, රුපියල් 80යි. ඇයි, ඒ වාගේ අඩු මිලකට මාළු තියෙද්දී ඒ මාළු ධීවරයින්ගෙන් මිලදී ගන්නේ නැත්තේ? විදේශ ධීවර යාත්‍රාවල මාළු මිලදී ගන්නවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තමුන්නාන්සේලා ඉස්සෙල්ලා කිව්වේ -

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
අන්න ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔබතුමා මගේ මිත්‍රයා.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ඊ ළඟ එක තමයි මේ තිබෙන මාළු

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මාළු නේද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තත්පරයක් ඉන්න. දැන් අහ ගන්න.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මිලදී ගනු ලැබූ මාළු නේද, මේ ශීතාගාරවල තැන්පත් කර තිබෙන මෙට්‍රික් ටොන් 43?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඒක ඉතුරු වෙන්නේ නැහැ. ඒක ලබන සුමානේ ඉවර වෙනවා.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ඒ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මාළු.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මිලදී ගත්තු මාළු මේ. අපේ ධීවරයාගේ මාළු මිලදී ගන්නේ නැහැ. ධීවර සංස්ථාවට හැකියාව තිබියදී ධීවර සංස්ථාව මිලදී ගන්නේත් නැහැ. අනෙක් පැත්තෙන්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විදේශ ධීවර යාත්‍රාවලින්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මුදල්වලින් මාළු අරගෙන ඒවා මෝදර ශීතාගාරවල තැන්පත් කරලා තිබෙනවා.

ඒක මහජන මුදල් ගසා කෑමක් නේද? [බාධා කිරීම්]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මෝදර ධීවර වරායේ තැන්පත් කිරීමට තමයි එතැන cold store එකක් හදලා තිබෙන්නේ. [බාධා කිරීම්] ඒකෙන් මේ පාර්ලිමේන්තුවට දෙනවා. [බාධා කිරීමක්] මොකක්ද? [බාධා කිරීමක්] කැත කථා විතරක් කියන්න එපා.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ඔබතුමා දේශ ප්‍රේමියෙක් වාගේ කථා කරනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කැත කථා විතරක් කියන්න එපා.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මිල දී ගත්ත මාළු ආණ්ඩුවේ ශීතාගාරවල තැන්පත් කරලා තිබෙනවා. අපට තිබෙන ප්‍රශ්නය ඒකයි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
හැබැයි මම එකක් කියන්නම්. අපි තමුන්නාන්සේලා වාගේ තුට්ටු දෙකට වැටෙන්නේ නැහැ. [බාධා කිරීම්] මං කොල්ල කන්නේ නැහැ. [බාධා කිරීම්] මම ඔබතුමා එක්ක පැටලුණේ නැහැ නේ. කරුණාකරලා පැටලෙන්නේ නැතුව ඉන්න. [බාධා කිරීම්] අවුස්සා ගන්න එපා. අපි ගිනි තියන අය නොවෙයි. [බාධා කිරීම්] අවුස්සා ගන්න එපා. අපිට ඔබතුමාව කටින් ගිනි තියන්න පුළුවන්. ඒ නිසා කට වහ ගෙන ඉන්න. [බාධා කිරීම්]

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නයට උත්තර දෙන්න. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ ඒ මාළු මෙට්‍රික් ටොන් 43හි අයිතිය තිබෙන්නේ කාටද කියලායි.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ධීවර සංස්ථාවටද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මොකක්ද?

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ඒ මාළු මෙට්‍රික් ටොන් 43හි අයිතිය තිබෙන්නේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ධීවර සංස්ථාවටද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ධීවර සංස්ථාවට.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
අසත්‍ය කියන්න එපා, ඇමතිතුමා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු මන්ත්‍රීතුමනි, මම හෙට මේකෙන් අස් වෙනවා, ධීවර සංස්ථාවෙන් - [බාධා කිරීමක්]

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ඇයි ඇමතිතුමනි, අසත්‍ය කියන්නේ? [බාධා කිරීම්]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කැත කථා විතරක් කියන්න එපා. [බාධා කිරීම්]

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ඇයි, ගරු ඇමතිතුමා අසත්‍ය කියන්නේ? මේ උත්තරීතර සභාවට ඇවිල්ලා අසත්‍ය කියන්නේ ඇයි?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු කථානායකතුමනි, ඒක ඉල්ලා අස් කර ගන්න කියන්න. [බාධා කිරීම්]

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ඉල්ලා අස් කර ගන්නවා නොවෙයි -[බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මර්වින් සිල්වා ඇමතිතුමනි, ඔබතුමාගේ ආසනය නොවෙයි - [බාධා කිරීම්]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු කථානායකතුමනි, මගේ ආත්ම ගෞරවය කෙළෙසන්න දෙන්න එපා. [බාධා කිරීමක්]

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
මේ මෝදර ධීවර වරායේ ශීතාගාරයේ තැන්පත් කරලා තිබෙන්නේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මාළු. [බාධා කිරීම්]

මේ ධීවර සංස්ථාවේ මාළු නොවෙයි. ඇයි, මේ වාගේ අසත්‍ය ප්‍රකාශ කරන්නේ? මෙට්‍රික් ටොන් 43

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මාළු. [බාධා කිරීමක්] ඇත්ත. මම වගකීමකින් තමයි කියන්නේ. ධීවර සංස්ථාවට මාළු මිලදී ගන් න සල්ලි නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න වෙලාව නිකම් චෝදනා කරන්න අවස්ථාවක් කර ගන්න එපා. [බාධා කිරීම්]

**ගරු එම්. එම්. ජේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ඇමතිතුමා, ධීවර සංස්ථාවට මාළු මිලදී ගන්න විධියක් නැහැ. [බාධා කිරීමක්] මෙට්‍රික් ටොන් 43ක් මිලදී ගන්නේ කොහොමද? [බාධා කිරීමක්] ධීවර සංස්ථාව ගන්නේ නැහැ. මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීමක්]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මහජන බැංකුව කඩපු එකේ පළමු වන විත්තිකාරයා කවුද?

**ගරු එම්. එම්. ජේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
හමුදාවේ කෑම්ප්ස්වලට පැනලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ධීවර සංස්ථාවේ වෙක් එකකින් අරගෙන තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇයි, ඇමතිතුමාට චෝදනා කරන්නේ? එහෙම චෝදනා කරන්න එපා. අතුරු ප්‍රශ්න වාරය හේතු විරහිත චෝදනාවලට අවස්ථාවක් කර ගන්න එපා. අතුරු ප්‍රශ්නවලදී පෞද්ගලිකව එහෙම එල්ල කරන කොටස් පිළිතුර වශයෙන් දමන්නේ නැහැ. [බාධා කිරීම්]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
එදා කියනවා, මාළු මිල වැඩියි කියා. අද කියනවා අඩුයි කියා. [බාධා කිරීම්] අඩු වුණත් - [බාධා කිරීම්] දන්න මහුලක් තිබෙනවා යැ. නැහැ නේ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 05 ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, ඇමතිතුමා කියපු විධියට මුහුදේ ඉන්නවාට වඩා වැඩි කාලයක් ශීතාගාරවල ඉන්නවා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5 -0284/'09 - (3), ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ජාතිය ගොඩනැඟීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය දිහා බැලුවොත් ඔබතුමාට පැහැදිලිව පෙනෙනවා, මේවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ගත හැකි තොරතුරක් බව. මේ ප්‍රශ්නය අද න්‍යාය පත්‍රයට ඇවිත් තිබෙන්නේ තුන් වන වතාවටයි. තුන් වන වතාවේත් කල් ඉල්ලනවා. ගරු ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමනි, මේ ප්‍රශ්නය වැදගත් වන්නේ, අහිංසක ජනතාවගේ සමෘද්ධිය කපා නුසුදුසු අයට ලබා දීලා තිබෙන නිසායි. ඒ පිළිබඳවයි අපි මේ අහන්නේ. දැන් නැවතත් මාසයක් කල් ඉල්ලන්නේ හතර වන වතාවටයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හතර වන වතාවේ පිළිතුරු දීමට මා පොරොන්දු වනවා. දැනට මේ ප්‍රශ්නයට දී තිබෙන පිළිතුර යළි බලන්න වෙලා තිබෙනවා. එය පිටු සිය ගණනක දෙයක්. දැනට රුපියල් මිලියන 3.6ක් වැය වෙලා තිබෙනවා, මේ කටයුත්ත සඳහා පිළිතුරු දීමට. එනමුත් ඒකත් අපි කර ගෙන යන අතර ගරු කථානායකතුමනි, ඒ එකින් එක නිවැරැදි දැයි යළි සොයා බලා මාසයක් ඇතුළත දී මාස එකහමාරක්- [බාධා කිරීමක්] ඕනෑ නම් මාස එකහමාර, මාසයක් කරමු. පිළිතුරු දෙන්නම්. මේ ඉල්ලන විස්තර අනුව මේක මහා බරපතළ වැය ශීර්ෂයක් බවටත් පත් වෙලා තිබෙනවා. ප්‍රශ්න අහන අයිතිය ගැන නොවෙයි මා මේ කියන්නේ. ඔබතුමාට අමාත්‍යතුමාගේ උපදේශක කාරක සභාවේදී මේ ගැන අදාළ තැන්වලට ගිහින් විපරම් කරන්න පුළුවන්, ඔය හොරෙන් දමපු නම් ටික විතරක්. නමුත් මේක ඇත්ත නම්, මේ අහන විධියට දැනට රුපියල් මිලියන 3.6ක් වැය වෙලා තිබෙනවා ප්‍රශ්නයට පිළිතුර සපයන්න විතරක්. [බාධා කිරීමක්] ඉල්ලන්නේ අලුතින් එකතු වී තිබෙන ඒවා විතරක් නොවෙයි නේ. මුල ඉඳලාම ඉල්ලනවා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමා පොරොන්දුවක් දුන්නා. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔක්කොම එක්ක අමාරුවේ වැටෙන එකක්. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් පොරොන්දුවක් දුන්නා. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව විසුරු වන තෙක් මේ ප්‍රශ්නයට උත්තර හම්බ වන්නේ නැහැ. එහෙම වුණොත් මේ ඡන්දය දිනන්න කරපු හොරකම්, වංචාවන් ඔක්කොම හෙළි වනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මාසයකින් මේකට උත්තර දෙන්නම්. එන මාසයේ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා පොරොන්දුවක් වුණා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එන මාසයේ මුල් සතියට මේ ප්‍රශ්නය ගන්න, ගරු කථානායකතුමනි. එන මාසයේ මුලට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා පොරොන්දුවක් දුන්නා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ කාලයට පාර්ලිමේන්තුව විසුරු වන්නේ නැහැ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක අලුත් පොරොන්දුවක්. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
යන්නෙ කොහෙද-මල්ලෙ පොල් කතාවලට උත්තර දෙන්නේ නැහැ පාර්ලිමේන්තුවේ. [බාධා කිරීම්]

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6-0290/'09-(1), ගරු විජිත රණවීර මහතා.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சர்)
(The Hon. A. D. Susil Premajayantha - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. මෙම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා ජාතික අධ්‍යාපන පීඨ 17කින් සහ ගුරු අභ්‍යාස විද්‍යාල 08කින් තොරතුරු ලබා ගනිමින් යනවා මේ දිනවල. ඒ නිසා සති දෙකකින් මා මේකට පිළිතුර දෙන්නම්.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
ගරු කථානායකතුමනි, මා මෙතුමාට කරදර කරන්න බලාපොරොත්තු වුණේ නැහැ. මේ ප්‍රශ්නය මා උපදේශක කාරක සභාවට දැම්මා. නමුත් උපදේශක කාරක සභාවේදී අප අහන ප්‍රශ්නවලට නොවෙයි උත්තර දෙන්නේ. නිලධාරියාට හිතුණු එකක් ලියලා එවනවා. ඒ නිසා අපට ඔබතුමාගෙන් උත්තර ඉල්ලා මේක ඉදිරිපත් කරන්න වුණා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට මගේ දැනුමෙන් පිළිතුරු දෙන්න පුළුවන්. නමුත් සංඛ්‍යා ලේඛන නිවැරදිව අවශ්‍යයි. ඒ නිසා තමයි මා සති දෙකක් කල් ඉල්ලුවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උපදේශක කාරක සභාවේදී ඒක හරියට ඉෂ්ට වෙලා නැහැ කියායි කියන්නේ.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
මා මේක පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ නැහැ- [බාධා කිරීම්]

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
නැහැ. මේක අපි දෙන්නාට ගැටලුවක් නැහැ.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7-0365/'09-(2), ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා.

**ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர். எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

**ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர். எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය න්‍යාය පත්‍රයට එන්නේ දෙ වැනි වතාවටයි. මීට කලිනුත් මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මාසය මාසය කල් ඉල්ලුවා. දැන් තව මාසයක් ඉල්ලනවා කියන්නේ නොවැම්බර් මාසයේයි මේ ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, දෙ වැනි වතාවටයි මේ අහලා තිබෙන්නේ.

**ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர். எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ ප්‍රධාන පිළිතුරු ගන්න ඕනෑ පොලිස්පතිතුමාගෙන්. පොලිස්පතිතුමා නොවැම්බර් මාසය වන විට විශ්‍රාම යනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පොලිස්පතිතුමා විශ්‍රාම ගියාට තොරතුරු ගන්න පොලීසිය තිබෙනවා නේ. මේක තේරුමක් නැති කථාවක් නේ.

**ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர். எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ගරු ඇමතිතුමා කලින් දුන් පිළිතුර අනුව මේ ප්‍රශ්නයට පිළිතුරු ගන්න ලක්ෂ කීයක් යනවාද? [බාධා කිරීම්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පොලීසියක් තිබෙනවා ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා හොඳට දන්නවා නේ ඒක. පොලීසිය ගැන-

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ශ්‍රී ලංකා පොලීසිය ද තිබෙන්නේ? [බාධා කිරීම්]

**ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர். எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ලබන මාසෙත් ගරු ඇමතිතුමා කියාවි, මේකට මිලියන මෙච්චරක් යනවා කියා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ලබන මාසයේ උත්තර දෙන්නම්.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නගර සංවර්ධන සැලැස්ම : වැඩ අවසන් නගර

**நகர அபிவிருத்தி திட்டம் : வேலை பூர்த்தியான நகரம்**
TOWN DEVELOPMENT PLAN : WORK-COMPLETED TOWNS

0088/'09

10. **ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) නගර සංවර්ධන සැලැස්මකට අනුව වැඩ අවසන් කළ නගරයක් හෝ නගර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර නගරද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නගර සංවර්ධන සැලැස්මේ කටයුතුවලට අනුව 50% කින් වැඩ අවසන් කළ නගරයක් හෝ නගර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර නගරද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, புனித பகுதிகள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நகர அபிவிருத்தி திட்டத்தின் பிரகாரம் வேலைகள் பூர்த்தி செய்யப்பட்ட நகரம் அல்லது நகரங்கள் இருக்கின்றனவா,

(ii) ஆமெனில், அந்நகரங்கள் யாவை

என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) நகர அபிவிருத்தி திட்ட பணிகளின் பிரகாரம் 50% வேலைகள் பூர்த்தி செய்யப்பட்டுள்ள நகரம் அல்லது நகரங்கள் இருக்கின்றனவா,

(ii) ஆமெனில், அந்நகரங்கள் யாவை

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development and Sacred Area Development:

(*a*) Will he inform this House-

(i) whether there is a town in which development work has been completed according to a town development plan or whether there are such towns; and

(ii) if so, what those towns are?

(*b*) Will he state-

(i) whether there is a town in which 50 per cent of its development work has been completed according to a town development plan or whether there are such towns; and

(ii) if so, what those towns are?

(*c*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

(අ) (i) නගර සැලසුම් ක්‍රියාවලිය නොනවතින ක්‍රියාදාමයකි. දින පතා වැඩි වන ජනගහනයේ අවශ්‍යතා සපුරාලීම පිණිස කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන වශයෙන් සැලසුම් යෝජනා කොට ඒවා ක්‍රියාත්මක කිරීම නගර සැලසුමක අරමුණ වේ. මූලික වශයෙන් අදාළ ප්‍රදේශයේ ඉඩම් භාවිතය කලාපීයකරණ සැලැස්මක් මඟින් පාලනය කර අනාගත සංවර්ධනයන් සඳහා මඟ පෙන්වීම මේ අනුව සිදු වේ.

කාලයට උචිත ලෙස හා එදිනෙදා මුහුණ දෙන අභියෝග මත සංවර්ධන සැලසුම් නිතරම යාවත්කාලීන කරනු ලැබිය යුතුය. ශ්‍රී ජයවර්ධනපුර සංවර්ධන යෝජනා ක්‍රමය දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන සැලසුමකට මූලික නිදසුනක් වේ. පළමු අදියරේදී ශ්‍රී ලංකා

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර නගරය තුළ ප්‍රතිස්ථාපනය කළ අතර, මධ්‍ය කාලීන ව්‍යාපෘති ලෙස පරිපාලන සංකීර්ණ ඉදි කිරීම සිදු විය. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය හා පරිපාලන නගරයට අදාළ අනෙකුත් ව්‍යාපෘති ද දිගු කාලීන සැලසුම් යෝජනා ලෙස සමගාමීව සිදු කර ගෙන යනු ලැබේ. මහ දඹුල්ල, විසල් හම්බන්තොට, විසල් ත්‍රිකුණාමලය සංවර්ධන සැලසුම් ද මේ සඳහා නිදසුන් වේ. සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය ගතික නොවන අතර, කාලීන අවශ්‍යතා අනුව එය නිරතුරුව වෙනස් කරමින් උචිත ලෙස සකස් කරනු ලැබේ.

(ii) නගර 32ක් සඳහා සංවර්ධන සැලසුම් මේ වන විට අනුමත කොට ක්‍රියාත්මක කරමින් පවතී. තවත් නගර 158ක් සඳහා සංවර්ධන සැලසුම් පිළියෙල කරමින් පවතින අතර, ඒවායේද දළ සැලැස්මට අනුව සැලසුම් යෝජනා ක්‍රියාත්මක කිරීම සිදු කර ගෙන යනු ලබයි.

(ආ) (i) නගර සැලසුම් ක්‍රියාවලිය ඉහත දැක්වූ පරිදි කාලීනව වෙනස් වන හෙයින් නගරයේ අවශ්‍යතාවලට අනුකූලව සැකසෙන සැලසුම්වල කටයුතු දිගටම සිදු කර ගෙන යනු ලැබේ. මහනුවර, කුරුණෑගල, බලංගොඩ, නාවලපිටිය, නිට්ටඹුව හා කඩවත යනාදී ප්‍රදේශ සඳහා පිළියෙල කර ඇති සැලසුම් මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතින අතර එම සැලසුම් ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රදේශයේ විශාල සංවර්ධනයක් සිදු වෙමින් පවතී.

(ii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

ගරු කථානායකතුමනි, මගේ පළමු වෙනි අතුරු ප්‍රශ්නය මේකයි. ඔබතුමාගේ උත්තරය හරහා පෙනෙනවා, එක නගරයක්වත් සංවර්ධනය කර නැති බව. වැඩ අවසන් නැහැ. සියයට 50ක්වත් වැඩ අවසන් කරපු එක නගරයක් හෝ නැහැ. හැම දාම සැලසුම්වලට පමණක් සීමා වෙලා තිබෙනවා. මම උදාහරණයක් හැටියට කිව්වොත්, පිළියන්දල නගර සංවර්ධන සැලැස්ම දැන් වෙනස් කර තිබෙනවා. ඒ කියන්නේ අවුරුදු ගණනාවකට පස්සේ දැන් වෙනස් කරලා. ඒකට හේතුව වෙලා තිබෙන්නේ මේකයි. පිළියන්දල නගරයේ තිබුණු ගොඩනැඟිලි සීමාව අඩි 50යි. ගරු කථානායකතුමනි, දැන් මේක අඩි 40ක් කර තිබෙනවා. අඩි 40ක් කරන්න හේතුව මේකයි. එක්සත් ජාතික පක්ෂයේ ඉඳන් ආණ්ඩුවට ගිහින් ඇමතිකමක් ගත්ත

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇමතිතුමාගේ ගොඩනැඟිල්ලක් ඉදි කරනවා නගර සංවර්ධන සැලසුම්වලට අනුකූල නොවන විධියට. ඒක මේ පාර්ලිමේන්තුවේදී මම ප්‍රශ්න කළා. ඒක ප්‍රශ්න කළාට පස්සේ ඒ නගර සංවර්ධන සැලැස්ම සම්පූර්ණයෙන්ම අහෝසි කළා. කිසිම තැනක මේ ගැන විධිමත් ආකාරයෙන් සාකච්ඡා නොකර තමයි ඒ පියවර අර ගෙන තිබෙන්නේ. මේ ගැන ඔබතුමා මොකද කියන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමා අහන්නේ නිශ්චිත කාරණයක් ගැන නම් ඒ නිශ්චිත කාරණයට උත්තරයක් දිය හැකියි. සැලැස්ම ක්‍රියාත්මක වන්නේ නැහැ කියන එක පිළිගන්න බැහැ. සැලැස්මක ව්‍යාපෘති ගැනයි මෙතුමා පටලවා ගෙන තිබෙන්නේ. සැලැස්මක් කියන්නේ මොකක්ද? කලාපකරණය කොට නගරයක් කෙසේ ඉදිරියේ සංවර්ධනය විය යුතුද කියන එකයි; නේවාසික, වාණිජ, කර්මාන්ත සහ පාරිසරික වශයෙන් ලක් කරන කලාපකරණයේ ඉදිරි සංවර්ධනයට මඟ පෙන්වීමයි. ගරු කථානායකතුමනි, ඒ තුළ ව්‍යාපෘති තිබෙනවා. පෞද්ගලික අංශය කරන, රාජ්‍ය අංශය කරන මහා මාර්ග වැනි අතිප්‍රධාන ව්‍යාපෘති තිබෙනවා. ඒවා පටලවා ගෙනයි මේ කථා කරන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

ඇමතිතුමා, මට පැටලිලා නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පොඩ්ඩක් ඉන්න. දැන් ඔබතුමා කියන දේ මා අහ ගෙන සිටියා. දැන් මම කියන දේත් අහ ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

හරි. ඔබතුමා කියන්න කෝ. ගරු කථානායකතුමනි, මට තව අතුරු ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

සැලසුම කියන්නේ එකක්. ව්‍යාපෘතිය කියන්නේ තව එකක්. දැන් ඔබතුමා නිශ්චිත ව්‍යාපෘතියක් ගැන ඇහැව්වා. මේ ගරු සභාවේ සිටින ගරු ඇමතිවරයකුට ඇඟිල්ල දික් කරලා කිව්වා, එතුමා නිසා ඒ ව්‍යාපෘතිය වෙනස් කළාය කියලා. එසේ වන්නේ නැහැ. මාර්ගයක් අධිවේගී මාර්ගයක් බවට පත් කිරීමේ දී එහි මාර්ග මායිම් වෙන් කිරීම සිදු කරන්න වන්නේ මාර්ග සංවර්ධන අධිකාරියේ එකඟතාව පරිදියි.

අපි ශ්‍රී ජයවර්ධනපුර සංවර්ධන යෝජනා ක්‍රමය අරගෙන බැලුවොත් ගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා තමයි ඒක ප්‍රකාශයට පත් කළේ. ඒකට දැන් අවුරුදු තිහකට කිට්ටුයි. සම්පූර්ණයෙන් ඉවර කරලා නැහැ. අලුත් යෝජනාත් මේ ව්‍යාපෘතිය අස්සට දැන් ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා එක තැන හිර වෙලා එසේම පවතින නගර කියලා නගර ලෝකයේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

ඔබතුමා උත්තර දීලා ඉවරද? ගරු කථානායකතුමනි, මට- [බාධා කිරීමක්]

**ගරු ලයනල් ප්‍රේමසිරි මහතා**
(மாண்புமிகு லயனல் பிரேமசிறி)
(The Hon. Lionel Premasiri)

ගරු කථානායකතුමනි, මටත් අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)

අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා? මේක මගේ ප්‍රශ්නයක් නේ. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එතුමාටත් අතුරු ප්‍රශ්න අහන්න අයිතියක් තිබෙනවා. මේක සභාවට අයිති ප්‍රශ්නයක්. [බාධා කිරීමක්] එහෙම නම් ඔබතුමන්ලා වෙන අයට අතුරු ප්‍රශ්න අහන්න ඉඩ දෙන්නේ. මේ පැත්තෙන් ඇහැව්වාම තියෙන වැරැද්ද මොකක්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයේ අයිතිකාරයා ඒ මන්ත්‍රීතුමායි. එතුමා අතුරු ප්‍රශ්න අහලා ඉවර වුණාම ඊට පස්සේ-

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)
ගරු කථානායකතුමනි, දැන් මෙතුමා කියන දේ මම අහ ගෙන සිටියා. මට පැටලිලා නැහැ, ගරු ඇමතිතුමා. ඔබතුමා තමයි මේක රවුමේ අර ගෙන යන්නේ. උපදේශක කාරක සභාවේ දී නිශ්චිත විධියට මම මේ සම්බන්ධව ප්‍රශ්න කළා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පිළියන්දල ගැන?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)
පිළියන්දල ගැන.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක තමයි. නිශ්චිත කාරණය ඒක නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)
ඒක තමයි. නිශ්චිත විධියට ප්‍රශ්න කළා. ප්‍රශ්න කළාට පස්සේ මේකට වග කිව යුත්තෙක් සිටියේ නැහැ. නමුත් මේ පාර්ලිමේන්තුවේ සභා ගැබේ ප්‍රශ්න කරන්නේ ඔබතුමා ඇමතිතුමා හැටියට මේ සම්බන්ධව වග කියන්න ඕනෑ නිසායි. ඒ සැලසුම ඇතුළේම තමයි පාරේ මේ ගොඩනැඟිලි සීමාව තිබෙන්නේ. ඒක වෙනස් කළේ ඇයි?

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇමතිතුමාගේ ගොඩනැඟිල්ල බේරා ගන්නයි. මම අහන්නේ ඒකයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම හිතන්නේ ඒක ඉතාම වැරදියි. ඇමතිවරයකුගේ නමක් කියලා පුද්ගලික චෝදනාවක් කරන එක-

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)
නැහැ, වැරදි වෙන්නේ මම මේක කලින් ප්‍රශ්න නොකර සිටියා නම්. මීට කලින් පාර්ලිමේන්තුවේදීත් මා මේ ගැන ප්‍රශ්න කළා. උපදේශක කාරක සභාවේදීත් ප්‍රශ්න කළා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හරි. උපදේශක කාරක සභාවේ දී තමුන්නාන්සේ අහපු කාරණයට තොරතුරු පැහැදිලි කරලා දීලා තමුන්නාන්සේ කියන කාරණය නිවැරදි කිරීමට-

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)
උපදේශක කාරක සභාවේදී ඔබතුමා මොකුත් කිව්වේ නැහැ. කට වහ ගෙන සිටියා. උපදේශක කාරක සභාවේදී කිසි උත්තරයක් දුන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සාධාරණ නැහැ. එවැනි චෝදනාවක් කරනවා නම් අනුගමනය කළ යුතු වගන්තියක් ස්ථාවර නියෝග යටතේ තිබෙනවා, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙමයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ නිසා ඒ නම ඉල්ලා අස් කර ගන්නය කියා මා ගරු මන්ත්‍රීතුමාට කියනවා. [බාධා කිරීමක්] ඒක ඉල්ලා අස් කර ගන්න වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 84(viii).

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මන්ත්‍රීවරයකුට විරුද්ධව චෝදනාවක් කරනවා නම් substantive Motion එකක් ගෙනෙන්න ඕනෑ; විශේෂ යෝජනාවක් ගෙනෙන්න ඕනෑ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
84(vii).

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම රකින්නේ එක්සත් ජාතික පක්ෂය. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අනුව ඒකට ඉඩ දෙන්නේ නැහැ. ඒ අනුව අවශ්‍ය පියවර ගන්නවා. [බාධා කිරීමක්] අවසාන අතුරු ප්‍රශ්නය. දැන් අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතුමන්ලාගේ කාල පරිච්ඡේදයේ විවිධ දේවල් කරලා තිබෙනවා. නමුත් ඉතින් රටේ යන වැඩසටහන් අවලංගු කරන්න බැහැ නේ. පුළුවන්ද? බැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන් වන අතුරු ප්‍රශ්නය. අතුරු ප්‍රශ්න තුනයි අහන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මෙතැන දී පැණ නැඟුණ- [බාධා කිරීමක්] ඔව් නේ. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේලාට තිබෙන්නේ පෞද්ගලික ප්‍රශ්න නේ. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තාත්තත් එහේ තමයි නැවතුණේ. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තාත්තා නැවතුණේ නැහැ, කොහේවත්. තමුන්නාන්සේලාගේ නායකයා මමත් එක්ක කියපු කතන්දර තමුන්නාන්සේලා දන්නේ නැහැ. තමුන්නාන්සේලා එතකොට පොඩි කොල්ලෝ. [බාධා කිරීම්] තේරෙනවාද? මමත් එක්ක කරපු කතා දන්නේ නැති පොඩි කොල්ලෝ. අද වන තෙක් මම ඒවා ප්‍රසිද්ධ කරලා නැහැ. [බාධා කිරීම්]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔයා අපේ තාත්තාද? [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අද වන තෙක් අපි ඒවා ප්‍රසිද්ධ කළේ නැහැ. දේශපාලන තාත්තා එක්කයි මම කතා කළේ. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එහෙම කියනවා නම් මෙතුමාත් මහින්ද මහත්මයා ගැන හොරෙන් හොරෙන් අපිට කියන ඒවා කියන්න අපි ලැහැස්තියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අනේ කියන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ලජ්ජයි. කොන්ද කෙළින් තියා ගෙන මෙතැන කතා කරනවා. මෙතැන දමන ශබ්දය නොවෙයි- [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අනේ කියන්න. අනේ කියන්න. ඔක්කොම කියන්න. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කෙළින් කියන්න කෝ. එහෙම කියන්න කොන්ද පණ නැහැ. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ප්‍රසිද්ධියේ කියන්න. සභා ගර්භයේ දී ම කියන්න මහින්ද මහත්මයාට විරුද්ධව යමක් කියලා තිබෙනවා නම්. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කැබිනට් පත්‍රිකාව ගැන, මෙතුමා මෙහෙමය, මෙතුමා මෙහෙම යනවාය, අතැන වැඩේ මෙහෙමයි ඔහොම නේ කියන්නේ? හරිද? ඒවා ඕනෑ නම් කියමු. කියා ගන්න ඕනෑ නම් කැබිනට් එකට ගිහින් ඇවිල්ලා අපට කියන ඒවාත් අපි කියන්නම්. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කියන්න. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නයක් අහනවාද නැද්ද? මොකද කරන්නේ? කෙළින්ම අතුරු ප්‍රශ්නය අහන්න. තුන් වන අතුරු ප්‍රශ්නය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අහනවා. මෙතුමා වෙන එකක් කියපු නිසායි ඒ ගැන කතා කළේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අනුර දිසනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නේ නැත්නම් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට අවස්ථාව දෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම අහනවා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මෙතැන ප්‍රශ්නය වී තිබෙන්නේ මේකයි. පැහැදිලිවම මෙම ව්‍යාපෘතියේ දී පාරේ සිට අඩි 50ක් දුරින් තමයි ගොඩනැඟිලි ඉදි කිරීමට තිබුණේ. දැන් එය පාරේ සිට අඩි 40 දක්වා යනුවෙන් වෙනස් කරලා තිබෙනවා. එහෙම වෙනස් කරන කොට යම් යම් පුද්ගලයන්ගේ ගොඩ නැඟිලි බේරෙනවා. මා දන්නේ නැහැ. නමුත් එසේ බේරෙන පුද්ගලයෙක් හැටියට තමයි ගාමිණී ලොකුගේ කියන මහත්මයකුගේ නමක් කියැ වෙන්නේ. එතකොට ඒක වෙනස් කළේ ඔබතුමාගේ අවබෝධයට යටත්ව ද, ඔබතුමා දැනුවත්ව ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, මගේ අවබෝධයකට යටත්ව නොවෙයි. මේ කාරණය මන්ත්‍රීතුමා උපදේශක කාරක සභාවේදීත් නැඟුවා. ඒ අනුව ඒ ලිපි ගොනු මන්ත්‍රීතුමාට පෙන්වීමට මා නියෝගයකුත් දුන්නා. ඒ අනුව එහි වැරැද්දක් සිදු වී තිබෙනවා නම් ඒ වෙනුවෙන් ගත යුතු ක්‍රියා මාර්ගය ගැනීමට උපදේශක කාරක සභාවේ තීරණයකුත් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරි. එහෙම එන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ප්‍රශ්න අංක 11. ගරු ආර්.පී.ඒ. රණවීර පතිරණ මහතා ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් අහන ප්‍රශ්නය. [බාධා කිරීම්]

**ගරු ලයනල් ප්‍රේමසිරි මහතා**
(மாண்புமிகு லயனல் பிரேமசிறி)
(The Hon. Lionel Premasiri)
ගරු කථානායකතුමනි,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවර වුණා. [බාධා කිරීමක්]

**ගරු ලයනල් ප්‍රේමසිරි මහතා**
(மாண்புமிகு லயனல் பிரேமசிறி)
(The Hon. Lionel Premasiri)
ගරු කථානායකතුමනි, ඔබතුමා පැහැදිලිවම ප්‍රකාශ කළා ඒ පැත්තෙන් අතුරු ප්‍රශ්න අහලා ඉවර වුණාම මගේ අතුරු ප්‍රශ්නයට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක හරි. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ පැත්තෙන්ම අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවර වුණා. [බාධා කිරීමක්] ඒක නිසා මට දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ඉඩ දෙන්නත් බැරි වුණා. [බාධා කිරීම්]

**ගරු එස්. කේ. සුබසිංහ මහතා**
(மாண்புமிகு எஸ். கே. சுபசிங்க)
(The Hon. S. K. Subasinghe)
තුනයි පුළුවන්. වාඩි වන්න. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ලයනල් ප්‍රේමසිරි නියෝජ්‍ය ඇමතිතුමනි, මා කවදාවත් ඔබතුමාට එහෙම කරන්නේ නැහැ. ස්ථාවර නියෝග යටතේ අහන්න පුළුවන් වන්නේ අතුරු ප්‍රශ්න තුනයි. [බාධා කිරීම්] නැහැ. ඉතින් වැරැදියි. අතුරු ප්‍රශ්න තුනයි අහන්න පුළුවන් වන්නේ. අතුරු ප්‍රශ්න දෙකක් එම ප්‍රශ්නය හිමි මන්ත්‍රීතුමා ඇහුවා. ඊ ළඟ අතුරු ප්‍රශ්නය එම පක්ෂයේ නායක මන්ත්‍රීතුමා ඇහුවා. [බාධා කිරීමක්] ඇමතිවරයා, මන්ත්‍රීවරයකු ද වේ. [බාධා කිරීමක්] බැහැ යි කියලා නැහැ, ස්ථාවර නියෝගවල.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
රණවීර පතිරණ මන්ත්‍රීතුමනි, අපේ වැඩේ අපි කරමු. ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர்.பீ.ஏ. ரணவீர பத்திரண)
(The Hon. R. P. A. Ranaweera Pathirana)
ගරු කථානායකතුමනි, මා ප්‍රශ්නය අහනවා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා, ලයනල් ප්‍රේමසිරි නියෝජ්‍ය ඇමතිතුමාගේ අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙනවාද? ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කිරීමක් කර ගන්න අහනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හතරක් බැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ. පැහැදිලි කර ගැනීමක්. ඇමතිතුමා කැමැතිද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්, එතුමා අහන ප්‍රශ්නය ගාල්ල ගැනයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහන්න, ලයනල් ප්‍රේමසිරි නියෝජ්‍ය ඇමතිතුමනි. එතුමා එකඟයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇමතිවරුන්ට පැහැදිලි කිරීම් ඕනෑ නම් ගිහිල්ලා අහ ගන්න පුළුවන් නේ.

**ගරු ලයනල් ප්‍රේමසිරි මහතා**
(மாண்புமிகு லயனல் பிரேமசிறி)
(The Hon. Lionel Premasiri)
පැහැදිලි කිරීමක් නොවෙයි, මගේ ප්‍රශ්නයක් අහන්නේ. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, ඔබතුමා නියෝගයක් දීලා ඒක ඉවර වුණා. ඊට පස්සේ මයික් එක දුන්නා අධ්‍යාපන ඇමතිතුමාට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කාටද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අධ්‍යාපන ඇමතිතුමාට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැන් ආපහු කොහොමද ඒ ප්‍රශ්නය එන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක තමයි, වැරැදියි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ආ! වැරැදියි, වැරැදියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ සභාව ගෙනිය ගන්නත් එපායැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එහෙම බැහැ, එහෙම බැහැ. [බාධා කිරීම්] එහෙම බැහැ. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක ඉවර වුණාට පස්සේ අපිත් අහන්න ගත්තොත් මොකක්ද වන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අතරතුර ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මගෙන් අතුරු ප්‍රශ්නයක් ඇහුවා, අතුරු ප්‍රශ්නයක් ඇමතිවරයකුට අහන්න පුළුවන්ද කියලා. මම කිව්වා, ස්ථාවර නියෝග අනුව ඇමතිවරයකුට අහන්න බැහැ කියලා එකක් නැහැ කියලා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒකේ ප්‍රශ්නයක් නැහැ. අතුරු ප්‍රශ්න තුන ඉවරයි. ඔබතුමාගේ නියෝගය පරිදි අධ්‍යාපන ඇමතිතුමා නැඟිට්ටා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මයික් එකත් දුන්නා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට ප්‍රශ්නයක් අහන්න ඉඩ දෙන්න සභාවේ එකඟතාවක් නැහැ?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
නැහැ, නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි. එහෙම නම් ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කරුණාකර පිළිතුරු දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ඇමතිතුමාට පැහැදිලි කිරීමක් කර ගන්න ඕනෑ නම් එළියට ගිහිල්ලා පැහැදිලි කර ගන්නය කියන්න.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
අයියෝ, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, අපට මේ උත්තරය දෙන්න පොඩ්ඩක් ඉඩ දෙන්න කෝ. [බාධා කිරීම්] උත්තර දෙන්න හදන මිනිහාට උත්තර දෙන්න ඉඩ දෙන්නේත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අධ්‍යාපන ඇමතිතුමා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට උත්තර දෙන්න මම දැන් විනාඩි පහක් විතර බලා ගෙන හිටියා.

## ගුරුවරු : විස්තර
**ஆசிரியர்கள் : விபரம்**
TEACHERS : DETAILS

0099/'09

11. **ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண)
(The Hon. R.P.A. Ranaweera Pathirana)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) දිවයිනේ සියලුම පාසල්වල සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) උපාධිධාරී ගුරුවරුන් අතුරින් කලා, වාණිජ, විද්‍යා හා වෙනත් උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) උසස් පෙළ විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන හෝ ඉගැන්විය හැකි ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) එම උපාධිධාරීන් අතුරින් ඉංග්‍රීසි විෂයය උපාධිය සඳහා හදාරා ඇති හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය ලබා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(vi) මෙම උපාධිධාරීන් අතුරින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සමත්වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டின் அனைத்துப் பாடசாலைகளிலும் பணியாற்றி வருகின்ற ஆசிரியர்களின் எண்ணிக்கை யாதென்பதையும்,

(ii) இவர்கள் மத்தியில் பட்டதாரி ஆசிரியர்களின் எண்ணிக்கை யாதென்பதையும்,

(iii) பட்டதாரி ஆசிரியர்களில் கலை, வணிக, விஞ்ஞான மற்றும் ஏனைய பட்டதாரிகளின் எண்ணிக்கை தனித்தனியாக யாதென்பதையும்,

(iv) உயர்தரப் பாடங்களை ஆங்கில மொழிமூலமாகக் கற்பிக்கின்ற அல்லது கற்பிக்கக்கூடிய ஆசிரியர்களின் எண்ணிக்கை யாதென்பதையும்,

(v) அப்பட்டதாரிகள் மத்தியில் ஆங்கிலத்தைப் பட்டப்படிப்பிற்காக பயின்றுள்ள அல்லது ஆங்கில மொழிமூலமாகப் பட்டத்தைப் பெற்றுள்ளோரின் எண்ணிக்கை யாதென்பதையும்,

(vi) இப்பட்டதாரிகள் மத்தியில் கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தரம் ) பரீட்சையில் ஆங்கிலப் பாடத்தில் சித்தியடைந்தோரின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(ஆ) கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தரம்) பாடங்களை ஆங்கில மொழிமூலமாகக் கற்பிக்கப் போதியளவு எண்ணிக்கை கொண்ட ஆசிரியர்கள் இல்லையென்பதை அவர் ஏற்றுக்கொள்கிறாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of Education :

(a) Will he inform this House -

(i) the number of teachers serving in all the schools in the island;

(ii) the number of graduate teachers out of them;

(iii) separately the number of Arts, Commerce, Science and other graduates, out of those graduate teachers;

(iv) the number of teachers who teach or are capable of teaching Advanced Level subjects in English medium;

(v) the number of teachers who have studied English as a subject for the degree or obtained the degree in English medium, out of the number of teachers mentioned in the Answer for (iv) above; and

(vi) the number of graduates who passed English at the General Certificate of Education (Advanced Level) Examination out of the number of teachers mentioned in the Answer for (v) above?

(b) Will he admit that a sufficient number of teachers to teach the subjects for the General Certificate of Education (Advanced Level) Examination in English medium is not available?

(c) If not, why?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

(අ) (i) 212,683 (2008 පාසල් සංගණනය අනුව) නමුත් මේ සංඛ්‍යාව මේ වන විට 218,000 ඉක්මවා තිබෙනවා, 2009 දීපු පත්වීම් එක්ක.

(ii) 74,218 (2008 දෙසැම්බර් 31ට) මේ වර්ෂය තුළදී දීපු උපාධිධාරි පත්වීම් සමඟ 76,370යි.

(iii)

| විෂයය | උපාධිධාරි ගුරුවරුන් සංඛ්‍යාව |
|---|---|
| කලා | 58,218 |
| වාණිජ | 7,741 |
| විද්‍යා | 8,259 |

(iv) 405

(v) 252

(vi) උසස් පෙළ ඉංග්‍රීසි විෂයය සමත් වූ සංඛ්‍යාව 08යි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අටයි?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

අටයි. ගරු කථානායකතුමනි, මුළු දිවයිනේම විෂයයක් හැටියට ඉංග්‍රීසි භාෂාව උසස් පෙළ විභාගයට ගන්න සාමාන්‍ය සංඛ්‍යාව 1,300ක් පමණ වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි අවාසනාවක්.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

පසු ගිය වසර පහක හෝ දහයක ප්‍රතිඵල විශ්ලේෂණයක් කළොත් උසස් පෙළට පෙනී සිටි සංඛ්‍යාවෙන් ඉංග්‍රීසි භාෂාව විෂයයක් හැටියට ගත්ත අයගෙන් සියයට 40ක 45ක සංඛ්‍යාවක් තමයි සමත් වන්නේ. නමුත් උපාධිය හැදෑරීමට ඒක බාධාවක් නැහැ, ඉංග්‍රීසි විෂයය උපාධියට හදාරන අයට හැර. මොකද, දැන් විද්‍යා උපාධිධාරීන් ඉංග්‍රීසි භාෂාව හදාරන්නේ නැහැ. නමුත් ඒ ගොල්ලෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය කරනවා.

(ආ) නැත.

විද්‍යා අංශයට ගුරුවරුන් සිටී.

දැනට උසස් පෙළ විෂය ධාරා තුනම පවත්වන්නේ සීමිත සිසුන් සංඛ්‍යාවකට. ඒ අනුව දැනට විද්‍යා අංශයෙන් උසස් පෙළ ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් උපාධිධාරීන් සිටී. තව බඳවා ගැනීමටත් උපාධිධාරීන් සිටී. නමුත් කලා හා වාණිජ විෂයයන් සඳහා සිටින්නේ සීමිත ගුරුවරුන් සංඛ්‍යාවක්. හේතුව, 6 වන ශ්‍රේණියේ සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් පන්ති පටන් ගත්තේ 2003 වර්ෂයේ නිසා. ඒ අවස්ථාව වන විට විශ්වවිද්‍යාලවල කලා හා වාණිජ පීඨයන්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධි පාඨමාලා ආරම්භ කර තිබුණේ නැහැ. ඒ නිසා මේ වන විට විශ්වවිද්‍යාලවලින් පිට වන ඉංග්‍රීසි මාධ්‍ය කලා හා වාණිජ උපාධිධාරීන් ප්‍රමාණවත් නැහැ අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාවට පත් කර ගැනීමට. ගරු කථානායකතුමනි, දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය කෙරෙනවා. නමුත් කළමනාකරණ පීඨයෙන් එන උපාධිධාරීන්ගේ උපාධිය කළමනාකරණ උපාධිය. උපාධියේ විෂයයන් 26ක් අතුරින් ආර්ථික විද්‍යාව එක විෂයයක් පමණයි. ඒ විෂයය කෙරෙන්නේත් micro and macroeconomics. ඒ කියන්නේ එක semester එකක පමණයි ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඒ කොටස කෙරෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වෙලාව 10.16යි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඒ නිසා උසස් පෙළ ආර්ථික විද්‍යාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන ගුරුවරයකු ප්‍රධාන විෂයය හැටියට ආර්ථික විද්‍යාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන තිබිය යුතුයි. මේ අභියෝගයට අපි මුහුණ දීලා සිටිනවා. මන්ත්‍රීතුමා අසා තිබෙන ප්‍රශ්නය හරි. නමුත් මෙයින් මිදීම සඳහා දැනට කටයුතු කර ගෙන යනවා. ඒ අනුව සාමාන්‍ය පෙළ විභාගයට ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළමු වන වතාවට ශිෂ්‍යයන් පෙනී සිටියේ පසු ගිය සාමාන්‍ය පෙළ විභාගයේදී. පෙනී සිටපු සංඛ්‍යාව 4,200ක් පමණ වනවා. එයින් සියයට 90ක ප්‍රතිඵල තිබෙනවා. ඒ කියන්නේ 3,700ක් පමණ උසස් පෙළ හැදෑරීම සඳහා සමත් වෙලා තිබෙනවා. ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය කළ සමහරු උසස් පෙළ කිරීම සඳහා සිංහල මාධ්‍යත් තෝරා ගන්නවා. මෙයින් වැඩි සිසුන් සංඛ්‍යාවක් තෝරා ගෙන තිබෙන්නේ විද්‍යා විෂය ධාරාව. ප්‍රධාන නගරවල පාසල්වල කල් සිට සැලසුම් කරලා කලා සහ වාණිජ පන්ති ආරම්භ කරලා තිබෙනවා. උදාහරණ වශයෙන් රාජකීය විද්‍යාලය, විශාඛා විද්‍යාලය, දේවි බාලිකා විද්‍යාලය, ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය; කොළඹ සහ මහනුවර ප්‍රධාන පාසල්වල. මේ පාසල්වලට මේ වන විට ගුරුවරුන් ලබා දීලා තිබෙනවා. මීට අමතරව, ඉංග්‍රීසි මාධ්‍යයෙන් කලා සහ වාණිජ උගන්වන්න පුළුවන් ගුරුවරු ක්ෂේත්‍රය තුළ ඉන්නවා. ඒ අනුව අපි දැන්වීම් පළ කරලා 262 දෙනකු සම්මුඛ පරීක්ෂණවලට ආවා. එයින් පළමු කණ්ඩායමේ 62ට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අර ගෙන තිබෙනවා. සමහර ගුරුවරුන් ඉන්නේ පළාත් පාසල්වල. ඒ ගුරුවරු ජාතික පසල්වල වාණිජ හා කලා මාධ්‍යයෙන් උසස් පෙළ ඉගැන්වීම සඳහා මේ වන විට අනුයුක්ත කරලා තිබෙනවා. ඒ නිසා දැනට මේ වර්ෂයේදී මේ ප්‍රශ්නය අපි විසඳා ගෙන තිබෙනවා.

ඒ වාගේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් මම ඉල්ලීමක් කරලා තිබෙනවා, අනාගතයේදී උසස් පෙළ කලා, වාණිජ විෂය ධාරාවන් සඳහා අවශ්‍ය උපාධිධාරීන් බිහි කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් විශ්වවිද්‍යාල තුළින් යොදලා ඒ බිහි වෙන උපාධිධාරීන් අපට ලබා දෙන්න කියලා.

ඊට අමතරව තව දැන්වීමක් තව සති දෙකකදී පළ කරනවා, ආසන්න කාලයේ විශ්‍රාම ගිහින් සිටින ගුරුවරු කොන්ත්‍රාත් පදනම යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් කලා සහ වාණිජ විෂය ධාරාවන් ඉගැන්වීම සඳහා බඳවා ගැනීමට.

(ඇ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න.

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர்.பீ.ஏ. ரணவீர பத்திரண)
(The Hon. R.P.A. Ranaweera Pathirana)
ගරු කථානායකතුමනි, මෙතුමාගේ මේ උත්තරයෙන් පැහැදිලි වනවා, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්විය හැකි ගුරුවරු 405කට කිට්ටු ඉතාමත් අවම පිරිසක් තමයි දිවයින පුරාම ඉන්නේ කියන එක. ඒ වාගේම තමුන්නාන්සේලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අපොස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ ඉගැන්වීමට පටන් ගැනීමේ ප්‍රතිඵලයක් විධියට දිවයිනේ බොහෝ පාසල්වල, විශේෂයෙන් දුෂ්කර පළාත්වල පාසල්වල යම් පෙලඹුමක්, අවශ්‍යතාවක් තිබෙනවා, ඒ පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන්න ඕනෑ කියලා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඔව්, අපොස සාමාන්‍ය පෙළ ගැටලුවක් නැහැ. අපොස උසස් පෙළ තමයි ගැටලුව තිබෙන්නේ.

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர்.பீ.ஏ. ரணவீர பத்திரண)
(The Hon. R.P.A. Ranaweera Pathirana)
එතකොට දැනට තමුන්නාන්සේලා මේක සීමා කරලා තිබෙනවා, නගරයේ පාසල්වලට පමණක්. ඒ නිසා අපි දැන ගන්න කැමැතියි, මේ වාගේ අවම ගුරුවරු සංඛ්‍යාවක් සිටියදී ඉදිරියේදී මේ අභියෝගයට මුහුණ දෙන්න දැනට ඉන්න ගුරුවරු පුහුණු කරන්න හෝ නැත්නම් උපාධි මට්ටමට ගෙනෙන්න යම් නිශ්චිත වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවාද කියලා. ඔබතුමා කෙසේ පැහැදිලි කළත් දැනටම උසස් පෙළ පන්තිවල ඉගෙන ගන්නා බොහෝ දරුවන්ට බරපතළ අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. පූර්ණ සුදුසුකම් තිබෙන ගුරුවරුන් නොමැති ගැටලු නිසා අඩු සුදුසුකම් තිබෙන ගුරුවරුන්ගෙන් ඉගෙනුම ලබා ගෙන මේ ළමයින්ට තරග විභාගවලට පෙනී සිටින්න සිද්ධ වෙලා තිබෙනවා. මේ තිබෙන තත්ත්වය වෙනස් කරන්න කුමන ක්‍රියා මාර්ගයක් ගන්නවාද කියලා දැන ගන්නට කැමැතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න දෙකයි.

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர்.பீ.ஏ. ரணவீர பத்திரண)
(The Hon. R.P.A. Ranaweera Pathirana)
එක ප්‍රශ්නයමයි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගැටලුවක් නැහැ ගරු කථානායකතුමනි. එතුමා අහන ප්‍රශ්නවලට මම පිළිතුරු දෙනවා, ඒකේ ගැටලුවක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක හරි. මට වෙලාවේ ප්‍රශ්නය තිබෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඔව්, ඒක ඇත්ත.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙතැන වෙලාවේ ප්‍රශ්නයක් තිබෙනවා නේ. දැන් වෙලාව පෙරවරු 10.22යි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඉතින් මට ඉඩ දෙන්න, උත්තර දෙන්න. ගරු කථානායකතුමනි, එතුමා අහපු ප්‍රශ්නය පිළිබඳව මම කලින් කළ පැහැදිලි කිරීමේත් සඳහන් වනවා. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සාමාන්‍ය පෙළ දක්වා ඉගැන්වීමට අවශ්‍ය ගුරුවරු සංඛ්‍යාව අපේ විද්‍යා පීඨවලින් බිහි වනවා. ඒ නිසා සාමාන්‍ය පෙළ දක්වා ගුරුවරුන් ලබා දීමේ ගැටලුවක් කොහෙත්ම නැහැ. නමුත් 2003 වසරේ 6 වන පන්තියේ සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම ආරම්භ වන අවස්ථාවේ සිටම විශ්වවිද්‍යාලවල කලා, වාණිජ උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පටන් ගත්තා නම් අද මේ ප්‍රශ්නය මතු වන්නේ නැහැ. ඒ අවස්ථාවේ ගත යුතු පියවර ඒ අය නොගත් නිසා තමයි ඒ වෙනුවෙන් මට මේ අභියෝගයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. 2003 ඉඳලා තමයි මේ ප්‍රශ්නය එන්නේ. ඒ වෙලාවේ ඒ ගැන

ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත යුතුව තිබුණා. ගරු කථානායකතුමනි, කොහොම වුණත් මම එතුමාට පැහැදිලි කළේ ඒකයි. 4,500ක් පෙනී හිටපු විභාගයෙන් සියයට 90ක් සමත් වෙලා තිබෙනවා. එයින් සමහරු සිංහල මාධ්‍යයෙන් උසස් පෙළ කරනවා. සමහරු විද්‍යා විෂය ධාරාව කරනවා. විශ්වවිද්‍යාලවල විද්‍යා පීඨවලින් ජීව විද්‍යා, භෞතික විද්‍යා ගුරුවරු බිහි වන නිසා ඉංග්‍රීසි මාධ්‍යයෙන් විද්‍යා විෂය ධාරාවට ගුරු හිඟයක් නැහැ. කලා, වාණිජ දෙකට තමයි අපට ගැටලුව තිබෙන්නේ. ඒකට දැනට මේ පියවර අර ගෙන තිබෙනවා. ඉංග්‍රීසි මාධ්‍ය ගුරුවරු විශ්වවිද්‍යාලවලින් බිහි වන තෙක් ඉදිරි කාලය තුළ දී විශ්‍රාම ගිය ගුරුවරුන් පවා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගෙන අපි ඒ කටයුත්ත කර ගෙන යනවා. විශ්වවිද්‍යාලවලත් දැන් ඒ පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ආරම්භ කර තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, දැන් "උතුරු මිතුරු" කියලා වැඩසටහනක් යනවා. ඒ වාගේම උතුරු පළාතේ දුම්රිය ස්ථාන ගොඩ නඟන්න එක් එක් පාසල් සහ අධ්‍යාපන කලාපවලට භාර දීලා තිබෙනවා. ඒ සඳහා මුදල් එකතු කිරීමක් අද පාසල්වල සිද්ධ වනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, පාසල්වල මුදල් එකතු කර ගැනීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අවසරයක් ලබා දීලා තිබෙනවාද කියා. ඒ වාගේම එම මුදල් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මොන විගණන ක්‍රියා පටිපාටියකට ද ලක් කරනු ලබන්නේ? ඒ නිසා අද ළමයින් විශාල දුෂ්කරතාවකට පත් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එක ළමයෙක් මුදල් දුන්නාම අනෙක් ළමයාට නොදී ඉන්න බැහැ. ඒ නිසා ඔවුන් මානසික අපහසුතාවකට පත් වනවා. ඒ නිසා මේ දුම්රිය පොළවල් ගොඩ නඟන්නට අද දෙමවුපියන්ගෙන් සල්ලි එකතු කරන තත්ත්වයකට පත් වී තිබෙනවා. මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඒක කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අවසරයක් සහිතව ද, ඒවා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් අධීක්ෂණය කරනවාද, එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාවට නඟන්න හේතුව කුමක්ද කියලා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරන එක වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒක මේ වන විට අවසන් කර තිබෙනවා. 9,714ක් වන රජයේ පාසල් පද්ධතිය තුළ අපේ දරුවෝ ලක්ෂ 40ක් ඉන්නවා. "උතුරු මිතුරු" වැඩසටහන යටතේ වවුනියාවේ සිට යාපනය දක්වා දුම්රිය මාර්ගය සකස් කිරීමේ වැඩ පිළිවෙළේ දී එක් එක් දුම්රිය පොළවල් ඉදි කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ භාර ගත්තා. ඒ අනුව කිලිනොච්චි දුම්රිය පොළ ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 6.5ක මුදලක් තමයි මූලික ඇස්තමේන්තුව හැටියට තිබුණේ. මේ කර්තව්‍යය සඳහා - ඔය ක්‍රියාකාරකම් පිළිබඳව - අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙනම අංශයක් තිබෙනවා. ඒකෙන් විධිමත් ආකාරයට අනුමතිය ලබා ගෙන කැමැති දරුවන්ගෙන් පමණක් එක් කෙනෙකුගෙන් රුපියල් 2ක කාසියක් කැටයකට දමා එකතු කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. එහෙම කැමැති අය රුපියල් 2ක් කැටයකට දමා එකතු කරපු මුදල් ගරු කථානායකතුමනි, කෙළින්ම ඒ ඒ පළාතේ ගිණුමට තමයි බැර වන්නේ. එහෙම බැර වන මුදල් සියල්ලම අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලික ගිණුමට බැර වනවා. මේ සියල්ලම විගණනයට යටත් වනවා. ඒ ලේඛන එවා තිබෙනවා. ඒ සියල්ල බැංකුගත කර තිබෙනවා. රුපියල් 2 ගණනේ කැටවලින් එකතු කරපු මුදල බැංකුවේ තිබෙනවා. මේක කරන්න හේතු වුණේ ගරු කථානායකතුමනි, උතුරු පළාතෙත් අපේ දරුවෝ ඉන්නවා. පාසල් එක්දහස් දෙසිය ගණනක් තිබෙනවා. මේ වැඩ පිළිවෙළට උතුරු පළාතෙන් මුදල් එකතු කළේ නැහැ. උතුරු පළාතෙන් හැර අනෙක් පළාත්වලින් රුපියල් 2 ගණනේ කැටවලින් එකතු කරපු මුදල අමාත්‍යාංශයේ අනුමතිය ඇතුව එකතු කරපු මුදලක්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නියෝගය තියෙන්න පුළුවන්, කැටයකට රුපියල් 2ක් දමන්න කියා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

එහෙම තමයි තිබුණේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හැබැයි සිදු වී තිබෙන්නේ ඒක නොවෙයි. විශාල බල කිරීමක් ළමයින්ට කරලා තිබෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අනිවාර්ය කිරීමක් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එක දුම්රිය පොළක් හදන්න මෙතුමා කියන විධියට ලක්ෂ 65ක් විතර යන්නේ. ඔය ලක්ෂ 65 වෙන් කර ගන්න පුළුවන්, එක ඇමතිවරයෙක් අයින් කළොත්. එක ඇමතිවරයෙකුට අවුරුද්දකට රුපියල් කෝටියක් විතර වැය කරනවා. ඇමතිවරු 50ක් අයින් කළොත් ගරු කථානායකතුමනි, stations ටික ඔක්කොම හදන්න පුළුවන්; දුම්රිය පොළවල් 50 හදලා ඉවර කරන්න පුළුවන්. ඇයි, මේ දරුවන්ට බර පටවන්නේ?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ගරු කථානායකතුමනි, මෙය එහෙම ප්‍රශ්නයක් නොවෙයි, මේ ළමයින්ගේ හොඳ හිත පෙන්වීමක්. උතුරු පළාත වෙනුවෙන් දකුණු පළාතේ දරුවෝ රුපියල් 2 ගණනේ කැටයකට එකතු කළා. ඒකයි මා කිව්වේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඔය, ඩලස් ඇමතිතුමාගේ වැඩ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 12 -0224/'09- (1), ගරු පේමසිරි මානගේ මන්ත්‍රීතුමා.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M.M. Pemasiri Manage)

ගරු කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - சுகாதார நலத்துறை, போசணை அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Healthcare and Nutrition and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති 2ක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.[බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මුදල් ඇමතිතුමාට බාධා කරන්න එපා. මුදල් ඇමතිතුමා පිළිතුරු දෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, දැන් මෙතැන කථා කරපු නිසා මා අහනවා. ලලිත් වීරතුංග ජනාධිපති ලේකම්ට මුදල් ලැබිලා ඊට පසුව

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සල්ලි ලැබුණා කියා මේ ගොල්ලෝ දන්නවාද? එතැන මොනවාද වෙලා තිබෙන්නේ? [බාධා කිරීමක්]

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Rohitha Bogollagama - Minister of Foreign Affairs)
ගරු කථානායකතුමනි, මගේ නම සඳහන් කළා. මට ඒකට පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)

Sir, I rise to a point of Order. I would like to know from my Friend as to why he mentioned my name. For what? -[ *Interruption.*] I stood against that. So, what is wrong in that? I am against that.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Very good. We are also with you on that.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)

So you must say that. My position is how can the LTTE -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මුදල් ඇමතිතුමා.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා (කම්කරු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா - தொழில் அமைச்சர்)
(The Hon. (Dr.) Mervyn Silva - Minister of Labour)
ජාත්‍යන්තරව පිළිගෙන තිබෙනවා, එක්සත් ජාතික පක්ෂයේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වන්න. මුදල් ඇමතිතුමා පිළිතුර දෙනවා.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
රට පාවා දෙන

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මුදල් ඇමතිතුමා පිළිතුරු දෙන්න.

## ලංකා මැරයින් සමාගම, වෝටර්ස් එජ් සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව : ලාභය සහ අලාභය

**லங்கா மெரைன் லிமிடெட், வோட்டர்ஸ் எட்ஜ் மற்றும் இலங்கை காப்புறுதிக் கூட்டுத்தாபனம் : இலாப, நட்டம்**

LANKA MARINE LIMITED, WATER'S EDGE AND SRI LANKA INSURANCE CORPORATION : PROFIT AND LOSS

0389/'09

13. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ලංකා මැරයින් සමාගම, වෝටර්ස් එජ් සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රජය වෙත ආපසු පවරා දෙනු ලැබුවේ කෙදිනද;

(ii) ඒවා පෞද්ගලීකරණය කළ දින සිට රජය වෙත ආපසු පවරා දෙනු ලැබූ දින දක්වා සහ මේ වන විට ඒවායේ ලාභය සහ අලාභය දෙසැම්බර් මස 31 දිනට ශේෂ පත්‍රය සමග වාර්ෂික හා ආයතන පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා මැරයින් සමාගම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ වෝටර්ස් එජ් මුලින්ම පවරා ගනු ලැබූ ආයතනයන්ට ගෙවනු ලැබූ මුදල සහ ගෙවීමට නියමිත මුදල කොපමණද;

(ii) පුද්ගලික අංශයට බාර දෙනු ලැබූ අවස්ථාවෙහි සහ නැවත රජය වෙත පවරා දෙනු ලැබූ අවස්ථාවෙහි සේවයේ යෙදී සිටි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට සේවයේ යෙදී සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) லங்கா மெரைன் லிமிடெட், வோட்டர்ஸ் எட்ஜ், இலங்கை காப்புறுதிக் கூட்டுத்தாபனம் ஆகியன அரசாங்கத்திடம் மீள ஒப்படைக்கப்பட்ட திகதி என்னவென்பதையும்,

(ii) ஒவ்வொரு வருடமும் டிசெம்பர் 31ஆந் திகதி உள்ளவாறு ஐந்தொகையுடன் இவற்றின் இலாபம், நட்டம் ஆகியவற்றையும், தனியார் மயப்படுத்தப்பட்டதிலிருந்து இன்றுவரை இவை கைமாற்றப்பட்ட திகதிகளை வருடாந்த அடிப்படையிலும், நிறுவனங்களின் அடிப்படையிலும் தனித்தனியாகவும்

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஆ) (i) லங்கா மெரைன் லிமிடெட், வோட்டர்ஸ் எட்ஜ், இலங்கை காப்புறுதிக் கூட்டுத்தாபனம் ஆகியவற்றை ஆரம்பத்தில் பொறுப்பேற்ற நிறுவனங்களுக்கு செலுத்தப்பட்ட தொகை, செலுத்தப்படவேண்டியுள்ள தொகை ஆகியன என்ன வென்பதையும்,

(ii) இவை தனியார் நிறுவனங்களுக்கு கையளிக்கப்பட்ட சந்தர்ப்பத்தில் வேலைக்கமர்த்தப்பட்டிருந்தவர்களது எண்ணிக்கை மீண்டும் அரசாங்கத்திற்கு பொறுப்பளிக்கப்பட்ட பொழுது வேலைக்கமர்த்தப் பட்டவர்களது எண்ணிக்கை ஆகியவற்றையும்,

(iii) தற்போது வேலைக்கமர்த்தப்பட்டுள்ளவர்களது எண்ணிக்கை என்னவென்பதையும்

அவர் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House-

(i) the date that the Lanka Marine Limited, Water's Edge and Sri Lanka Insurance Corporation were reverted back to the Government; and

(ii) the profit and loss along with the balance sheet as at 31st December of the year and the date of transfer from the date it was privatized to-date on per year and per entity basis?

(b) Will he state-

(i) the amount that has been paid and the amount more that got to be paid to the entities that initially took over Lanka Marine Limited, Sri Lanka Insurance Corporation and Water's Edge;

(ii) the number of people worked at the time of handling over to the private entities, and at the time of reverting back to the Government; and

(iii) the number of people that are working now?

(C) If not, why?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ලංකා මැරයින් සමාගම, වෝටර්ස් එජ් සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රජය වෙත ආපසු පවරා දෙනු ලැබුවේ:

| සී/ස. ලංකා මැරයින් සර්විසස් පුද්ගලික සමාගම | වෝටර්ස් එජ් | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව |
|---|---|---|
| සී/ස. ලංකා මැරයින් සමාගම රජය වෙත ආපසු පවරා ගෙන නැත. 2008 ජූලි 21 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය ප්‍රකාරව සී/ස. ලංකා මැරයින් සමාගමේ ඉඩම පමණක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පවරා දී ඇත. | රජයට ආපසු පවරා දෙනු ලැබුයේ 2009 පෙබරවාරි 08 | රජයට ආපසු පවරා දෙනු ලැබුයේ 2009 ජූනි 04 |

(ii) ඒවා පෞද්ගලීකරණය කළ දින සිට රජය වෙත ආපසු පවරා දෙනු ලැබූ දින දක්වා සහ මේ වන විට ඒවායේ ලාභය සහ අලාභය දෙසැම්බර් මස 31 දිනට ශේෂ පත්‍රය සමඟ වාර්ෂික හා ආයතන පදනමින් :

| සී/ස. ලංකා මැරයින් සර්විසස් පුද්ගලික සමාගම ලාභ/අලාභ | වෝටර්ස් එජ් ලාභ/අලාභ | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ලාභ/අලාභ |
|---|---|---|
| ඉඩමක් පමණක් පවරා ගෙන ඇති බැවින් 2008.12.31 දිනයෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභ/අලාභ ප්‍රකාශ කිරීම අදාළ නොවේ. | (රු. 000)<br>2005 රුපියල් මිලියන 87<br>2006 රුපියල් මිලියන 324<br>2007 රුපියල් මිලියන 163<br>2008.12.31 80,304<br>දිනයෙන් අවසන් වන වර්ෂ<br>2009.02.01-2009.08.31 2,346<br>(පොලිය සහ ක්ෂය වීම් හැර ලාභය) | (රු. 000)<br>2003.12.31 1,533,402<br>2004.12.31 631,772<br>2005.12.31 1,080,427<br>2006.12.31 559,703<br>2007.12.31 236,503<br>2008.12.31 583,685<br>(යන දිනයන්ගෙන් අවසන් වන වර්ෂ සඳහා මෙම වර්ෂය අවසාන වූ පසු වර්ෂයේ ලාභ ප්‍රකාශ කළ හැක.) |

(ආ) (i) ලංකා මැරයින් සමාගම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ වෝටර්ස් එජ් මුලින්ම පවරා ගනු ලැබූ ආයතනයන්ට ගෙවනු ලැබූ මුදල සහ ගෙවීමට නියමිත මුදල:

| සී/ස. ලංකා මැරයින් සර්විසස් පුද්ගලික සමාගම | | | වෝටර්ස් එජ් | | | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | | |
|---|---|---|---|---|---|---|---|---|
| අධිකරණ නියෝගය ප්‍රකාරව රජය විසින් පෞද්ගලික හිමිකමට ගෙවිය යුතු මුදල රු. | පෞද්ගලික හිමිකමට රජය විසින් මෙතෙක් ගෙවා ඇති මුදල රු. | පෞද්ගලික හිමිකම වෙනුවෙන් රජය විසින් ගෙවිය යුතු මුදල රු. | අධිකරණ නියෝගය ප්‍රකාරව රජය විසින් පෞද්ගලික හිමිකමට ගෙවිය යුතු මුදල රු. | පෞද්ගලික හිමිකමට රජය විසින් මෙතෙක් ගෙවා ඇති මුදල රු. | පෞද්ගලික හිමිකම වෙනුවෙන් රජය විසින් ගෙවිය යුතු මුදල රු. | අධිකරණ නියෝගය ප්‍රකාරව රජය විසින් පෞද්ගලික හිමිකමට ගෙවිය යුතු මුදල රු. | පෞද්ගලික හිමිකමට රජය විසින් මෙතෙක් ගෙවා ඇති මුදල | පෞද්ගලික හිමිකම වෙනුවෙන් රජය විසින් ගෙවිය යුතු මුදල |
| අදාළ නොවේ | - | - | රු. මි 410 + තොග පිරිවැය (මෙතෙක් ඇස්තමේන්තු ගත කර නැත) | නැත | රුමි. 410 + තොග පිරිවැය | රු. මි. 6,050 + 2003.4.11 සිට 2009.06.24 දක්වා ශ්‍රී.ල.ර.ස රඳවාගත් ලාභය | නැත | රු. මි. 6050 + රඳවාගත් ලාභය |

(ii) පෞද්ගලික අංශයට බාර දෙනු ලැබූ අවස්ථාවෙහි සහ නැවත රජය වෙත පවරා දෙනු ලැබූ අවස්ථාවෙහි සේවයේ යෙදී සිටි පුද්ගලයන් සංඛ්‍යාව:

| සී/ස ලංකා මැරයින් සර්විසස් පුද්ගලික සමාගම | වෝටර්ස් එජ් | | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | |
|---|---|---|---|---|
| ඉඩමක් පමණක් වන නිසා අදාළ නැත | පුද්ගලික අංශයට පවරා දෙනු ලැබූ අවස්ථාවේ සේවකයන් නැත | නැවත රජය වෙත පවරා දෙනු ලැබූ අවස්ථාවේ 424 | පුද්ගලික අංශයට පවරා දෙනු ලැබූ අවස්ථාවේ 2977 | නැවත රජය වෙත පවරා දෙනු ලැබූ අවස්ථාවේ 2051 |

(iii) දැනට සේවයේ යෙදි සිටින පුද්ගලයන් සංඛ්‍යාව:

| සී/ස ලංකා මැරයින් සර්විසස් පුද්ගලික සමාගම | වෝටර්ස් ඒජ් | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව |
|---|---|---|
| අදාළ නොවේ | 349 | 2018 |

(ඇ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙවැනි කොම්පැනි 03ක් නැවත ආණ්ඩුවට පවරා දී තිබෙනවා. ඒ දෙන අවස්ථාවේදී දුන්නු තීන්දුව තුළින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ගෙදර යවලා දැන් නැවත ගෙන්වා තිබෙනවා. මේක තුළින් නැවත මේ ආයතන පෞද්ගලික අංශවලට භාර දෙන්න යනවාද, නැද්ද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

කිසි සේත්ම නැහැ. ගරු මන්ත්‍රීතුමනි, අප ඉතා පැහැදිලි ප්‍රතිපත්තියක ඉන්නවා, මහින්ද චින්තනය යටතේ රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කරන්නේ නැත කියන එක සම්බන්ධයෙන්. ඒ නිසා ඔබතුමා කිසි ගැටලුවක් ඇති කර ගන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා එසේ කිව්වත්, කන්කසන්තුරේ සිමෙන්ති කොම්පැනියේ දාලා තිබෙනවා Letter of Interest එකක්. ඒකේ සියයට 49ක් පෞද්ගලික අංශයට දෙනවා කියා තිබෙනවා. ඒක පෞද්ගලීකරණය නොවේද? වන්දිකරණය නොවේද? ඔබතුමන්ලාගේ industrial enterprise website එකේ තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, එතුමාට ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අහනවා නම් මට ඒ ගැන සොයා බලා ප්‍රකාශ කරන්න පුළුවන්. නමුත් මා වග කීමෙන් කියනවා, මේ රජයේ ප්‍රතිපත්ති අනුව මහින්ද චින්තනයේ ආරම්භයේ සිට මේ දක්වා අප කිසිදු ආයතනයක් පෞද්ගලීකරණය කර නැත කියා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මා **සභාගත*** කරනවා කන්කසන්තුරේ- [බාධා කිරීමක්]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ඒ පිළිබඳව සොයා බලා මට කියන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මා හිතන්නේ රක්ෂණ සංස්ථාවේ 122ක් විතර වන සේවක පිරිසක් ගෙදර යවා තිබුණා කියලායි. දැන් එය රජය විසින් පවරා ගෙන තිබෙන නිසා ඒ අය නැවත සේවයට බඳවා ගන්න පුළුවන් ද කියන ප්‍රශ්නය මා ඔබතුමාගෙන් අහනවා.

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, අහේතුකව සේවයෙන් නෙරපා හැර තිබෙන කණ්ඩායම් පිළිබඳව මේ වන කොට රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂ පරීක්ෂණයක් කර ගෙන යනවා. ඔවුන් ගෙන්වා සාකච්ඡා කරනවා. ඒ අනුව අසාධාරණ විධියට ඉවත් කළ සේවකයින් ඉන්නවා නම් අපි බලාපොරොත්තු වනවා නැවත ඔවුන්ට අවස්ථාව ලබා දීමට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, තුන් වන අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් මෙය පෞද්ගලීකරණයට යොමු කරලා යම් විධියකින් කළමනාකරණයක් තිබුණා. ඒ කළමනාකරණය සම්පූර්ණයෙන්ම වෙනස් කරලා තිබෙනවා. ඒකත් එක්ක යම් විධියකින් ලාභය අඩු වී ගෙන යනවාය කියන එක ගැන ඒ සේවක පිරිස අපව දැනුවත් කරලා තිබෙනවා. ඔබතුමන්ලා විධිමත්ව ඒක සොයා බලා එය යථා තත්ත්වයට ගෙනෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද, නැද්ද කියන එක මා මේ අවස්ථාවේදී අහන්න කැමැතියි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාත් දකින්න ඇති අපි අධ්‍යක්ෂ මණ්ඩලය පත් කළ ආකාරය. අධිකරණය විසින් නියම කළ ආකාරයේ විශේෂ වෘත්තිකයන් පිරිසක් තමයි මේ ආයතන සියල්ලටම අපි පත් කරනු ලැබුවේ. එහි පළමු වන අදහස තමයි මේ ආයතන රාජ්‍ය ආයතන ලෙසත්, වඩාත් ශක්තිමත් ආයතන ලෙසත් ඉදිරියට ගෙන යාම. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමා සැකයක් ඇති කර ගන්න අවශ්‍ය නැහැ. අපි මේ ආයතන ආරක්ෂා කරමින් ඉදිරියට ගෙන යන්න සූදානම්.

## ජාතික රූපවාහිනිය : මැතිවරණ දැන්වීම්
### தேசிய தொலைக்காட்சி : தேர்தல் விளம்பரங்கள்
### NATIONAL RUPAVAHINI : ELECTION ADVERTISEMENTS

0105/'09

14. **ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர்.பீ.ஏ. ரணவீர பத்திரண)
(The Hon. R.P.A. Ranaweera Pathirana)

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) ජාතික රූපවාහිනිය 2005, 2006, 2007 සහ 2008 වර්ෂවලදී පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරණය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ආයතනය එම පූර්ව මැතිවරණ ප්‍රචාරක කටයුතු මඟින් එක් එක් දේශපාලන පක්ෂයෙන් හෝ ආයතන හා පුද්ගලයන්ගෙන් වාර්ෂිකව උපයා ගත් මුදල කොපමණද;

(ii) එසේ පූර්ව මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදීම හේතුවෙන් කොපමණ මුදලක් අය කර ගැනීමට තිබේද;

(iii) එසේ අය කර ගත යුතුව ඇත්තේ කවර පක්ෂයකින්, කවර ආයතනයකින්, කවර පුද්ගලයෙකුගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மக்கள் தொடர்பாடல், தகவல் அமைச்சரும் தொழில் முயற்சி அபிவிருத்தி, முதலீட்டு ஊக்குவிப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) தேசிய தொலைக்காட்சி (ரூபவாஹினி) 2005, 2006, 2007 மற்றும் 2008 ஆம் ஆண்டுகளில் தேர்தல் பிரச்சார விளம்பரங்களை பிரச்சாரம் செய்ததென்பதை அவர் அறிவாரா ?

(ஆ) (i) இந்நிறுவனம் மேற்படி தேர்தல் பிரச்சார நடவடிக்கைகள் மூலமாக ஒவ்வோர் அரசியல் கட்சி அல்லது நிறுவனம் மற்றும் ஆட்களிடமிருந்து வருடாந்தம் ஈட்டிய பணத்தொகை யாதென்பதையும்,

(ii) இவ்விதமாக தேர்தல் பிரச்சார நடவடிக்கைகளில் ஈடுபட்டதன் காரணமாக எவ்வளவு பணத்தொகை அறவிடப்பட வேண்டியுள்ளதென்பதையும்,

(iii) எக்கட்சியிடமிருந்து, நிறுவனத்திடமிருந்து, ஆளிட மிருந்து பிரச்சார நடவடிக்கைகளுக்காக இவ்விதமாக அறவிடப்பட வேண்டியுள்ளதென்பதையும்

அவர் குறிப்பிடுவாரா ?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Information and Minister of Enterprise Development and Investment Promotion:

(a) Is he aware that the National Television (Rupavahini) telecast election advertisements in the years 2005, 2006, 2007 and 2008?

(b) Will he state-

(i) the amount of money earned by this institution from each political party or institutions and persons through such election publicity activities;

(ii) the amount of money due to be recovered as a result of engaging in such pre-election publicity activities; and

(iii) the names of political parties, institutions or persons from whom the money is due to be recovered for engaging in their publicity activities?

(c) If not, why?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

(අ) ඔව්,

2005 වසරේ ජනාධිපතිවරණය සහ 2006 වසරේ පළාත් පාලන ආයතන සඳහා මැතිවරණ පවත්වා ඇති අතර පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් පළ කර ඇත.

2007 වසරේ මැතිවරණ පවත්වා නැති හෙයින් පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් පළ කිරීමේ අවශ්‍යතාවක් ඇති වී නැත.

2008 වසරේ පළාත් සභා දෙකක් සඳහා මැතිවරණ පවත්වා ඇති අතර ප්‍රධාන දේශපාලන පක්ෂ විසින් පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් පළ කර නැත.

(ආ) (i) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මඟින් 2005, 2006, යන වර්ෂවලදී පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරය කිරීමෙන් උපයා ඇති මුදල්

| *වර්ෂය* | *නියෝජිත ආයතනය* | *සේවාදායක* | *උපයා ඇති මුදල* | *එකතුව* |
|---|---|---|---|---|
| | ඉන්ටර් මීඩියා ඇඩ්වර්ටයිසිං | එක්සත් ජාතික පක්ෂය | 48,696,250.00 | |
| | මයින්ඩ්ස් ෆෝ ගෲප් | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 3,150,000.0 | |
| | මීඩියා ෆැක්ටරි | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 7,920,625.00 | |
| 2005 | මීඩියා ඔබ්සර්වේෂන් යුනිට් | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 2,650,625.00 | 86,811,750.00 |
| | මීඩියා ඔබ්සර්වේෂන් යුනිට් | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 75,000.00 | |
| | | මංගල සමරවීර මහතා | 19,231,750.00 | |
| | ෆීනික්ස් ඇඩ්වර්ටයිසිං | එක්සත් ජාතික පක්ෂය | 2,987,500.00 | |
| | රෙඩ් ලයිම් පුද්ගලික සමාගම | එක්සත් ජාතික පක්ෂය | 2,100,000.00 | |
| | ටෝයි ඇඩ්වර්ටයිසිං | ජනතා විමුක්ති පෙරමුණ | 8,239,375.00 | |
| 2006 | සැලසිනේ රූපවාහිනී ආයතනය | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 13,586,562.50 | 22,318,937.50 |
| | | ජාතික හෙළ උරුමය | 493,000.00 | |
| | | එකතුව | | 109,130,687.50 |

(ii) අය කර ගැනීමට ඇති හිඟ මුදල රු34,657,589.70 කි.

(iii) එම හිඟ මුදල් පහත සඳහන් ආයතනවලින් හා පුද්ගලයන්ගෙන් අය කර ගත යුතුව ඇත.

| *පුද්ගලයා හෝ ආයතනය* | *අදාළ වර්ෂය* | *අය කර ගැනීමට ඇති මුදල* |
|---|---|---|
| මීඩියා ඔබ්සර්වේෂන් යුනිට් | 2005 | 1,781,059.80 |
| මංගල සමරවීර මහතා | 2005 | 18,796,967.40 |
| එක්සත් ජනතා නිදහස් සන්ධානය | 2006 | 13,586,562.50 |
| ජාතික හෙළ උරුමය | 2006 | 493,000.00 |
| එකතුව | | 34,657,589.70 |

(ඇ) ජාතික රූපවාහිනී සංස්ථාව වාණිජ මට්ටමින් ක්‍රියා කරනු ලබන ආයතනයකි. ණය පදනම මත සේවා සැපයීම එහි සාමාන්‍ය වෙළෙඳ ප්‍රතිපත්තියකි. ඒ අනුව ඉහත (ආ) (iii) හි සඳහන් මුදල් ද ඉදිරියේ දී අය කර ගැනීමට ක්‍රියා කරන බව එම ආයතනය අප වෙත දන්වා ඇත.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දැන් ඔබතුමා කිව්ව විධියට පක්ෂ ගණනාවක්ම ණයයි. ලක්ෂ 130ක් ඔබතුමාගේ පක්ෂය ණයයි. ඒ මිලියන දහතුනකුත් ගණනක්.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමාගෙන් මම දැන ගන්න කැමැතියි මේවා අය කර ගැනීම සඳහා ගෙන තිබෙන පියවර මොකක්ද කියලා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඇත්තටම අපි දැන් ඒ නියෝජිත ආයතනවලට දැනුම් දීලා තිබෙනවා. අපි හැම වෙලාවේම ක්‍රියා කරන ආකාරයක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් ණය අය කර ගැනීමේදී අපි ළඟ ණයගැති ලැයිස්තුවකුත් තිබෙනවා. අපි සාමාන්‍යයෙන් ණයට තමයි ගනුදෙනු කරන්නේ. ඒක සාමාන්‍යයෙන් නියෝජිත ආයතනවල ක්‍රමයක්. එවැනි අවස්ථාවලදී අපි ඒ අයට ඒවා අය කර ගැනීමේදී යම් කිසි විධියකට ප්‍රමාණාත්මක වශයෙන් අය කර ගැනීමටත් ඉඩ දීලා තිබෙනවා. නොඑසේ නම් සම්පූර්ණයෙන් අය කර ගැනීමට හෝ ක්‍රියා කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, පෞද්ගලික ආයතන ගත්තොත්, දැන්වීම් දෙනවා. ඔවුන් දිගටම දැන්වීම් දෙන නිසා ණය පදනම මත ඔවුන්ගේ දැන්වීම් යන එක සාධාරණයි. හැබැයි දේශපාලන පක්ෂ එහෙම නොවෙයි. ඒ ඒ මොහොතේ මැතිවරණ සඳහා පමණයි ඔවුන් දැන්වීම් ලබා දෙන්නේ. එතකොට ඒවා දිගු කාලීන ව්‍යාපෘති නොවෙයි. ඡන්දයක් එන කොට ලබා දෙනවා. ඡන්ද නැති වන කොට නැහැ. ඒ නිසා ඒවායේදී අය කර ගැනීම ඒ මොහොතේම කරනවා. අද ජාතික රූපවාහිනියට අපි දැන්වීමක් අර ගෙන ගියොත් සල්ලි බැඳලා තමයි අපිට ඒ දැන්වීම දමා ගන්න වන්නේ. එහෙම නැතිව අපිට දමා ගන්න දෙන්නේ නැහැ. හැබැයි ඔබතුමන්ලාට තමයි ඔය ණය පදනමින් දෙන්නේ. [බාධා කිරීමක්] ඉන්න, මම අවසන් කළේ නැහැ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

නැහැ, නැහැ. අපි, -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මම මේ කාරණයත් දැන ගන්න කැමැතියි. මේ ආයතන ගොඩ නැඟීමේ කාර්ය භාරය තිබෙන්නේ රජයටයි. මේ රාජ්‍ය ආයතන. එතකොට මේවා අද විශාල පාඩුවකට ලක් වීමේ අනතුරකටත් මුහුණ දීලා තිබෙනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

නැහැ. පාඩු වෙලා නැහැ ගරු කථානායකතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමන්ලාගේ පක්ෂය තමයි දැන් මේ ණය වෙලා තිබෙන්නේ. ඉතින් මේ ගරු සභාවේ ඉන්න ඇමතිවරු පක්ෂ සාමාජිකයන් නේ? අනේ! කීය කීය හරි එකතු කරලා ඒ ණය ගෙවලා දමන්න බැරිද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු කථානායකතුමනි, ඒකට මම පිළිතුරක්, - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
පොඩ්ඩක් ඉන්න. ඒකට මම පිළිතුරක් දෙන්නම්. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊ ළඟට මට ඔබතුමාගෙන් තව කාරණයක් දැන ගන්න ඕනෑ. ඔබතුමා දන්නවා මේ වන විට යම් යම් මාධ්‍ය ආයතනවලට CID එකෙන්, -

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම මේකට උත්තර දීලා ඉන්නම් කෝ, ඔබතුමාගේ ඔය ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේකත් අහලාම දෙන්න.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
අදාළ ප්‍රශ්නයට උත්තර දෙන්නම්. අදාළ නොවන ප්‍රශ්නවලට මට උත්තර දෙන්න බැහැ නේ, ගරු කථානායකතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා මම මේ අහන එකට,-

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
උත්තර දෙන්නම්. ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් මාධ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වය මේකයි. ඒ අය නියෝජිත ආයතනයක් මඟිනුයි දැන්වීම් එවන්නේ. ඒ නියෝජිත ආයතනය ඒ ඒ ආයතන සමඟ දීර්ඝ කාලයක් ගනුදෙනු කරපු ආයතනයි. ඒ වුණත් මීට අතිරේකව තවත් සමහර වැඩසටහන්වලත් එහෙම අය කර ගැනීමට යම් කාල ගන්නා අවස්ථාත් තිබෙනවා. අපි වාණිජ ප්‍රතිපත්තියක් මත ක්‍රියා කරන අය නිසා අපි යම් කිසි ආකාරයක ක්‍රමවේදයන් මතයි ක්‍රියා කරන්නේ. ඒ නිසා අපි අනිවාර්යයෙන්ම මේ අය කර ගැනීම කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙම නම් හොඳයි. මගේ තුන් වන අතුරු ප්‍රශ්නය මේකයි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මට අතුරු ප්‍රශ්නයක් තිබෙනවා ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන. එතුමා අහනවා අතුරු ප්‍රශ්නය.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මට අහන්න අයිතියක් දෙන්නේ නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක නේන්නම්. මොකද කරන්නේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම කියන්න හැදුවේ මේකයි. යම් යම් ප්‍රවෘත්ති ප්‍රකාශ කිරීම සහ යම් යම් කරුණු ඉදිරිපත් කිරීම මත දැන් CID එකෙන්, ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් එම මාධ්‍යවේදීන් සහ එම මාධ්‍ය ආයතන ප්‍රශ්න කිරීමකට ලක් කරමින් තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න. ඒක සීමා කරන්න බැහැ මට.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
උදාහරණයක් කිව්වොත්, පසු ගිය දා ගාල්ලේදී මුතුහෙට්ටිගම මැතිතුමා කරන ලද ප්‍රකාශයක් "සිරස" මාධ්‍ය ආයතනය මඟින් ප්‍රකාශයට පත් කළා. ඔවුන්ට නියෝගයක් ඇවිත් තිබෙනවා එම කැසට් පටය දෙන්න කියලා. ඒක සාධාරණයි. එම කැසට් පටය ඉල්ලන එක සාධාරණයි. හැබැයි ඒකේ අහනවා මෙය රූපගත කළේ කවුද, මෙය සංස්කරණය කළේ කවුද, මෙය ඉදිරිපත් කළේ කවුද, ඔවුන්ගේ නම් සහ ලිපිනයන්. මෙම කැසට් පටය ඉල්ලන එක සාධාරණයි, ඒ පිළිබඳ විමර්ශනයක් කෙරෙනවා නම් කැසට් පටය ලබා ගැනීම සාධාරණයි. හැබැයි අනික් අතුරු ප්‍රශ්න ඇහුවේ ඇයි? එය රූපගත කළ පුද්ගලයාගේ නම සහ ලිපිනය, එය සංස්කරණය කරන ලද පුද්ගලයාගේ නම සහ ලිපිනය, එය ඉදිරිපත් කරන ලද පුද්ගලයාගේ නම සහ ලිපිනය, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, -

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු කථානායකතුමනි, ඒ පොලීසියේ ප්‍රශ්න කිරීම් මම දන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉතින් ඔබතුමා මාධ්‍ය ඇමතිතුමා නේ?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම දන්නවා එකක්. ඔබතුමා දන්නවා අද මේ නවීන තාක්ෂණය අනුව ඕනෑම දෙයක් එකතු කරන්න, කපන්න, අදාළ නොවන කරුණු ඇතුළු කරන්න පුළුවන් බව. පොලිස් නිලධාරියෙක් පරීක්ෂණයක් කරන කොට ඒ පරීක්ෂණය කරන ආකාරයක් තිබෙනවා. ඒ කාරණාව සම්බන්ධයෙන් මට උත්තර දීමට පුළුවන්කමක් නැහැ ගරු කථානායකතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මොකක්ද අපරාධය?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම දන්නේ නැහැ.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
මම කනගාටු වෙනවා "සිරස" කියන කොටියා වෙනුවෙන්, - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු පේමසිරි මානගේ මන්ත්‍රීතුමා, ප්‍රශ්න අංක 15. [බාධා කිරීම්] ගරු විපක්ෂ නායකතුමා-[බාධා කිරීම්]

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M.M. Pemasiri Manage)
මම ඒ ප්‍රශ්නය අහනවා ගරු කථානායකතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වෙලාව. දැන් 10.45යි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මේ ඇමතිතුමා කිව්ව කාරණය ගැන, මම කැමැතියි එතුමා මේ සභාවට ඉදිරිපත් කරනවා නම්- [බාධා කිරීම්] 2005 දී විශේෂයෙන්ම ඡන්ද වාණිජ දැන්වීම් ගැන මේ සංස්ථා දෙක ඉදිරිපත් කරපු චක්‍රලේඛන අනුව ඒ මුදල් ටික ගෙවන්න තිබෙනවා දැන්වීම දමන්න ඉස්සර වෙලා. අපි ඔක්කොටම සිදු වුණා දැන්වීම දමන්න ඉස්සර වෙලා මුදල් බඳින්න. එහෙම නම් යම් කිසි පුද්ගලයකුගෙන් මුදල් ගන්නේ නැතිව දැන්වීම් දැම්මා නම් කවුද ඒක කළේ? ඒ ගැන වෙනම විභාගයක් තියන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ අවධානයට.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු ඇමතිතුමා, ඔබතුමා කිව්වා - [බාධා කිරීමක්] මේක සාමාන්‍ය වාණිජ එකක් නොවේ. අනිවාර්යයෙන් මේක දෙන්න ඕනෑ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මා ඒක සොයා බලා වාර්තා කරන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා තොරතුරු සොයලා දෙයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඒ පිළිතුර වැරදියි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මා සොයා බලා වාර්තා කරන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු පේමසිරි මානගේ මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] විපක්ෂ නායකතුමා පැහැදිලි කිරීමක් කළා. [බාධා කිරීමක්] පැහැදිලි කිරීමක් කළා. ප්‍රශ්නයක් නොවෙයි, ඒක පැහැදිලි කිරීමක්. ගරු ඇමතිතුමා එකඟයි. [බාධා කිරීමක්] ඒක පැහැදිලි කිරීමක්. ඒ බලය විපක්ෂ නායකවරයාට තිබෙනවා.

ප්‍රශ්න අංක 15 -0489/09-(1), ගරු පේමසිරි මානගේ මන්ත්‍රීතුමා.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M.M. Pemasiri Manage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம்.எம். பேமசிறி மானகே)
(The Hon. M.M. Pemasiri Manage)
ගරු ඇමතිතුමා, ඔබතුමා නිශ්චිතවම සති දෙකකින් උත්තර දෙනවාද?

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මාලදිවයින රැකියාලාභීන් : වන්දි

### மாலைதீவில் தொழில்பெற்றோர் : நட்டஈடு

### PERSONS EMPLOYED IN MALDIVES : COMPENSATION

0452/'09

**8. ගරු රවි කරුණානායක මහතා (ගරු දුනේෂ් ගන්කන්ද මහතා වෙනුවට)**

(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு துனேஷ் கங்கந்த - சார்பாக)

(The Hon. Ravi Karunanayake - on behalf of the Hon. Dunesh Gankanda)

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i)

| | | |
|---|---|---|
| පැල්මඩුල්ල | - | පී. ජී. හේමසිරි තිලකරත්න |
| නිට්ටඹුව | - | මොහොමඩ් මුසම්මිල් |
| යක්කල | - | රංජිත් ප්‍රේමරත්න |
| බත්තරමුල්ල | - | ලාල් පල්ලියගුරුගේ |
| අංගොඩ | - | අතුල පුෂ්පකුමාර |
| වැල්ලම්පිටිය | - | සිරිවර්ධන ගමරාලගේ |
| ගනේමුල්ල | - | නිහාල් බඩතුරගේ |

යන පිරිස ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ සේවා ගිවිසුම්ගතව රක්ෂණය වී, මරදාන ෆයිනාස් ඇසෝසියේටඩ් ආයතනය හරහා මාලදිවයිනේ සේවය සඳහා 2009 පෙබරවාරි මාසයේ දී පිටත් කර යවා ඇති බවත්;

(ii) අදාළ ගිවිසුම් ප්‍රකාරව එරටදී වැටුප් හා අනෙකුත් පහසුකම් නොලද බවත්;

(iii) මාලදිවයිනේ තානාපති කාර්යාලය වෙත ඔවුන් විසින් කරන ලද පැමිණිලි අනුව නැවතත් ඔවුන් මෙරටට ගෙන්වා ඇති බවත්;

(iv) මේ සම්බන්ධව ඔවුන් විසින් ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය වෙත පැමිණිලි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පැමිණිලි අනුව ඔවුන් වෙත වන්දි ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) ගිවිසුම් කඩ කරන ලද එම විදේශ රැකියා ආයතනය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு மற்றும் நலனோம்புகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i )

| | | |
|---|---|---|
| பி.ஜீ. ஹேமசிறி திலகரத்ன | - | பெல்மடுல்ல |
| மொஹொமட் முசம்மில் | - | நிட்டம்புவ |
| ரஞ்சித் பிரேமரத்ன | - | யக்கல |
| லால் பல்லியகுருகே | - | பத்தரமுல்ல |
| அதுல புஷ்பகுமார | - | அங்கொட |
| சிறிவர்தன கமராலகே | - | வெல்லம்பிட்டிய |
| நிஹால் படதுரகே | - | கனேமுல்ல |

ஆகியோர் இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தில் சேவை உடன்படிக்கை செய்து , காப்புறுதி செய்துக்கொண்டு, மருதானை பயினாஸ் அசோசியேடட் நிறுவனத்தினூடாக மாலைதீவில் சேவைக்காக 2009 ஆம் ஆண்டு பெப்ருவரி மாதம் அனுப்பப்பட்டுள்ளார்களென்பதையும்,

(ii) சம்பந்தப்பட்ட உடன்படிக்கையின் படி அந்த நாட்டில் சம்பளம் மற்றும் ஏனைய வசதிகள் வழங்கப்படவில்லை என்பதையும்,

(iii) மாலைதீவு உயர்ஸ்தானிகர் அலுவலகத்திற்கு அவர்கள் செய்த முறையீட்டின் பேரில் மீண்டும் அவர்கள் இந்நாட்டுக்கு அழைத்துவரப் பட்டுள்ளார்களென்பதையும்,

(iv) இவர்கள் இது சம்பந்தமாக இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்பு பணியகத்துக்கு முறையீடு செய்துள்ளார்களென்பதையும்

(ஆ) (i) மேற்படி முறையீடுகளின் படி அவர்களுக்கு இழப்பீடு வழங்க நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்,

(ii) உடன்படிக்கையை மீறியுள்ள குறிப்பிட்ட வெளிநாட்டு வேலைவாய்ப்பு நிறுவனம் சம்பந்தமாக எடுக்கப்படும் நடவடிக்கை யாதென்பதையும் ,

அவர் குறிப்பிடுவாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of Foreign Employment Promotion and Welfare:

(a) Is he aware that-

(i) in February, 2009, the persons mentioned below were sent for employment in the Maldives through the agency named "Fainaz Associated" in Maradana after they had entered into agreements at the Sri Lanka Bureau of Foreign Employment and obtained the relevant insurance coverage;

P.G. Hemesiri Thilakarathna - from Pelmadulla
Mohammed Mussammil - from Nittambuwa
Ranjith Premarathna - from Yakkala
Lal Palliyaguruge - from Battaramulla
Athula Pushpakumara - from Angoda
Siriwardhana Gamaralage - from Wellampitiya
Nihal Badathurage - from Ganemulla

(ii) they did not receive wages and other facilities in that country, according to the relevant agreements;

(iii) they have been brought back to the country in view of the complaints lodged by them with the Sri Lankan Embassy in the Maldives; and

(iv) they have complained to the Sri Lanka Bureau of Foreign Employment in this regard?

(b) Will he state-

(i) whether action will be taken to pay compensation to them on the complaints mentioned above; and

(ii) the steps that will be taken against the agency named Fainaz Associated, which has breached the agreements?

(c) If not, why?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு மற்றும் நலனோம்புகை அமைச்சர்)

(The Hon. Keheliya Rambukwella - Minister of Foreign Employment Promotion and Welfare)

Hon. Speaker, I table* the Answer.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(a) (i) Yes.
(ii) Yes.
(iii) No.
(iv) Yes.

(b) (i) No.

The decision taken is to pay wages relevant to their period of employment, but not as compensation. Workers have returned to Sri Lanka on their own will and a need for paying compensation does not arise.

(ii) On complaints lodged by them, the Sri Lanka Bureau of Foreign Employment summoned the foreign employment agency and got them to agree to give the contracted employment, pay the arrears of wages and for facilities according to the agreement immediately, and the workers were informed of the decision accordingly. But, the workers vehemently refused to work in the Maldives any further. Because of this, action cannot be taken against the employment agency, but the employment agency was ordered to provide air-tickets to bring the workers back and pay the arrears of wages. The employment agency had provided the air tickets and brought the workers back to Sri Lanka. Only four of the workers have consented to accept the arrears of wages and the letters posted to the other two have got returned to the Bureau.

(c) Not relevant.

## රාජකාරි වේලාවන්හිදී පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදීම: විනයානුකූල පියවර

### கடமை நேரங்களில் தனியார் வைத்திய சேவையில் ஈடுபடல் : ஒழுக்காற்று நடவடிக்கை

### DOCTORS ENGAGED IN PRIVATE PRACTICE DURING OFFICE HOURS : DISCIPLINARY ACTION

0527/'09

9. **ගරු ලලිත් දිසානායක මහතා (ගරු චන්දිම වීරක්කොඩි මහතා වෙනුවට)**

(மாண்புமிகு லலித் திஸாநாயக்க - மாண்புமிகு சந்திம வீரக்கொடி - சார்பாக)

(The Hon. Lalith Dissanayake - on behalf of the Hon. Chandima Weerakkody)

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) වර්ෂ 2004 සිට 2009 දක්වා කාල සීමාව තුළ රාජකාරි වේලාවන්හිදී පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදී, රාජකාරිය පැහැර හැර ඇති බවට වාර්තා වී ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වෛද්‍යවරුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම වෛද්‍යවරුන් සඳහා අදාළ අමාත්‍යාංශය මඟින් ගන්නා ලද විනය ක්‍රියාමාර්ග කවරේද;

(iii) එලෙස විනයානුකූල පියවර ගන්නා ලද වෛද්‍යවරුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார நலத்துறை, போசணை அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2004 முதல் 2009 வரையிலான காலகட்டத்தில், கடமை நேரங்களில் தனியார் வைத்திய சேவையில் ஈடுபட்டதன்மூலம் கடமையிலிருந்து தவறியுள்ளது என அறியப்பட்ட மருத்துவர்களின் எண்ணிக்கை யாதென்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) அத்தகைய மருத்துவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதையும்,

(ii) சம்பந்தப்பட்ட அமைச்சினால் மேற்படி மருத்துவர்கள் தொடர்பாக மேற்கொள்ளப்பட்டுள்ள ஒழுக்காற்று நடவடிக்கை யாதென்பதையும்,

(iii) அவ்வாறு ஒழுக்காற்று நடவடிக்கை மேற்கொள்ளப்பட்ட மருத்துவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of Healthcare and Nutrition:

(a) Will he inform this House of the number of doctors who are alleged to have neglected their duties by engaging in private practice during office hours within the period from the year 2004 to year 2009?

(b) Will he submit to this House-

(i) the names and addresses of those doctors;

(ii) the disciplinary action taken by the relevant Ministry in respect of those doctors; and

(iii) the names and addresses of doctors against whom such disciplinary action was taken?

(c) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) 2004 වසරේ සිට 2009 දක්වා කාල සීමාව තුළ රාජකාරි වේලාවන්හිදී පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදී රාජකාරිය පැහැර හැර ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව 56කි.

(ආ) (i) එම වෛද්‍යවරුන්ගේ නම් සහ රාජකාරි ලිපිනයන් පිළිවෙළින් ඇමුණුමේ 3 හා 4 තීරුවල දක්වා ඇත. ඇමුණුම බලන්න.

(ii) එම වෛද්‍යවරුන් සඳහා අමාත්‍යාංශය මේ වන විට ගෙන ඇති විනය ක්‍රියා මාර්ගයන්හි එක් එක් පියවරයන් සඳහා ගත වී ඇති කාලයන් පිළිබඳ විස්තර ඇමුණුමෙහි 6 වන තීරුවෙහි සිට 10 තීරුව දක්වා සඳහන් වන අතර ගෙන ඇති විනය ක්‍රියා මාර්ගයේ වර්තමාන තත්ත්වය ඇමුණුමේ 11 වන තීරුවෙහි දක්වා ඇත.

(iii) ඉහත (ii) පිළිතුරෙහි සඳහන් තොරතුරු අදාළ වේ.

(ඇ) පැන නොනඟී.

ඇමුණුම

# 2004-2009 කාලය තුළ රාජකාරි වේලාවේදී පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදී චෝදනා ලබා ඇති වෛද්‍ය නිලධාරීන්ගේ නාම ලේඛනය

| 1 අනු අංකය | 2 විෂය ගොනු අංකය | 3 වෛද්‍ය නිලධාරියාගේ නම | 4 සේවා ස්ථානයේ ලිපිනය | 5 පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදුණු දිනය | 6 චෝදනා පත්‍ර කෙටුම්පත රා.සේ.කො.ස. වෙත යැවූ දිනය | 7 රා.සේ.කො.ස. විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය | 8 චෝදනා පත්‍රයට පිළිතුර හා එය ලබා දුන් දිනය | 9 රා.සේ.කො.ස. විසින් පරීක්ෂණ මණ්ඩලය පත් කළ දිනය | 10 B වාර්තාව රා.සේ.කො.ස. වෙත යවා ඇති දිනය | 11 ගෙන ඇති විනය ක්‍රියාමාර්ගයේ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | CF/ DPG/34/2005 | වෛද්‍ය ලලිත් කුඩාගොඩගේ මහතා | මහ රෝහල මාතර | 2005.09.15 | 2006.08.11 | 2006.12.19 | 2007.02.15 වරද පිළිගෙන ඇත |  | 2007.06.21 | විනය දඬුවම් පමුණුවා ඇත<br>1. වැටුප් වර්ධක 1ක් විලම්භනය<br>2. තදින් තරවටු කිරීම |
| 02 | CF/ DPG/07/2005 | වෛද්‍ය ජේ.ඒ. එස්.පී. අබේවික්‍රම මහතා | ගොඩවෙල දිසා රෝහල | 2005.05.06 | 2005.06.06 | 2006.07.06 | 2006.07.24 | 2007.04.18 |  | අධිකරණ කටයුත්තක් පවතින බැවින් විධිමත් විනය පරීක්ෂණය තාවකාලිකව නවතා ඇත. |
| 03 | CF/ DPG/21/2005 | වෛද්‍ය ජී.එම්. ධර්මපාල මහතා | නාරවැල්පිට රජයේ රෝහල | 2005.08.11 |  |  |  |  |  | විධිමත් විනය පරීක්ෂණය අවසන් කර ඇත. පරීක්ෂණ වාර්තාව මෙතෙක් භාර දී නැති අතර අධිකරණ කටයුත්තක් සඳහා මූලික ගොනුව නීති අංශය භාරයට ගෙන ඇත. |
| 04 | CF/ DPG/33/2005 | ඩී.එම්.සී.කේ. දිසානායක මහතා | හල්දුම්මුල්ල දිසා රෝහල | 2005.07.25 | 2006.05.04 | 2006.11.30 | 2007.02.07 | 2007.08.09 |  | විධිමත් විනය පරීක්ෂණය අවසන් කර ඇතත් විනය පරීක්ෂණ වාර්තාව මෙතෙක් භාර දී නැත. |
| 05 | CF/ DPG/35/2005 | වෛද්‍ය එන්.පී.සී. කේ. වීරත්න මහතා | පස්සර දිසා රෝහල | 2005.07.26 | 2006.01.20 | 2006.08.18 | 2006.09.12 | 2008.04.29 |  | විධිමත් විනය පරීක්ෂණය අවසන් කර ඇතත් විනය පරීක්ෂණ වාර්තාව මෙතෙක් භාර දී නැත. |
| 06 | CF/ DPG/36/2005 | ප්‍රසව හා නාරිවේද වෛද්‍ය කුසුම්සිරි ද සිල්වා මහතා | ගම්පොල මූලික රෝහල | 2005.09.23 | 2006.05.16 | 2008.06.19 |  |  |  | 2008.07.30 සේවය හැර යාමේ නියෝගය නිකුත් කර ඇති බැවින් විධිමත් විනය පරීක්ෂණය අත් හිටුවා ඇත. |
| 07 | CF/ DPG/42/2005 | වෛද්‍ය වයි.එම්. කේ.සී. අබේරත්න මහතා | ඉත්තෑපාන දිසා රෝහල | 2005.10.07 | 2006.05.15 | 2006.12.11 | 2007.01.18 | 2007.10.02 | 2009.02.17 | විධිමත් විනය පරීක්ෂණය අවසන් කර විනය නියෝගය ලබා දී ඇත.<br>1. වැටුප් වර්ධක 3ක් විලම්භනය<br>2. තදින් තරවටු කිරීම |
| 08 | CF/ DPG/22/2005 | වෛද්‍ය එම්.ඒ.සී.කේ. පෙරේරා මහතා | හල්දුම්මුල්ල දිසා රෝහල | 2005.0725 | 2006.05.16 | 2008.07.02 |  |  |  | චෝදනා පත්‍ර නිකුත් කර ඇත. |

| *1* *අනු අංකය* | *2* *විෂය ගොනු අංකය* | *3* *වෛද්‍ය නිලධාරියාගේ නම* | *4* *සේවා ස්ථානයේ ලිපිනය* | *5* *පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදුණු දිනය* | *6* *චෝදනා පත්‍ර කෙටුම්පත රා.සේ.කො.ස. වෙත යැවූ දිනය* | *7* *රා.සේ.කො.ස. විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය* | *8* *චෝදනා පත්‍රයට පිළිතුර හා එය ලබා දුන් දිනය* | *9* *රා.සේ.කො.ස. විසින් පරීක්ෂණ මණ්ඩලය පත් කළ දිනය* | *10* *B වාර්තාව රා.සේ.කො.ස. වෙත යවා ඇති දිනය* | *11* *ගෙන ඇති විනය ක්‍රියාමාර්ගයේ වර්තමාන තත්ත්වය* |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 09 | CF/ DPG/18/2005 | වෛද්‍ය ඒ.ඩබ්.ඒ.එස්. පියරත්න මහතා | බලපිටිය මූලික රෝහල | 2005.07.13 | 2005.08.25 | 2006.07.06 | 2006.08.14 | 2007.04.25 | 2008.08.29 | විධිමත් විනය පරීක්ෂණය අවසන් කර විනය නියෝගය සඳහා රා.සේ.කො. සභාවට යවා ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 10 | CF/ DPG/10/2005 | වෛද්‍ය නිමල් රංජිත් එදිරිසිංහ මහතා | ඇල්පිටිය දිසා රෝහල | 2005.05.12 | 2005.07.08 | 2005.11.30 | 2006.01.19 | 2006.05.23 | 2007.05.01 | විනය දඬුවම් පමුණුවා ඇත.<br>1. වැටුප් වර්ධක 2ක් විලම්භනය |
| 11 | CF/ DPG/11/2005 | දන්ත ශල්‍ය වෛද්‍ය ප්‍රසාද් ශ්‍රීමාල් ගමගේ මහතා | අම්බලන්ගොඩ දිසා රෝහල | 2005.05.12 | 2005.06.30 | 2005.11.30 | 2006.01.24 | 2006.05.31 | 2007.06.01 | විනය දඬුවම් පමුණුවා ඇත.<br>1. වැටුප් වර්ධක 1ක් විලම්භනය<br>2. තදින් තරවටු කිරීම |
| 12 | CF/ DPG/26/2005 | වෛද්‍ය ආර්.එම්.ඩී. රාජපක්ෂ මහතා | හපුතලේ දිසා රෝහල | 2005.07.26 | 2006.02.06 | 2006.07.12 | 2006.07.28 | 2007.05.16 | 2008.04.08 | විනය දඬුවම් පමුණුවා ඇත. |
| 13 | CF/DPC/25/2005 | ලියා පදිංචි වෛද්‍ය අයි.ආර්.එච්.එම්. ජයතිලක මයා | මධ්‍යම බෙහෙත් ශාලාව, මාකඳුර. | 2005.08.12 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට දකුණු පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |
| 14 | CF/ DPD/17/2006 | වෛද්‍ය පී.ටී.අයි. පෙරේරා මයා | දි.වෛ.නි. මූලික රෝහල, දඹුල්ල. | 2006.02.28 | 2006.07.12 | 2006.12.12 | නිවැරදිකරු 2007.04.20 | 2007.07.17 | | පැ.මෙ. නිලධාරී හා රැකවරණ නිලධාරී වෙනස් වීම හේතුවෙන් විධිමත් විනය පරීක්ෂණය මේ දක්වා අවසන් වී නැත. |
| 15 | CF/ DPD/18/2006 | වෛද්‍ය ධම්මික ජයන්ත පෙරේරා මයා | පර්යන්ත ඒකකය, කොස්ගම. | 2006.02.23 | 2006.07.06 | 2006.12.26<br>2008.10.24 | | | | 2006.12.26 දින නිකුත් කළ චෝදනා පත්‍රය අස්ථානගත වී ඇති බැවින් 2008.10.24 දින නව චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත. මෙතෙක් පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| 16 | CF/ DPD/25/2006 | වෛද්‍ය රම්‍යා ආනන්ද මිය | දිසා රෝහල, බණ්ඩාරගම. | 2005.10.07 | 2006.09.13 | 2007.03.27 | 2007.05.29 | | | චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට 2009.06.13 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා ඇත. |
| 17 | CF/ DPD/28/2006 | වෛද්‍ය ඉමේෂ් ප්‍රතාපසිංහ මහතා | මහ රෝහල, පොලොන්නරුව. | 2006.03.01 | 2006.08.29 | 2007.12.18 | 2008.01.08 වරද පිළිගෙන ඇත. | | | චෝදනාවලට වරදකරු වී විනය දඬුවම් පමුණුවා ඇත.<br>1. වැටුප් වර්ධක 1ක් විලම්භනය<br>2. තදින් තරවටු කිරීම |

| 1 අනු අංකය | 2 විෂය ගොනු අංකය | 3 වෛද්‍ය නිලධාරියාගේ නම | 4 සේවා ස්ථානයේ ලිපිනය | 5 පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදුණු දිනය | 6 චෝදනා පත්‍ර කෙටුම්පත රා.සේ.කො.ස. වෙත යැවූ දිනය | 7 රා.සේ.කො.ස. විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය | 8 චෝදනා පත්‍රයට පිළිතුර හා එය ලබා දුන් දිනය | 9 රා.සේ.කො.ස. විසින් පරීක්ෂණ මණ්ඩලය පත් කළ දිනය | 10 B වාර්තාව රා.සේ.කො.ස. වෙත යවා ඇති දිනය | 11 ගෙන ඇති විනය ක්‍රියාමාර්ගයේ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 18 | CF/ DPD/36/2006 | වෛද්‍ය ඩබ්.එම්.එම්. ප්‍රසාද් ද සිල්වා | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, ඇල්පිටිය. | 2006.03.11 | 2006.08.24 | 2008.04.29 | 2008.06.01 නිවැරදිකරු | 2008.09.16 | | විධිමත් විනය පරීක්ෂණය ආරම්භ කර ඇත. චෝදනා පත්‍ර සංශෝධනය සඳහා 2009.04.08 දිනැතිව රා.සේ.කො.ස. යවා ඇත. ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට ඇත. |
| 19 | CF/ DPD/40/2006 | වෛද්‍ය එම්.එන්.එච්. ක්‍රිෂාන්ත මයා | පර්යන්ත රෝහල, හබ්බෙගමුව. | 2006.03.27 | 2006.08.24 | 2008.06.25 | 2008.07.10 වරද පිළිගෙන ඇත | | 2008.11.24 | චෝදනාවලට වරදකරු වී විනය දඬුවම් පමුණුවා ඇත.<br>1. වැටුප් වර්ධක 2ක් විලම්භනය |
| 20 | CF/ DPD/66/2006 | වෛද්‍ය විමල් වීරසේකර මයා | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, වැලිපිටිය. | 2006.02.13 | 2006.11.23 | 2007.07.26 | 2007.09.28 | 2008.01.14 | 2009.06.13 | විනය පරීක්ෂණය අවසන් වී බී වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවා ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 21 | CF/ DPD/82/2006 | වෛද්‍ය ආර්. කොලොන්නේ මයා | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 2006.11.16 | | | | | | විනය කටයුතු කරන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වා ඇත. |
| 22 | CF/ DPG/08/2006 | වෛද්‍ය සී.ජී. වික්‍රමරත්න මහතා | දෙයියන්දර ග්‍රාමීය රෝහල | 2005.12.23 | 2006.05.15 | 2007.07.06 | 2007.08.14 | 2007.12.15 | | මෙතෙක් විධිමත් විනය පරීක්ෂණය අවසන් නැත. |
| 23 | CF/ DPG/09/2006 | වෛද්‍ය එන්.ටී.එම්.පී.පී. කේ. මුදලිගේ මිය | තිස්සමහාරාමය දිසා රෝහල | 2005.12.26 | 2006.05.01 | 2007.12.20 | 2008.01.03 | 2008.05.30 | | විධිමත් විනය පරීක්ෂණයක් ක්‍රියාත්මක වෙමින් පවතී. චෝදනා පත්‍රය සංශෝධනය කිරීම සඳහා 2008.08.06 දිනැතිව රා.සේ.කො.ස. වෙතින් ඉල්ලීමක් කර ඇත. |
| 24 | CF/ DPG/10/2006 | වෛද්‍ය එස්.පී.සී. ඒකනායක මහතා | මැණික්හින්න දිසා රෝහල | 2006.01.18 | 2006.05.15 | 2007.09.15 | 2007.10.11 | 2007.12.31 | 2008.09.25 | විනය දඬුවම් පමුණුවා ඇත.<br>1. වැටුප් වර්ධක 2ක් විලම්භනය<br>2. නැගෙනහිර පළාතට ස්ථාන මාරු කිරීම |
| 25 | CF/ DPG/11/2006 | වෛද්‍ය කේ.පී. පට්ටියවත්තගේ මහතා | හල්දුම්මුල්ල පර්යන්ත රෝහල | 2006.01.30 | 2006.05.04 | 2007.12.03 | 2008.01.25 | 2008.04.23 | | විධිමත් විනය පරීක්ෂණයක් ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 26 | CF/ DPG/12/2006 | ලියාපදිංචි වෛද්‍ය ඩී.එම්.එන්.අයි.බී. දිසානායක මයා | මැණික්හින්න දිසා රෝහල | 2006.01.18 | | | | | | විධිමත් විනය පරීක්ෂණය සඳහා මධ්‍යම පළාත් සභාව වෙත යවා ඇත. |

| 1 අනු අංකය | 2 විෂය ගොනු අංකය | 3 වෛද්‍ය නිලධාරියාගේ නම | 4 සේවා ස්ථානයේ ලිපිනය | 5 පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදුණු දිනය | 6 චෝදනා පත්‍ර කෙටුම්පත රා.සේ.කො.ස. වෙත යැවූ දිනය | 7 රා.සේ.කො.ස. විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය | 8 චෝදනා පත්‍රයට පිළිතුර හා එය ලබා දුන් දිනය | 9 රා.සේ.කො.ස. විසින් පරීක්ෂණ මණ්ඩලය පත් කළ දිනය | 10 B වාර්තාව රා.සේ.කො.ස. වෙත යවා ඇති දිනය | 11 ගෙන ඇති විනය ක්‍රියාමාර්ගයේ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 27 | CF/ DPG/07/2006 | වෛද්‍ය පී.එච්.ජේ. වීරසිංහ මහතා | ආරච්චිකන්ද දිසා රෝහල | 2005.09.30 | 2006.06.02 | 2007.12.28 | 2008.02.19 | 2008.05.30 | 2009.08.04 | විධිමත් විනය පරීක්ෂණය අවසන් කර විනය නියෝගය සඳහා රා.සේ.කො. සභාවට යවා ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 28 | CF/ DPG/03/2006 | දන්ත ශල්‍ය වෛද්‍ය පී.එම්.එම්. ශාන්ති හේරත් මිය | ගලේවෙල දිසා රෝහල | 2005.12.21 | 2006.05.04 | 2007.09.18 | 2007.10.10 | 2008.01.07 | 2009.03.31 | විධිමත් විනය පරීක්ෂණය අවසන් කර විනය නියෝගය සඳහා රා.සේ.කො. සභාවට යවා ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 29 | CF/ DPG/02/2006 | වෛද්‍ය ඩබ්.ඒ.ඩී.එස්. ජයකාන්ත මහතා | සෞ.වෛ.නි. කාර්යාලය, ගලේවෙල. | 2005.12.21 | | | | | | විධිමත් විනය පරීක්ෂණය අවසන්ව ඇතත් විනය පරීක්ෂණ වාර්තාව මෙතෙක් භාර දී නැත. |
| 30 | CF/DPC/01/2006 | ලියා පදිංචි වෛද්‍ය ජේ.කේ.ඩබ්.එස්. කරුණාතිලක මයා | ග්‍රාමීය රෝහල, මහවිලච්චිය. | 2005.12.22 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට උතුරු මැද පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |
| 31 | CF/DPC/11/2006 | ලියා පදිංචි වෛද්‍ය මාලනී කුමාරිහාමි මිය | ප්‍රාදේශීය රෝහල, නාරම්පනාව. | 2006.01.18 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට මධ්‍යම පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |
| 32 | CF/DPC/32/2006 | ලියා පදිංචි වෛද්‍ය කේ. සන්ධ්‍යා කුමාරි මිය | දිසා රෝහල, කඩුගන්නාව. | 2006.04.20 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට මධ්‍යම පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |
| 33 | CF/DPC/33/2006 | ලියා පදිංචි වෛද්‍ය ඩී.එම්.ඒ.සී. දිසානායක මයා | රජයේ රෝහල, ගලෙන්බිඳුණුවැව. | 2006.02.28 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට උතුරු මැද පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |

| *1* *අනු අංකය* | *2* *විෂය ගොනු අංකය* | *3* *වෛද්‍ය නිලධාරියාගේ නම* | *4* *සේවා ස්ථානයේ ලිපිනය* | *5* *පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදුණු දිනය* | *6* *චෝදනා පත්‍ර කෙටුම්පත රා.සේ.කො.ස. වෙත යැවූ දිනය* | *7* *රා.සේ.කො.ස. විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය* | *8* *චෝදනා පත්‍රයට පිළිතුර හා එය ලබා දුන් දිනය* | *9* *රා.සේ.කො.ස. විසින් පරීක්ෂණ මණ්ඩලය පත් කළ දිනය* | *10* *B වාර්තාව රා.සේ.කො.ස. වෙත යවා ඇති දිනය* | *11* *ගෙන ඇති විනය ක්‍රියාමාර්ගයේ වර්තමාන තත්ත්වය* |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 34 | CF/ DPC/33/2006 | ලියා පදිංචි වෛද්‍ය ජී.එල්.එස්. ජයවර්ධන මයා | මධ්‍යම බෙහෙත් ශාලාව, දේවාලේගම. | 2006.03.17 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනායනුකූලව කටයුතු කිරීමට සබරගමුව පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |
| 35 | CF/ DPC/49/2006 | ලියා පදිංචි වෛද්‍ය අනුර ඩී. වැලිකල මයා | දිසා රෝහල, රඹුක්කන. | 2006.04.20 | | | | | | තමාට අයත් වෛද්‍ය මධ්‍යස්ථානයේ පූර්ව නේවාසික වෛද්‍යවරයකු සේවයේ යෙදවීම සම්බන්ධයෙන් මෙම නිලධාරියාට එරෙහිව විනායනුකූලව කටයුතු කිරීමට සබරගමුව පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |
| 36 | CF/ DPD/05/2007 | ඩබ්.එම්.ටී.කේ. බුද්ධදාස මයා | දිසා රෝහල, කඩුගන්නාව. | 2006.04.20 | 2007.03.19 | 2007.06.30 | 2007.09.10 | 2007.11.27 | 2009.07.03 | විනය පරීක්ෂණය අවසන් වී බී වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවා ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 37 | CF/ DPD/09/2007 | වෛද්‍ය ශිෂ්‍ය එන්.ජී.ආර්. ප්‍රියදර්ශනී මිය | | 2005.12.19 | | | | | | වෛද්‍ය ශිෂ්‍යාවක් බැවින් වෛද්‍ය සභාවට දැනුම් දී ඇත. |
| 38 | CF/ DPD/41/2007 | වෛද්‍ය එස්.ඩබ්.ඒ. අශීෂ් මයා | අෂ්රොෆ් අනුස්මරණ රෝහල, කල්මුණේ. | 2007.05.10 | | | | | | නව පරීක්ෂණ නිලධාරියකු පත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට දැනුම් දී ඇත. |
| 39 | CF/ DPD/50/2007 | වෛද්‍ය එස්.එම්.අයි.එස්. ජයතිලක මයා | මූලික රෝහල, මහියංගනය. | 2007.07.24 | 2008.02.15 | 2008.05.02 | 2008.05.29 වරද පිළිගෙන ඇත. | | 2008.12.11 | විනය දඬුවම් පමුණුවා ඇත. |
| 40 | CF/ DPD/51/2007 | වෛද්‍ය කේ.එම්.ආර්.ජේ. කේ. ගුණසේකර මිය | ග්‍රාමීය රෝහල, තලල්ල. | 2007.05.24 | 2007.11.25 | 2008.10.24 | 2008.12.10 | 2009.03.03 | | විධිමත් විනය පරීක්ෂණය අවසන් නැත. |
| 41 | CF/ DPD/65/2007 | වෛද්‍ය මෙල්හේන්ගේ මහින්දරත්න මයා | රජයේ රෝහල, සූරියවැව. | 2005.09.20 | | | | | | මූලික විමර්ශනයේ අඩු පාඩු සකස් කර එවන ලෙස දකුණු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත 2008.02.25 දිනැතිව යවා ඇත. |
| 42 | CF/ DPC/13/2007 | ලියා පදිංචි වෛද්‍ය ශ්‍රීමතී සමරතුංග මිය | ග්‍රාමීය රෝහල, අම්තිරිගල. | 2004.07.27 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනායනුකූලව කටයුතු කිරීමට සබරගමුව පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |

| 1 අනු අංකය | 2 විෂය ගොනු අංකය | 3 වෛද්‍ය නිලධාරියාගේ නම | 4 සේවා ස්ථානයේ ලිපිනය | 5 පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදුණු දිනය | 6 චෝදනා පත්‍ර කෙටුම්පත රා.සේ.කො.ස. වෙත යැවූ දිනය | 7 රා.සේ.කො.ස. විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය | 8 චෝදනා පත්‍රයට පිළිතුර හා එය ලබා දුන් දිනය | 9 රා.සේ.කො.ස. විසින් පරීක්ෂණ මණ්ඩලය පත් කළ දිනය | 10 B වාර්තාව රා.සේ.කො.ස. වෙත යවා ඇති දිනය | 11 ගෙන ඇති විනය ක්‍රියාමාර්ගයේ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 43 | CF/DPC/67/2007 | ලියා පදිංචි වෛද්‍ය කේ.බී. ඉලංගසිංහ මයා | මධ්‍යම බෙහෙත් ශාලාව, උහුමීය. | 2006.03.17 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනායානුකූලව කටයුතු කිරීමට වයඹ පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |
| 44 | CF/ DPD/42/2008 | වෛද්‍ය කේ.ඩබ්.එස්.එන්. සම්පත් මයා | පර්යන්ත ඒකකය, බදුරලිය. | 2008.05.26 | | | | | | චෝදනා පත්‍ර සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවා ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 45 | CF/ DPD/56/2008 | වෛද්‍ය බී.එච්.එම්.එස්. හේරත් මිය | දිසා රෝහල, හපුතලේ. | 2007.12.11 | | | | | | චෝදනා පත්‍ර සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවා ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 46 | CF/DPC/05/2008 | ලියා පදිංචි වෛද්‍ය ඩබ්.එම්. විජේරත්න මයා | දිසා රෝහල, නාරම්මල. | 2007.09.05 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනායානුකූලව කටයුතු කිරීමට වයඹ පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |
| 47 | CF/DPC/35/2008 | සහකාර වෛද්‍ය ඉන්දික උපුල් බණ්ඩාර වනිගසේකර මයා | පර්යන්ත රෝහල, කොස්ගහවෙල. | 2008.05.30 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනායානුකූලව කටයුතු කිරීමට මධ්‍යම පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |
| 48 | CF/ DPD/17/2008 | වෛද්‍ය ඒ.එම්.ඩී. ලලිත් චන්ද්‍රසිරි මයා | මහ රෝහල, කළුතර. | 2006.12.19 | 2008.08.01 | 2008.10.08 | 2008.10.29 | 2009.06.16 | | විධිමත් විනය පරීක්ෂණය ආරම්භ කර ඇත. |
| 49 | CF/ DPD/03/2009(1) | වෛද්‍ය ශ්‍රී ස්කන්ධරාජා මයා | මූලික රෝහල, මීගමුව. | 2007.08.14 | | | | | | චෝදනා පත්‍ර සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| 50 | CF/ DPD/03/2009 (11) | වෛද්‍ය ඉනෝකා ද සිල්වා මිය | මූලික රෝහල, මීගමුව. | 2007.08.14 | | | | | | චෝදනා පත්‍ර සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |

| 1 අනු අංකය | 2 විෂය ගොනු අංකය | 3 වෛද්‍ය නිලධාරියාගේ නම | 4 සේවා ස්ථානයේ ලිපිනය | 5 පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදුණු දිනය | 6 චෝදනා පත්‍ර කෙටුම්පත රා.සේ.කො.ස. වෙත යැවූ දිනය | 7 රා.සේ.කො.ස. විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය | 8 චෝදනා පත්‍රයට පිළිතුර හා එය ලබා දුන් දිනය | 9 රා.සේ.කො.ස. විසින් පරීක්ෂණ මණ්ඩලය පත් කළ දිනය | 10 B වාර්තාව රා.සේ.කො.ස. වෙත යවා ඇති දිනය | 11 ගෙන ඇති විනය ක්‍රියාමාර්ගයේ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 51 | CF/ DPD/07/2009 | වෛද්‍ය පෝල් රංජිත් මයා | මුලික රෝහල, කුලියාපිටිය. | 2008.04.03 | | | | | | චෝදනා පත්‍ර සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවා ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 52 | CF/ DPD/20/2009 | වෛද්‍ය ආර්.එම්. කිත්සිරි හේරත් මයා | මධ්‍යම බෙහෙත් ශාලාව, නුවරගල. | 2009.03.12 | | | | | | චෝදනා පත්‍ර සකස් කිරීම සඳහා නිලධාරියකු පත් කර ඇත. |
| 53 | CF/ DPG/17/2009 | වෛද්‍ය ඩී.ඒ.එම්. දසනායක මහතා | එප්පාවල රජයේ රෝහල | 2008.06.30 | | | | | | චෝදනා පත්‍ර නිකුත් කිරීමට ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 54 | CF/ DPG/18/2009 | වෛද්‍ය එස්.එම්.එන්.කේ. සමරසිංහ මහතා | නොච්චියාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය | 2009.01.27 | 2009.07.20 | | | | | චෝදනා පත්‍ර නිකුත් කිරීමට ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 55 | CF/ DPG/30/2009 | වෛද්‍ය එස්.කේ. දෙනියාය මහතා | අධ්‍යක්ෂ මැලේරියා මර්දන ව්‍යාපාරය | 2009.02.11 | | | | | | චෝදනා පත්‍ර නිකුත් කිරීමට ඇත. රා.සේ.කො.ස. අක්‍රිය බැවින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. |
| 56 | CF/DPC/19/2009 | ලියා පදිංචි වෛද්‍ය එච්.එම්. හේමා කුමාරිහාමි මිය | ග්‍රාමීය රෝහල, හබරණ. | 2009.02.19 | | | | | | මෙම නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට උතුරු මැද පළාත් සෞඛ්‍ය ලේකම් වෙත යොමු කිරීමට ඇත. |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
රීති ප්‍රශ්නයක්. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, මොකක්ද, රීති ප්‍රශ්නය?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් අමාත්‍යාංශය පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. මම හිතුවා මේක ඉදිරිපත් කරන්නේ ප්‍රශ්නවලට පස්සේයි කියලා. නමුත් ඊට පෙර ඉදිරිපත් කර තිබෙන්නේ. පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා රුපියල් කෝටි 1,060ක් ඉල්ලනවා. මේක 24 වන පරිපූරක ඇස්තමේන්තුවයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොන කාරණයට අදාළවද ඔබතුමා කථා කරන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පාර්ලිමේන්තුවේ සම්පූර්ණ මුදල් පාලනය තිබෙන්නේ අපි යටතේයි. ලබන අවුරුද්දට අය වැයක් ඉදිරිපත් කරන්න බැහැයි කියලා රුපියල් කෝටි 1,060කට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා. කොහොමද, මේ මුදල් ප්‍රමාණය ලබා ගන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතුවලට එන කොට ඒක අහන්න. දැන් තිබෙන්නේ ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

I

## රාජ්‍ය සේවක වැටුප් මත බදු පැනවීම
### அரச ஊழியர்களின் வேதனத்தில் வரி விதிப்பு
### IMPOSITION OF TAXES ON PUBLIC SERVANTS' SALARIES

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ, ගරු රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍යතුමාගෙන් මා මෙම ප්‍රශ්නය අසනවා.

ලක්ෂ සංඛ්‍යාත රාජ්‍ය සේවකයන්ගේ ආර්ථිකය කෙරෙහි විෂම අන්දමින් බලපෑ හැකි කරුණක් සභාව අභිමුඛයේ තැබීමට ඔබතුමාගේ අවසරය පතමි.

ගරු කථානායකතුමනි, පසු ගිය අය වැයෙන් යෝජනා කර ඇති පරිදි රාජ්‍ය සේවකයන්ගේ බදු ගෙවීමේ වගකීම පිළිබඳව විධිවිධාන සලසා ඇති අතර, ඒ අනුව වාර්ෂිකව වැටුප් හා දීමනාවලින් (රජයේ සේවකයන් ලබන) ආදායම රුපියල් 3,00,000.00 ඉක්මවන රජයේ සේවකයන්ගේ වැටුපෙන් බදු ගෙවිය යුතු බව සඳහන් වේ.

මෙහිදී රජයේ සේවකයන් ලබන දීමනා වශයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සලකන්නේ, මුදලින් ලැබෙන ප්‍රතිලාභ යම් වේතන, වැටුප්, ප්‍රසාද මුදල්, කොමිස් මුදල්, නිවාඩු වැටුප්, අතිකාල ගෙවීම්, ගාස්තු, පාරිතෝෂික, අමතර ලැබීම්, දීමනා හෝ සේවයේ නියුක්ත වීමේදී ලැබෙන වෙනත් ගෙවීමක් හෝ විශ්‍රාම වැටුපක්; විශ්‍රාම ගැනීමට පෙර අනුමත අර්ථසාධක අරමුදලෙන් ලබා ගත් මුදල්; යම් සංග්‍රහ දීමනාවක් හෝ ගමන් වියදම් දීමනාවක් හෝ වෙනත් යම් දීමනාවක්; නීත්‍යානුකූල හෝ නොවූ තෑගි මුදලක් හෝ වාහනයක් මිල දී ගැනීම සඳහා දෙන යම් දීමනාවක්; මුදලින් නොවන ප්‍රතිලාභ; නොමිලේ ලබන වෛද්‍ය පහසුකම්, ඉන්ධන, විදුලිය යනාදියෙහි වටිනාකම සහ නොමිලේ ලැබෙන ප්‍රවාහන පහසුකම් සහ පවුලේ අයට ලබා දෙන නිවාඩු ගමන් බලපත්‍රවල වටිනාකම.

රජයේ සේවා නියුක්තිකයන් මත ආදායම් බද්ද යනු රාජ්‍ය ආයතනයක හෝ වෙනත් ආයතනයක සේවා නියුක්තිකයන් සේවා නියුක්ති ආදායම ද ඇතුළුව මුළු ව්‍යවස්ථාපිත ආදායම මත බද්දට යටත් වන අතර, සාමාන්‍ය නීති යටතේ බදු අනුපාතය සිදු කෙරේ.

සේවා යෝජකයාගෙන් බදු අඩු කිරීමක් සිදු නොකරන අතර, සේවා නියුක්තිකයා විසින් ස්වයං තක්සේරු පදනම මත බදු ගෙවිය යුතු වේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2007.07.19 දිනැති චක්‍රලේඛය අනුව නිශ්චිත වශයෙන් සඳහන් කර ඇත්තේ "මෙම බද්ද පනවනු ලබන්නේ 'රාජ්‍ය ආයතන' මත වන අතර, එබැවින් සේවකයන්ගෙන් වැටුප් දීමනාදියෙන් බදු අය කිරීමක් නොකළ යුතුය" යන්නය. එසේ වුවත් 2007 අංක 10 දරන සහ 2008 අංක 9 දරන සහ අනතුරුව 2009 අංක 19 දරන දේශීය ආදායම් බදු (සංශෝධන) පනත් තුළින් පඩිනඩි ලබන රජයේ සේවකයන් හට ලබා දී තිබූ මෙම සහනය 2008 මාර්තු 31 දින දක්වා පමණක් වලංගු විය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය සේවකයන් තුළ තවමත් තමන් විසින් ගෙවිය යුතු බදු මුදලේ සැබෑ ස්වරූපය පිළිබඳව මහත් ව්‍යාකූලතාවක් සහ අවිනිශ්චිතභාවයක් ඇති වූ අතර එම බද්ද ගෙවීමේ වගකීම රඳා පවතින්නේ කවරෙකු මත ද යන්න පිළිබඳව ප්‍රශ්නයක් මතු විය.

2009.09.10 "Daily Mirror" පුවත් පතේ "Financial Times" අතිරේකයට රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මහතා සඳහන් කර ඇත්තේ ජනතාවගෙන් වැඩිපුර බදු මුදල් අය නොකරන බවයි. මෙවර අය වැයෙන් රජයේ සේවකයන් බොහෝ දෙනෙකුගේ බලාපොරොත්තුව වන්නේ වැඩි වී ඇති අධික ජීවන බරින් තරමකින් හෝ නිදහස් කිරීම සඳහා රජය විසින් වැටුප් වැඩි කිරීමක් සිදු කරනු ඇති බවයි. ඒ බව පසු ගිය මැතිවරණ කාලයේ රජය මඟින් ප්‍රකාශ කළ අතර, ඒ අනුව රජයේ සේවකයන් බහුතරයක් ඔවුන්ගේ ඡන්දය රජයට පක්ෂව ලබා දී තිබේ. ඒ අනුව දැන් රජයේ පාර්ශ්වයට කෘතගුණ සැලකීමේ වාරය එළඹ ඇත. රජය මඟින් වැටුප් වැඩි කළ යුතු අවස්ථාවක මාසිකව රුපියල් 25,000ක වැටුප් හා දීමනා ලබන රජයේ සේවකයන්ගෙන් බදු මුදල් අය කර ගැනීමට කටයුතු කිරීම ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ වැඩකි.

එබැවින් රාජ්‍ය සේවකයන්ගේ මෙම බදු ගෙවීමේ වගකීම පිළිබඳව පවතින සැබෑ තත්ත්වය කුමක්ද යන්නත්, මෙම බද්ද ගෙවීමේ වගකීම වලංගු වන්නේ කවර දිනක සිටද යන්නත්, එහි වගකීම ඇත්තේ කවරකු මතද යන්නත්, එය රජය මඟින් ගෙවනවාද, එසේ නැතහොත් රජයේ සේවකයන්ගේ වැටුපෙන් එම බදු මුදල් අඩු කිරීමට කටයුතු කළ යුතුද යන්නත්, ඒ අතරම මෙවර ඉදිරිපත් කරන අතුරු සම්මත ගිණුම මඟින් හෝ රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට පියවර ගන්නේද යන්නත්, ඒ කොපමණ ප්‍රමාණයකින්ද යන්නත් මෙම සභාවට දන්වන්නේ නම් ස්තුතිවන්ත වෙමි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய - அரச இறைவரி, நிதி அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Revenue and Finance and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ගරු ජෝශප් මයිකල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

රුපියල් 25,000කට වැඩි වැටුපක් ලබන රජයේ සේවකයන්ගේ වැටුප් සහ දීමනාවලින් 2008.03.31 දිනෙන් පසුව ආදායම් බදු අය කර ගැනීමට කටයුතු යොදා ඇතැයි පැවසීම සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයකි. නැතහොත් 2009 අංක 19 දරන දේශීය ආදායම් (සංශෝධන) බදු පනතේ සඳහන් විධිවිධාන නිසි පරිදි අවබෝධ කර නොගෙන කරනු ලබන ප්‍රකාශයකි.

කෙසේ වෙතත් රජයේ සේවකයන්ගේ වැටුප් මත බදු අය කර ගැනීම සඳහා දැනට පවතින නීති තත්ත්වය සහ 2008.03.31 දින දක්වා පැවැති විධිවිධාන පිළිබඳව පැහැදිලි කිරීමට අපේක්ෂා කරමි.

යම් රජයේ සේවකයෙක් ලබන වැටුප් සහ අනෙකුත් දීමනාවලින් සියයට 50ක් ආදායම් බද්දට යටත් සේ සලකා බද්දට බැඳෙන වෙනත් ආදායම් එකතු කොට බදු නිදහස් දීමනාව වන රුපියල් 3,00,000 අඩු කිරීමෙන් පසුව ඉතිරි ආදායම මත අදාළ බදු අනු ප්‍රමාණයන් අනුව ආදායම් බද්ද ගණනය කරන ලදී. එසේ ගණනය කරනු ලැබූ ආදායම් බද්දෙන් සේවා ආදායමට අනුකූල වන බද්ද භාණ්ඩාගාරය විසින් ගෙවීමටත්, වෙනත් ආදායම් මත අදාළ වන බද්ද සේවකයාගෙන් අය කර ගැනීමටත් සිදු විය.

මෙම ක්‍රමය තුළින් සිදු වූයේ රජයේ සේවකයන්ගේ වැටුප් මත ගෙවිය යුතු බද්ද භාණ්ඩාගාරය විසින් ගෙවීමකි. රජයේ සේවකයන්ගේ වැටුපට ලබා දී තිබූ ආදායම් බදු සහනය එලෙසම පවත්වා ගනිමින් රජයේ සේවකයකුට හිමි වෙනත් ආදායම් මත අය විය යුතු බද්ද ඔහුගෙන් අය කර ගැනීම සඳහා 2008.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දේශීය ආදායම් පනතට සංශෝධන ඉදිරිපත් කරන ලදී.

මේ අනුව රජයේ සේවකයකුගේ වැටුප ආදායම් බද්දට යටත් සේ සලකා බද්දට යටත් ඔහුගේ වෙනත් ආදායම්වලට වැටුප එකතු කොට රුපියල් 3,00,000 බදු නිදහස් දීමනාව අඩු කිරීමෙන් පසු අදාළ බදු අනුප්‍රමාණ අනුව මුළු බද්ද ගණනය කෙරේ. ඉන් පසුව මුළු බද්දෙන් සේවකයාගේ වැටුපට අදාළ වන බදු කොටස සඳහා බදු බරක් ලබා දීම මගින් සේවකයාගේ වැටුප මත අදාළ ආදායම් බද්ද නිදහස් කොට ඇත. ඒ අනුව රජයේ සේවකයන්ගේ වැටුප් සහ දීමනාවන් මත ආදායම් බද්දක් පැන නොනඟින අතර රජයේ සේවකයා ලබන්නා වූ වෙනත් ආදායම් සහ සාමාන්‍ය රජයේ සේවකයකුට හිමි නොවන දිරි දීමනා, ත්‍යාග මුදල්, දඩ මුදල් මත පැන නඟින ආදායම මත ආදායම් බද්ද සේවකයාගෙන් අය කර ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වේ. මේ අනුව යම් රජයේ සේවකයකුට වැටුපට අමතරව වෙනත් ආදායමක් නොමැති නම් සේවකයාගේ වැටුප් මත ගණනය කරනු ලැබූ ආදායම් බද්ද ඔහුට හිමි බදු බැරට සමාන වන නිසා කිසිදු බද්දක් පැන නොනඟී. ඒ නිසා රුපියල් 25,000 ඉක්ම වන රජයේ සේවකයන්ගේ වැටුපෙන් ආදායම් බදු අය කරන්නේ යැයි පැවසීම සත්‍යයක් නොවේ.

මෙහිදී සිදු කරන්නේ රජයේ සේවකයකු වුවද වෙනත් ආදායම් මත ආදායම් බද්ද අය කර ගැනීමේ ක්‍රම වේදයක් හඳුන්වා දීම පමණි. රුපියල් 25,000ට වඩා වැඩි වැටුපක් ලබන රජයේ සේවකයන්ගේ වැටුප් මත ආදායම් බදු පනවා ඇතැයි අසත්‍ය ප්‍රකාශ කරන විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට රජයේ සේවකයින් ගැන කතා කිරීමට සදාචාරාත්මක හිමිකමක් ඇත්දැයි සැලකීම මෙම ගරු සභාවේ යුතුකමක් සේ සලකමි. [බාධා කිරීමක්] අහ ගන්න.

රාජ්‍ය සේවයට නව නිලධාරීන් බඳවා නොගන්නා ලෙස චක්‍රලේඛ මගින් ප්‍රකාශයට පත් කළ රජයක සාමාජිකයන් වශයෙන් රජයේ සේවකයින්ගේ වැටුප් මත ආදායම් බදු පනවා ඇතැයි අසත්‍ය ප්‍රකාශ කිරීම විහිළුවකි. අවස්ථා ගණනාවකදී රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන ලද්දේ මහින්ද රාජපක්ෂ රජය බව නැවතත් මෙම ගරු සභාවට මතක් කර දීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එසේම අපගේ රජය විසින් රාජ්‍ය සේවයේ උන්නතිය උදෙසා ගෙන ඇති පියවර බොහෝය. ඒ අතුරින් රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි කිරීමටත්, සේවක සංඛ්‍යාව පුළුල් කිරීමටත් ගෙන ඇති පියවර කිහිපයක් පමණක් මෙම ගරු සභාවට මතක් කර දීමට ද කැමැත්තෙමි.

රාජ්‍ය සේවයේ ධුරාවලියේ පහළම තනතුර වන කාර්යාල කාර්ය සහායක සේවයේ අවම මාසික වැටුප 2003 වසරේ දී රුපියල් 4,650ක් වූ අතර එය වර්තමානයේ දී රුපියල් 11,730ක් දක්වා වැඩි කරන ලදී. එය සියයට 152ක වැටුප් වැඩි වීමකි. මීට අමතරව 2006 ජනවාරි 01 දින සිට අර්ධ රාජ්‍ය සේවය ද ඇතුළුව සියලුම රාජ්‍ය සේවකයන් සඳහා මාසික ජීවන වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු යෙදූ අතර එය 2009 ජනවාරි 01 දින සිට රුපියල් 4,500ක් ලෙස වැඩි කරන ලදී.

පසු ගිය රජය යටතේ කළමනාකරණ චක්‍රලේඛ අංක 16 අනුව රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සම්පූර්ණයෙන්ම පාහේ සීමා කරන ලද අතර, එතෙක් පැවැති සියලුම පුරප්පාඩු අහෝසි කිරීමට කටයුතු කරන ලදී. මේ නිසා රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය තනතුරුවලට පවා බඳවා ගැනීම් සීමා වීමෙන් රාජ්‍ය සේවයේ බොහෝ කටයුතුවලට බාධා පැමිණුණි. මෙම තත්ත්වය අවබෝධ කර ගත් වර්තමාන රජය ක්‍රමානුකූලව රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අදහසින් සෑම ක්ෂේත්‍රයකම බඳවා ගැනීම් සිදු කරන ලදී. ඒ අනුව 2004 වර්ෂයේ දී සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල හැරුණු විට සමස්ත රාජ්‍ය සේවයේ 8,42,255ක් වූ කාර්ය මණ්ඩලය 2009 වසරේ මැද භාගය වන විට ලක්ෂ 11ක් දක්වා වැඩි වී ඇත. මෙය 2004 වර්ෂයට සාපේක්ෂව සියයට 27ක වැඩි වීමකි. මීට අමතරව වත්මන් රජය විසින් වාර්ෂිකව ඇති වන පුරප්පාඩු පදනම් කර ගෙන බඳවා ගැනීමේ පටිපාටි අනුගමනය කරමින් රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රමානුකූලව සිදු කර ගෙන යනු ලැබේ.

මෙම රජය විසින් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ කළමනාකරණ ක්‍රමෝපායන්ට අමතරව ඉහත දැක් වූ පරිදි රාජ්‍ය සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කරමින් රාජ්‍ය සේවය ශක්තිමත් කළ අතර, ඊට අමතරව සියලු රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප සහ ජීවන වියදම් දීමනාව ද විශාල වශයෙන් ඉහළ දමන ලදී. ඒ අනුව 2003 වසරේ දී රුපියල් මිලියන 91,800 ක්වූ සමස්ත රාජ්‍ය සේවක වැටුප් බිල 2008 වන විට රුපියල් මිලියන 239,000 දක්වා වැඩි වී ඇත. එය සියයට 160ක වැඩි වීමකි. 2009 වසරේ වැටුප් සඳහා ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 2,80,000කි. මේ අනුව, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සහ වැටුප් ඉහළ දැමීම තුළින් රාජ්‍ය සේවය ශක්තිමත් කිරීමට කටයුතු යොදා ඇති බව පැහැදිලි වේ.

මීට අමතරව 1996.12.31 දිනට ප්‍රථම රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය විශ්‍රාමිකයන්ගේ වැටුප් 1997.01.01 දින පැවැති වැටුප් තලයන්ට ගෙන එමින් එතෙක් පැවැති විශ්‍රාම වැටුප් විෂමතාවන් මඟ හරවා ගැනීමට ද කටයුතු යෙදූ අතර, මේ වන විට රජයේ විශ්‍රාම වැටුප් සඳහා වැය කරන මුදල රුපියල් මිලියන ලක්ෂයකට ආසන්න වී ඇත.

රාජ්‍ය සේවකයන්ගේ ආකර්ෂණීය අයිතිවාසිකම ලෙස සලකනු ලැබූ විශ්‍රාම වැටුප ද තම පාලන කාලය තුළ අහිමි කළ එක්සත් ජාතික පක්ෂය අද රාජ්‍ය සේවකයන් වෙනුවෙන් කථා කිරීම පිළිබඳව මාගේ ස්තුතිය පිරිනමනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් තිබෙන්නේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමක් තිබෙනවා. මට විනාඩියක් දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පැහැදිලි කර ගැනීමක්. ඔව්, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඉක්මනට.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රංජිත් සියඹලාපිටිය ඇමතිතුමාගෙන් මා අහන්න කැමැතියි, එතුමා අර ප්‍රකාශ කරපු අය වැය වෙනුවට ඊ ළඟට ලැබෙන්නේ සියඹලා ටොෆියක්ද කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

II

## රැකියා විරහිත උපාධිධාරීන්
### தொழிலற்ற பட்டதாரிகள்
### UNEMPLOYED GRADUATES

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ගරු කථානායකතුමනි, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා, විවිධ විෂයයන් පිළිබඳව උපාධි ලබා ගැනීමෙන් ද අනතුරුව, තවමත් රැකියා විරහිතව සිටින උපාධිධාරීන්ගේ ගැටලුව පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කිරීමට මා බලාපොරොත්තු වනවා. මේ වන විට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා ගැනීමෙන් අනතුරුව සුදුසු රැකියාවක නිරත වීමේ අවස්ථාව අහිමි වූ උපාධිධාරීන් 25,000ක් පමණ සිටින බව වාර්තා වී තිබෙනවා. වරින් වර මේ ආණ්ඩුව ඔවුන්ට රැකියා දෙන බවට පොරොන්දු වුවත් ඒ කිසිදු පොරොන්දුවක් තවමත් ඉටු වී නැහැ. වත්මන් ජනාධිපතිතුමා 2005 ජනාධිපතිවරණයට ඉදිරිපත් කළ "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 9 වන පිටුවේ රැකියා අවස්ථා ඇති කිරීම පිළිබඳව සඳහන් කර තිබෙනවා. 2006 වසර තුළ දී උපාධිධාරීන් 10,000කට රැකියා ලබා දීමටත්, රාජ්‍ය සේවයේ ඇති පුරප්පාඩු 33,000ක් වහාම පිරවීමටත් එහි පොරොන්දු වී තිබෙනවා. නමුත් ඒ පොරොන්දු කිසිවක් ඉටු වුයේ නැහැ. 2008 අය වැය ලේඛනයෙන් ද උපාධිධාරීන් 15,000කට රැකියා ලබා දීමට යෝජනා කළත් ඒ කිසිවක් ඉටු වී නැහැ. මේ අතර රාජ්‍ය සේවයේ පුරප්පාඩු සම්පූර්ණ නොකර තිබීම හේතුවෙන් රාජ්‍ය සේවය ද අර්බුදයට ගොස් තිබෙනවා. 2008 වසර වන විට රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ආයතනවල පුරප්පාඩු 17,767ක් පවතින බව මුදල් හා රාජ්‍ය ආදායම් අමාත්‍යාංශය ප්‍රකාශ කර තිබුණා. නමුත් ඉන් අනතුරුව ඒවා සම්පූර්ණ කිරීම සඳහා කිසිදු පියවරක් ගත්තේ නැහැ. ආණ්ඩුව යළි යළිත් උද්ඝෝෂණයේ යෙදෙන උපාධිධාරීන්ට විවිධ පොරොන්දු ලබා දෙනවා. නමුත් ඒ පොරොන්දු ඉටු කිරීම සඳහා සැලැස්මක් හෝ වැඩ පිළිවෙළක් ඇති බව පෙනෙන්නට නැහැ. ඒ වෙනුවට සිදු වන්නේ රැකියා ලබා දීම අත් හිටු වන ආකාරයේ විවිධ නියෝග වරින් වර නිකුත් කිරීම පමණයි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම යාපනයේ උපාධිධාරීන් 2,100කට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන්ට පෞද්ගලික අංශයේ රැකියා ලබා ගැනීම සඳහා කිසිදු ඉඩ ප්‍රස්තාවක් නැහැ. ඔවුන්ට රැකියා ලබා දිය යුත්තේ රාජ්‍ය ක්‍රියාවලියකදීම පමණයි. ඒ මන්ද? ඔවුන් විශේෂයෙන්ම පසු ගිය කාලයේ බෙදුම්වාදී ව්‍යාපාරයන්ගේ හිංසනයන්ට සහ පීඩනයන්ට ලක් වූ දෙමළ තරුණයන් වීමයි. ඔවුන් විශාල දුෂ්කරතා මධ්‍යයේ තමයි උපාධි ලබා ගනු ලැබුවේ. නමුත් 2,100කට ආසන්න සංඛ්‍යාවක් යාපනයේ දිස්ත්‍රික්කයේ පමණක් රැකියා නැතුව -රැකියා විරහිතව- අද සිටිනවා. ඒ ප්‍රදේශ තුළ පෞද්ගලික අංශයේ ප්‍රසාරණයක් නැති වීම හේතු කොට ගෙන ඔවුන් රැකියා ලබා ගැනීමේ විශාල දුෂ්කරතාවකට මුහුණ දී සිටිනවා. ඒ නිසා ඔවුන්ට රැකියා ලබා දිය යුත්තේ රජය විසින් පමණක්මයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම රැකියා අත් හිටු වීම සඳහා විවිධ නියෝග නිකුත් කරමින් තිබෙනවා. නිදසුනක් මා කියන්නම්. 2009 මාර්තු 04 වන දා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය පළාතේ ලේකම්වරුන්ට ලිපියක් යවා තිබෙනවා. එම ලිපියේ සඳහන් වන්නේ රජය මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් අලුත් රැකියා ලබා දීම නතර කිරීමට සිදු වන බවයි. ඒ අනුව පළාත් සභාවල මාණ්ඩලික මට්ටමේ නොවන සියලු ශ්‍රේණිවලට ස්ථිර, තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත වන බඳවා ගැනීම් හා පුරප්පාඩු පිරවීම් නැවත දන්වන තුරු අත් හිටුවා තිබේ. එබැවින් අලුත් රැකියා ලබා දෙන බවට දී ඇති පොරොන්දු ඉටු නොවන බව පෙනී යයි. මෙම තරුණ පිරිස අප රටේ සීමිත උසස් අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමට සමත් වූ රටේ බුද්ධිමය ශ්‍රම සම්පත බව මේ ගරු සභාව පිළිගන්නවා ඇතැයි මම විශ්වාස කරමි.

අප රටේ උසස් අධ්‍යාපන අවස්ථා හිමි වන්නේ පාසල්වලට ඇතුළු වන ශිෂ්‍යයන්ගෙන් සියයට හතරකටත් අඩු සිසුන් ප්‍රමාණයකට ය. එබැවින් එම සුළුතරය පවා ආර්ථිකයට උරා ගත නොහැකි බරපතළ ප්‍රශ්නයක් දැන් ඇති වී තිබේ. මෙම ප්‍රශ්නය උපාධිධාරීන්ගේ ජීවිත අර්බුදයට යවා ඇත. ඔවුන් මේ වන විට වයස්ගත වෙමින් සිටින අතර ඇතැමුන්ට විවාහ වීමට ද, තවත් අයට දරුවන් පෝෂණය කිරීම ඇතුළු ජීවිතයේ වෙනත් ඉලක්ක කරා යාමට ද රැකියාවක් නොමැති වීම බරපතළ බාධාවක් බවට පත් වී තිබේ. එබැවින් මෙම ප්‍රශ්නයට වහාම විසඳුම් සෙවිය යුතු බව පැහැදිලිය. මේ වන විටත් ඒ සම්බන්ධයෙන් ආණ්ඩුව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මුදල් හා රාජ්‍ය ආදායම් ඇමතිතුමා ගරු සභාව දැනුවත් කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

ගරු කථානායකතුමනි, මේ වන විටත් දේශීය වෛද්‍ය ආයතනයේ දේශීය වෛද්‍ය උපාධිය ලබා ගත් සිසුන් විශාල සංඛ්‍යාවක් අද උපවාසයක නිරත වී සිටිනවා, ඔවුන්ට ඔවුන්ගේ අධ්‍යාපනයට සරිලන රැකියාවක් ලබා දෙන්නය කියා ඉල්ලමින්. ඒ වාගේම මේ වන විටත් කොටුව දුම්රිය පොළ ඉදිරිපිට ඒකාබද්ධ රැකියා විරහිත උපාධිධාරී සංගමය සංවිධානය කරන ලද විශාල උද්ඝෝෂණයක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එයට විවිධ පොලිස් අධිකරණ නියෝග හරහා බලපෑම් කරනවා හැරුණු කොට එම දුවා දරුවන්ගේ සැබෑ ප්‍රශ්නයට විසඳුම් සෙවීම සඳහා රජය කිසිදු ක්‍රියාමාර්ගයක් අර ගෙන නැහැ. තැන තැන රටේ උද්ඝෝෂණ ගණනාවක් මතු වෙමින් තිබෙනවා. පසු ගිය දා උපාධිධාරීන් මඩකලපුවේ ඔරලෝසු කණුව යට වාඩි වී උපවාසයක නිරත වුණා. නැඟෙනහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා ඇවිත් ඔවුන්ට මෙම මාසයේ රැකියා ලබා දෙන බව පොරොන්දු වී තිබුණා. නමුත් එවැනි කිසිදු රැකියාවක් ලබා දීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් නැති බව දැන් පෙනෙනවා. ඒ වාගේම තමයි පසු ගිය දිනවල දුම්රිය පොළ ඉදිරිපිට සෞන්දර්ය උපාධිධාරීන් උද්ඝෝෂණයක නිරත වුණා. එයට රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍යතුමාත්, ඒ වාගේම විවිධ දේශපාලනඥයනුත් මැදිහත් වෙලා ඔවුන්ට පොරොන්දුවක් ලබා දී තිබෙනවා, ජනවාරියේ රැකියා ලබා දෙන බවට. මා දැන ගන්න කැමැතියි එම රැකියා ලබා දීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද කියා. ඒ වාගේම විශේෂයෙන්ම පහත ප්‍රශ්නවලට මම ආණ්ඩුව පාර්ශ්වයෙන් පිළිතුරු බලාපොරොත්තු වෙමි.

1. දැනට රාජ්‍ය සේවයේ කොපමණ පුරප්පාඩු සංඛ්‍යාවක් තිබේද?
2. එම පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම ඇතුළුව ගෙන ඇති පියවර කවරේද?
3. සෞන්දර්ය උපාධිධාරින්ට 2010 ජනවාරි මාසය වන විට රැකියා ලබා දීමට ආණ්ඩුව පොරොන්දු වී ඇති අතර ඒ වෙනුවෙන් දැනට දියත් කර ඇති ක්‍රියාමාර්ගය හා එහි ප්‍රගතිය කවරේද?
4. මේ වසරේ ඔක්තෝබර් මස 01 වන දින වන විට උතුරු හා නැඟෙනහිර පළාත්වල උපාධිධාරින්ගේ රැකියා ප්‍රශ්නය සඳහා විසඳුමක් ඉදිරිපත් කරන බවට ආණ්ඩුව පොරොන්දු වූ අතර එම විසඳුම් සකස් කර තිබේද?
5. ශ්‍රී ලංකාවේ සමස්ත රැකියා විරහිත උපාධිධාරින්ට රැකියා ලබා දීම පිළිබඳව ආණ්ඩුවේ ඇති සැලසුම කවරේද?
6. කවර දිනට පෙර රැකියා ලබා දීමට ආණ්ඩුව අපේක්ෂා කරන්නේද?
7. ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට දැනට ගෙන ඇති පියවර කවරේද? අය වැය ලේඛනයක් ඉදිරිපත් නොකරන්නේ මෙම රැකියා ලබා දීම සඳහා නිශ්චිත සැලැස්මක් නැති නිසාද?

උක්ත ප්‍රශ්න පිළිබඳව ආණ්ඩුව වෙනුවෙන් ගරු මුදල් හා රාජ්‍ය ආදායම් අමාත්‍යතුමා මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි අපේක්ෂා කරමි. රටේ උගත් තරුණ පරපුර විරැකියාවට ගොදුරු වීම නිසා උද්ගත වී ඇති බරපතළ සමාජ ප්‍රශ්නය දෙස මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි. ස්තුතියි ගරු කථානායකතුමනි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඊයේ මා වෙත ලැබෙන්න සැලැස්වූ ප්‍රකාශය සහ අද එතුමා ඉදිරිපත් කළ ප්‍රකාශය අතර විශාල වෙනස්කම් රාශියක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගොඩක් තිබෙනවාද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔව්. ඇයි එහෙම වන්නේ? එතුමාට පස්සේ මතක් වෙච්ච ඒවාත් මේකට එකතු කරලා අහනවා නම් ඒක වැරදියි ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මට සහතික වෙලා තිබෙනවා. පක්ෂ නායක රැස්වීමේදී තීරණයක් අර ගෙන තිබෙනවා එයින් පිට යන්නේ නැහැ කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මා ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරනවා. එතුමා ඊයේ ඉදිරිපත් කරපු ලිපියට නැවත රට මතක් වන ඒවා දැම්මාම අපට උත්තර දෙන්න අපහසුයි ගරු කථානායකතුමනි. එතකොට අපේ අසමත්භාවයයි ප්‍රකාශ වන්නේ. ඒ නිසා මම ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරනවා. මින් ඉදිරියට එහෙම කරන්න එපා කියනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙටියෙන් ඉදිරිපත් කරන්න ඇමතිතුමා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. වාර්තාගත තොරතුරුවලට අනුව රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල මාණ්ඩලික, ද්විතීය හා ප්‍රාථමික ශ්‍රේණිවල පුරප්පාඩු 25,000ක් පමණ පවතිනවා. අදාළ බඳවා ගැනීම් පටිපාටිය අනුව ඒ ඒ පත්වීම් බලධාරීන් විසින් එම පුරප්පාඩුවලට නිලධාරීන් බඳවා ගැනීමට නිති පතා පියවර ගන්නා බවත්, රාජ්‍ය සේවයේ පුරප්පාඩුවලට බඳවා ගැනීම් කිසිවක් අත් හිටුවා නොමැති බවත්, රැකියා නොදෙන බවට චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවට කරන ප්‍රකාශයන් අසත්‍යයක් බවත් මා ප්‍රකාශ කරනවා. පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන තොරතුරු අය වැය ඇස්තමේන්තු සම්පාදනය කරන අවස්ථාවේදී කැඳවා සාකච්ඡාවට භාජන කරනවා. ඒ අනුව පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කරන වැටුප් හා දීමනා ඇතුළු අනිකුත් වියදම් ඇස්තමේන්තුගත කර ජාතික අය වැය දෙපාර්තමේන්තුව යටතේ භාණ්ඩාගාර විවිධ තැන්පත් ගිණුමේ වෙන් කර තිබෙනවා. ඒ යටතේ ඒ ඒ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කළ විට එම සංඛ්‍යාවන්ට අදාළව මුදල් ප්‍රතිපාදන අදාළ ආයතන වෙත විවිධ තැන්පත් ගිණුමෙන් මුදා හැරීම සිදු කරනවා.

සෞන්දර්ය ගුරුවරුන් බඳවා ගැනීම සඳහා නිශ්චිතව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවන් සහ පුරප්පාඩු පවතින පාසල් හඳුනා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය මේ දිනවල කටයුතු කර ගෙන යනවා. මේ පාසල් අතර පළාත් සභා පාසල් බොහොමයක් වන නිසා ඉක්මනින් තොරතුරු එකතු කර ගැනීම මඳක් දුෂ්කරව පැවතුණා. කෙසේ වෙතත් එම කටයුතු අවසන් වූ පසු සෞන්දර්ය ගුරු පුරප්පාඩු 3,174ක් පමණ සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග අප්‍රමාදව ගැනීමට අපේක්ෂා කරනවා. එමෙන්ම එම බඳවා ගැනීමට අදාළ කැබිනට් පත්‍රිකාව මෙම සතියේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කිරීමට සූදානම් බව දැන ගැනීමට ඇත.

උතුරු නැඟෙනහිර පළාත්වල උපාධිධාරින්ගේ රැකියා ප්‍රශ්නය පමණක් නොවෙයි, මුළු රටේම රැකියා ප්‍රශ්නය විසඳීමට රජයට වුවමනාව තිබෙනවා. එයට කැප වී කටයුතු කරනවා. 2004 වර්ෂයේ සිට මේ දක්වා පමණක් විශාල සංඛ්‍යාවකට, එනම් උපාධිධාරීන් 57,764කට අවම වශයෙන් රාජ්‍ය අංශයේ රැකියා ලබා දී තිබෙනවා. මීට අමතරව උපාධිය සුදුසුකම හැටියට සලකන ශ්‍රී ලංකා පරිපාලන සේවය, ගණකාධිකාරි සේවය, සැලසුම් සේවය, තක්සේරු නිලධාරීන්, බඳු නිලධාරීන් වැනි තනතුරු රාශියකට ද උපාධිධාරීන් බඳවා ගෙන තිබෙනවා. විරැකියා අනුපාතය 2005 වර්ෂයේ සියයට 7.7 සිට 2008 වර්ෂයේ සියයට 5.2 දක්වා පහත වැටීමෙන් පෙනෙන්නේ අනිකුත් අංශවලින්ද විශාල රැකියා ප්‍රමාණයක් ලැබී ඇති බවයි. රටේ සමස්ත රැකියා ප්‍රශ්නය විසඳීමට රාජ්‍ය අංශයට පමණක් හැකියාවක් නොමැති බව පිළිගත යුතුයි.

වසර 30ක් පැවති යුද්ධය නිමා කර උදා කර ගත් සාමකාමී වාතාවරණය තුළ පෞද්ගලික අංශයේ ආයෝජකයින්ද ඉතා ශක්තිමත්ව නැගී සිටිනවා. ලංකාවේ කොටස් වෙළෙඳ පොළ ලෝකයේ හොඳම කොටස් වෙළෙඳ පොළ බවට පත්ව තිබෙනවා. විදේශ ආයෝජන පෙර නොවූ විරූ ඉහළ අගයකට පැමිණ තිබෙනවා. මහින්ද චින්තන ජාතික ප්‍රතිපත්තිය යටතේ කෘෂිකාර්මික අංශ ශීඝ්‍ර වර්ධනයක් පෙන්වනවා. මේ සියලුම අංශ ඒකාබද්ධ කර ගනිමින් රටේ ආර්ථිකය ශක්තිමත්භාවයට පත් කරමින් සමස්ත රැකියා ප්‍රශ්නයට තිරසාර දිගු කාලීන විසඳුමක් ලබා දීමට අප රජය සැලසුම් කරනවා. රාජ්‍ය අංශයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය අය වැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී ඒ ඒ අමාත්‍යාංශ විසින් ජාතික අය වැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. ඒ අනුව අවශ්‍යතා හඳුනා

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

ගැනීමෙන් පසු ජාතික අය වැය දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාර විවිධ තැන්පත් යටතේ ඇතුළත් කර පුරප්පාඩු සම්පූර්ණ කරන අවස්ථාවේදී අවශ්‍යතාව අනුව ඒ අමාත්‍යාංශයට, දෙපාර්තමේන්තුවට මුදා හැරීම පිළිගත් ප්‍රතිපත්තිය බව ප්‍රකාශ කරන්න කැමැතියි. දැනටමත් උපාධිධාරීන් සඳහා ඇති ඇබෑර්තු පිළිබඳව විශේෂ සමීක්ෂණයක් සිදු කරමින් පවතින අතර, ඒ අනුව 2010 වර්ෂයේදී එම ඇබෑර්තු පිරවීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කිරීමට බලාපොරොත්තු වනවා. ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වන්නි මැතිවරණ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්. කනගරත්නම් මහතා පිළිබඳ නිවාඩු යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මහතා.

# නොපැමිණීමේ අවසරය : ගරු එස්. කනගරත්නම් මහතා
## வராதிருக்க அனுமதி : மாண்புமிகு எஸ். கனகரத்தினம்
## LEAVE OF ABSENCE : HON. S. KANAGARATNAM

**ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මහතා**
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
கௌரவ சபாநாயகர் அவர்களே,

" வன்னி தேர்தல் மாவட்ட பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு எஸ். கனகரத்தினம் அவர்களுக்கு இலங்கை ஜனநாயக சோசலிஷக் குடியரசின் அரசியலமைப்புச் சட்டத்தின் 66(ஊ) ஆம் உறுப்புரையின் பிரகாரம் 2009 ஒக்ரோபர் மாதம் 21ஆந் திகதியிலிருந்து மூன்று மாத காலங்கள் பாராளுமன்ற அமர்வுகளுக்குச் சமுகமளிக்காதிருப்பதற்கு அனுமதி வழங்கப் படுமாக"

என நான் பிரேரிக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# වරප්‍රසාද : පොලීසිවලින් පැමිණිලි භාර නොගැනීම
## சிறப்புரிமை : பொலிஸாரால் முறைப்பாடுகள் ஏற்றுக்கொள்ளப்படாமை
## PRIVILEGE : NON-ACCEPTANCE OF COMPLAINTS BY POLICE

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 24(6) යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන මාගේ වරප්‍රසාද උල්ලංඝනය වීම සම්බන්ධයෙන් වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීම සඳහා ඔබතුමාගේ අවසරය ලබා දීම පිළිබඳව මම ස්තුති කරනවා.

ගරු කථානායකතුමනි, පසු ගිය දකුණු පළාත් සභා මැතිවරණ කාල වකවානුවේදී මගේ සහෝදර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කීප දෙනකු සමඟ එක්සත් ජාතික පක්ෂයේ සහ එම පක්ෂයේ අපේක්ෂකයින් කීප දෙනකුගේ මැතිවරණ කටයුතුවලට අපි විටින් විට සම්බන්ධ වුණා. විශේෂයෙන් මාතර දිස්ත්‍රික්කයේ සහ දෙනියාය ආසනයේ ඒ කටයුතුවල අපි නියැලී සිටියා. අපි මෙලෙස මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල නියැලෙමින් සිටියදී තුසිත රණවක නමැත්තෙක් අප ගමන් කරමින් සිටි මාර්ගය අවහිර කරමින් එය ඔහුගේ පෞද්ගලික ඉඩමකට පිවිසීම සඳහා තනා ඇති මාර්ගයක් බව පවසමින් අපගේ ගමනට බාධා ඇති කරන ලදී. තවදුරටත් තර්ජනය කරමින් එතුමා පවසා සිටියේ, "මේ මාර්ගය ගැන පාර්ලිමේන්තුවේ කථා කරලා තිබෙනවා, ආයිත් නම් මේක ගැන කථා කරන්න ඉඩ තියන්නේ නැහැ" කියලායි. එසේ තර්ජනය කරමින් එතුමා අපට බාධා කළා. එහෙත් ඇත්ත වශයෙන්ම එම මාර්ගය මග නැඟුම අරමුදලින් ඉදි කරන ලද අවට ගම්මානවල පදිංචි ගම්වාසීන් විසින් ප්‍රයෝජනයට ගනු ලබන පිවිසුම් මාර්ගයකි. අනතුරුව එම ස්ථානයට රැස්ව සිටි රජයේ අමාත්‍යවරයකු ඇතුළු දේශපාලනඥයින් කීප දෙනෙක් සහ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් මාගේ සහෝදර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, මා හට සහ අපගේ ආධාරකරුවන්ට පහර දෙමින් අප ගමන් කළ වාහනවලට ද තදබල අලාභ හානි සිදු කළා. අප මේ පිළිබඳව දෙනියාය -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකරලා පාර්ලිමේන්තුවේ ඒ ගැන කථා කළ දිනය කියන්න. හැන්සාඩ් වාර්තාවේ දිනය කියන්න.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ගරු කථානායකතුමනි, 2009 සැප්තැම්බර් 08 වන දින පාර්ලිමේන්තුවේදී මේ ගැන විවාද වුණා.

ඉන් අනතුරුව ගරු කථානායකතුමනි, අපි දෙනියාය පොලීසියට මේ පිළිබඳව පැමිණිලි කරන්න ගියා. නමුත් එතැන සුදුසු වාතාවරණයක් තිබුණේ නැහැ. එදින අතිගරු ජනාධිපතිතුමාගේ රැස්වීම මාතර පවත්වන බැවින් විශාල පිරිසක් දෙනියාය පොලීසිය අවට රැස් වෙලා සටන් පාඨ කියමින් සිටියා. අපි ඊ ළඟට මාතරට ගියා ගරු කථානායකතුමනි. නමුත් මාතර පොලීසියට ළං වෙන්නවත් බැහැ. ඒ අවට පෙළපාළි යමින් සිටියා, ජනාධිපතිතුමාගේ රැස්වීමට යන ආධාරකරුවන්. ඉන් අනතුරුව -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ කඩ වුණු වරප්‍රසාදය මොකක්ද?

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ඒක තමයි කියා ගෙන එන්න හැදුවේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක මේ ඡන්ද කරන්න ගිහින් වෙච්ච වැඩක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කැඩුණු වරප්‍රසාදය?

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ගාල්ලේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට ගියා පැමිණිල්ල කරන්න. එතැනදී කිව්වා, එදාත් පසු දිනත් ඒ කාර්යාලයට මේ වාගේ දේවල් භාර ගන්න පසු බිමක් නැහැ. මොකද, අතිගරු ජනාධිපති - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පාර්ලිමේන්තුවේදී කරන ලද කථාවකදී අනාවරණය කෙරුණු කරුණක් සම්බන්ධයෙන් කියලා මේක දක්වලා තිබෙන්නේ.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ඉතින් ගරු කථානායකතුමනි, අපි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට ගියා. එතැන එදිනත්, ඊට පසු දිනත් ඒකට වාතාවරණයක් නැහැ කියලා අපිට පැවසුවා. ඒ, අතිගරු ජනාධිපතිතුමා ඒ ප්‍රදේශවල සිටින නිසා. අපි ඉන් පසු ගාල්ල පොලීසියට ගියා. ගාල්ල පොලීසියේ නිලධාරියෙක් කිව්වේ, මේක භාර ගැනීමෙන් එතුමාට නීතියෙන් ප්‍රශ්නයක් එනවා. කරුණාකරලා Police Headquartersවලට මේ පැමිණිල්ල කරන්න කියලායි. ඒක කරන්න අපි කොළඹට පැමිණියා. ඒ එන අතරතුරේදී ගරු කථානායකතුමනි, රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමාගේ කාර්යාලය පුච්චලා තිබෙනවා කියලාත් අපට දැන ගන්න ලැබුණා. ඒ වාගේම මගේ කොළඹ නිවසට හානි කරලා කියලාත් දැන ගන්න ලැබුණා. මම මේ පිළිබඳව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මැදිවක මහතාට දුරකථනයෙන් කථා කළා. මම කිව්වා, මම තවම කොළඹ එන ගමන්, කරුණාකරලා මෙතැනට පොලිස් කණ්ඩායමක් යවලා පරීක්ෂණ පවත්වන්න කියලා. එතුමා කිව්වා 119 එකට කථා කරන්නය කියලා. ඊට පස්සේ මම පොලිස්පතිතුමාගේ duty officerට කථා කළා. එතුමා සහකාර පොලිස් අධිකාරිවරයෙක්. මට මතක හැටියට එයාගේ නම විජේරත්න. එතුමාත් මට පැවසුවේ ඒ කථාවමයි.

ගරු කථානායකතුමනි, මේ අතරතුර අදාළ ඉඩමේ අයිතිකරු තමා බව ප්‍රකාශ කර සිටි තුසිත රණවක නමැති අය දෙනියාය පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කරමින්, අප ඔහුගේ ඉඩමට බලහත්කාරයෙන් ඇතුළු වූ බවටත්, ඔහුට මා සහ මාගේ සහෝදර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන තිස්ස අත්තනායක, රවි කරුණානායක, ලක්ෂ්මන් කිරිඇල්ල සහ පාලිත රංගෙ බණ්ඩාර යන අයවළුන් විසින් බලපෑම් කළ බවටත් අසත්‍ය පැමිණිල්ලක් කර තිබෙනවා. එම පැමිණිල්ල අසත්‍යයක් වන අතර පළමුව, බලහත්කාරයෙන් ඇතුළු වීමට හෝ බලපෑම් කිරීමට හෝ අප කණ්ඩායමෙන් එක් අයකු හෝ ප්‍රයත්නයක් නොදැරූ අතර සහ දෙවනුව ඔවුන් විසින් ප්‍රකාශ කර ඇති පරිදි මෙම තුසිත රණවක නැමති අයට එම අදාළ ඉඩම අයත් නොවන අතර ඇත්ත වශයෙන්ම - [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පොඩ්ඩක් ඉන්න.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
එම ඉඩමේ හිමිකාරිත්වය ලබා තිබෙන්නේ විචිත්‍රා ශීලාදරී රාජපක්ෂ මහත්මියත්, සී.පී. චන්ද්‍රදාස මහත්මියත්, එච්.එල්. හෙට්ටිආරච්චි මහතාත් බවත් මා පවසනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මිනිත්තු දෙකක් තුනක් ඉල්ලුවේ. ඔබතුමා දැන් මහ දිග හැල්ලක් කියවන්නේ. මට දීපු කඩදාසියේ ඔය කොටස නැහැ.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
එසේම "බී" වාර්තාවක් ගොනු කිරීමට පෙර පොලීසිය -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එම නිසා වරප්‍රසාද කඩ වීමක් තිබෙනවා නම් ඒක වරප්‍රසාද කමිටුවට භාර දෙන්නම්. [බාධා කිරීම්] හොඳයි. දැන් ප්‍රධාන කටයුතු - [බාධා කිරීම්]

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ගරු කථානායකතුමනි, මට අවස්ථාවක් දෙන්න. වරප්‍රසාද -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් - [බාධා කිරීමක්] එහෙම නම් ඒකත් ඇතුළත් වෙන්න ඉඩ හරින්නම්. [බාධා කිරීම්] එහෙම නම් ඒක ඇතුළත් වෙන්න ඉඩ හරින්නම්. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, එහෙම නම් ඒක ඇතුළත් වෙන්න ඉඩ හරිනවා. [බාධා කිරීම්] හරි, එහෙම නම් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඒකත් මම ඇතුළත් වෙන්න ඉඩ හරින්නම්. මම ඒක හැන්සාඩ් වාර්තාගත කිරීම පිළිබඳව -[බාධා කිරීම්] දැන් හරි. ගරු සාගල රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ මේක වරප්‍රසාද කමිටුවට යොමු කරන්න කියලා නේ. හරි. ඔබතුමා දැන් ඒ සිද්ධිය කිව්වා.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
මේක පාර්ලිමේන්තුව නොමඟ යැවීම ගැන හැන්සාඩ් වාර්තාවෙන් මතු වන කරුණක් ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සාගල රත්නායක මන්ත්‍රීතුමනි, වරප්‍රසාද පිළිබඳව අපට සටහනක් ලියලා දෙනවා. ඒක තමයි පුරුද්ද. තමුන්නාන්සේ මට දීපු සටහනේ නැති කරුණු කියන්න බැහැ. දැන් ඔබතුමා සංක්ෂිප්ත වශයෙන් සඳහන් කරන ලද කාරණය අනුව යම් කිසි ආකාරයක වරප්‍රසාද උල්ලංඝනය වීමක් තිබෙනවා නම් ඒ පිළිබඳ යෝජනාවක් යථා කාලයේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව මම දන්වනවා. [බාධා කිරීම්]

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
හැන්සාඩ් වාර්තාවෙන් මතු වන කරුණක් ගැන මට සඳහන් කරන්න ඉඩ දෙන්න ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක හරි. දැන් ඉඩ දුන්නා ඕනෑ හැටියට. දැන් හරි. [බාධා කිරීම්] පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳව දැනුම් දීම.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එතුමා වැදගත්ම තැනටයි ආවේ. පාර්ලිමේන්තුව නොමඟ යැවීමක් පිළිබඳව කිව්වා. ඔබතුමා අහන්න ඕනෑ, කියන්නේ මොකක්ද කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කථානායකතුමා වශයෙන් අහන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා මාව හම්බ වුණා. ඊයේ හම්බ වුණා. ඒ දුන්න සටහනේ නැති කරුණුයි මේ කථා කරන්නේ. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පාර්ලිමේන්තුව නොමඟ යැවීමේ ප්‍රකාශයක් කරලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද ප්‍රකාශය? [බාධා කිරීම්]

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
මට තව විනාඩියක් දෙන්න ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වෙලාව දුන්නා. දැන් වෙලාව පෙරවරු 11.15යි. දැන් අපට ඊයේ නියම කර ගත්ත වෙනත් රැස්වීමක් තිබෙනවා.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
මට විනාඩියක් දෙන්න ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, විනාඩියෙන් කියන්න. [බාධා කිරීම්] විනාඩියයි.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ගරු කථානායකතුමනි, ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා කියනවා, "අයිතිකාරයාගේ නම ඕනෑ නම් කියන්නම්. ප්‍රශ්නයක් නැහැ. නාතගල වත්තේ අයිතිකරු තුසිත රණවක" කියලා. නමුත් කොටපොල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් උපුටා ගත් ඒ නියමිත පිටුවේ තිබෙනවා, ඒකේ අයිතිකාරයෝ නුගේගොඩ පදිංචි චන්ද්‍රානි ප්‍රීති චන්ද්‍රදාස, විචිත්‍රා ශීලාදරී රාජපක්ෂ සහ හිමාල් ලලින්ද්‍ර හෙට්ටිආරච්චි යන අය කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකෙන් සිදු වන ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීම මොකක්ද?

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
මේකෙන් අපේ ගරු පාර්ලිමේන්තුව සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොමඟ යවා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අසත්‍ය කියලා.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
අසත්‍යයක් කියලා නේ ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අනවශ්‍ය කථා. [බාධා කිරීම්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම් දීම. ගරු පළාත් පාලන සහ පළාත් සභා ඇමතිතුමා.

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு ஜனக பண்டார தென்னக்கோன்)
(The Hon. Janaka Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, ග්‍රාමෝදය මණ්ඩල අරමුදල (සංශෝධන), 1982 අංක 28 දරන - [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පාර්ලිමේන්තුවේ - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කවුද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මා හම්බ වන්න ඕනෑ. එහෙම නේ අපේ සිරිත. තමුන්නාන්සේ කථානායකවරයා වශයෙන් කාලයක් හිටියා නේ. [බාධා කිරීමක්] අපට දන්වනවා නේ. [බාධා කිරීම්] අද සිද්ධ වුණු එකක්ද? [බාධා කිරීම්] දැන් සිද්ධ වුණු එකක් නම් කියන්න. [බාධා කිරීම්] දැන් මා කියලා ඉවරයි. ඔබතුමා මතු කරපු කාරණය හැටියට ගරු ජනක - [බාධා කිරීම්] ඔබතුමා මට මතක් කර දුන්නා, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ නම සඳහන් කළාට පසුව කොහොමද ආපහු තව කෙනෙකුට කියන්නේ කියා. ඒ අනුව මා නම සඳහන් කර තිබෙනවා. [බාධා කිරීම්] මොකක්ද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මා මෙතැන හිට ගෙන සිටිද්දී, රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මා ඒක කියලා තිබුණා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමාත් හිට ගෙන සිටිද්දී - [බාධා කිරීම්] ඔබතුමා වෙන කෙනෙක්ව නම් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ. මම මේක කියා තිබුණා.

ගරු පළාත් පාලන සහ පළාත් සභා ඇමතිතුමා, ග්‍රාමෝදය මණ්ඩල අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත.

# පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

## ග්‍රාමෝදය මණ්ඩල අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත
### கிராமோதய சபை நிதியம் (திருத்தம்) சட்டமூலம்
### GRAMODAYA MANDALA FUND (AMENDMENT) BILL

"1982 අංක 28 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා විසිනි.***
***2009 නොවැම්බර් 03 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***
*உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சர் மாண்புமிகு ஜனக பண்டார தென்னக்கோன் அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*2009 நவம்பர் 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*
*Presented by The Hon. Janaka Bandara Tennakoon, Minister of Local Government and Provincial Councils; to be read a Second time upon Tuesday, 03rd November, 2009 and to be printed.*

# පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

I

## අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### அநுராதபுரம் ஸ்ரீ புஷ்பதான அபிவிருத்தி தர்ம ஸ்தாபனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### ANURADHAPURA SRI PUSHPADANA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා (ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார - தேசத்தைக் கட்டியெழுப்புவதற்கான அமைச்சர்)
(The Hon. A. P. Jagath Pushpakumara - Minister of Nation Building)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමු වන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා වෙත පවරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Religious Affairs for report.*

## බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### பலன புத்தர் சிலை அமைப்புச் சபை (கூட்டிணைத்தல்) சட்டமூலம்
### ORGANIZATION FOR THE CREATION OF BALANA BUDDHA STATUE (INCORPORATION) BILL

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමු වන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා වෙත පවරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Religious Affairs for report.*

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද, රීති ප්‍රශ්නය ගරු රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාගේ අවධානයට යොමු කළා, ඊයේ මගේ කථාව වෙලාවේ -වරප්‍රසාද ප්‍රශ්නය වෙලාවේදී- එය රූපවාහිනී තිරය මත දිස් නොකිරීම සම්බන්ධව. ඒ පිළිබඳව අද ඔබතුමා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ගැන විමසලා මම කිව්වා. මම ඒ ගැන විමසුවා. [බාධා කිරීමක්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔව්, ගරු කථානායකතුමනි,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මා ඒ ගැන විමසුවා. මා විමසා බැලුවා. අපේ සම්ප්‍රදාය, සභාවේ යම් කිසි ආන්දෝලනකාරී තත්ත්වයක් ඇති වනවා නම්, කලබලකාරී තත්ත්වයක් තිබෙනවා නම් කැමරාව කථානායකවරයාට, එහෙම නැත්නම් කලබලයක් නැති ස්ථානයකට යොමු කිරීම.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හොඳයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක තමයි සම්ප්‍රදාය. [බාධා කිරීමක්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, මෙතැනදී කලබලකාරී තත්ත්වයක් ඇති වුණේ නැහැ. [බාධා කිරීමක්] ඇහුම් කන් දෙන්න. මමත්, ගරු කථානායකතුමාත් බොහොම පැහැදිලිව, බොහොම සුහදව කථා කළා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ. නැහැ. කථානායකතුමා පැහැදිලිව ගරු මන්ත්‍රීතුමාට නියම කර තිබුණා, ඒ පෝස්ටරය ඉවත් කර ගන්න කියා. මේ නිලධාරි මහත්වරුන්ගේ තත්ත්වය ගැන කල්පනා කරන්න. අපේ සම්ප්‍රදාය තමයි - පාර්ලිමේන්තුවේ නිලධාරින් කටයුතු කිරීමේදී සම්ප්‍රදාය තමයි- යම් කිසි විධියක එබඳු කැලඹිලිකාරී තත්ත්වයක් තිබෙනවා නම් ඒ අවස්ථාවේදී කැමරාව කථානායකතුමාට හෝ එබඳු තත්ත්වයක් නැති තැනකට යොමු කිරීම.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හොඳයි, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක තමයි පිළිවෙළ. ඒක එදා ඉඳලා එන සම්ප්‍රදායක්. මා මේ ගැන හොයලා බැලුවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, ඔබතුමායි මමයි කථා කරද්දී ඉතාමත්ම පැහැදිලිව ඔබතුමාත් එකඟ වුණා, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මා නිලධාරින්ගෙන් විමසා බලා මේ කියන්නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
කරුණාකර, මට ඇහුම් කන් දෙනවාද ගරු කථානායකතුමනි? [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතැන කඩ වෙලා නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමායි මමයි එකඟ වුණා, මගේ කථාව අවස්ථාවේදී ඒ බැනර් එක ප්‍රදර්ශනය කරන්න. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ. මම හොයලා බැලුවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
එහෙම තියෙද්දි ඒක වැළැක්වීමට නියෝගයක් දීලා තිබුණා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා මොන ස්ථාවර නියෝගය යටතේද ඔය ප්‍රශ්නය මතු කරන්නේ?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මීට ප්‍රථම මේ සභාවේ ධීවර ජැකට් ගෙනාපු අවස්ථාවේ ප්‍රදර්ශනයට ලක් කළා. අනෙක් එක කිසිම කලබලයක් තිබුණේ නැහැ, ගරු කථානායකතුමනි. කිසිම කලබලයක් තිබුණේ නැහැ, මම කථා කරන අවස්ථාවේ. ඒ වාගේම ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, ධීවර ආම්පන්න ගෙනල්ලා මේ ගරු සභාවේදී ප්‍රදර්ශනය කළා. ඒ සියල්ල පෙන්වූවා. එතකොට මේක විතරක් වැළැක්වීමට පියවර ගත්තේ ඇයි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ගැන මා හොයලා බැලුවා. ඔබතුමා ඊයේ වැරදි චෝදනාවක් කළා, වැඩ බලන මහ ලේකම්තුමාට මා නියෝග කළා කියා. මා එහෙම දෙයක් කළේ නැති බව කිව්වා. ඒ වාගේම වැඩ බලන මහ ලේකම්තුමාත් ඒ බව පැහැදිලිව ප්‍රකාශ කළා. ඒකයි හැබෑ තත්ත්වය. මම ඊට පසුව නිලධාරීන්ගෙන් විමසා බැලුවා, මේක සිදු වුණු ආකාරය කොහොමද කියන එක. ඔවුන් කිව්වා, අපි මෙතෙක් ගෙන ගිය සම්ප්‍රදාය තමයි මේ විධියට සභාවේ ප්‍රශ්නකාරී තත්ත්වයක් තිබෙනවා නම් ඒ ප්‍රශ්නගත කටයුත්ත පිළිබඳ පැත්තට කැමරා ඇස යොමු කරන්නේ නැත කියා. ඒ තත්ත්වයයි ගෙන ගිහින් තිබෙන්නේ. [බාධා කිරීමක්] ආයේ මොනවාද කථා කරන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කථා කර කර ඉන්න එකයි තිබෙන්නේ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම විමසා බැලුවා. [බාධා කිරීම්] මා විශේෂ නියෝගයක් කළේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. එහෙම කළා නම් මා කියනවා. එය කියන්න මට ශක්තිය තිබෙනවා. ඒ ගැන ඔබතුමා සැකයක් ඇති කර ගන්න එපා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාගෙන් අහන්නේ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඔබතුමාට මෙතැන හරස් ප්‍රශ්න අහන්න බැහැ. [බාධා කිරීම්] නැහැ. මොන ස්ථාවර නියෝගය යටතේද? [බාධා කිරීම්] මොන ස්ථාවර නියෝගය යටතේද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ස්ථාවර නියෝග 25.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කියවන්න. [බාධා කිරීම්] ස්ථාවර නියෝග 25 කියවන්න. [බාධා කිරීම්] නැහැ. ඒකට අයිති නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 25ට අයිති නැහැ. එතැන රීති ප්‍රශ්නයක් නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට කෙළින්ම සම්බන්ධයි. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක1 සිට 4 දක්වා සම්මත කිරීම.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හැංගෙන්න දෙයක් නැහැ. මොන ස්ථාවර නියෝග යටතේද? [බාධා කිරීම්] කියවන්න. - [බාධා කිරීම්]

## පරිපූරක මුදල : ලුනාව පරිසර ප්‍රවර්ධන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය
## குறைநிரப்புத் தொகை : லுனாவ சுற்றாடல் மேம்பாட்டு, சமூக அபிவிருத்திச் செயற்றிட்டம்
## SUPPLIMENTARY SUPPLY : LUNAWA ENVIRONMENT IMPROVEMENT AND COMMUNITY DEVELOPMENT PROJECT

[පූ. භා. 11.25]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நகர அபிவிருத்தி, புனித பகுதிகள் அபிவிருத்தி அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena-Minister of Urban Development and Sacred Area Development and Chief Government Whip)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක්දහස් හත්සිය පහළොවකට (රු. 1,715,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ශීර්ෂය | 123 - | නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය |
| වැඩසටහන | 02 - | සංවර්ධන කාර්යයන් |
| | ප්‍රාග්ධන වියදම් රු. | 1,715,000,000 |
| | රු. | 1,715,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)"

ගරු කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ 1, 2, 3 හා 4 යන පරිපූරක ඇස්තමේන්තු මා ඉදිරිපත් කරනවා. අදාළ ඇමතිතුමන්ලා මේ පිළිබඳව වෙන වෙනම විස්තරාත්මකව කරුණු ඉදිරිපත් කරමින් කථා කරනවා ඇති. [බාධා කිරීම්]

ගරු කථානායකතුමනි, නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ලුනාව ව්‍යාපෘතිය සඳහා පරිපූරක ඇස්තමේන්තුව මේ අවස්ථාවේදී ඉදිරිපත් කරමින් මා සඳහන් කරන්නට කැමැතියි, - [බාධා කිරීම්] ලුනාව කළපුවේ ජලපෝෂිත ප්‍රදේශයක් වශයෙන් හඳුනා ගෙන ඇති දෙහිවල - ගල්කිස්ස සහ මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ වර්ග කිලෝමීටර 07කට ආසන්න ප්‍රදේශයක පිහිටි ඇළ මාර්ග අවහිර වීම නිසාවෙන් සහ ලුනාව කළපුවේ මෝය කට නිසි අයුරින් පවත්වා ගෙන යාමට නොහැකි වීම නිසා බොහෝ කාලයක සිට සුළු වර්ෂාවකදී පවා මෙම ප්‍රදේශය ජල ගැලීම්වලට භාජනය විය. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතැන වරප්‍රසාද කථාවක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අධික ජන ඝනත්වයක් ඇති නාගරික ප්‍රදේශයක් වූ ලුනාව කළපුවේ ජලපෝෂක ප්‍රදේශයෙන් ඇළ මාර්ගවලට සහ කළපුවට බැහැර කරන ලද අපද්‍රව්‍ය සනීපාරක්ෂක ක්‍රම මත පාරිසරික තත්ත්වයන්ට ගැළපෙන පරිදි බැහැර නොවීම හේතුවෙන් සහ විශේෂයෙන්ම කාර්මික ස්ථානවලින් අක්‍රමවත් ලෙස බැහැර කරන ලද අපද්‍රව්‍ය නිසා මෙම ප්‍රදේශයේ සියලුම ජලාශවල තත්ත්වය පාරිසරික වශයෙන් ඉතාමත් අහිතකර තත්ත්වයකට වැටී තිබුණි. [බාධා කිරීම්]

ලුනාව කළපුව පාරිසරික වශයෙන් මළ කළපුවක් - biologically dead lagoon- වශයෙන් සඳහන්ව තිබුණි. ජල ගැලීම, ජල ගැලීමෙන් සිදු වන හානි සමඟ, ඒ වාගේම අපද්‍රව්‍ය මේ ජල ගැලීම සමඟ සිදු වීම ලෙඩ රෝග හා පාරිසරික බලපෑම්වලට මුළු ප්‍රදේශයේ ජනතාව එකල පත් විය. මේ නිසාම නිරන්තරව සිදු වන ජල ගැලීම් නිසා මෙම ප්‍රදේශයේ ජනතාවට ජල ගැලීමෙන් සිදු වන හානියත් සමඟම පාරිසරික වශයෙන් අහිතකර ලෙස බැහැර කරන ලද අපද්‍රව්‍ය මෙම ජල ගැලීම් සමඟ මිශ්‍ර වී තිබීම මඟින් ජල ගැලීමකින් සිදු වන බලපෑමට වඩා ඉතාමත් අහිතකර තත්ත්වයේ ලෙඩ රෝග සහ වෙනත් පාරිසරික බලපෑම්වලටද මුළු ප්‍රදේශයේම ජනතාව ලක් විය. මෙම නිරන්තර ජල ගැලීම්වලින් රත්මලාන, මොරටුව ප්‍රදේශයේ පවුල් 18,000ක් පමණ මේ තත්ත්වයට ගොදුරු වීමෙන් මුදා ගැනීමට මහ කොළඹ ගං වතුර පාලන ව්‍යාපෘති යටතේ 04 වන පියවර වශයෙන් මේ ව්‍යාපෘතිය ආරම්භ වුණා. ගරු කථානායකතුමනි, - [ඝෝෂා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකර නිශ්ශබ්ද වන්න. [ඝෝෂා කිරීම්] කරුණාකර නිශ්ශබ්ද වන්න. [ඝෝෂා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ අනුව සමස්ත ව්‍යාපෘතියේ වටිනාකම යෙන් මිලියන - [ඝෝෂා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, මඳක් නිශ්ශබ්ද වන්න. දැන් ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා නැඟී සිටියේ ඊයේ සිද්ධියක් පිළිබඳව කාරණයක් මගෙන් මතු කරන්නයි. ඒ ප්‍රශ්නය, එතුමා එක එල්ලේම මගෙන් විමසා සිටියා, මම නියෝගයක් කරලා තිබුණාද කියලා වැඩ බලන මහ ලේකම්තුමාට ඒ කැමරා ඇස එතැනින් ඉවත් කරන්න, එතුමාගේ පැත්තෙන්. ඊයේ මම ඉතා පැහැදිලිව කිව්වා, එහෙම එකක් වෙලා නැහැයි කියලා. ඊට පසුව ඊයේ හැන්දෑවේ මා නැවතත් මේ සිද්ධිය පිළිබඳව පරීක්ෂා කරලා බැලුවා, මෙය සිදු වුණේ කොහොමද කියන එක. එතකොට මට දැන ගන්න ලැබුණා, සාමාන්‍යයෙන් ප්‍රශ්නකාරී තත්ත්වයන්වලට එන කොට ඒ කැමරා ඇස යොමු වෙන්නේ එක්කෝ කථානායකතුමා දෙසට, එහෙම නැත්නම් කලබලකාරී තත්ත්වයක් නැති පැත්තකටයි කියන එක. නිලධාරින්ට දීලා තිබෙන උපදෙස් අනුව දීර්ඝ කාලයක් තිස්සේම කටයුතු කෙරෙන්නේ එහෙමයි. ඒක සම්ප්‍රදාය. ඒ අනුවයි සිදු වුණේ. ඒක ඔබතුමාගේ දැන ගැනීම පිණිස මා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා. [බාධා කිරීම්] එතැන තිබෙන වරප්‍රසාද ප්‍රශ්නය මොකක්ද? [බාධා කිරීම්] මොකක්ද, වරප්‍රසාද ප්‍රශ්නය? [බාධා කිරීම්] හොඳයි, එහෙම නම් වැරදියි කියලා ඔබතුමා ප්‍රකාශ කරන්න. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ නිලධාරින්වත් ගෙන්වා- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හා, වෙන වැඩ නැහැ. [බාධා කිරීම්] මම කියන වචනය ඔබතුමා භාර ගන්නේ නැද්ද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
භාර ගන්නේ නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ආ! එහෙනම් කමක් නැහැ. එහෙනම් ඉන් එහාට ඒක ගැන කතා කරන්නේ නැහැ. [බාධා කිරීම්] එහෙම කතා කරන්න බැහැ. [බාධා කිරීම්] ඔබතුමා එහෙම අහන්නේ නැත්නම් වැඩක් නැහැ.

ඔබතුමා බලහත්කාරකමෙන් කටයුතු කරන්න බලාපොරොත්තු වෙන්න එපා. ඉතාම වැරදියි. හිටපු කථානායකවරයෙක් වශයෙන් ඔබතුමාට මගේ ගෞරවයක් තිබෙනවා. ඔබතුමා එහෙම කටයුතු කරන්න එපා. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මූලාසනයට ගරු කරන්න. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වෙන්න. පක්ෂ නායක රැස්වීමක් කැඳ වනවා. ඒ රැස්වීමේදී අවශ්‍ය නම් නිලධාරින් ගෙන්වා ඔබතුමාට ඒ පැහැදිලි කිරීම් කර- [බාධා කිරීම්] ඒ වෙලාවේදී අපි බලන්නම්. ගරු ප්‍රධාන සංවිධායකතුමා. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ අනුව සමස්ත ව්‍යාපෘතියේ වටිනාකම යෙන් මිලියන 10,287 යි. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම දුන්නේ නැහැ, උපදෙසක්. උපදෙසක් දුන්නා නම් මට ශක්තිය තිබෙනවා ඒවා පිළිගන්න. [බාධා කිරීම්] ඔබතුමා බරපතළ වැරදි චෝදනාවක් එල්ල කළා මට.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමාට චෝදනාවක් එල්ල කළා නොවෙයි. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. නැත්නම්- [බාධා කිරීම්] බොහොම ස්තුතියි, "නැහැ" කිව්වාට. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මෙම ප්‍රදේශයේ අයහපත් පාරිසරික තත්ත්වයන්ගේ බලපෑමට සෘජුවම ලක් වුණු පවුල් 18,000 ක් පමණ මුදා ගැනීමට ලුනාව සංවර්ධන ව්‍යාපෘතියට හැකි වෙලා තිබෙනවා. මිනිසුන්ට ජීවත් වීමට බැරි තරමට විනාශයට පත් වී තිබූ මුළු ලුනාව ජල පෝෂක ප්‍රදේශයම අද ඉතා සුන්දර පරිසරයකට පරිවර්තනය වෙලා තිබෙනවා.

මගේ අමාත්‍යාංශය විසින් දියත් කරන ලද මෙම දැවැන්ත සංවර්ධන වැඩසටහන තුළින් ජන ජීවිතය යහපත් තත්ත්වයට පරිවර්තනය වී තිබෙනවා. මීටර් 6,722ක් වූ ප්‍රධාන ඇළ මාර්ගය ද, මීටර් 7,420ක් වූ ද්විතීය ඇළ මාර්ග ද, මීටර් 49,884ක් වූ තෘතීය ඇළ මාර්ග සහ දෙපස කාණු ද සංවර්ධනය කිරීම මඟින් පාරිසරික වශයෙන් - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා] මූලාසනාරූඪ විය.*
*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு இரா. சந்திரசேகர்] தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. RAMALINGAM CHANDRASEKAR] *took the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අනුව මළ කළපුවක් බවට පත්ව තිබූ ලුනාව කළපුව ක්‍රමවත්ව ප්‍රතිසංස්කරණය කිරීම මඟින් හා කළපුව වටා ප්‍රවේශ මාර්ගයක් ඉදි කිරීම මඟින් ද මුළු ලුනාව කළපු ජල පෝෂක ප්‍රදේශයටම ක්‍රමවත් ජලාපවහන පද්ධතියක් ස්ථාපනය කර තිබෙනවා. රත්මලාන, මොරටුව මහ නගර සභා සීමාවන් තුළ කිලෝමීටර් 16.25ක් පමණ අබලන් වූ ප්‍රවේශ මාර්ගයන් අද සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කර තිබෙනවා. ඒ වාගේම ලුනාව කළපුව හා ප්‍රධාන ඇළ මාර්ග ආශ්‍රිතව ප්‍රධාන පාලම් 6ක් රත්මලාන ප්‍රදේශයේ හා මොරටුව ප්‍රදේශයේ ඉදි කර ජනතා අයිතියට පවරා තිබෙනවා. ලුනාව ජල පෝෂක ප්‍රදේශයේ අඩු ආදායම් නිවාසවල ජීවත් වුණු ජනතාව මුහුණ දුන්න අනවසර පදිංචි ප්‍රශ්නයට, ජනාවාසවල ජීවත් වන ජනතාවගේ ජන ජීවිතය ක්‍රමානුකූල කර ගැනීමට පානීය ජලය, අභ්‍යන්තර මාර්ග, විදුලිය, අප ජල බැහැර කිරීමේ පද්ධති, මළ නාලිකා පද්ධති, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වැනි ව්‍යාපෘති ඇති කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තම ඉඩමට නීත්‍යානුකූල හිමිකමක් නොලැබී තිබුණු ජනාවාසවල පදිංචි ජනතාවට නීත්‍යානුකූල ඔප්පුවක් ලබා දීමට කටයුතු කර තිබෙනවා. මෙවැනි පරිවර්තනයකට මෙම මුළුමහත් ප්‍රදේශයේ ජන ජීවිතය ගෙන එන්නට හැකි වුණු ව්‍යාපෘතියකටයි අපි අද මේ පරිපූරකයෙන් මුදල් ඉල්ලා සිටින්නේ. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා බැංකුව -JBIC ආයතනය- මඟින් ලබා දෙන ආධාර හා ශ්‍රී ලංකා රජය මඟින් ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන මඟින්ද මේ ව්‍යාපෘතිය කර ගෙන යැමට අපි බලාපොරොත්තු වෙනවා. මේ වන විට මේ බලපෑමට ලක් වුණු පවුල් 863කට ප්‍රතිෂ්ඨාපන දීමනා වශයෙන් රුපියල් මිලියන 353ක් රජයේ අරමුදල්වලින් ගෙවා තිබෙනවා. අදාළ හිමිකම් ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක් වූ කුටුම්බයේ සියලු දෙනාටම එම අයිතිය ලබා දී ඇති අතර ස්වාමියා, භාර්යාව අයිතිකරුවන් වශයෙන් සැලකිල්ලට ගෙන නැවත පදිංචි වීම සඳහා සියලු යටිතල පහසුකම් සහිත ඉඩම් කැබැල්ලක නීත්‍යානුකූල අයිතියද මේ අයට ලබා දීමේ අලුත්ම ප්‍රවේශයක් මෙම ව්‍යාපෘතියට එක් කොට තිබෙනවා. මේ යටතේ මේ වන විටත් බහුවිධ මධ්‍යස්ථාන අටක්, ළමා උද්‍යාන පහක්, මාතෘ නිවාස, පුස්තකාල ගොඩනැඟිලි ප්‍රජා අයිතියට පත් කර තිබෙනවා. ප්‍රදේශයේ පාසල් 14ක් ආවරණය වන පරිදි පාසල් සනීපාරක්ෂක වැඩසටහන්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක වනවා. ප්‍රදේශයේ දරුවන් අධ්‍යාපනය ලබන පාසල් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම්, ළමා උද්‍යාන, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් සහ වැසි ජලය රැස් කිරීමේ ටැංකි ලබා දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ පාසල් යන දරුවන් දහස් ගණනක් සිටින මේ ප්‍රදේශවල එම දරුවන්ගේ මූලික අවශ්‍යතාවක් වූ පානීය ජලය සහ වැසිකිළි පහසුකම් නොමැති පාසල්වලට ඒ සියලු පහසුකම් සම්පූර්ණ කර දීමට මේ ව්‍යාපෘතිය මඟින් හැකි වී තිබෙන බව. එය අප ලබපු ජයග්‍රහණයක්. මොරටුව වේල්ස් විද්‍යාලය වැනි ලංකාවේ පැරණිතම විද්‍යාලයක ද මේ තත්ත්වයන් නිවැරදි කිරීමට

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

-වැසි ජල රැස් කිරීමේ කටයුත්තේ සිට- අපේ ව්‍යාපෘතිය සහාය වී තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ළමා සමාජ ඇති කිරීම තුළින් තමන්ගේ පරිසරයට ආදරය කිරීමටත්, පරිසරය ආරක්ෂා කිරීමටත් දරුවන් යොමු කර තිබෙනවා. ලෝක ළමා දිනය වැනි දිනයන්වල එම දරුවන් සමඟ කටයුතු කිරීමට අපට හැකි වුණා. මොරටුව, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශවල මෙම වැඩසටහන් සඳහා ජනතා සහභාගිත්වය වැඩි කර තිබෙනවා. කොම්පෝස්ට් බැරල් බෙදා දී තිබෙනවා. මෙම ව්‍යාපෘතිය තුළ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ එම ක්‍රියාමාර්ගවලට ඒ ප්‍රදේශයේ පවුල් 7,000කට අධික සංඛ්‍යාවක් සක්‍රියව හවුල් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ වුණත් මොරටුව, දෙහිවල, රත්මලාන වැනි ප්‍රදේශවල හරියාකාර සනීපාරක්ෂක පහසුකම් නැති ගෙවල් දොරවල් දහස් ගණනක් පවතින බව අප කවුරුත් දන්නා කාරණයක්. මේ ව්‍යාපෘතියට එය වෙනස් කිරීමට හැකි වුණා. එම ජනතාවගෙන් පවුල් 1,555කට අධික ප්‍රමාණයකට සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් සැපයීම ව්‍යාපෘතිය මඟින් ආරම්භ කොට දැනට ක්‍රියාත්මක කිරීමෙන් එම ජනතාවගේ සනීපාරක්ෂක තත්ත්වය වෙනස් කර ඵලදායී තත්ත්වයකට ගෙන එන්න හැකියාව ලැබී තිබෙනවා.

ලුනාව සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ඇති කරන පාරිසරික ජනාවාස මඟින් මිනිස් සමාජයේ මූලික අයිතිවාසිකම් සැපයීමටත්, එම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුවටත් දායකත්වයක් සැපයෙනවා. ලුනාව ප්‍රදේශය සම්බන්ධිත මේ මහ නගර සභා ප්‍රදේශවල ඒ ක්‍රියාකාරිත්වයට ද අපේ දායකත්වය ලබා දී තිබෙනවා. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා බැංකුවේ හා ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ආධාර ඇතිව මොරටුව, දෙහිවල-ගල්කිස්ස යන මහ නගර සභා බල ප්‍රදේශවල ක්‍රියාත්මක කරන මෙම පරිසර සංවර්ධන ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු හා නඩත්තු කළමනාකරණ කටයුතු සඳහා මෙම මහ නගර සභා දෙකට ප්‍රමාණවත් යන්ත්‍රෝපකරණ හා තාක්ෂණික සේවාවන් සපයා තිබෙනවා.

ඉතාම දියුණු තාක්ෂණික ක්‍රම මඟින් ජල බැස්ම අධ්‍යයනය කිරීම හා පාලනය කිරීම කළ හැකි ආකාරයට මේ ව්‍යාපෘතිය මූලාරම්භයක් ඇති කර තිබෙනවා. මේ තුළින් ඒ ප්‍රදේශයේ ජල ගැල්ම පාලනය වනවා පමණක් නොව, අපේ රටේ හැදෙන වැඩෙන පරම්පරාවට, ප්‍රජාවට මේ නව තාක්ෂණය ප්‍රයෝජනයට ගත හැකි වීම අප ලද ජයග්‍රහණයක් බව මේ අවස්ථාවේදී මා සඳහන් කරන්නට ඕනෑ. වසර 2010 අප්‍රියෙල් මාසය වන විට ණය ගිවිසුමට අදාළව අනුමත වී ඇති ඉදිරි සංවර්ධන කටයුතු සියල්ල ඒ ආකාරයෙන්ම සපුරා ගැනීමට මගේ අමාත්‍යාංශය විසින් සියලු කටයුතු සූදානම් කර ඇති බව මා ඉතා ගෞරවයෙන් මේ සභාවට දන්වන්නට කැමැතියි. මෙම ව්‍යාපෘතිය පාරිසරික හානිවලට ලක් වූ ජල පෝෂක ප්‍රදේශයන්හි පරිසර කළමනාකරණය කිරීම සඳහා වූ වෙනත් පරිසර වැඩසටහන්වලට ද මාර්ගෝපදේශකත්වය සලසන නියමු ව්‍යාපෘතියක් හැටියට හඳුන්වා දෙන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,මේ ප්‍රදේශයේ ජීවත් වන දරුවන්ගේ, තරුණයන්ගේ සහ වැඩිහිටියන්ගේ සුවිශේෂ ආයතනික සංවර්ධනයට ද මේ ව්‍යාපෘතිය උපකාර වනවා. UN-HABITAT වැඩසටහන යටතේ ප්‍රකාශයට පත් කර තිබෙන ප්‍රකාශනයේ මෙය විශේෂයෙන් පිළිගත් ව්‍යාපෘතියක් ලෙස හැඳින්වීම ශ්‍රී ලංකාවාසී ජනතාවටත්, අප රටටත් ජයග්‍රහණයක්. මහින්ද චින්තන වැඩසටහන යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් නිරන්තරයෙන් අපට ලබා දී ඇති මඟ පෙන්වීම නිසා මේ ව්‍යාපෘතිය මෙවැනි ජාත්‍යන්තර පිළිගැනීමකට ලක් වී තිබෙනවා. මේ ව්‍යාපෘතියට සම්බන්ධ නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශයට, මෙම විශේෂ ව්‍යාපෘතියේ ප්‍රධානත්වය දරන ලේකම්තුමාට සහ මෙම ව්‍යාපෘතිය භාර අධ්‍යක්ෂකවරුන්ට, ප්‍රජා සමිතිවලට, නගර සභාවලට මේ අවස්ථාවේදී ස්තුති කිරීම මගේ යුතුකමක් ලෙස මා සලකනවා. UN-HABITAT විසින් ශ්‍රී ලංකාවේ ලුනාව ව්‍යාපෘතිය පිළිගැනීමට ලක් කළ අදහස් ස්වල්පයක් මා මෙහිදී ඉදිරිපත් කරන්නට කැමැතියි.

Sir, the UN-HABITAT journal states, I quote:

"Innovative Approaches for Involuntary Resettlement
Lunawa Environmental Improvement & Community Development Project

In Sri Lanka today, as in many other developing countries, there is a growing urgency to come up with creative and sustainable solutions to tackle the twin pressures of infrastructure needs and the interests of communities who are affected by such projects, often losing their homes, land and livelihood in the process. Rapid industrialization has catapulted Colombo into an economic hub, however this has also severely damaged the environment where one of the worst victims of industrial wastewater pollution is the Lunawa Lake. The lake straddles two adjoining Municipal Councils: Dehiwala-Mt. Lavinia and Moratuwa. Continued discharge of waste water into its waters over the years wreacked havoc, killing most of the fish and the catchment area suffers from frequent flooding, due to an inadequate drainage system.

Today, the Lunawa Lake catchment area is the site of an innovative initiative called the Lunawa Environmental Improvement and Community Development Project. The project, getting off the ground in 2001, is the first project that translated Sri Lanka's National Involuntary Resettlement Policy into practice. This landmark policy, adopted in 2001, paved the way for the Lunawa model which validates the twin objectives of environmental improvement and community revitalization."

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමා, දැන් අවසන් කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මෙහි ඉතිරි කොටසත් කියවලා මම අවසන් කරන්නම්.

"The strategic partnership of three key institutions - the Government of Sri Lanka, the Japan Bank for International Cooperation (JBIC) and UN-HABITAT with the common aim of treating the involuntary resettlement as a development opportunity gave the project a categorical success. UN-HABITAT was the lead adviser on the community development component of the project. The use of an NGO to socially market a package of interventions to communities who were going to be affected in order to break down the distrust they harboured towards Government agencies was too a pioneering initiative by the project."

Then, I would like to quote Benthotha Silinona, a mother of five.

"I lived in an unauthorized structure along the canal. Though I paid municipal taxes, the land was not mine. After settling in Hike Terrace, I have now a piece of paper certifying ownership of the plot on which my new home stands and soon I will have the land deed. I liked my old house. But nothing can beat the pride I feel in living in a legally authorized colony."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මීට වඩා වේලාව ගන්නේ නැහැ. ජන ජීවිතයේ දුක්ඛිත භාගයන් සතුටු භාගයකට ගෙන එන්නට පුළුවන් ඉතා සාර්ථක ව්‍යාපෘතියක් බවට අපි මෙම ව්‍යාපෘතිය පත් කර තිබෙනවා. මේ ව්‍යාපෘතිය නිසා ඉදිරියේදී දෙහිවල, ගල්කිස්ස සහ මොරටුව යන ප්‍රදේශවල ජන ජීවිතයේ විශාල පරිවර්තනයක් සිදු වනවා. ඒ වාගේම මෙතෙක් මළ ජල

පෝෂිතයක් හැටියට සැලකු ලුනාව අද ජීවමාන ජල ප්‍රදේශයක් බවට පත් කිරීමට හැකියාව ලැබී තිබෙනවා. මේ සඳහා සහාය වුණු සැමට මේ අවස්ථාවේ මාගේ ගෞරවය පුද කරන අතර ලබන වසරේ මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට අවශ්‍ය මෙම පරිපූරක මුදල -දායකත්වය- අනුමත කර දෙන ලෙස ඉල්ලා සිටිමින් මාගේ කථාව අවසන් කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[පූ. භා. 11.45]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන මෙම පරිපූරක ඇස්තමේන්තු අනුමත කිරීමට පෙර, පසු ගිය අය වැයෙන් මෙම අමාත්‍යාංශ සඳහා මුදල් වෙන් කර ඇති ආකාරය අපේ අවධානයට ලක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මා තමුන්නාන්සේට කියන්න කැමැතියි, මේ එක් එක් අමාත්‍යාංශවල මුදල් වියදම් කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම පිළිබඳව සලකා බැලීමේදී විපක්ෂය විධියට අපට බරපතළ කරුණු ගණනාවක් මතු වන බව. මා හිතන්නේ ඒක මුළු රටම දන්නවා. විශේෂයෙන් මා කථා කරන්න බලාපොරොත්තු වන්නේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතේ උද්ගත වෙලා තිබෙන ප්‍රශ්න සම්බන්ධයෙන් සහ ඒ ආශ්‍රයෙන් ඇති වෙලා තිබෙන ගැටලු පිළිබඳවයි. විශේෂයෙන් අපි දන්නවා, මේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය මඟින් ගමින් ගමට මඟ නැඟුම ව්‍යාපෘතිය යටතේ, විවිධ සංකල්ප යටතේ විවිධ කටයුතු සිදු කරමින් යන බව. විශේෂයෙන්ම මේ දිනවල නැඟෙනහිර පළාතේ මඟ නැඟුම ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වනවා. මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කරලා අපි පැහැදිලිව අවබෝධ කර ගත්තා, මඟ නැඟුමෙන් කිලෝමීටරයක් තාර දැමීමට යන මුදලින් සාමාන්‍යයෙන් කිලෝමීටර් හතරක දුර තාර දමන්න පුළුවන්කම තිබෙනවාය කියා. ඇත්ත වශයෙන්ම අපි මාර්ග සංවර්ධනය සඳහා මුදල් සපයා ගන්නේ ණය ලබා ගෙන, එහෙම නැත්නම් ආධාරවලිනුයි. ඒ ණය සඳහා මේ රටේ ජනතාව පොලිය ගෙවන්න ඕනෑ. ඒ ණය ගෙවන්න වන්නේ ජනතාවටයි. ජනතාව මත ණය බර පටවලා, පොලිය ගෙවන්න ලබා ගන්නා මුදල් ඒ සඳහා යොද වන්නේ නැතුව ඒ මුදල් එක එක් කෙනාගේ සාක්කුවලට දමා ගැනීමේ වැඩසටහනක් තමයි ක්‍රියාත්මක වන්නේ. ඒ බව මම පැහැදිලිවම කියන්න ඕනෑ.

දෙහිවල flyover එක-ගුවන් පාලම- විවෘත කිරීම මා අද රූපවාහිනියෙන් දැක්කා. ගුවන් පාලම් සංකල්පය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී අපි දැක්කා, ඉස්සෙල්ලා සැලසුම් කරලා තිබුණේ බ්‍රිතාන්‍ය පවුම් මිලියන 50කින් සාමාන්‍ය පාලම් 222ක් සහ කැලණියේ ගුවන් පාලම හදන්න තමයි කියන එක. නමුත් අලුතින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා සාමාන්‍ය පාලම් 222 පාලම් 54ක් දක්වා අඩු කරලා ගුවන් පාලම් ප්‍රමාණය 7ක් දක්වා වැඩි කළා. අර සාමාන්‍ය පාලම් 222 හදන එක 54 දක්වා අඩු කරලා තමයි ඒක කළේ. මා දන්නේ නැහැ, මේකෙන් කොටස යන්නේ කාටද කියලා. නමුත් අත්‍යවශ්‍ය සාමාන්‍ය පාලම් 222ක් හැදීමේ අවස්ථාව නැති කරලා තමයි මේ ගුවන් පාලම් හදන එක පටන් ගත්තේ.

මේ ගුවන් පාලම් හදන්න කොන්ත්‍රාත්තුව ලබා දී තිබෙන්නේ කාටද කියා අපි බලමු. ගුවන් පාලම් හදන්න, සැකිලි හදන්න ප්‍රධාන වශයෙන් සම්පූර්ණ කොන්ත්‍රාත්තුව ලබා දී තිබෙන්නේ එංගලන්තයේ ඉතාම දූෂිත සමාගමක් වන Mabey and Johnson කියන ආයතනයට සහ ලංකාවේ හවුල්කාර සමාගමකටයි. Mabey and Johnson කියන සමාගම එංගලන්තයේ තිබෙන දූෂිතම සමාගමක් විධියටයි කියා තිබෙන්නේ. ලංකාවේ තිබෙන අල්ලස් කොමිසම වාගේ බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් මුදල් සපයන UK Serious Fraud Office එකෙන් කරන්නේ විදේශ රටවල් සමඟ කෙරෙන ඉදි කිරීමේ කර්මාන්තයේ ගනු දෙනු සම්බන්ධයෙන් යම් දූෂණ වංචා සොයා බලන එකයි. UK Serious Fraud Office එකෙන් Mabey and Johnson සමාගමේ දූෂණ, වංචා සම්බන්ධයෙන් කරුණු ගණනාවක් අනාවරණය කර තිබෙනවා. එවැනි සමාගමකට තමයි අපේ රට මේ ගුවන් පාලම් හදන කොන්ත්‍රාත්තුව දීලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා තමුන්නාන්සේට උදාහරණයක් කියන්නම්. Mabey and Johnson සමාගම 1996 දී ඉතාලි සමාගමක් මඟින් ඉතියෝපියාවේ පාලම් හදන්න ගත්තා. කිසිදු ශක්තියකින් තොර දුර්වල අමු ද්‍රව්‍ය පාවිච්චි කරලා හදපු ඒ පාලම් කඩා වැටුණා. ඒ අවස්ථාවේදී Mabey and Johnson සමාගම පිළිගත්තා ඒ ගොල්ලගේ අඩු පාඩුවක් තිබුණු බව. ඊට අමතරව ඒ සමාගම විසින් ඝානාවේ ඉදි කළ පාලම් සම්බන්ධයෙනුත් ප්‍රශ්න මතු වුණා. Mabey and Johnson සමාගමට ඝානාවේ පාලම් කිහිපයක්ම හදන්න දුන්නා. ඝානාවේ හදපු Priority Bridge 1, Priority Bridge 2 කියන ඒ විශාල පාලම් දෙකම කඩා වැටුණා. Mabey and Johnson කියන්නේ විදේශ රටවල ඉදි කිරීම් කොන්ත්‍රාත් බාර ගන්නා, විදේශ රටවල ඉන්න දේශපාලනඥයන්ට මහා පරිමාණ වශයෙන් අල්ලස් දෙන සමාගමක්. ඒක පැහැදිලිව පෙන්වා දී තිබෙනවා, UK Serious Fraud Office එකෙන්. එංගලන්ත රජයෙන් මුදල් සැපයුවත් ඒක ස්වාධීන ආයතනයක්. ඒ ස්වාධීන ආයතනය මඟින් පැවරූ නඩු 10ක් මඟින් Mabey and Johnson සමාගම ඉදි කිරීම් සම්බන්ධයෙන්, එහෙම නැත්නම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් තමන්ගේ වැරැද්ද පිළිගෙන තිබෙනවා. ඊට අමතරව විදේශ රටවල කළ ඉදි කිරීම්වලදී කරන ලද මෙවැනි දූෂණ හා වංචා සම්බන්ධයෙන් Mabey and Johnson සමාගමට විරුද්ධව පවරා තිබෙන සමහර නඩු මේ වන කොට එංගලන්ත අධිකරණයේ විභාග වෙමින් පවතිනවා. ඒ සමාගම විසින් ඉදි කළ පාලම් කඩා වැටුණත් ඝානාවේ දූෂිත දේශපාලනඥයෝ දිගින් දිගටම ඒ ගොල්ලන්ට ඒ කොන්ත්‍රාත් දුන්නා. ඉතියෝපියාවේත් එහෙමයි. ඉතියෝපියාවේ දේශපාලනඥයන්ට පගා දීලා තිබුණු නිසා තමයි ප්‍රමිතියෙන් තොර පාලම් හදන්න දිගින් දිගටම ඒ ගොල්ලන්ට බලය දීලා තිබුණේ. ඉතින් මම අහන්නේ අපි මේ කතා කරන, විදේශ රටවල දේශපාලනඥයන්ට අල්ලස් දෙන Mabey and Johnson කියන ඒ බ්‍රිතාන්‍ය සමාගමට අපේ රටේ කොන්ත්‍රාත් ලබා දීලා තිබෙන්නේ ඇයි කියන ප්‍රශ්නයයි. ඒ වාගේම ඒකෙන් මා පැහැදිලිව අවබෝධ කර ගත්තේ මේකෙන් වැඩි ගණනක් ගන්න ඕනෑ නම් ගුවන් පාලම් හදන්න ඕනෑය, ගුවන් පාලම් සඳහා මුදල් යොදවන්න ඕනෑය කියා පැහැදිලිව අවබෝධ කර ගෙන තමයි මේවාට මුදල් ලබා දී තිබෙන්නේ කියන කාරණයයි. ඒ වාගේම මේ "Mabey and Johnson" කියන සමාගමේ හිටපු අධ්‍යක්ෂකවරු අට දෙනාගෙන් පස් දෙනෙකුටම දූෂණ චෝදනා මත ඉවත් වීමට සිද්ධ වෙලා තිබෙනවා. මට ඕනෑ වුණේ, මේ Mabey and Johnson සමාගම පිළිබඳ ඉතිහාසය පෙන්වන්නයි. ඒ වාගේ දූෂිත සමාගමකට අපේ රටේ ගුවන් පාලම් හදන්න දීමෙන් බලාපොරොත්තු වන්නේ මොකක්ද? එහෙනම් මට පැහැදිලිවම පෙනෙනවා, මේ සම්බන්ධයෙන් බරපතළ කාරණා තිබෙනවා, ලංකාවේ දේශපාලනඥයනුත් දැන් මේ සෙල්ලම පටන් අරගෙනයි තිබෙන්නේ කියලා. ඝානාවේ දේශපාලනඥයන්ට පවුම් 4,70,000ක් අල්ලස් වශයෙන් ගෙවා තිබෙනවා, Mabey and Johnson සමාගම. මේවා ඔක්කෝම අපි තහවුරු කර ගෙන තිබෙනවා. එහෙනම් අපි කියනවා, අද ලංකාවේ හදමින් තිබෙන සහ හදලා තිබෙන පාලම් පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙනවා කියලා. ඒවායේ කිසිම ප්‍රමිතියක් නැහැ. දැන් නුගේගොඩ හදලා තිබෙන ගුවන් පාලම traffic අඩු කිරීමේ බලාපොරොත්තුවෙන් හදලා තිබුණත්, උදේට ගිහිල්ලා බැලුවොත් එහෙම ගුවන් පාලම උඩ තමයි traffic තිබෙන්නේ. ඇයි මොකද? වාහන ගුවන් පාලම උඩින් ඇවිල්ලා ආපසු පාරට ගන්න කොට පාර පටු නිසා ඔක්කෝම වාහන block වනවා. එතකොට ප්‍රමිතියක් නැතිව තමයි මේ පාලම් ටික නිර්මාණය කරලා තිබෙන්නේ. අද විවෘත කරන ලද දෙහිවල පාලම ගත්තත් එක පැත්තක් මුහුද දෙසටයි දිව යන්නේ. තුන් පැත්තකින් එන පාරවල්වලට මෙහෙම පාලම් හදන සිරිතක් සාමාන්‍ය ප්‍රමිතිය

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

අනුව නැහැ. මේ පිළිබඳව මීට පෙරත් මා මහාමාර්ග අමාත්‍යවරයාගෙන් ප්‍රශ්න කළාම අමාත්‍යවරයා උත්තර දුන්නා. නමුත් ප්‍රවෘත්ති අධ්‍යක්ෂක අනුෂ පැල්පිට මහතා කියනවා, ජනාධිපතිවරයාගේ මැදිහත් වීමෙන් තමයි Mabey and Johnson සමාගමට මේ කොන්ත්‍රාත්තුව ලබා දුන්නේ කියලා. එහෙනම් අපි අහනවා, මේ වාගේ දූෂිත, මේ වාගේ ජාත්‍යන්තර වශයෙන් වංචා කර ඇති සමාගම්වලට අපේ ආණ්ඩුව කොන්ත්‍රාත් දෙන්නේ ඇයි කියලා. අහිංසක මිනිසුන්ගේ බදු මුදල්වලින්, ඒ අහිංසක මිනිසුන්ට ගම සිසාරා පාරවල් හදන්න පුළුවන් කෝටි ගණනක මුදල් ප්‍රමාණයක් මේ වාගේ දූෂිත සමාගම්වලට දීලා නාස්ති කරන්නේ ඇයි කියලා අපි මේ ආණ්ඩුවෙන් අහනවා. මේවා කාගේ මුදල්ද? මේවා අහිංසක ජනතාවගේ මුදල්. ඒ නිසා මේ සම්බන්ධයෙන් ගැටලු තිබෙනවා.

තමුන්නාන්සේලාත් දන්නවා ඇති, පසු ගිය කාලයේ "මග නැඟුම" වැඩසටහන පිළිබඳව අපට විශාල වශයෙන් ප්‍රශ්න තිබුණු බව. දෙනියායේ පෞද්ගලික වත්තකට යන පාරකට කිලෝමීටර් 12ක් දුරට කොන්ක්‍රීට් දමලා, රුපියල් කෝටියක් වියදම් කරලා තිබුණා. ඒ මුදල සම්පූර්ණයෙන් ආණ්ඩුවෙන් වියදම් කරලා තිබුණේ. පෞද්ගලික නිවසකට යන පාරකට තමයි එහෙම කොන්ක්‍රීට් දමලා තිබුණේ. ඊට අමතරව ඒ දෙනියායේ නිවස හදන්න මග නැඟුමේ වාහන ඇතුළු සියලුම දේවල් යොදවා ගෙන තිබුණා. ඉතින් එහෙම නම් අපි කියන්නේ, මේ ආණ්ඩුව මේ වාගේ පරිපූරක ඇස්තමේන්තුවලින් මුදල් වෙන් කළත්, පසු ගිය අය වැයෙන් වෙන් කරපු මුදල් සම්බන්ධයෙන් පැහැදිලි දූෂණ සිදු වෙලා තිබෙනවා කියලායි. මම දකිනවා, පැහැදිලි දූෂණ තිබෙනවා; පැහැදිලි වංචා තිබෙනවා.

සමහර ආයෝජකයන් ආපුවාම, ගණන ඉල්ලනවා. මේ හැම තැනින්ම සියයට 10ක් එනවා. ඊට අමතරව මේ ව්‍යාපෘති සඳහා ලබා ගන්නා ණය මුදල්වලට මහ ජනතාව පොලිය ගෙවන්න ඕනෑ. මේ හැම එකකටම වැය වන්නේ අහිංසක ජනතාවගේ මුදල්. අහිංසක ජනතාව තමයි මේ හැම එකකම අඩියට තියන්න වෙලා තිබෙන්නේ.

බලන්න, අද යුද්ධය ඉවර වෙලා මාස පහක් ගත වෙලා තිබෙනවා. ඒ නිසා යුද්ධයට වැය වුණු මුදල් විශාල ප්‍රමාණයක් ඉතිරි විය යුතුව තිබෙනවා. නමුත් අද ඒ මුදල් ජනතාවට සහන වශයෙන් එන්නේ නැහැ. ජනතාවට තව තවත් බඩු මිල වැඩි කරනවා. හෙට අනිද්දා වන කොට විදුලි බිල වැඩි වනවා. තව මාස හතර පහකින් IMF loan එක අනුව අනිවාර්යයෙන්ම සියයට 150කින් විදුලි බිල වැඩි කරන්න ඕනෑ. ඒක එක කොන්දේසියක්. අනිවාර්යෙන්ම සමෘද්ධි සහනාධාරය කපන්න වනවා. අනිවාර්යෙන්ම පොහොර සහනාධාරය කපන්න වනවා. මා පැහැදිලිව කියනවා. මැතිවරණ පවත්වන්න තිබෙන නිසා ජනතාව මෝඩයා කර ගෙන තමයි මේ ආණ්ඩුව ඇද ඇද ඉන්නේ කියලා. ඒ නිසා තමයි අය වැයක් ඉදිරිපත් කරන්න බැරුව ආණ්ඩුව අද පරිපූරක ඇස්තමේන්තු ගෙනෙන්නේ.

උපාධිධාරීන්ගේ ප්‍රශ්නය විසඳන්නට, ජනතාවට සහන දෙන්න, ජනතාවගේ වැටුප් වැඩි කරන්න, ජනතාව වෙනුවෙන් යමක් කරන්න ආණ්ඩුවට පුළුවන්කම තිබෙනවා නම් පැහැදිලිවම අය වැය ඉදිරිපත් කරන්නත් ආණ්ඩුවට පුළුවන්කම තිබෙනවා. නමුත් ආණ්ඩුව දන්නවා ආණ්ඩුවට මුදල් නැහැ, ආණ්ඩුවට මුදල් සොයා ගැනීමේ හැකියාවක් නැහැ කියලා. ආණ්ඩුව ලොකු අර්බුදයකට ගිහින් තිබෙනවා. ආණ්ඩුවට GSP Plus සහනය නැති වුණොත් එහෙම තවත් ලක්ෂ ගණනක් තරුණ තරුණියන්ට පාරට බහින්න වනවා. ඒ නිසා තමයි අද පරිපූරක ඇස්තමේන්තු ගෙනෙන්න ආණ්ඩුවට සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙනම් මා කියනවා, අද අමාත්‍යාංශ හතරක් යටතේ පරිපූරක ඇස්තමේන්තු ගෙනෙනවා නම්, විශේෂයෙන්ම මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතේ ගෙනෙන පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව අපි අවධානය යොමු කළ යුතුවම තිබෙනවා කියලා. පැහැදිලිව ඕනෑම කෙනෙකුට පෙනෙනවා, ඔප්පු කරලා පෙන්වන්නට පුළුවන්කම තිබෙනවා, මේ මග නැඟුම වැඩසටහනෙන්, ඒ වාගේම ගුවන් පාලම් - flyovers - හැදීමේ දී ආදී මේ හැම එකකදීම දූෂණ වෙලා තිබෙනවා කියලා. එහෙම නම් මේ දූෂණවලට ඉඩ හදන්න, එක් එක් කෙනාගේ සාක්කුවලට යන්න, එක් එක් කෙනාට යටි මඩි ගහ ගන්න මේ රටේ අහිංසක ජනතාවගේ මුදල් වෙන් කරන එක අපරාධයක් කියලා මම මේ අවස්ථාවේදී කියනවා.

ඒ වාගේම මා අවසාන වශයෙන් තවත් කාරණයක් කියන්න කැමැතියි. තමුන්නාන්සේලා දන්නවා "මග නැඟුම" ව්‍යාපෘතියට රුපියල් මිලියන 2,042ක මහජන මුදල් නාස්ති කරලා තිබෙන බව. මෙහෙම නාස්ති කරලා තියෙද්දී ජනාධිපතිවරයාගේ නියෝගය මත ලංකාපුත්‍ර බැංකුවෙන් රුපියල් මිලියන 300ක් මග නැඟුම ආයතනය වෙත ආපසු නිකුත් කරන්න නියෝග කරලා තිබෙනවා. ඉතින් මෙතරම් දූෂණ වෙලා තියෙද්දී, මෙතරම් ගැටලුවලට මුහුණ දීලා තියෙද්දී ඇයි නැවත නැවත මේවාට මුදල් යොමු කරන්නේ? රුපියල් මිලියන 300ක් ණයයි ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට, මග නැඟුම ව්‍යාපෘතිය. එහෙම නම් රුපියල් මිලියන ගණන්වලින්, කෝටි ගණන්වලින් මේවාට විශාල මුදලක් වෙන් කරන්නේ ඇයි? මම පැහැදිලිව කියනවා, මේකෙන් භාගයක්වත් මේ රටේ සංවර්ධනය වෙනුවෙන්, මේ රටේ ජනතාවගේ අවශ්‍යතාව වෙනුවෙන් වෙන් කරන්නේ නැහැ කියා. එහෙම නම් මේ කරන කැත වැඩේ, රටට කරන මේ විනාශය වහාම නවත්වන්න කියා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ. භා. 11.58]

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා (ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார - தேசத்தைக் கட்டியெழுப்புவதற்கான அமைச்சர்)

(The Hon. A. P. Jagath Pushpakumara - Minister of Nation Building)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කරන පරිපූරක ඇස්තමේන්තු අතර ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යාංශය සඳහාත් පරිපූරක ඇස්තමේන්තුවක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. අපේ අමාත්‍යාංශය හරහා විශේෂයෙන්ම විදේශ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක වනවා. ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අප බලාපොරොත්තු වන්නේ ඒ සඳහා රජය පැත්තෙන් ඉදිරිපත් කරන කොටස සඳහා මෙම මුදල් -counterpart funds- ලබා ගන්නයි.

ඒ වාගේම විශේෂයෙන්ම අපේ වැඩ පිළිවෙළ සම්බන්ධව යමක් මතක් කරන්න ඕනෑ. ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යාංශයේ කැබිනට් අමාත්‍යතුමා හැටියට අතිගරු ජනාධිපතිතුමා කටයුතු කරන අතර කැබිනට් නොවන අමාත්‍යවරු හය දෙනෙක් සහ නියෝජ්‍ය අමාත්‍යවරයෙක් කටයුතු කරනවා. අපි රට කලාප හයකට වෙන් කරලා වැඩ කටයුතු ක්‍රියාත්මක කරනවා. අතිගරු ජනාධිපතිතුමාත්, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත් මෙම කලාප හයේම වැඩ කටයුතුවලට උපදෙස් දෙමින්, අධීක්ෂණය කරමින් කටයුතු කරනවා. විශේෂයෙන්ම උතුර සංවර්ධන කටයුතු,-උතුරු වසන්තය-නැඟෙනහිර සංවර්ධන කටයුතු-නැඟෙනහිර නවෝදය-කාර්ය සාධන බලකායේ සභාපතිතුමා හැටියට ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කර ගෙන යනවා.

විශේෂයෙන්ම මගේ කලාපය සම්බන්ධව යමක් කියන්න ඕනෑ. එය පරිපාලන දිස්ත්‍රික්ක හතරක් ආවරණය වන කලාපයක්. නුවර එළිය දිස්ත්‍රික්කය, බදුල්ල දිස්ත්‍රික්කය, රත්නපුරය දිස්ත්‍රික්කය, ඒ වාගේම මොණරාගල දිස්ත්‍රික්කය ඊට අයත් වනවා. මොණරාගල දිස්ත්‍රික්කයේ ආසන 3ක්, බදුල්ල දිස්ත්‍රික්කයේ ආසන 9ක්, නුවර එළිය දිස්ත්‍රික්කයේ ආසන 5ක් සහ රත්නපුර දිස්ත්‍රික්කයේ ආසන 8ක් වශයෙන් මැතිවරණ බල ප්‍රදේශ 25ක සංවර්ධන කටයුතු කර ගෙන යනවා. ඒ වාගේම සමස්ත කලාප බල ප්‍රදේශය ගත්තාම, මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11ක්, බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16ක්, රත්නපුරය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාස 17ක් සහ නුවර එළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5ක් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 49ක, තිස්එක් ලක්ෂයකට ආසන්න ජන ගහනයක් ජීවත් වන ප්‍රදේශයක සංවර්ධන කටයුතු සඳහා අපට ඉමහත් කාර්ය භාරයක් කර ගෙන යන්න හැකියාව ලැබිලා තිබෙනවා.

ජාතික සවිය ගම නැඟුම වැඩසටහන යටතේ 2006 දී මුළු රටේම දුෂ්කර ග්‍රාම නිලධාරි වසම් 119ක්, 2007 වර්ෂයේදී ග්‍රාම නිලධාරි වසම් 4,000ක්, 2008 සහ 2009 යන වසරවල ග්‍රාම නිලධාරි වසම් 14,000 ක් ආවරණය වන පරිදි අපි කටයුතු කර ගෙන යනවා. ජාතික සවිය ගම නැඟුම වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර තුනක වැඩ ආවරණය කරන්න බලාපොරොත්තු වනවා. එකක්, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය. ඒ වාගේම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන. අනෙක් පැත්තෙන් සාරධර්ම ප්‍රවර්ධන -පිරිහුණු සාර ධර්ම ප්‍රවර්ධන- වැඩසටහන.

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ක්ෂේත්‍රය යටතේ ග්‍රාමීය මාර්ග කොන්ක්‍රීට් කරලා සකස් කිරීම, ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, ජනතාවගේ අවශ්‍යතා සඳහා ජන සභා නිලධාරින් සම්බන්ධ කර ගෙන ජන සභා කාර්යාල ඇතුළු පොදු ගොඩනැඟිලි ඉදි කිරීම, පානීය ජල පහසුකම් සහ විශේෂ වැව් අමුණු සංවර්ධනය කිරීම ප්‍රධාන තැනක් ගන්නවා. ඒ වාගේම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහනින් අපේක්ෂා කරන්නේ ජනතාවගේ ආදායම් මාර්ග වැඩිදියුණු කිරීමටයි. විශේෂයෙන්ම ඒ ප්‍රදේශවල සම්පත් හා ශිල්පීය හැකියාවන් මත පදනම් වූ ස්වයං රැකියා අවස්ථා බිහි කරලීම වැදගත් කොට සලකනවා. මේ යටතේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය තුළින් වී නිෂ්පාදනය වැඩි කරන්න, ඒ වාගේම බඩඉරිඟු ඇතුළු ධාන්‍ය වර්ග සහ එළවලු පලතුරු නිෂ්පාදනය වැඩි කරන්න අපි චක්‍රීය අරමුදල් යටතේ ණය මුදල් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේම සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන තුළින් තනි තනි පවුල් ඒකකවල සදාචාරාත්මක හැදියාව වැඩිදියුණු කර යහපත් පුරවැසියන් බිහි කිරීමට ඉවහල් වන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක වනවා. විශේෂයෙන්ම අපි මේ කලාපය තුළ රණ විරුවන් සඳහා නිවාස 500ක් මේ අවුරුද්ද තුළ සකස් කර දෙන්නත්, ඒ වාගේම ඒ දිස්ත්‍රික්කවල පොල් අතු සෙවිළි කළ පාසල් තිබෙනවා නම් ඒ සියල්ලම ඉන් ඉවත් කර ස්ථිර ගොඩනැඟිලි ලබා දීමටත් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා. ඒ වාගේම ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය වැඩසටහන යටතේ 2009 වර්ෂය තුළ මේ වන විට අදාළ දිස්ත්‍රික්ක හතරේ මාර්ග කිලෝමීටර් 650ක් පමණ කොන්ක්‍රීට් කර සකස් කරන්න අපි මිලියන 947ක මුදලක් දැනට වැය කර තිබෙනවා. ඒ දිස්ත්‍රික්ක වශයෙන් කියනවා නම් මොණරාගල දිස්ත්‍රික්කයට මිලියන 181ක්, බදුල්ල දිස්ත්‍රික්කයට මිලියන 262ක්, ඒ වාගේම රත්නපුර දිස්ත්‍රික්කයට මිලියන 314ක්, නුවර එළිය දිස්ත්‍රික්කයට මිලියන 190ක් අපි වැය කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වර්ෂය තුළදී අදාළ කලාපය තුළ විදුලිය සඳහා මිලියන 325ක මුදලක් වැය කර තිබෙනවා. ඒ වාගේම ඒ තුළින් ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම රාශියක් ක්‍රියාත්මක කරන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. පානීය ජල පහසුකම් ලබා දීමට අදාළ කලාපය තුළ යෝජනා ක්‍රම 140ක් ක්‍රියාත්මක කරනවා. මේ සඳහා මිලියන 70ක් පමණ වැය කරන්න කටයුතු කර තිබෙනවා. ජීවනෝපාය සංවර්ධන වැඩසටහනේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා සමස්ත කලාපය තුළ මිලියන 145කට අධික මුදලක් වැය කර අපි කටයුතු කර තිබෙනවා. ඒ තුළින් අලුත් කුඹුරු අස්වද්දා කන්න දෙකම වගා කර ජාතික වී නිෂ්පාදනයට අගයක් එකතු කරන්න සමත් වෙලා තිබෙන බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඊට අමතරව මේක සුවිශේෂ වැඩසටහනක් හැටියට සෑම ග්‍රාම නිලධාරි වසමකම ස්වයං රැකියා අරමුදල් හැටියට මිලියන 150ක් වෙන් කර තිබෙනවා. චක්‍රීය අරමුදලක් හැටියට අපි ඒ අයගේ ආදායම වැඩි කරන්න, නැවතත් ඒ අයට ආර්ථිකය ශක්තිමත් කරන්න ආයෝජනය කළ මුදලක් හැටියට මිලියන 150ක් වෙන් කර කටයුතු කර තිබෙනවා. මම මේ සඳහන් කරන්නේ කලාප 1 ප්‍රදේශය සම්බන්ධව. අනික් ගරු ඇමතිතුමන්ලා ඒ සම්බන්ධව සඳහන් කරයි.

ඔබතුමා දන්නවා, නුවර එළිය ප්‍රදේශයේ, බදුල්ල ප්‍රදේශයේ, රත්නපුර සහ මොණරාගල දිස්ත්‍රික්කවල එළවලු, පලතුරු නිෂ්පාදනය කර වෙළෙඳ පොළ සඳහා එක්කෝ දඹුල්ලට, එක්කෝ කොළඹට, එහෙම නැත්නම් මීගොඩට ගෙනෙන විට ප්‍රවාහනයේදී සියයට 30ක් 40ක් අතර ප්‍රමාණයක් නාස්ති වන බව අපි දන්නවා. ඒ සඳහා ඇසුරුම් ලබා දීලා නරක් වන ප්‍රමාණය අඩු කර ගන්න අපි මුදල් වෙන් කර තිබෙනවා. ඒ සඳහා රත්නපුර, මොණරාගල, බදුල්ල සහ නුවර එළිය කියන ඒ දිස්ත්‍රික්ක හතරටම ලක්ෂ 80ක මුදලක් දැනට වෙන් කර තිබෙනවා. එතැනදී අපි බලාපොරොත්තු වනවා, වැඩි අගයක් ලැබිලා, වැඩි මුදල් ප්‍රමාණයක් ලැබිලා අපට කටයුතු කරන්න හැකියාව ලැබෙයි කියා. ඊ ළඟට 2009 වර්ෂය තුළ දී මෙම දිස්ත්‍රික්ක හතරටම රුපියල් මිලියන 2,000ක ප්‍රතිපාදන ලැබිලා තිබෙනවා. මේ රටේ ජාතික නිෂ්පාදනය වැඩි කිරීමට ඉවහල් වන ව්‍යාපෘති 4,500ක් පමණ මේ වසරේ ක්‍රියාවට නැංවීමට පියවර ගෙන තිබෙනවා. ඒ හැම ව්‍යාපෘතියක්ම ක්‍රියාත්මක කිරීමේදී සියයට 20ක ශ්‍රම දායකත්වයක් ඒ කියන්නේ මිලියන 400ක පමණ ශ්‍රම දායකත්වයක් ලබා ගන්න හැකියාව ලැබිලා තිබෙනවා. එයින් මේ ව්‍යාපෘතිවල තිබෙන අගය තවත් ඉහළ යනවා විතරක් නොවෙයි, මේක අපේ ව්‍යාපෘතියක්, අප හදා ගත්ත ව්‍යාපෘතියක් කියලා ජනතාව තුළ හැඟීමක් ඇති වනවා.

ඒ වාගේම ජාතික නිෂ්පාදනය වැඩි කිරීමට ඉවහල් වන සුළු වාරිමාර්ග ගණනාවක් ප්‍රතිසංස්කරණය කිරීමට හඳුනා ගෙන තිබෙනවා. ගම්බද ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය වාගේම කුඩා පරිමාණ ජල යෝජනා ක්‍රම සකස් කිරීමෙන් සහ වැව් අමුණු සකස් කිරීමෙන් ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා විශේෂයෙන්ම සඳහන් කළා, පොඩි පාලම් වෙනුවට- [බාධා කිරීමක්] මාර්ගවල තදබදය ගැන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කැලණිය දුම්රිය මාර්ගය ගැන බලන්න.-මම, අපේ ගරු රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමාගේ කාලයෙන් විනාඩි දෙකක් ගන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.- ගරු මන්ත්‍රීතුමාට තේරෙන්නේ නැද්ද කියලා මම දන්නේ නැහැ, මේ පාලම් නිසා මාර්ග තදබදය කොච්චර අඩු වෙනවාද කියන එක. ප්‍රධාන මාර්ගයක් හරහා කෝච්චියක් යන කොට කොච්චර වෙලාවක් යනවාද? එක කෝච්චියක් යන කොට විනාඩි හතරක් යනවා කියලා හිතලා බලන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔබතුමා වරදවා වටහා ගෙන පාලම් දමන එකෙයි, ගුවන් පාලම් දමන එකෙයි ප්‍රශ්නයක් නොවෙයි මම කිව්වේ.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
එහෙනම්?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
පාලම් දමන කොට හුඟක් අය දූෂණ කරන එක ගැනයි මම කිව්වේ.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
ඔබතුමා දූෂණ ගැන කථා කරනවා නම් කරුණාකරලා මෙතැන ඒ ගැන කථා කරන්න එපා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මෙතැන කියන්නේ නැතුව කොහේද කියන්නේ?

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
හොඳයි, මටත් කියන්න පුළුවන්. දැන් අපට මෙහෙම කියන්න පුළුවන්. එක්සත් ජාතික පක්ෂයේ අරමුදලට සල්ලි ලැබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ අරමුදලට සල්ලි ලැබෙන කොට -

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
එක්සත් ජාතික පක්ෂයේ අරමුදල ගැන නොවෙයි මේ කිව්වේ. [බාධා කිරීමක්] මේවා ආණ්ඩුවේ සල්ලි. [බාධා කිරීමක්]

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
හොඳයි, හොඳයි. ආණ්ඩුවේ සල්ලි. [බාධා කිරීමක්] හරි, හරි. [බාධා කිරීමක්] හරි, ඒ සියල්ලටම මම උත්තර දෙන්නම්. ඔබතුමා කලබල වෙන්න එපා. ඉඳ ගන්නකෝ. දැන් ඉඳ ගන්නකෝ. මම දැන් ඒකට එන්නම්. මගේ වෙලාව ගන්නේ. මම කියන්නම්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔබතුමා ආයෝජකයෙකුගෙන්- [බාධා කිරීමක්] ගත්තා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
හොඳයි, ගත්තා නේ. ඔව්, නඩුවේදී ඔප්පු වුණා, දෙ වෙනි නඩුකාරවරයෙක්- [බාධා කිරීමක්] ඔබතුමාගේ කාලය ගන්න. මගේ කාලය ඉතුරු කරන්න.

ගරු කථානායකතුමනි, පැමිණිල්ලක් ඉදිරිපත් කළාම එක්තරා අධිකරණයක නඩුව ගොනු කළා. නඩුව ගොනු කළ දවසට පහු වෙනි දා අතුරු තහනම් නියෝගයක් දුන්නා. සාමාන්‍යයෙන් අධිකරණයකදී වෙන්නේ නඩුවක් ගොනු කළාම සතියක් කල් දෙනවා, පැමිණිලිකාරයට ඇවිත් කරුණු ඉදිරිපත් කරන්න, මේ නඩුව ඉදිරියට පවත්වා ගෙන යනවාද නැද්ද කියන එක ගැන. දැන් මේ කියන කාරණාව සම්බන්ධයෙන් නඩුවක් ගොනු කළා, එක්තරා දවසක සවස. ඊට පහුව දා අතුරු තහනම් නියෝගයක් දෙනවා. මේ රටේ තියා ලෝකයේ කිසිම අධිකරණයක එහෙම සිද්ධියක් වෙලා නැහැ. හැබැයි ඒ ආයෝජකයාගේ ගෙදර තිබෙන දානේ ගෙවල්වල මෙය විභාග කළ සමහර අය යන කොට අපට තේරෙනවා, මොකක්ද වුණේ කියන එක. එහෙම නම් මේ උත්තරීතර සභාවේ මට මඩ ගහන්න කටයුතු කරන කොට, ඉස්සෙල්ලා දවසේ නඩුව ගොනු කරලා ඊට පහුව දා ඒකට අතුරු තහනම් නියෝග දෙනවා. ඒක විශ්ලේෂණය කරනවා. මම මේ අධිකරණයට අගෞරව කිරීමක් කරනවා නොවෙයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
අවසන් කරන්න ඇමතිතුමා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
ගරු රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමාගෙන් මම විනාඩි දෙකක් ගන්නවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමා දැන් වැඩිපුර විනාඩි තුනක් අරන් තිබෙනවා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
මම විනාඩි තුනක් ගත්තේ නැහැ. ඒ මන්ත්‍රීතුමා කථා කළේ. මගේ කාලය ගන්න එපා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
විනාඩි තුනක් වැඩියෙන් ගිහින් තිබෙනවා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
දූෂණය ගැන කථා කරනවා. රාජ් රාජරත්නම් සල්ලි එව්වේ කොහෙන්ද? ඩොලර් මිලියන තුනක් කාගේ සමාගමකටද එව්වේ? මේවා ගැනයි අපි හොයන්න ඕනෑ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
සෝභිත හාමුදුරුවෝ -

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
ඒකටත් එන්නම්. ඉන්න මම කියන්න. සෝභිත හාමුදුරුවෝ මගේ ආසනයෙන් ඉඩම් අක්කර දෙසීයක් බලෙන් ඉල්ලන කොට, අහිංසක මිනිසුන්ට දෙන ඒවා නවත්වන කොට- [බාධා කිරීමක්] ඒ කටයුතු කරලා දැන් පරීක්ෂා කර ගෙන යනවා. දැන් උන්වහන්සේ කියනවා, මම නොවෙයි ASP මහත්තයා තමයි මේක කිව්වේ කියලා. ASP මහත්තයාගෙන් කටඋත්තර අරන් තිබෙනවා. මේවා එකකටවත් අපි නැහැ. භය වෙන්න එපා.

රාජ් රාජරත්නම්ගේ සල්ලි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අයිති සමාගම්වල accountsවලට කොහොමද ආවේ? කරුණාකර මේවා කියන්න දූෂණ ගැන කථා කරද්දී. ඔබතුමා එක කඩදාසියක් නැතිව මේ කොම්පැනි ගැන, දූෂණ ගැන කථා කරනවා. වස්ගමුවේ ගිහිල්ලා නායකතුමාත් එක්ක මහවැලි ගඟේ බැහැලා හීතලේ නාන කොට පිට අතුල්ලනවා වාගේ සනීපයක් නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි අවසන් කරන්න.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
මට විනාඩියක් දෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වස්ගමුවේ, මහවැලි ගඟට ගියා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - தேசத்தைக் கட்டியெழுப்புவதற்கான அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardena - Minister of Nation Building)
මගේ කථාවේ විනාඩි දහය මම සම්පූර්ණයෙන්ම ඇමතිතුමාට දෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට විනාඩි පහයි දැන් තිබෙන්නේ.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
හරි, හරි. දහයක් තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාගේ විනාඩි පහෙනුත් කීපයක් දැන් අරගෙන තිබෙන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මා ළඟ කොළය තිබෙනවා, විනාඩි දහයක් තිබෙනවා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
විනාඩි දහයක් තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
නැහැ, ඒක අඩු කරලා තිබෙන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මම දන්නේ නැහැ, මට විනාඩි දහයක් තිබෙනවා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
මට අඩු කරන්න එපා. එතුමාගේ සම්පූර්ණ වෙලාව මට දෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
පොදුවේ සියලු දෙනාටම අඩු කරලා තිබෙන්නේ.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
එතුමාගේ වෙලාව මට දැන් දෙන්නකෝ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
එතුමාගේ වෙලාව තිබෙන ටික දැන් දෙන්නම්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
හරි, මම කථා කරන්නේ නැහැ.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහරු මෙතැන ඇවිත් කථා කරනවා; මහජන සේවය ගැන කථා කරනවා. සමහර පක්ෂවලට අරමුදල් හම්බ වෙනවා, රටවල්වලින් හම්බ වෙනවා. පක්ෂවලට සල්ලි හම්බ වුණාම ඒ පක්ෂයේ නායකයෝ තීරණය කරනවා, තමන්ගේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට කුරුණෑගල පැත්තෙන් වතු අරන් දෙන්න. මම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අහනවා,-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
ඔබතුමා කලබල වෙන්නේ නැතුව ඉන්නකෝ. ඉඳ ගන්නකෝ. ඉඳ ගන්න. තොප්පි දමා ගෙන කථා කරන්න එපා. මන්ත්‍රීතුමා ඉඳ ගන්න. මම කියනවා, අහන්න එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන්. අපේ ජාතියේ පියාගේ මුණුබුරා දැන් ගරු සභාවට එනවා. අපේ රුක්මන් සේනානායක මැතිතුමාගෙන් මම අහනවා, ඔබතුමා කියන්න-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔිවා හොඳයි, කොණ්ඩේ බැඳපු වීනුන්ට.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
මම කිව්වා, උත්තර දුන්නා.

අර බලන්න, අපේ ජාතියේ මුණුබුරා. එක්සත් ජාතික පක්ෂයේ නියම අයිතිය තිබෙන නායකයා; උරුමය තිබෙන නායකයා. තමුන්නාන්සේලා වාගේ නොවෙයි. මේ බලන්න, රුක්මන් සේනානායක මැතිතුමා. ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ, ඩී.එස්. සේනානායක මැතිතුමාගේ -ජාතියේ පියාගේ- මුණුබුරා ඇවිල්ලා ඉන්නවා. අන්න නායකයෝ. තමුන්නාන්සේලා මොන නායකයෝ ද? එක්සත් ජාතික පක්ෂයට ලැබුණ අරමුදල්වල, එක්සත් ජාතික පක්ෂයට මැතිවරණ සඳහා උදවු ලැබෙන කොට, විදේශ රටවලින් උදවු එන කොට- [බාධා කිරීම්] අද එක්සත් ජාතික පක්ෂයේ නායකයන්ට සැප දෙන, නායකයන්ට සනීප දෙන, නායකයන් සතුටු කර වන මන්ත්‍රීවරුන්ට පොල් වතු අර ගෙන දෙනවා. [බාධා කිරීම්] පසු ගිය කාලයේ නිවාඩුවට ගියා, මහජන සේවය සඳහා කැප වුණු අය. ගියාම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එක ගැන -

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
ඒ තමුන්නාන්සේට ඕනෑකම නිසා. මොකද?

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්] මගෙන් අහ ගන්න එපා. ඉඳ ගන්න. අද වස්ගමුවේ ගිහිල්ලා නායකයයි, මන්ත්‍රීවරුයි ගිහිල්ලා- [බාධා කිරීමක්] වස්ගමුවේ- [බාධා කිරීමක්] මහවැලි ගඟේ- [බාධා කිරීමක්] සබන් ග ගා පිට ඇතිල්ලුවේ කාගේ ද? [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමනි, බාධා කරන්න එපා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මම කියපු ඒවා නොවෙයි - [බාධා කිරීම්]

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
ඒ නිසා මම කියන්නේ කරුණාකරලා අනුන්ට මඩ ගහන්න ලැහැස්ති වෙන්න එපා කියලායි. [බාධා කිරීම්] අද රාජ් රාජරත්නම්ගේ සල්ලි ගැන සොයන්න ඕනෑ. ඒ වාගේම පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ සමහර වාහනවල නොම්මර මාරු කරලා. ඒ ජීප් එක අද - [බාධා කිරීම්] සමහරු නැහැ. අපි අද පොලිසියට කියන්න ඕනෑ, පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයෙන් ලබා දීපු මොන්ටෙරෝ වාහනවලට මොකද වුණේ කියලා, එක නොම්මරය තිබෙන වාහන දෙකක් තුනක් තිබෙන්නේ කොහොමද කියලා. ඒවා සොයලා බලලා මේ රටේ ඒ වැරදි කරපු අයට දැඩි දඬුවම් පමුණු වන්න කටයුතු කරන්න ඕනෑ.

ඒ නිසා අද එක්සත් ජාතික පාක්ෂිකයන් ගමේ සාමාජිකයන්ගෙන් එකතු කරන සල්ලි ටික, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් පක්ෂ අරමුදලට කපා ගන්නා සල්ලි ටික එකතු කරලා එක්සත් ජාතික පක්ෂයේ සමහර නායකයෝ, එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය සතුටු කරන අයට කුලියාපිටියෙන් පොල් වතු අර ගෙන දුන්න ඒවා සම්බන්ධයෙන් කටයුතු කළා නම් එක්සත් ජාතික පක්ෂයේ අලියා ලකුණ ඉදිරියෙන් කිසි කෙනෙක් කතිරයක් ගහන්නේ නැහැයි කියන එක මතක් කරන්න ඕනෑ. [බාධා කිරීම්] අන්න තොප්පිය දමා ගත්තා. හරි, කියන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Point of Order එක මොකක්ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මේ ඇමතිවරයා මීට පෙර අවස්ථා ගණනාවකදී මාව සම්බන්ධ කර ගෙන මේ වාගේ ප්‍රකාශයක් කළා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
නැහැ. නැහැ. නැහැ. දැන් මම නමක් කිව්වේ නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මීට ඉස්සර වෙලා කිව්වා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
ඔන්න තොප්පිය දමා ගත්තා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මීට ඉස්සර වෙලා නම කියලාම කිව්වා. තමුන්නාන්සේ මේ වාගේ අසත්‍ය කථා කියන්න එපා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
හරි. හරි. ඒක අදාළ නැහැ.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
තොප්පිය දමා ගත්තා. වස්ගමුවේ නාපු හැටි පිළිගත්තා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අපට ඉපදෙද්දිත් තිබුණා. තමුන්නාන්සේට මොනවාද තිබුණේ?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
තමුන්නාන්සේට කිසි දෙයක් තිබුණේ නැහැ. බයිසිකලයක්වත් තිබුණේ නැහැ.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
ඇත්තද? ඔබතුමාගේ බයිසිකලයේ තමයි මම ගියේ.[බාධා කිරීමක්]

[අ. භා. 12.14]

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Rohitha Bogollagama - Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විවාදයට සම්බන්ධ වන්නට ලැබීම ගැන මා සන්තෝෂ වනවා. මෙහි විශේෂ වැදගත්කමක් විධියට අප දකින්නේ ශ්‍රී ලංකාවේ අනාගතයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන අමාත්‍යාංශ කිහිපයක් සඳහා මෙම පරිපූරක ඇස්තමේන්තු අනුමත කිරීමට අවස්ථාව ලැබීමයි. අද ජනතාව දකිනවා, ශ්‍රී ලංකා රජයේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගෙන් මේ රට කොපමණ දුරට සංවර්ධනශීලී ව්‍යුහයකට අවතීර්ණ වෙලා ද කියා. ඊයේ ලංකාවේ දිගම පාලම විවෘත කළා. දෙහිවල ගුවන් පාලම අද උදේ විවෘත කරන්නට යෙදුණා. ඒ තුළින් අපි ඒ සංවර්ධනය දකිනවා. මේ ආදී වශයෙන් සුවිශේෂී අවස්ථා කිහිපයක් සංවර්ධන ව්‍යුහය තුළ අද අපට දකින්නට ලැබෙනවා. ඒ වාගේම නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය, ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය ආදී වශයෙන් අමාත්‍යාංශ සම්බන්ධ වෙලා මේ සියලු කටයුතු සිද්ධ වනවා. මේ ආකාරයට ශ්‍රී ලංකාවේ සුවිශේෂී සංවර්ධන වේගයක් ඇති කිරීම සම්බන්ධයෙන් ඒ අමාත්‍යතුමන්ලා සියලු දෙනාටත්, මහාමාර්ග ක්ෂේත්‍රය මෙහෙයවන අතිගරු ජනාධිපතිතුමාටත් අපේ උණුසුම් ප්‍රසාදය, ගෞරවය මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරන්නට ඕනෑ.

පසු ගිය කාලයේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ක්ෂේත්‍රය තුළ සුවිශේෂ ප්‍රගතියක් ලබමින් අද ලංකාව ජාත්‍යන්තර වශයෙන් කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. පසු ගිය දා ආසියානු සහයෝගිතා සංවර්ධන වැඩ පිළිවෙළ තුළින් රටවල් 31ක සහභාගිත්වයෙන් පැවැත් වුණු ආසියාකරයේ ප්‍රධානතම වේදිකාව ශ්‍රී ලංකාව තුළ ගොඩ නැඟිලා තිබුණා. ඒ සියල්ලක්ම ලංකාවේ ආර්ථිකයට සුවිශේෂ වැදගත්කමක් ලබා දෙන, ආර්ථික වේගය තව තවත් වැඩිදියුණු කරන ආර්ථික ප්‍රසාරණය අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාවේ ජනතාව වෙත ලබා දෙන, ජාත්‍යන්තර වශයෙන් ලංකාව ලෝකයට සම්බන්ධ වන අවස්ථාවක් විධියට අප දකිනවා. ආසියානු සහයෝගිතා සංවාදය තුළින් එහි සභාපතිත්වය ලංකාවට ලබා ගැනීම දක්වාම ඉදිරියට යාම සඳහා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය විශේෂ වශයෙන් ඉවහල් වෙලා තිබෙනවා.

මේ, එම නායකත්වය ලෝකය තුළ පිළිගත්ත, තහවුරු වුණු අවස්ථාවක් විධියට මා දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයේ නොයෙකුත් ස්ථානවලදී ලංකාව ගැන කථා බහට ඒ වාගේම වාද විවාදවලට ලක් වන දර්ශන අපිට තවමත් දකින්න ලැබෙනවා. පසු ගිය අවස්ථාවේදී බ්‍රිතාන්‍ය විදේශ ලේකම් ඩේවිඩ් මිලිබෑන්ඩ් මහතා එහි පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශයට අනුකූලව මා විසින් උත්තර දීමක් කළ යුතුව තිබෙනවා. පසු ගිය දින තමිල්නාඩු දූත පිරිසක් ශ්‍රී ලංකාවේ ඓතිහාසික සංචාරයක යෙදුණා. ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමකුත්, GSP සහනය ලබා දීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ ස්ථාවරය ගැන මේ සභාව තුළදී දැනුවත් කිරීමකුත් මේ සභාව ඉදිරියේ තබන්න මා අදහස් කරනවා. මූලික වශයෙන්ම පසු ගිය ඔක්තෝබර් මස 13 වන දා ඩේවිඩ් මිලිබෑන්ඩ් මහතා විසින් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ කරන ලද ප්‍රකාශයට මගේ පිළිතුරු ප්‍රකාශයත් මේ ගරු සභාව තුළම ඉදිරිපත් කරන්න මා අදහස් කරනවා.

We continue to engage with the international community on a range of issues of mutual concern relating to the IDPs, resettlement and livelihood projects. Our engagement has included a series of meetings and interactions both in Sri Lanka and overseas about which I informed the Hon. Members on 8th October, 2009. Due to these interactions, the international community is beginning to show some acknowledgment of the improvements that are taking place in the post-conflict scenario in our country. For instance, the British Foreign Secretary, David Miliband, speaking in the House of Commons on 13th October, 2009 acknowledged the improvement of sanitation facilities and cases of malnutrition having markedly decreased in the welfare centres for the internally displaced. However, there were concerns expressed, and notwithstanding that, some countries do continue to express concern on a range of issues relating to the IDP facilities. From my perspective, there is clearly a need for a greater degree of understanding by those countries which do not appreciate wholly the challenges faced by Sri Lanka in the aftermath of over three decades of brutal terrorism. Hence, our engagement has sought to secure a greater appreciation of these challenges and tangible assistance to address the very issues which mutually concern us.

The resettlement of persons in their original areas of habitation and the resultant decrease in numbers in the IDPs to less than 250,000 is being appreciated by many quarters. The issuance of IDs to over 160,000 persons and the completion of registration of all IDPs over 12 years have been noted. We are confident that the targets set for clearance of 58,000 for resettlement by end October will be met. Dry rations and an allowance for the reconstruction of shelter for the returnees have been provided.

The notable progress made in the health sector with the reduction of the annual mortality rate to less than 4.4 per 1,000 in the welfare centres in Vavuniya, which is compatible with any other part of the country, symbolizes the significant achievement in stabilization of the health facilities for the IDPs.

Almost 40,000 children are attending classes in welfare centres. The Government has facilitated 1,187 students to sit for the GCE (Advanced Level) Examination in August this year. This reflects the emphasis the Government places on the long-term welfare of the present IDPs. The fact that 166 of them were LTTE surrendees needs to be appreciated.

Our interlocutors have also been informed of the contingency plan and flood preparedness to face the imminent North-East monsoon rains. The construction and improvement of the storm water drainage system in Vavuniya by the RDA and the District Road Development Authority, the Sri Lanka Army with the partnership of international organizations have also to be noted. The fact that drainage facilities in Zones 1 and 2 have been completed is appreciated. Over 50 per cent of the work in the other zones has also been completed, except Zone 7, where work is to begin very soon.

[ගරු රෝහිත බෝගොල්ලාගම මහතා ]

On de-mining which is a prerequisite for resettlement of IDPs, we have articulated Sri Lanka's commitment to intensify de-mining. We have made the international community aware that it is the Government of Sri Lanka, through the expertise of the Sri Lanka Army, that has carried out over 70 per cent of de-mining.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, තව විනාඩියකින් අවසන් කරන්න.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විනාඩි තුනකින් ඉවර කරනවා.

The fact that the Government has disbursed large amount of funds to secure equipment for a speedier, mechanized de-mining process symbolizes the Government's commitment to de-mining and resettlement. In our interactions, we have emphasized particularly to those who call for a speedy resettlement, the need for tangible assistance in the de-mining process. Some have responded and the responses of others are pending. The certification by the UNHCR that the area is safe is a basic prerequisite before any resettlement can take place in an area. This is a rule strictly followed by the Government for the safety of our people.

The sensitivity with which the Government is addressing the needs and difficulties of special categories of IDPs - the elderly, the clergy et cetera - by releasing them is also being appreciated. Up to now, over 10,000 people have been considered under this programme. So has the rehabilitation of former combatants including children. The well thought-out programme for rehabilitation of former combatants implemented at Ambepussa and Poonthottam with the partnership of UN agencies and other donors, we believe, will provide a fine example to be applied even in other post-conflict situations.

Now, I will move on to another very important area in terms of the GSP Plus.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
සභාගත කරන්න.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කථාව අවසානයේදී සභාගත කරනවා.

With regard to the GSP Plus review process, on Monday, 19th October, 2009, the European Commission handed over to the Government of Sri Lanka its report on Sri Lanka's implementation of three of the 27 UN Conventions relevant to its GSP Plus benefits, which were of concern to the European Commission. The Note from the Directorate General for Trade of the European Commission forwarding the European Commission's report to the Mission of Sri Lanka in Brussels stated, "The Commission will now decide whether to propose a temporary withdrawal of the special incentive arrangement for sustainable development and good governance provided for under Council Regulation (EC) No. 732/2008". The Note goes on to add, "If the Government of Sri Lanka wishes to make any representations on this matter or specifically in relation to the Commission report in annex, it is kindly requested to bring these to the Commission's attention no later than 06th November, 2009…..".

It would be recalled that the GSP Plus "investigation" on Sri Lanka by the European Commission was launched a year ago, at a time when the Government of Sri Lanka was on the verge of ending 30 years of terrorism in Sri Lanka. The Government of Sri Lanka did not participate in the process of the GSP Plus "investigation" and refused a request for "experts" to visit Sri Lanka as a matter of principle as it was felt inappropriate for Sri Lanka as a sovereign State to participate in such a process and unnecessary, given the numerous ongoing processes both between the Government of Sri Lanka and the UN system as well as between the Government and the European Union.

While not co-operating with the process of "investigation", the Government of Sri Lanka continued to engage with the European Commission on the issues of mutual interest through existing diplomatic channels, a fact acknowledged in the European Commission report. The Government of Sri Lanka for its part will continue to engage with the European institutions in keeping with the spirit of transparency and mutual respect that is appropriate to the historic and long-standing relationship between Europe and Sri Lanka.

The Government of Sri Lanka, within the joint Cabinet Sub-Committee appointed by His Excellency the President, will therefore closely study the European Commission report and consider ways and means of addressing the issues in our continuing pursuance of securing the GSP Plus facility.

Sir, I table* my Statement and also some portions of the Briefing Note on the outcome of the visit by the Members of the Indian Parliament from the constituencies in the State of Tamil Nadu to be included in Hansard in order to avoid time consumption.

Thank you.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

***සභාමේසය මත තබන ලද ප්‍රකාශය සහ දැනුවත් කිරීමේ සටහනේ කොටස් :***

**சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்றும் குறிப்பின் பகுதியும்:*

*Statement and portions of the Briefing Note tabled:*

Hon Members, we continue to engage the International community on a range of issues of mutual concern relating to the IDPs, resettlement and livelihood projects.

Our engagement has included a series of meetings and interactions both in Sri Lanka and overseas, of which I informed the Hon. Members on 08th October, 2009. The interactions are beginning to show some acknowledgement of the improvements.

For instance, the British Foreign Secretary, David Miliband, speaking in the House of Commons on 13th October, 2009, acknowledged the improvement of sanitation facilities and cases of malnutrition having markedly decreased in the welfare centres for the internally displaced.

However, there were concerns expressed and notwithstanding, some countries do continue to express concern on a range of issues relating to the IDP facilities.

From my perspective, there is clearly a need for a greater degree of understanding by those countries which do not appreciate wholly the challenges faced by Sri Lanka in the aftermath of over three decades of brutal terrorism. Hence, our engagement has sought to secure a greater appreciation of these challenges and tangible assistance to address the very issues which mutually concern us.

The resettlement of persons in their original areas of habitation and the resultant decrease in the numbers in the IDP facilities to less than 250,000 is being appreciated by many quarters. The issuance of IDs to over 160,000 persons and the completion of registration of all IDPs over 12 years have been noted. We are confident that the targets set for clearance of 58,000 by end of October for settlement will be met. Dry rations and an allowance for the reconstruction of shelter for the returnees have been provided.

The notable progress made in the health sector with the reduction of annual mortality rates to only 4.4 per 1000 in the welfare centres in Vavuniya, which is compatible with any other part of the country, symbolizes the significant achievement in stabilization of the health facilities for the IDPs.

Almost 40,000 children are attending classes in welfare centres. The Government has facilitated 1,187 students to sit for the G.C.E. Advanced Level Exam in August this year. This reflects the emphasis the Government places on the long-term welfare of the present IDPs. The fact that 166 of them were LTTE surrendees needs to be appreciated.

Our interlocutors have also been informed of the contingency planning and flood preparedness in preparation for the Imminent North-East monsoon rains. Construction and improvement of the storm water drainage system in Vavuniya by the RDA and the District Road Development Authority, the Sri Lanka Army with the partnership of international organizations have also been noted. The fact that drainage facilities in zones 1 and 2 have been completed is being appreciated. Over 50 per cent of the work in the other zones have also been completed, except in zone7, where work is to begin very soon.

On Demining, which is a prerequisite for resettlement of IDPs, we have articulated Sri Lanka's commitment to intensify demining. We have made the international community aware that it is the Government of Sri Lanka, through the expertise within the Sri Lanka Army, that has carried out over 70 per cent of demining. The fact that the Government has disbursed a large amount of funds to secure equipment for a speedier and mechanized demining process symbolizes the Governments commitment to demining and resettlement. In our interactions, we have emphasized, particularly to those who call for speedy resettlement, the need for tangible assistance in the demining process. Some have responded and others are pending. The certification by the UNHCR that the area is safe is a basic prerequisite before any resettlement can take place in an area. This is a rule strictly followed by the Government for the safety of our people. The emphasis Sri Lanka has placed on the demining of the Rice Bowl in the Mannar District and the progress made in demining the region by the end of October, in time for the cultivation season, Demonstrated the commitment of the Government, not only to resettle the people in the region, but also to facilitate the return to their traditional livelihoods. The provision of land, plant material, fertilizer subsidies and equipment for the returnees is part of the additional financial commitment of the Government to our people. We have emphasized to our interlocutors that returning the people to demined areas is only one part of the challenge and that, from their end, tangible assistance is needed such as for construction of permanent shelter and developing of livelihood programmes in the area. We will continue to engage our interlocutors on this area of necessary assistance.

The sensitivity with which the Government is addressing the needs and difficulties of special categories of IDPs - the elderly, the clergy et al-by releasing them is also being appreciated. Up to now, over 10,000 have been considered under this programme.

So too the rehabilitation of former combatants including children. The well thought-out programme for rehabilitation of former combatants implemented at Ambepussa and Poonthottam with the partnership of UN agencies and other donors, we believe, will provide a fine example to be applied even in other post - conflict situations.

As the Hon. Members are aware, for the short, medium and long-term development of the areas affected by the conflict, the infrastructure is vital. Our interlocutors have been informed of the progress made in the construction of the Kachcheries, Divisional and Pradeshiya Sabha buildings, schools and health facilities. The establishment of major government institutions including the BOI is being considered. The banking facilities including development banks have been established, which has been noted by the interlocutors.

The Hon. Members need to be aware that we have impressed on members of the international community the need to interdict anti-Sri Lanka activity by pro-LTTE groups which are inimical to Sri Lanka's national interest. We have impressed on them that just as much as calls are being made by the international community for reconciliation in Sri Lanka, the international community itself must also desist from permitting or turning a blind eye to continuing inimical action by pro-LTTE groups. We have emphasized that such inimical action will make the political processes in Sri Lanka and national reconciliation much more difficult and complex.

( Rajaratnam)

A Significant development was seen in the area of the LTTE's financing network. An individual named Raj Rajaratnam has been charged in the US on 16th October relating to insider trading involving hedge funds.

This subject is believed to have also provided material support to the terrorist organization - the LTTE. The Hon. Members may be aware that investigations in Sri Lanka on the activities and support of Mr. Rajaratnam to the terrorist organization are continuing, particularly in relation to the funding allegedly provided by him to the LTTE front organization TRO. The FIU of the Central Bank of Sri Lanka has stated that any suggestions that such investigations are concluded or that Mr. Rajaratnam has been cleared of possible involvement are incorrect and misleading.

(GSP Plus)

With regard to the GSP plus review process, the European Commission - EC- on Monday, 19th October, 2009 handed over to the Government of Sri Lanka - GoSL- its report on Sri lanka's implementation of three of the 27 UN Conventions relevant to its GSP Plus benefits that were of concern to the European Commission.

The Note from the Directorate General for Trade of the European Commission forwarding the EC report to the Mission of Sri Lanka in Brussels stated, "The Commission will now decide whether to propose a temporary withdrawal of the special incentive arrangement for sustainable development and good governance provided for under

Council Regulation (EC) No. 732/2008". The Note goes on to add, "if the Government of Sri Lanka wishes to make any representations on this matter or specifically in relation to the Commission report in annex, it is kindly requested to bring these to the Commission's attention no later than 06th November, 2009 ..........".

It would be recalled that the GSP plus "investigation" on Sri Lanka by the European Commission was launched a year ago, at a time when the Government of Sri Lanka was on the verge of ending 30 years of terrorism in Sri Lanka. The Government of Sri Lanka did not participate in the process of the GSP plus "investigation" and refused a request for "experts" to visit Sri Lanka as a matter of principle, as it was felt inappropriate for Sri Lanka as a sovereign State to participate in such a process and unnecessary given the numerous ongoing process both between the Government of Sri Lanka and the UN system, as well as between the Government of Sri Lanka and the European Union.

While not co-operating with the process of "investigation" the Government of Sri Lanka continued to engage with the European Commission on the issues of mutual interest through existing diplomatic channels, a fact acknowledged in the European Commission report. The Government of Sri Lanka for its part will continue to engage with the European Institutions in keeping with the spirit of transparency and mutual respect that is appropriate to the historic and long-standing relationship between Europe and Sri Lanka.

The Government of Sri Lanka, within the joint Cabinet Subcommittee appointed by His Excellency the President, will therefore closely study the European Commission report and consider ways and means of addressing the issues in our continuing pursuance of securing the GSP plus facility.

*සභාමේසය මත තබන ලද ලියවිලි:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள் :*
*Documents tabled:*

**Briefing Note on the Outcome of the Visit by Members of the Indian Parliament from the Constituencies in the State of Tamil Nadu**

H.E. President Mahinda Rajapaksa extended an invitation to the Chief Minister of Tamil Nadu, Hon. M. Karunanidhi on 11th June 2009 requesting the Chief Minister to "… consider sending a delegation of your choice". The President added "the delegation would be able to ascertain at first-hand for themselves, developments in all parts of our country".

Subsequently, the Government of India and the Government of the State of Tamil Nadu arranged in liaison with the Sri Lankan authorities for the visit to take place from 10th -14th October 2009. The composition of the delegation was:

1. Mr. T.R. Baalu, former Indian Minister for Shipping and Transport and DMK Parliamentary Group Leader in the Lok Sabha (Lower House)
2. Mr. A.K.S. Vijayan, DMK MP in the Lok Sabha
3. Mr. T.K.S. Elangovan, DMK Lok Sabha MP
4. Ms. J. Helen Davidson, DMK Lok Sabha MP
5. Ms. Kanimozhi Karunanidhi, DMK Rajya Sabha MP (Upper House) and daughter of Hon. M. Karunanidhi, Chief Minister of Tamil Nadu
6. Mr. Thol. Thirumaavalavan, Viduthalai Chiruthaikal Katchchi (VCK) Lok Sabha MP
7. Mr. N.S.V. Chitthan, Congress Lok Sabha MP
8. Mr. S. Alagiri, Congress Lok Sabha MP
9. Dr. E.M. Sudarsana Nachiappan, Congress Rajya Sabha MP
10. Mr. J.M. Haroon Rashid, Congress Lok Sabha MP

On their arrival in Chennai, the Chief Minister of Tamil Nadu Mr. M. Karunanidhi himself went to the airport and received the delegation in a gesture which signified the importance attributed to the visit.

Addressing a media briefing the same day, the Chief Minister announced according to the "The Hindu" edition of 15.10.2009 that following the visit of the delegation, the Government of Sri Lanka had assured that "…58,000 internally displaced Sri Lankan Tamils in camps will be sent back to their native places in 15 days', while 'the remaining Tamils would return gradually'. Countering the misinformation that the Government was attempting to change the demography of the northern area by resettling Sinhalese people in those areas, Chief Minister Karunanidhi had stated that 'President Mahinda Rajapaksa had denied that such a thing would happen'.

The salient features of the visit by the delegation include:

a. They were able to move freely and interact with the people accommodated at the welfare villages without any restrictions whatsoever.
b. They were able to see for themselves the reality of the situation and observe the facilities provided and how the Government machinery is working in the interest of the IDPs.
c. The people have, naturally, expressed their desire to return to their areas of residence, which is also the wish of the Government of Sri Lanka.
d. The Government of Sri Lanka manifested its commitment to act in a spirit of transparency. The Government moreover in opening the welfare villages for scrutiny, demonstrated that the authorities have nothing to hide or to be ashamed of, since they are acting in good faith.

The visit and its outcome may be viewed with dismay and disappointment by pro-LTTE elements across the world, which have been thriving by criticizing the Government of Sri Lanka. The visit has been successful in debunking the criticism against the Government of Sri Lanka. The confirmation that a large number of the IDPs would be resettled in the coming weeks, would also be a blow to the pro-LTTE lobbies.

[பி.ப. 1.02]

**ගරු සොලමන් සූ. සිරිල් මහතා**
(மாண்புமிகு சொலமன் சூ. சிறில்)
(The Hon. Soloman S. Cyril)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இன்று நகர அபிவிருத்தி, புனித பகுதிகள் அபிவிருத்தி அமைச்சு, தேசத்தைக் கட்டியெழுப்புதல் மற்றும் தோட்ட உட்கட்டமைப்பு அபிவிருத்தி அமைச்சு, நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சு, நெடுஞ்

சாலைகள், வீதி அபிவிருத்தி அமைச்சு என்பவற்றுக்கான குறைநிரப்புப் பிரேரணைகள் விவாதத்திற்கு எடுத்துக்கொள்ளப் பட்டுள்ளன. இந்த நான்கு அமைச்சுக்களும் மக்களின் நாளாந்த வாழ்வுடன் பின்னிப் பிணைக்கப்பட்டுள்ளன. ஆனால், குறிப்பாக எமது மக்களுக்கு இந்த அமைச்சுக்களின் சேவை கிடைக்கப் பெறவில்லை; யுத்தப் பிரதேசங்கள் என்ற காரணத்தினால் எமது பிரதேசங்கள் கவனிக்கப்படாதிருந்தாலும் யுத்தத்திற்கு முன்பும் இதே நிலைதான் இருந்திருக்கின்றதென்பதை இந்த வேளையிலே சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! யுத்தத்தினால் வாழ்வின் அனைத்தையும் இழந்து, உள்ளக இடப் பெயர்வுக்கு ஆளாகி, முகாம்களில் அவல வாழ்வு வாழ்ந்தாலும் "எங்களுக்கும் கைகள் உண்டு, கால்கள் உண்டு, நாம் உழைத்து வாழ்வோம்" என்ற உறுதியுடனும் உணர்வுடனும் உள்ள எமது மக்களுக்கு விடிவு கிடைக்கும்வரை அபிவிருத்தி பற்றிப் பேசுவதில் எமக்கு மனநிறைவு கிடைக்கப்போவதில்லை. இருந்தாலும், ஒருசில விடயங்களைச் சுட்டிக்காட்ட வேண்டிய தேவையும் கடமையும் எமக்கு இருக்கின்றது. இலங்கையில் அதிகரித்து வருகின்ற சனத்தொகைக்கு ஏற்ப சுகாதார மற்றும் போக்குவரத்து வசதிகள் உட்பட, குடிநீருடன் கூடிய குடியிருப்புக்களை அமைத்துக் கொள்வதில் மக்கள் பெரும் சிரமங்களை நாளாந்தம் எதிர்நோக்கி வருகின்றனர். பல்வேறு ஆரோக்கியப் பிரச்சினைகளுக்கு அவர்கள் முகம் கொடுத்து வருகின்றனர். இதேவேளை, பெரும்பாலான மக்கள் தங்கள் வாழ்க்கைத்தரத்தை உயர்த்திக்கொள்ளும் நோக்கு டனும் கல்வி மற்றும் வேலைவாய்ப்புக்களைப் பெற்றுக் கொள்ளும் வகையிலும் மற்றும் இடப்பெயர்வு, பாதுகாப்பு அச்சுறுத்தல் போன்ற காரணங்களினாலும் கிராமங்களிலிருந்து நகரங்களுக்கு குடியேறுவதால் நகரங்களில் இடநெருக்கடி அதிகரித்துள்ளது. அத்துடன், நகரமே சேரிகளால் நிரம்பி நரகமாக மாறிவருவதையும் காண முடிகின்றது. இது பெரும்பாலும் வட பகுதியையும் வட பகுதி மக்களையும் பெரும் பாதிப்புக்களுக்கும் ஆபத்துக்களுக்கும் உள்ளாக்கி வருகின்றது. குடாநாட்டைப் பொறுத்தமட்டில் யாழ்ப்பாணத்தில் ஒருபுறம் மக்கள் குடியிருப்புக்களை அமைத்துக் கொள்வதில் பாரிய பிரச்சினைகளுக்கு முகங்கொடுத்துள்ள நிலையில், மறுபுறம் அவர்கள் சொந்தக் குடிமனைகளையும் இழந்து தொடர்ந்தும் அகதிகளாகவே இருக்கின்ற நிலைமை காணப்படுகின்றது. இவர்கள் பற்றி எவரும் கவனம் செலுத்து வதாகத் தெரியவில்லை. குறிப்பாக, தீவக பகுதிகள், வலிகாமம் வடக்கு மற்றும் வலிகாமம் மேற்கு பகுதி மக்கள் அதிக பாதிப்புக்களுக்குள்ளாகி கடந்த இருபது வருடங்களாக உறவினர் வீடுகளிலும் முகாம்களிலும் தங்கியிருக்கின்றார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நகர அபிவிருத்தியின் நோக்கம் என்ன? குடிமக்களின் வாழ்க்கைக்கேற்ப சிறந்த வாழ்விடங்களை அமைத்துக் கொடுத்தல், நகரங்களில் வேலைவாய்ப்பு மற்றும் போக்குவரத்து வசதிகளை ஏற்படுத்திக் கொடுத்தல், சூழலைச் சுத்தமாக வைத்திருத்தல், சமூக ஒற்றுமை, பொருளாதார ஸ்திரத்தன்மை போன்றவற்றைப் பேணுதல், சிறந்தமுறையில் திட்டமிட்டு இடம்சார் வேறுபாடுகளை நீக்கி சம வளர்ச்சி எட்ட வழிவகுத்தல் போன்றவற்றை அது இலக்காகக் கொண்டுள்ளது. இவை எமது மக்களுக்கும் கிடைக்கவேண்டும். அழிந்துபோன எமது நகரங்கள் ஆக்கம் காணவேண்டும். பயங்கரவாதத்தின் பிடியிலிருந்து நாட்டை முழுமையாக விடுவித் திருப்பதாக சர்வதேசரீதியில் பிரச்சாரம் செய்யப்பட்டு வருகிறது. ஆனால், மடுப் பிரதேசத்துக்குச் சென்று சுதந்திரமாக மத வழிபாடுகளில் கலந்துகொள்வதற்கு இதுவரையும் வழிவகுத்துக் கொடுத்ததாகத் தெரியவில்லை. மடுத் திருத்தலமும் அதனைச் சூழவுள்ள புனித பிரதேசமும் முழுமையாக விடுவிக்கப்பட்டு ஒரு வருடமாகியும் அங்கு வழிபாட்டிற்காக மக்கள் நாளாந்தம் சுதந்திரமாக சென்று திரும்புவதற்கான அனுமதி இதுவரை வழங்கப்படவில்லை. விடுவிக்கப்பட்ட பகுதிகளில் சிவில் நிர்வாகத்தை ஏற்படுத்துவதாகக் கூறிய அரசு, மக்களை மீள்குடியேற்றாது அப்பகுதியில் காவல் நிலையங்களைத் திறந்து வைத்துள்ளது. எனவே, மக்களின் நிம்மதியான, சுதந்திரமான, புனிதத்தன்மை நிறைந்த நாளாந்த வழிபாட்டிற்கு அனுமதி வழங்க வேண்டுமென நகர அபிவிருத்தி, புனித பகுதிகள் அபிவிருத்தி அமைச்சர் அவர்களைக் நான் இந்த வேளையிலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! தேசத்தைக் கட்டியெழுப்பும் அமைச்சுக்கான குறைநிரப்புப் பிரேரணையும் இன்று விவாதிக்கப்படுகின்றது. இந்த அமைச்சு, பெருமை மிக்கது; பெறுமதி மிக்கது. காரணம், இது மேதகு சனாதிபதி அவர்களின்கீழ், அவரின் நேரடிக்கண்காணிப்பில் உள்ளது. இந்த அமைச்சின்மூலம் நாட்டில் பல அபிவிருத்தி திட்டங்கள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. குறிப்பாக, கிராமிய ரீதியாக முன்னேற்றகரமான கட்டுமானப் பணிகளை -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(Mr. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே, மதிய போசனத்துக்காகச் சபையை இடைநிறுத்த வேண்டியிருக்கின்றது. இடைவேளையின் பின்னர் நீங்கள் உங்களுடைய எஞ்சிய நேரத்தை எடுத்துக் கொள்ளலாம்.

මේ අවස්ථාවේදී දිවා ආහාරය සඳහා පස් වරු 1.00 දක්වා සභාවේ කටයුතු තාවකාලිකව අත් හිටුවනවා.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.00ට නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணி வரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed .*

**ගරු සොලමන් සූ. සිරිල් මහතා**

(மாண்புமிகு சொலமன் சூ. சிறில்)

(The Hon. Soloman S. Cyril)

கௌரவ குழுக்களின் பிரதித்தவிசாளர் அவர்களே, எனது பேச்சைத் தொடர்வதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்காக உங்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன்.

தமிழ் பிரதேசங்களில் கடந்த மூன்று தசாப்த காலங்களாகப் போரினாலும் பொருளாதாரச் சுமையினாலும் சீரழிந்து சின்னா பின்னப்பட்டு உடைந்துபோன எமது தமிழ் மக்களின் உள்ளங்களைக் கட்டியெழுப்பவும் அவர்களுடைய எதிர்கால வாழ்வின் வளர்ச்சியில் நம்பிக்கையூட்டவும் தமிழ் மக்களின் தேசிய இனப்பிரச்சினைக்கு அரசியல் ரீதியிலான விரைவானதும் உறுதியானதும் நிரந்தரமானதுமான சிறந்ததோர் தீர்வைத் தரவேண்டும் என இந்த வேளையிலே மேதகு சனாதிபதி அவர்களிடம் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித்தவிசாளர் அவர்களே! வரட்சியான காலநிலையின்பொழுது நாட்டின் சகல பகுதிகளிலும் குடிநீருக்குத் தட்டுப்பாடு ஏற்படுவதை அவதானிக்க முடிகின்றது. இதனைத் தவிர்க்கும் வகையில் நடவடிக்கை எடுக்கவேண்டியது மிகவும் அவசியமாகும். குடிநீரைப் பெறும் நீர்நிலைகளைச் சுத்தமாக வைத்திருக்கவும் குடிநீரைச் சேமித்து வைக்கக்கூடிய திட்டங்களை மேற்கொள்ளவும் அரசாங்கம் நடவடிக்கை எடுப்பது அவசியம் என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். குறிப்பாக வடக்கில் குடிநீர்ப் பிரச்சினை பெரும்பிரச்சினையாக உள்ளது. அங்கு நிலத்தடி நீர்மட்டம் குறைந்துகொண்டே போகின்றது. அங்கு நீர்வீழ்ச்சிகள் இல்லை; பெரும் அருவி ஆறுகள் இல்லை. மாறாக குளங்கள்தாம் உண்டு. யாழ். குடாநாட்டில் 992 குளங்கள் உள்ளன. வடக்கின் வசந்தம் திட்டத்தினூடாக 23 குளங்களும் உலக உணவுத் திட்டத்தின்மூலம் 23 குளங்களும் புனரமைப்புச் செய்யப்பட்டன. ஏனைய குளங்கள் கைவிடப்பட்ட நிலையில் உள்ளன. போருக்கு முன்னர் இருந்த அதே நிலைமைதான் போருக்குப் பின்பும் காணப்படுகின்றதென்றால் குடிநீர் தட்டுப்பாடு ஏற்படுவதனைத் தவிர்க்க முடியாது. குளங்கள் புனரமைக்கப்படாத நிலைமையில்

[ගරු සොලමන් සූ. සිරිල් මහතා]

ஊர்மனைகளில் உள்ள கிணறுகளின் நீர்மட்டம் குறைந்துபோவதினால் குடிதண்ணீர் தட்டுப்பாடு அதிகமாகவுள்ளது. பருவமழை உரிய காலத்தில் கிடைக்கப்பெறாத காரணத்தினால் கிணற்று நீரை விவசாயத் துக்குப் பயன்படுத்தவேண்டிய நிலைமையும் விவசாயிகளுக்கு ஏற்பட்டுள்ளது. அகதிமுகாம் பிரச்சினைகளை வார்த்தைகளால் கூறமுடியாது. யாழ்ப்பாணக் குடாநாட்டைப் பொறுத்தமட்டில் குடிநீர் திட்டத்தில் மகாவலித்திட்டம், புத்தூர் நிலாவரைத் திட்டம், வழுக்கை ஆற்றுத் திட்டம், இரணைமடுத் திட்டம் என பல திட்டங்கள் முன்மொழியப்பட்டுள்ளபோதிலும் அவை நடைமுறைப் படுத்தப்படவில்லை. நிலத்தடி நீர் மாசடையாது பாதுகாப்பதுடன் குடாநாட்டு மக்களுக்குச் சுத்தமான குடிநீர் வசதிகளைத் தாராளமாக வழங்குவதற்கான நீர் விநியோகத் திட்டத்தையும் வடிகாலமைப்புத் திட்டத்தையும் நீர் வழங்கல் வடிகாலமைப்பு அமைச்சு மேற்கொள்ள வேண்டும் எனவும் கேட்டுக்கொள்கின் றேன். இது மாநகர சபை, நகர சபை அல்லது பிரதேச சபைகளின் வேலைத்திட்டம் எனத் தட்டிக்கழிக்க முடியாது.

கௌரவ குழுக்களின் பிரதித்தவிசாளர் அவர்களே! நெடுஞ் சாலைகள் சம்பந்தமாகவும் கூறவேண்டியிருக்கிறது. வடபகுதி பல வருட காலமாகக் கவனிக்கப்படவில்லை. இலகு பிரயாணங்களை மேற்கொள்ளக்கூடிய விதத்தில் பாதைகள் அமைக்கப்படவில்லை. அவை படிப்படியாகச் சீர்செய்யப்படுவதாக அறிகின்றோம். இந்த நெடுஞ்சாலைகளுடன் இணைக்கப்பட்டுள்ள உப வீதிகளும் புனரமைப்புச் செய்யப்படவேண்டும். அரசு தென்பகுதிகளில் தற்பொழுது நவீன சாலைகள் மற்றும் மேம்பாலங்கள் அமைக்கும் திட்டங்களைச் செயற்படுத்தி வருவதுபோன்று வட பகுதியிலும் பரீட்சார்த்தமாக அவற்றை நடைமுறைப்படுத்துவதற்கு நட வடிக்கை எடுக்கவேண்டும். பாதுகாப்புக்காக மூடப்பட்ட வீதிகள் மக்களின் நாளாந்த பாவனைக்காகத் திறந்து விடப்படவேண்டும். மேலும் பருவமழை ஆரம்பமாக இருக்கிறது. சென்ற வருட மழையின்பொழுது குடாநாடு வெள்ளக்காடானது. இதனால் பல உயிரிழப்புக்களும் சொத்து இழப்புக்களும் ஏற்பட்டன. இதற்குக் காரணம் வடிகால்கள் புனரமைப்புச் செய்யப்படாமையும் துப்புரவு செய்யப்படாமையுமே. சில கால்வாய்ப் பகுதிகளிலே இராணுவ அரண்கள் அமைக்கப்பட்டுள்ளன. காலத்துக்குக் காலம் மேற்படி வேலைத்திட்டங்களை மேற்கொள்வதற்கு உள்ளூராட்சி சபை களிடம் போதிய வருமானம் இல்லை. இது காலங்கடந்த விடயமாயினும் அமைச்சு கவனத்தில் கொள்ளவேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

யாழ்ப்பாணத்துக்கான போக்குவரத்துக்குரிய தரைவழிப்பாதை இன்றுவரையில் மக்களின் பாவனைக்காக முழுமையாகத் திறந்துவிடப்படவில்லை. யுத்தம் முடிவடைந்ததும் ஏ-9 வீதி பயணிகள் போக்குவரத்துக்காகத் திறக்கப்படும் என்று அரசாங்கம் அறிவித்திருந்தும் அது இலகுவானதாக அமையவில்லை.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே உங்களுக்கென ஒதுக்கப் பட்டுள்ள நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු සොලමන් සූ. සිරිල් මහතා**
(மாண்புமிகு சொலமன் சூ. சிறில்)
(The Hon. Soloman S. Cyril)
Sir, I want two more minutes.
இதே போலவே கடல்வழிப் போக்குவரத்தும் இழுபறி நிலையிலேயே உள்ளது. மக்கள் பல சிரமங்களின் மத்தியில் பல நாட்களாகக் காத்துக் கிடக்க வேண்டியுள்ளது. அதிக பணம் கொடுத்து விமானங்களில் பயணிப்பதற்கு சாதாரண மக்களால் முடியாது. 'வடக்கின் வசந்தம்' வேலைத்திட்டத்தின்மூலம் அபிவிருத்தியை முன்னெடுப்பதற்கு முன்பு, ஏ-9 வீதியூடாக சகல இடங்களுக்குமான போக்குவரத்தினை, முன்னைய காலங்களில் இருந்தது போன்று, சாதாரண நிலைமைக்குக் கொண்டு வரவேண்டும் என்பதே வடபகுதி மக்களின் கோரிக்கையாகும். எனவே, அரசாங்கம் மேற்படி விடயங்களில் அக்கறையுடன் செயற்படுவதோடு, யாழ். குடாநாட்டு மக்கள் மாத்திரமன்றி வன்னி முகாமில் உள்ள மக்களும் தங்கள் சொந்த இல்லிடங்களிலிருந்து வடக்கின் வசந்தத்தை அனுபவிக்கக்கூடிய விதத்தில் அதற்கு வழிசமைத்துக் கொடுக்கவேண்டுமெனவும் இந்த உயரிய சபை யிலே நான் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
கௌரவ கனகசபை அவர்கள்

**ගරු ටී. කනගසබෙයි මහතා**
(மாண்புமிகு ரி. கனகசபை)
(The Hon. T. Kanagasabai)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! எனக்கு எவ்வளவு நேரம் ஒதுக்கப்பட்டிருக்கின்றது?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
உங்களுக்குப் பத்து நிமிடங்கள் ஒதுக்கப்பட்டிருக்கின்றன.

[பி.ப. 1.07]

**ගරු ටී. කනගසබෙයි මහතා**
(மாண்புமிகு ரி. கனகசபை)
(The Hon. T. Kanagasabai)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய இந்த விவாதத்திலே பங்குகொள்வதற்குச் சந்தர்ப்பம் தந்தமையை யிட்டு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். நான் முதலிலே நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சு சம்பந்தமாகச் சில வார்த்தைகள் கூற வேண்டியிருக்கின்றது. எங்களுடைய பிரதேசத்திலே சென்ற ஆண்டு பருவப் பெயர்ச்சி மழை பொய்த்து விட்டது. அதனால் அங்கு கடுமையான வரட்சி நிலவிக் கொண்டிருக்கின்றது. நான் அண்மையிலே மட்டக்களப்புக்குச் சென்றபோது அங்கு மக்கள் குடிநீருக்கு மிகவும் கஷ்டப்படுவதைக் காணக்கூடியதாக இருந்தது. இது சம்பந்தமாக நான் அங்குள்ள அரசாங்க அதிபர், பிரதேச செயலாளர், பிரதேச சபைச் செயலாளர் ஆகியோரோடு கதைத்தேன். ஆனால், அந்த அளவுக்குப் பெரிய பலன் கிடைக்கவில்லை. எனவே, அங்கு 'பவுசர்'கள்மூலம் நீர் விநியோகித்து அந்த மக்களின் நீர்ப் பிரச்சினையை ஓரளவுக் காவது தீர்த்து வைக்குமாறு கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, நான் நெடுஞ்சாலைகள் அமைச்சுடன் சம்பந்தப் பட்ட சில விஷயங்களைப் பேச வேண்டியிருக்கின்றது. நான் அண்மையிலே கொழும்பிலிருந்து மட்டக்களப்புக்குச் சென்ற பொழுது வாழைச்சேனை வரையில் வீதிகள் விரிவுபடுத்தப் பட்டிருந்ததைக் கண்டேன். அதேபோல் பொத்துவில், அக்கரைப் பற்றுப் பகுதிகளிலிருந்து கல்முனைக்குச் செல்கின்ற வீதியும் புனரமைப்புச் செய்யப்பட்டு விரிவுபடுத்தப்பட்டிருக்கின்றது. ஆனால், அங்கு வாழைச்சேனையில் இருந்து கல்முனை வரை யுமான சுமார் 80 கிலோ மீற்றர் தூரப் பாதை மிகவும் பாதிக்கப் பட்ட நிலையிலே காணப்படுகின்றது. இதனை ஆங்கிலத்தில் சொன்னால் நன்றாக இருக்குமென்று நான் நினைக்கிறேன். When I go home via Valaichenai, I see that up to Valaichenai the road has been widened but from Valaichenai to Kalmunai nothing has been done. From Kalmunai to Akkaraipattu, the road has already been completed. I go home in my vehicle. It is very difficult to travel on this road because it is very badly damaged. They have dug small culverts and left all the stones along

the road making it very difficult to travel. Every time after coming back from home, I hand over my vehicle for repairs. I went home and came back yesterday and today I sent my vehicle for repairs. So, the Hon. Minister must take some action in this regard. I understand that this work has to be completed before July. I am glad the Hon. Minister is walking in. Hon. Minister, I am speaking about the highway up to Batticaloa. Up to Valaichenai it has been completed, thank you very much for that. The road from Valaichenai to Kalmunai, which is about 80 kilometers, is in a very bad condition. The road is not even. In trying to do something, here and there they have dug culverts. I understand this work has to be completed before July next year, but I do not think they can do it. At the rate they are doing this work, I think it will take another five years to complete it. Hon. Minister, this is a very good time because we are having dry weather. I saw a lot of people working but the work is going on very slowly. Please look into this.

**ගරු ටී. බී. ඒකනායක මහතා (මහාමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. T. B. Ekanayake - Minister of Highways)

You mean the Valaichenai Road?

**ගරු ටී. කනගසබෙයි මහතා**
(மாண்புமிகு ரி. கனகசபை)
(The Hon. T. Kanagasabai)

From Valaichenai to Kalmunai is about 80 kilometers. You have to expedite the work on that. I heard that you have handed it over to a contractor and when I checked it up from the Road Development Authority they said, "Yes, we have handed it over to a contractor." Even though they have handed it over to a contractor, they have to look into this and they must get this work expedited. Otherwise it is very difficult to travel on this road.

The second issue, Mr. Deputy Chairman, is regarding the Kallady Bridge. It is on the other side that I stay, in the Southern part. There is another bridge, the Kallaru Bridge, and it has been fully completed. On the side that I stay, there is the Oddamavadi Bridge and it is reaching completion but they have not started any work on Kallady Bridge. They have just put some gravel there. I do not know when they are going to start and finish work on this Kallady Bridge. That is a very important bridge. So when I go home, everyone is asking me, "Now what is happening to this bridge?" So, I want the Hon Minister to look into this matter too and get this work expedited.

I now get on to the projects under the Ministry of Nation Building and Estate Infrastructure Development. Sir, I find that most of the projects such as NECORD, NECCDEP, NEHRP are coming to an end within the next few months. But, this is the time opportune for them to do a good job of work in our areas because now only the people are being resettled there. Therefore, the Government, especially the Ministry of Nation Building and Estate Infrastructure must take action to extend the time frame of these projects. I understand that the Asian Development Bank which is the funding agency of these projects is prepared to extend their time frame and it is up to the Ministry to do the spade work and get them extended. Once they are extended, I am sure the people will benefit much.

The third matter on which I want to speak is about a project where I was employed. Earlier, it was called "NEIAP" and now they call it "Re-awakening Project". As you know this was a very good project. When I was working in this project, a team of officials - experts from the World Bank along with the Residential Representative of the World Bank - used to inspect the worksite every six months and they did monitor the project. If there were any lapses or shortcomings, they took immediate action to rectify it. We, as workers of that project, were on pins those days. But, now the NEIAP is not active as in those days. I read in one of the newspapers, that this project has contributed much towards the development of agriculture in the Eastern region as well as in the Northern region. Mr. Deputy Chairman, I am very much disappointed about the present situation. I am sorry that the Hon. Minister concerned is not here now. When I spoke to him before, he said that he would organize a meeting to review the progress of this "Re-awakening Project", but so far it has not been done. I checked up from the Secretary to the Ministry of Nation Building and Estate Infrastructure Development and he said that he would organize a progress review meeting in Colombo but I suggested that it should be held in Batticaloa because only then we can achieve some good results. Sir, these are the matters I want to bring to your notice.

Thank you very much.

[අ. භා. 1.17]

**ගරු රෝහණ දිසානායක මහතා (නාගරික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க - நகர அபிவிருத்தி அமைச்சர் )
(The Hon. Rohana Dissanayake - Minister of Urban Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන 1,715ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයත්, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයත්, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයත් පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේදී අපගේ අමාත්‍යාංශයෙන් කරන කටයුතු සම්බන්ධයෙන් වචනයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටු වනවා.

අද මේ රුපියල් රුපියල් මිලියන 1,715ක පරිපූරක ඇස්තමේන්තුව අනුමත වූ විට දෙහිවල-ගල්කිස්ස, ඒ වාගේම මොරටුව මහ නගර සභා සීමාවල ක්‍රියාත්මක කරන ලුනාව ව්‍යාපෘතිය මඟින් අපට තවත් විශාල වැඩ කටයුතු ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි. මේ ව්‍යාපෘතිය යටතේ අද ඒ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු රාශියක් ක්‍රියාත්මක කරන්න අපිට

[ගරු රෝහණ දිසානායක මහතා]

අවස්ථාව ලැබිලා තිබෙනවා. ලුනාව පරිසර ප්‍රවර්ධන හා පරිසර සංවර්ධන ව්‍යාපෘතිය මීට වසර කීපයකට ඉස්සර වෙලා -2002 දී- නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ අපි ආරම්භ කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පුංචි වැස්සක් ආවත් ජලයට යට වන, ජලයෙන් පීඩා විඳින ජනතාවක් ජීවත් වන ප්‍රදේශයක් මේක. මම හිතන හැටියට ඔවුන්ගේ ජීවිතවලට අනාගතයක් තිබුණේ නැහැ. ඔවුන්ගේ ජීවිත ගැන විශ්වාසයක් තිබුණේ නැහැ. හරියට ඒ කාලයේ යුද්ධයෙන් විපතට පත් වූ ජනතාව වාගෙයි. ඒ විධියට ජීවිත පිළිබඳව කවදාවත් විශ්වාසයක් නොතිබූ ජනතාවට මේ ලුනාව පරිසර ප්‍රවර්ධන සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය තුළින් අද විශාල සේවයක් ලබා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ සියලු දෙනාම ඒ ප්‍රතිලාභ ලබන පවුල් බවට පත් වන්න අවස්ථාව උදා වෙලා තිබෙනවා.

මොරටුව මහ නගර සභා සීමාව තුළ ඉඩම් ගොඩ කිරීම, ඒ ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂණ කටයුතු, ජල පහසුකම් ලබා දීම, විදුලිය පහසුකම් ලබා දීම මේ ව්‍යාපෘතිය යටතේ සිද්ධ කරනවා. ඒ මඟින් ඔවුන් මෙතෙක් කර ගෙන ආපු ඔවුන්ගේ ආර්ථික කටයුතු ක්‍රියාවලිය ඉස්සරහට ගෙන යන්න, සමස්තයක් විධියට ඔවුන්ගේ ජීවන තත්ත්වය යහපත් කරන්න අපිට අවස්ථාව ලැබිලා තිබෙනවා. අතිගරු ජනාධිපති තුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළින් ඒ සඳහා නායකත්වය ලබා දෙනවා. විශේෂයෙන්ම නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍ය අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. අනුර දසනායක මහත්මයාත්, කීර්ති ජයවර්ධන මහත්මයාත් මේ සඳහා නොමඳ සහයෝගයක් ලබා දෙනවා.

වැස්සක් එන කොට නිරන්තරයෙන්ම ජලයට යට වුණු මේ ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටු වන්න මේ තුළින් අපට හැකි වෙලා තිබෙනවා. මම හිතන හැටියට ලුනාව කළපුව අජීවී කළපුවක් බවට පත් වෙලායි තිබුණේ. එහි කිසිම ජීවයක් තිබුණේ නැහැ. මළ කළපුවක් බවට පත් වෙලා තිබුණු තැනක්. කිසිම ආකර්ෂණීය බවක් තිබුණේ නැහැ. ඒ ප්‍රදේශයේ අලුතෙන් මහා මාර්ග ඉදි කරන්න අප කටයුතු කළා. අලුතෙන් බෝක්කු 103ක් ඉදි කරන්නත් අපට පුළුවන් වුණා. අලුතෙන් පාලම් හයක් ඉදි කරලා ඒ ප්‍රදේශයේ මං මාවත් එකිනෙක යා කරන්න අපිට හැකියාව ලැබුණා. ඒ වාගේම මේ ලුනාව ව්‍යාපෘතිය නිසා ප්‍රධාන ඇළ මාර්ග කිලෝමීටර් හතක් දුර සංවර්ධනය කරන්න පුළුවන් වුණා. ඒ වාගේම අතුරු ඇළ මාර්ග කිලෝමීටර නවයකුත් සංවර්ධනය කරන්න පුළුවන් වුණා. තෘතීයව, සමස්තයක් වශයෙන් ඇළ මාර්ග කිලෝමීටර් 60ක් අපිට මේ තුළින් සංවර්ධනය කරන්න පුළුවන් වුණා.

ඒ වාගේම ලුනාව ව්‍යාපෘතිය තුළින් නව මාර්ග කිලෝමීටර් 16ක් ඉදි කිරීමට අපට හැකියාව ලැබුණා. සමස්තයක් වශයෙන් ගත්තාම ඒ ප්‍රදේශයේ නව මාර්ග 89ක් සංවර්ධනය කරන්න අපට අවස්ථාව ලැබුණා. අද මේ පරිපූරක ඇස්තමේන්තුව යටතේ මුදල් ලබා ගන්න ලුනාව ව්‍යාපෘතියෙන් මේ වන විට පවුල් -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
තව විනාඩියකින් අවසන් කරන්න.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
සම්පූර්ණ කාලය විනාඩි 10ද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
සම්පූර්ණ වෙලාව විනාඩි 8යි.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අජීවී කලාපයක්, ඒ වාගේම මළ කලාපයක්ව පැවැති ඒ ප්‍රදේශයේ සම්පූර්ණ ජන ජීවිතය යහපත් කරන්න, ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් යහපත් කරන්න, ඔවුන්ගේ ජීවිතවලට විශ්වසනීයබව ඇති කරන්න නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලුනාව පරිසර හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය තුළින් අද අපට පුළුවන් වෙලා තිබෙනවා. අපි ඔවුන් එක්ක කථා කළා. ඔවුන් ඉතාම සුබවාදීව ඉතාම සතුටෙන් කථා කරන්නේ. එදා පුංචි වැස්සක් වැස්සාම ඔවුන්ට තිබුණු අවිශ්වසනීය බව අද නැහැ. මේ ලුනාව පරිසර හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය නිසා අද ඔවුන් ආරක්ෂා වෙලා සිටිනවා; ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත වෙලා තිබෙනවා. විශේෂයෙන් මේ රටේ උතුරු නැඟෙනහිර ප්‍රදේශ ඇතුළු මේ රටේ සමස්ත ප්‍රදේශ සංවර්ධනය කිරීමේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට පුළුවන් වෙලා තිබෙනවා, මේ සියලු අමාත්‍යාංශ හරහා, මේ ව්‍යාපෘති හරහා උතුරත්, දකුණත්, නැඟෙනහිරත්, බස්නාහිරත් සමස්ත රටම ආවරණය වුණු සංවර්ධන ව්‍යාපෘතියකට යන්න. එක පැත්තකින් රජය ගෙන යන මඟ නැඟුම, ගම නැඟුම, ජාතික සවිය වැනි වැඩ පිළිවෙළ හරහා, නොයෙක් ව්‍යාපෘති හරහා - මහා පරිමාණ ව්‍යාපෘති හරහා- නගරවලට මහා පරිමාණ ජල ව්‍යාපෘති ලබා දෙන්න, අධිවේගී මාර්ග ක්‍රියාත්මක කරන්න, ගමේ තිබෙන පාර කොන්ක්‍රීට් කරන්න, එම සංවර්ධන කටයුතු කරන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ නිසා මේ සඳහා සියලු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතියි.

[අ. භා. 1.23]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අද දිනයේ තවත් විශාල ප්‍රමාණයක - රුපියල් කෝටි 2,237ක- පරිපූරක ඇස්තමේන්තු අනුමත කරන වෙලාවේදී 2009 අවුරුද්ද දිහාවට අපි ආපස්සට හැරිලා බැලුවොත්, මේ 2009 අවුරුද්දේ අපේ පාර්ලිමේන්තුව මූල්‍ය පරිපාලනය පැත්තෙන් ගත්තාම සම්පූර්ණ අකාර්යක්ෂම ආණ්ඩුවක් බවට පත් වෙලායි කියන එක ඔප්පු කර තිබෙන බව පෙනෙනවා. නොවැම්බර් මාසයේ ඉදිරිපත් කරන්න නියමිතව තිබෙන අය වැය වෙනුවට අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන්න තමයි ආණ්ඩුව තීන්දු කර තිබෙන්නේ. හැබැයි ඒ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් වන්නේ 2009 අවුරුද්දට විතරක් රුපියල් මිලියන 54,657ක්; කෝටිවලින් ගත්තොත් රුපියල් කෝටි 5,462ක පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරලා. අපි දන්නේ නැහැ, අය වැය වෙනුවට අතුරු සම්මත ගිණුම එන ඉදිරි කාලය තුළ තව කොච්චර පරිපූරක ඇස්තමේන්තු එයිද කියා. එතකොට මේ පරිපූරක ඇස්තමේන්තුවක් කියලා කියන්නේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැයේදී ඇස්තමේන්තු නොකළ, ආදායම් නැති ඍජු වියදමක්. ආදායම් මාර්ග නැතුව ඒ ඍජු වියදම සොයන්නේ කොහොමද? මේ පරිපූරක ඇස්තමේන්තු රුපියල් කෝටි 5,000කින් වැඩි කළාම, ඒ කියන්නේ ගිය අවුරුද්දේ -2008-අය වැය ඉදිරිපත් කරන වෙලාවේ ඇස්තමේන්තු කළ අය වැය හිඟයට වඩා කෝටි 5,000ක අය වැය හිඟය වැඩි වීමක් වනවා. ඒක තමයි ප්‍රශ්නය. රටට සංවර්ධනය අවශ්‍යයි. රටට පාර අවශ්‍යයි. රටට ජල සම්පත අවශ්‍යයි. රටට සංවර්ධන

ක්‍රියාදාමයන් අවශ්‍යයි. ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. රටට අවශ්‍ය කරන ඒ සංවර්ධන ක්‍රියාදාමය ආණ්ඩුවක් හැටියට සැලසුම් කරන්නේ කොහොමද? මොකද, අපි මේ සෙල්ලම් කරන්නේ, අපි මේ වියදම් කරන්නේ මහ ජනතාවගේ මුදල්. ඒවා මහ ජනතාවගේ බදු මුදල් වන්න පුළුවන්. මොකද, ආණ්ඩුවේ ආදායමෙන් සියයට 89ක් බදු ආදායමයි. බදු නොවන ආදායම තිබෙන්නේ සියයට 11යි. ඒ බදු ආදායමෙන් තමයි අපි මේ ඔක්කොම ජාති කරන්නේ. අපට කියන්න පුළුවන්, විදේශ ණය ලැබී තිබෙනවා, විදේශ ප්‍රදානයන් ලැබී තිබෙනවා කියලා. විදේශ ප්‍රදානයක් ගත්තොත්, විදේශ ණයක් ගත්තොත් අපේ නූපන් පරම්පරාවත් ඒ ණය මුදල ගෙවන්න ඕනෑ. ඒ ණය ප්‍රමාණය අපේ රටේ ජනගහනයෙන් බෙදුවාම, අද හැම පුරවැසියකුම, හැම දරුවකුම රුපියල් ලක්ෂ දෙකකට ආසන්න මුදලකට ණයකාර යෙක් කරලා තිබෙනවා.

එතකොට දැන් ආණ්ඩුව කල්පනා කරන්න ඕනෑකම තිබෙන්නේ මොකක්ද? එක පැත්තකින් මේ ආණ්ඩුවට පුළුවන්කමක් ලැබී නැහැ, 2010 අවුරුද්දේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න. ආණ්ඩුවට පුළුවන්කමක් ලැබී නැහැ, ආදායම ඇස්තමේන්තු කරන්න. එහෙම තිබියදී ආණ්ඩුව තමන්ගේ වියදම් වෙනුවෙන් මේ පරිපූරක ඇස්තමේන්තු මඟින් මුදල් වෙන් කර ගෙන තිබෙනවා. මෙතැන තිබෙන බරපතළම තත්ත්වය මේකයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. කථා කරන හුඟක් දෙනෙක් දැන් කියන්නේ, ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යාංශ යෙන්, මහාමාර්ග අමාත්‍යාංශයෙන් ඉදි කරන පාලම්, අධිවේගී මාර්ග, ගුවන් පාලම් වෙනුවෙන් තමයි මේ සංවර්ධන ක්‍රියාවලිය පටන් ගත්තේ කියලායි.

රුපියල් බිලියන 3ට වඩා වැඩි විදේශ මූල්‍ය ප්‍රදානයන් සහිත ව්‍යාපෘති ලැයිස්තුවක් සහ ශ්‍රී ලංකා රජයෙන් මූල්‍ය ප්‍රතිපාදනය කරන ව්‍යාපෘති ලැයිස්තුවක් මා ළඟ තිබෙනවා. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ තිබෙන මේ ලැයිස්තුව පාර්ලිමේන්තුවේ Research Section එකෙනුයි මා ලබා ගත්තේ. මේ ලැයිස්තුව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින් මා එය **සභාගත*** කරනවා. ඒ ව්‍යාපෘති ලැයිස්තුවේ තිබෙනවා, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය - Colombo-Katunayake Expressway එක - පිළිබඳ විස්තර. 2009 අවුරුද්දට කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සඳහා වෙන් කරපු ප්‍රමාණය රුපියල් මිලියන 13,202යි. මේ වන කොට වියදම් කර තිබෙන්නේ රුපියල් මිලියන 2,309යි. ඒ කියන්නේ ප්‍රගතිය සියයට 17යි. පිට රවුම අධිවේගී මාර්ගය ව්‍යාපෘතිය සඳහා 2009 අවුරුද්දට ප්‍රතිපාදන වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 6,085යි. වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 88යි. ඒ කියන්නේ සියයට 1.45යි. Dam Safety and Water Resources Planning Project - National Water Management Improvement Project - සඳහා වෙන් කරපු මුදල රුපියල් මිලියන 1,675යි. දැනට වැඩ කර තිබෙන්නේ රුපියල් මිලියන 38කයි. ප්‍රගතිය සියයට 2.28යි. ඊ ළඟට උමා ඔය ව්‍යාපෘතිය. දැන් ඔබතුමන්ලා ඉරාන ජනාධිපතිතුමා ගෙන්වා ගෙන විශාල උත්සවයක් පැවැත්වුවා. ඒ උත්සවයට රුපියල් ලක්ෂ 260ක් වියදම් කරනවා. විවෘත කිරීමේ කුලුනු දෙකට රුපියල් ලක්ෂ 55ක් වියදම් කරනවා. උත්සවයට රුපියල් ලක්ෂ 260ක් වියදම් කරපු ව්‍යාපෘතියට 2009 අවුරුද්දට වෙන් කළා, රුපියල් මිලියන 6,000ක්. හැබැයි ඒකෙන් වැඩ කරලා තිබෙන්නේ රුපියල් මිලියන 108කයි. ඒ කියන්නේ ප්‍රගතිය ගත්තොත් සියයට 1.8යි. මේ උමා ඔය ව්‍යාපෘතිය සඳහායි. මහාමාර්ග ඇමතිතුමනි, මහාමාර්ග ඇමතිතුමා හැටියට ඔබතුමාම 2009 අගෝස්තු 21 වන දා පාර්ලිමේන්තුවට උත්තරයක් දුන්නා. මේ වියදම් කරපු රුපියල් මිලියන 108න් රුපියල් මිලියන 26ක් ගිහින් තිබෙන්නේ උත්සවයට. ඒ මුදල උත්සවයේ වියදම් විතරයි. මොනවාද ඒ? මා එය නැවත අවධාරණය කරනවා. දැන්වීම් ප්‍රචාරක කටයුතුවලට රුපියල් ලක්ෂ 85යි; සංග්‍රහ කටයුතුවලට රුපියල් ලක්ෂ 29යි; සංස්කෘතික අංගවලට රුපියල් ලක්ෂ 16යි; මාර්ගය සැකසීමට, අලුත්වැඩියාවට සහ සැරසිලි කටයුතුවලට රුපියල් ලක්ෂ 55යි; අර ඔක්කොමත් කරලා වෙනත් වියදම් රුපියල් ලක්ෂ 20යි; ස්මාරක කුලුනු දෙක සඳහා රුපියල් ලක්ෂ 55යි. එතකොට උමා ඔය ව්‍යාපෘතියේ 2009 අවුරුද්දේ ප්‍රගතිය සියයට 1.8යි. හැබැයි ඒකේ සමාරම්භක උත්සවයට වියදම් කළා, රුපියල් ලක්ෂ 260ක්. මේ විදේශ ව්‍යාපෘතිවල ප්‍රගතියයි. තව තිබෙනවා, Conflict Affected Area Rehabilitation Project. ඒ කියන්නේ විපතට පත් වුණු අය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2009 අවුරුද්දට වෙන් කළා, රුපියල් මිලියන 1,325ක්. ඒකෙන් වැඩ කළේ රුපියල් මිලියන 604ක විතරයි. ඒ කියන්නේ මොකක්ද? ඔබතුමන්ලා කියනවා නේ, අවතැන් වුවන් යළි පදිංචි කරවීමේ කටයුතු සඳහා කරන ලද වියදම් ගැන. අන්න ඒවා. ඊ ළඟට ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතියට - ඒක JBIC ව්‍යාපෘතියක් - වෙන් කළ මුදල මිලියන 2,600යි. ඒකේ මොකුත් ප්‍රගතියක් නැහැ.

මා කලින් කිව්වේ විදේශ ප්‍රදානයන්ගෙන් ලැබුණු ව්‍යාපෘති; විදේශ මූල්‍ය ව්‍යාපෘති. දැන් මා සඳහන් කරන්න යන්නේ ශ්‍රී ලංකා රජයේ මුදල් යොදවාපු ව්‍යාපෘති. ඉන් එකක් තමයි, Upgrading & Double Tracking Coast Line Railway Colombo-Matara. කොළඹ - මාතර ඊ ළඟ railway එක හදන්න -ඒකත් විදේශ ව්‍යාපෘතියක්. Indian Credit Line එකෙන් ගත්තේ- 2009 වසරේ වෙන් කළේ රුපියල් මිලියන 2,800යි. වියදම රුපියල් මිලියන 27යි. ප්‍රගතිය සියයට 0.97යි. ඊ ළඟට Jaffna Peninsula Water Supply & Sanitation Project එක ADB ව්‍යාපෘතියක්. ඒකට ඇස්තමේන්තු කළ මුදල රුපියල් මිලියන 11,800යි. ඒ සඳහා වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන දෙකයි. නමුත් කරපු වැඩක් නැහැ. මෙම ව්‍යාපෘතිය ගැන සඳහන් වෙලා තිබෙන්නේ "Agreement not yet signed." කියලායි. Ratnapura Water Supply Development Project එකට ඇස්තමේන්තු කළ මුදල රුපියල් මිලියන 9,742යි. ඒ සඳහා රුපියල් මිලියන 60ක් වෙන් කරලා තිබෙනවා. නමුත් වැඩ කරලා නැහැ. ඒකට හේතුව වශයෙන් සඳහන් කර තිබෙන්නේ tender evaluation එකේ ප්‍රමාදයක් - delay - ගැනයි. විදේශ ව්‍යාපෘති ඔක්කොම ගත්තොත් -ලංකාවට මේ වන කොට ලැබී තිබෙන රුපියල් බිලියන තුනට වඩා වැඩි විදේශ ව්‍යාපෘතිවල අවසාන ප්‍රගතිය ගත්තොත්- 2009 අවුරුද්දට රුපියල් මිලියන 85,803ක් වෙන් කරලා මිලියන 26,735ක වැඩයි කරලා තිබෙන්නේ ඔක්කොම හොරකම් කරපු ඒවාත් එක්ක. ඒ කියන්නේ ප්‍රගතිය සියයට 31යි කියන එකයි. මේ විදේශ ව්‍යාපෘති තුනෙන් එකක්වත් සම්පූර්ණ නැහැ. ඒ කියන්නේ මොකක්ද? ණය අර ගෙන, ප්‍රදානයන් ලැබිලා තිබෙන බිලියන 3ට වඩා වැඩි විදේශ ව්‍යාපෘතිවලින් තුනෙන් එකක්වත් රජයට තවම සම්පූර්ණ කරන්න බැරි වෙලා තිබෙනවා. ඊට පස්සේ තිබෙනවා -

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා (ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா - நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சர்)

(The Hon. A. L. M. Athaullah - Minister of Water Supply and Drainage)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කොහොමද කියන්නේ හොරකම් කරලා තිබෙනවා කියා?

***** *කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒ හොරකම් කර තිබෙන ක්‍රම දන්නේ ඔබතුමන්ලා. ඒක අපි දන්නේ නැහැ.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

නැහැ. ඒක වැරදියි. ඒක withdraw කරන්න. එහෙම කියන්න එපා. ඒකේ ප්‍රමාදය කියලා කියන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

හරි. හොරකම් කළා කියන්නේ- [බාධා කිරීමක්]

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

ඒකට කියන්න එපා හොරකම් කළා කියලා. ඒක වැරදියි. කතා කරන්න ඉඩ දුන්නාය කියලා ඔක්කෝම කතා කරන්න බැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒවාත් එක්ක -including those- කියලායි කිව්වේ. ඒවාත් එක්ක.

ඊ ළඟට ශ්‍රී ලංකා රජයේ මුදල් යොදවපු, "mega projects over Rupees three billion" ගැන කියන්නම්. එකක් තමයි, Moragahakanda Kaluganga Development Project එක; මොරගහකන්ද ව්‍යාපෘතිය. ඔබතුමන්ලා සෑහෙන්න ඒ ගැන කතා කරනවා. ඒ ව්‍යාපෘතියට රුපියල් මිලියන 2,388යි 2009 අවුරුද්දේ වෙන් කිරීම. ඒකෙන් වැඩ කරලා තිබෙන්නේ රුපියල් මිලියන 419ක. ඒ කියන්නේ ප්‍රගතිය සියයට 17.58යි කියන එකයි. [බාධා කිරීමක්] ඉඳ ගන්න. ඔබතුමා කතා කරලා ඉවරයි. ඊ ළඟට E-NIC Project එක. මේ ව්‍යාපෘතිය සඳහා Internal Administration Ministry එකෙන් "ඊ" වැඩසටහන යටතේ වෙන් කර තිබෙනවා රුපියල් මිලියන 637ක්. වැඩ කළේ රුපියල් මිලියන 5.6කයි. ඒ කියන්නේ, ලක්ෂ 56යි. ප්‍රගතිය සියයට 0.88යි. ඊ ළඟට බිම් සවිය ව්‍යාපෘතිය. මේක ඔබතුමන්ලා සෑහෙන්න කෑ ගහන එකක්. මේක ක්‍රියාත්මක කරන්නේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයෙන්. මේ ව්‍යාපෘතිය සඳහා වෙන් කළා රුපියල් මිලියන 500ක්. වැඩ කරලා තියෙන්නේ රුපියල් මිලියන 87කයි. ප්‍රගතිය සියයට 17.4යි. ඊ ළඟට දෙ වැනි අන්තර්ජාතික ගුවන් තොටුපොළ ව්‍යාපෘතියට වෙන් කරපු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 595යි, 2009 අවුරුද්දට. ඒකෙන් වැඩ කර තිබෙන්නේ රුපියල් මිලියන 17.8කයි. ප්‍රගතිය සියයට 2.99යි. ඊළඟට, Matara-Kataragama Railway එක දිගු කිරීමේ ව්‍යාපෘතියට 2009ට වෙන් කර තිබෙනවා රුපියල් මිලියන 810ක්. වැඩ කරලා තියෙන්නේ රුපියල් මිලියන 112කයි. ප්‍රගතිය සියයට 13යි. මෙන්න මේ ආදී වශයෙන් ශ්‍රී ලංකා රජය රුපියල් බිලියන තුනට වඩා මුදල් වෙන් කර ගත්ත මෙම ව්‍යාපෘති සඳහා වෙන් කළ රුපියල් මිලියන 12,178කින් වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 3,303යි; අවසාන ප්‍රගතිය තිබෙන්නේ සියයට 27යි. අඩු තරමින් තුනෙන් පංගුවක්වත් වැඩ කරලා නැහැ. මා මේ කිව්වේ, ශ්‍රී ලංකා රජයේ මුදල් වෙන් කළ ව්‍යාපෘතිවල, ශ්‍රී ලංකා රජය ණය හෝ ප්‍රදානයන් වශයෙන් අරගත්ත විදේශ ව්‍යාපෘතිවල අවසාන ප්‍රගතිය. කල්පනා කරලා බලන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊ ළඟට ප්‍රශ්නය වී තිබෙන්නේ, එහෙම තිබියදී දැන් ඔබතුමන්ලා අලුතින් නව ව්‍යාපෘතිවලට ආරාධනා කරන්න, නව පටන් ගැනීම් කරන්න, සංවර්ධන කතා බහට අලුතින් පරිපූරක ඇස්තමේන්තු ඇති කර ගන්න කටයුතු කරන එකයි. මා කිව්වේ ඒකයි. දැන් කෝටි පන්දහසකට වැඩිය අය වැය හිඟය ඉක්ම වන පරිපූරක ඇස්තමේන්තු අරගෙන තිබෙනවා. ගරු අතාවුල්ලා අමාත්‍යතුමා මගෙන් ඉස්සෙල්ලා හොඳ ප්‍රශ්නයක් ඇහුවා. "හොරකම් කළා" කියා කියන්න එපා කිව්වා. දැන් මා එක කාරණාවක් ගැන විතරක් කතා කරන්නම්. මේ තියෙන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හය වැනි පාර්ලිමේන්තුවේ දෙ වැනි සැසි වාරයට විදේශ ආධාර ව්‍යාපෘති පිළිබඳ ඉදිරිපත් කරපු විගණකාධිපතිතුමාගේ වාර්තාව. මේ වාර්තාවේ තිබෙනවා, කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ගැන. දැන් මේ ඔබතුමන්ලා කයිවාරු ගහන ව්‍යාපෘතියක්. ඒ ව්‍යාපෘතියට මොකද වුණේ? එම වාර්තාවේ මේ විධියට සඳහන්ව තිබෙනවා:

"මිලියන 9,516ක්වූ කොන්ත්‍රාත් මුදලින් කොන්ත්‍රාත්තුව නතර කරන අවස්ථාවේදී වන්දි ද ඇතුළුව මිලියන 5,444ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. පසුව ඉතිරි කාර්යයන් මිලියන 22,800කින් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රංශයේ සමාගමක් සමඟ 2006 ඔක්තෝබර් 27 වන දා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙම වැයම ද සාර්ථක නොවූ අතර ඉතිරි කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා ණය ප්‍රදානකරුවෙකු හෝ කොන්ත්‍රාත්කරුවෙකු මාර්ග සංවර්ධන අධිකාරිය බලාපොරොත්තුවෙන් සිටී."

ඒ කියන්නේ, මොකක්ද? ව්‍යාපෘතියක් පටන් ගත්තා. සැලසුමක් හැදුවා. සැලසුම හදලා අන්තිමේදී, දැන් බලා ගෙන ඉන්නේ මොකද? කවුරු හරි කොන්ත්‍රාත්කරුවෙක් වඩිනකන්.

උමාඔය ව්‍යාපෘතිය බලන්න. ඒක ඔබතුමන්ලා දන්නවා. මෙතුමා උත්තර දුන්නා. ඒ ව්‍යාපෘතිය පටන් ගන්න උත්සවයට රුපියල් ලක්ෂ 260ක් වියදම් කළා. සමාරම්භක කුලුණුවලට ලක්ෂ 55යි. සැරසිලිවලට ලක්ෂ 29යි. හැබැයි ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් නැහැ. ව්‍යාපෘතියට මුල්ගල් තියනවා; සරසනවා; උත්සවය කරනවා. හැබැයි කොන්ත්‍රාත්කාරයෙක් එනකන් බලා ගෙන ඉන්නවා. නැත්නම් ණය දෙන්න මිනිහෙක් එනකන් බලා ගෙන ඉන්නවා. මේක තමයි තත්ත්වය. හැබැයි ඒ තත්ත්වය එහෙම තියෙද්දී, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කරුණුත් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්නය කියා ඉල්ලා සිටිනවා. මුදල් අමාත්‍යාංශයෙන් මේ තොරතුරු ලබා ගත්තෙත්. 2009 දෙ වැනි කාර්තුව අවසාන වන කොට අමාත්‍යාංශ 55කට අදාළව -ඒ කියන්නේ එක අමාත්‍යාංශයකට ඇමතිවරු තුන් හතර දෙනෙක් ඉන්නවා. හැබැයි උපදේශක කාරක සභා තිබෙන්නේ 55යි. ඒ 55ට අදාළව- ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම් කර තිබෙන ආකාරය මෙතැන තිබෙනවා. කාල වේලාව ඉක්ම යන නිසා මම මේක සම්පූර්ණයෙන් -අමාත්‍යාංශයෙන්, අමාත්‍යාංශයට- කියවන්න යන්නේ නැහැ. මෙතැන කෘෂිකර්ම ඇමතිතුමා සිටියා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම්වලින් 2009 අවුරුද්දේ දෙ වැනි කාර්තුව අවසාන වන කොට වැඩ කර තිබෙන්නේ සියයට 8.35යි. හැබැයි ඒකේ පුනරාවර්තන වියදම්, පඩිනඩිවලට වරප්‍රසාදවලට ඔක්කොටම සියයට 65ක් වියදම් කර ගෙන තිබෙනවා. ඒ කියන්නේ අමාත්‍යාංශයට වෙන් වන පුනරාවර්තන වියදම්වලින් සියයට 65ක් වියදම් කරලා. ප්‍රාග්ධන වියදම්වලින් වැඩ කර තිබෙන්නේ සියයට 8යි. සමස්තයක්

වශයෙන් තර්ක කරන්න පුළුවන්, කියන්න පුළුවන්, අන්තිම වන කොට අපි කොහොම හරි කරනවාය කියලා. අපි දන්නවා, අන්තිම වන කොට කරන හැටි. අන්තිම වන කොට තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව එන්නේ. අන්තිම වන කොට වියදම් කෙරිලා, අවසානයේ දැන් එනවා කෝටි 5,000ක පරිපූරක ඇස්තමේන්තු. දෙ වැනි කාර්තුව අවසාන වෙද්දී මේ ආණ්ඩුවේ - ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ- අමාත්‍යාංශ 55ක අවසාන ප්‍රගතිය බලන්න. දෙ වන කාර්තුව අවසාන වන කොට ප්‍රාග්ධන වියදම්වලින් වැඩ කර තිබෙන්නේ සියයට 28.37යි. ඒ කියන්නේ තුනෙන් එකක්වත් නැහැ කියන එකයි. හැබැයි ඒ වනකොට පුනරාවර්තන වියදම්වලින් සියයට 50කට ආසන්න ප්‍රමාණයක් වියදම් කරලා ඉවරයි. ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. ඒ කියන්නේ මෙතැන හිතන්න ඕනෑ දෙයක් තිබෙනවා. ඔබතුමන්ලා එක පැත්තකින් අමාත්‍යාංශවලට වෙන් කර ගත්ත ප්‍රාග්ධන වියදම්වලින් අඩු තරමේ තුනෙන් පංගුවකවත් ප්‍රතිඵලයක් ගන්න උත්සාහ කරලා නැහැ. එතකොට විදේශ ණයවලින් ලැබුණු ඒවා ගැනයි මා ඉස්සෙල්ලා කථා කළේ. ඒවායේ ප්‍රතිඵලය පල්ලෙහා තියෙන්නේ. සමහර ව්‍යාපෘතිවල- [බාධා කිරීමක්] සමා වෙන්න, ඔබතුමා. මට පොඩි වෙලාවයි තිබෙන්නේ. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී කියන්න. [බාධා කිරීමක්]

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

2010 දී තමයි ඒක පටන් ගන්නේ. Finalize කරලා තිබෙන්නේ preliminary workවලට විතරයි. ඔබතුමාට කවුදෝ වැරදි තොරතුරු දීලා තිබෙනවා. තවම පටන් ගත්තේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ website එකෙන් මම මේ තොරතුරු ගත්තේ.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

තවම පටන් ගත්තේ නැහැ. 2010 දී තමයි ADB එක පටන් ගන්නේ. තවම පටන් ගත්තේ නැහැ. වැරදි තොරතුරු අර ගෙන ඇවිල්ලා මෙතැන කථා කරන එක හොඳ නැහැ. ඒක තවම පටන් ගත්තේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ADB ව්‍යාපෘතියට මම දන්නා තරමට ඔබතුමන්ලා කරපු total estimation එක මිලියන 11,800යි. ඒ මිලියන 11,800න් දැනට වැඩ කෙරිලා තිබෙන්නේ මිලියන 2යි. ඒකේ උත්තරය තමයි-

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

2010 දී තමයි ඒක පටන් ගන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔව්. "Agreement not yet signed". [බාධා කිරීමක්] ඇමතිතුමා, මම ගත්තේ මේ සම්පූර්ණයෙන්ම තියෙන ව්‍යාපෘති ටික.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

ඒක නිසා ඒක පොඩ්ඩක් බලලා පරිස්සමින් කථා කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

සම්පූර්ණයෙන්ම ගත්ත ව්‍යාපෘති ටික. [බාධා කිරීමක්] මේ සම්පූර්ණයෙන්ම ගත්ත ව්‍යාපෘති ටික. ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. ඔබතුමන්ලා තවම agreement sign නොකරපු ව්‍යාපෘතිවලට තොරණ ගහනවා. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. Agreement sign කරලාත් නැහැ. හැබැයි තොරණ ගහනවා. [බාධා කිරීමක්] Jaffnaවල තොරණ ගැහැව්වාද නැද්ද කියන්න මම දන්නේ නැහැ. Agreement එක sign නොකර තොරණ ගහනවා. ශක්‍යතා අධ්‍යයන වාර්තාව හදන්නේ නැතිව උත්සවය ගන්නවා. දැන් ඔබතුමන්ලා පිළිගන්නවා නේ, උමාඔය ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් හදන්නේ නැතිව ලක්ෂ 260ක් වියදම් කළා කියලා. ඒක පිළිගන්නේ නැද්ද ඔබතුමන්ලා? කුලුනු දෙකක් හැදුවා. ලක්ෂ 55ක් වියදම් කරලා විවෘත කරන්න කුලුනු දෙක හැදුවා, ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් නැතුව. ඒවා නාස්තිකාර වියදම්. ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. මේවා මහජන මුදල්. මෙතැන ආණ්ඩු පක්ෂයෙන් හෝ විපක්ෂයෙන් හෝ කිසිම මන්ත්‍රීවරයකුගේ, ඇමතිවරයකුගේ පෞද්ගලික වැටුපකින් හෝ මේ සල්ලි යන්නේ නැහැ. එහෙම කියන්නේත් නැහැ. එහෙම කරන්නත් බැහැ. මේවා මහජන මුදල්. ජනතාවගේ මුදල්. ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් බෝඩ් දමලා, සැරසිලි කරලා, උත්සව තියලා, මල් වෙඩි ගහලා, තොරණ ගහන එක නොවෙයි කරන්න ඕනෑ. රටක සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ සංවර්ධන සැලැස්මයි ක්‍රියාත්මක වන්න ඕනෑ. ඒ සංවර්ධන සැලැස්ම අනුවයි වැඩ කෙරෙන්න ඕනෑ. [බාධා කිරීමක්] අනේ ඇමතිතුමනි, ඔබතුමාත් අපිත් බබ්බු නොවෙයි නේ. ඔබතුමා කියාවි තොරණ ගහන්නේ මිනිස්සුය කියා; "මහරජාණෙනි, ඔබ පිළිගන්නවා"ය කියා තොරණ ගහන්නේ මිනිස්සුය කියා. ඒක නේ ගිහිල්ලා "මම මහරජා නොවෙයි, මම භාරකාරයායා" කියන්නේ. මිනිස්සුයි ඒ තොරණ ගහන්නේ. ඒ මිනිස්සු මාර්ග සංවර්ධන අධිකාරියේ මිනිස්සු, එහෙම නැත්නම් UDA එකේ මිනිස්සු. ඒ මිනිස්සු තමයි මේවා ගහන්නේ. ඒ අය පඩි ලබන මිනිස්සු. අවසානයේ ඒ අයගේ පඩිය ගෙවන්නේත් මේ රටේ ජනතාව. ඔය තොරණ ගහන මිනිසුන්ගේ පඩිය ගෙවන්නේත් මහ ජනතාවයි. ඒකයි ඇත්ත දේ. අපි දන්නවා නේ කෙරෙන විදිය. නැද්ද ඇමතිතුමනි? [බාධා කිරීමක්] ඒ මිනිස්සු ගැන අපි දන්නවා.

මම මෙතැනදී ප්‍රධාන වශයෙන් මතු කරන කාරණාව තමයි 2009 අවුරුද්ද අවසන් වන කොට මිලියන 54,000ක පරිපූරක ඇස්තමේන්තු අනුමත කර තිබෙනවාය කියන එක. ඒ කියන්නේ මිලියන 54,000කින් අය වැය හිඟය වැඩි වනවාය කියන එකයි. ආණ්ඩුවක් හැටියට ඔබතුමන්ලා අසමත් වෙලා තිබෙනවා, රටක් හැටියට මේ රටම අසමත් වෙලා තිබෙනවා, මේකේ සැබෑ ප්‍රතිඵලය රටට ගන්න. අන්න ඒක තමයි මේ අවධාරණය කරන්නේ. අද, ශක්‍යතා අධ්‍යයන වාර්තාවලට සීමා වෙච්ච රුපියල් බිලියන 3කට වඩා වැඩි ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. කොන්ත්‍රාත්කරුවන් සොයා ගන්න බැරි වෙච්ච රජයේ ව්‍යාපෘති තිබෙනවා. කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය එහෙම එකක්. දකුණු කොළඹ වට රවුම් ව්‍යාපෘතියේ තිබෙන්නේත් එවැනිම තත්ත්වයක්. ඒ නිසා අපි කියන්නේ ආණ්ඩුව මේ හැම එකක් ගැනම සැලකිලිමත් වන්න ඕනෑය කියන එකයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වට රවුම් ව්‍යාපෘතියේ එහෙම දෙයක් නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
වට රවුම් ව්‍යාපෘතියේ කතන්දරේ මම කිව්වා ගරු ඇමතිතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වට රවුම් ව්‍යාපෘතිය, කොට්ටාව, කඩුවෙල, කඩවත -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Outer Circle Highway Project එක.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්. ඒක තමයි. The Outer Circle Highway Project එක ගැන මොකක්ද කියන්නේ? මේ අවුරුද්දේ තමයි ඒක ප්‍රදානය කරන්නට නියමිතව තිබුණේ. ප්‍රදානය කරලා තිබෙනවා. ලබන අවුරුද්දේ ඉඳලා තමයි පටන් ගන්න නියමිතව තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, මම කිව්වේ මිලියන 6,085ක් වියදම් කරන්න ඔබතුමන්ලා 2009 අවුරුද්දේදී ඇස්තමේන්තු කළාය කියායි. නමුත් මිලියන 88ක විතරයි වැඩ කෙරිලා තිබෙන්නේ. ඒ කියන්නේ සියයට 1.45යි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ලැබෙන ආධාර යටතේ එකඟ වුණු විධිය අනුව tender එක ප්‍රදානය -award- කරන්න ඕනෑ. ඉතින් ඒක කරලා තිබෙනවා. ඒ අනුව 2010 දී තමයි පටන් ගන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එතකොට ඒ මිලියන 88 පටන් ගැනීමේ කටයුතුවලට තමයි වියදම් වෙලා තිබෙන්නේ. ඒවා පටන් ගැනීමේ කටයුතු සඳහා කරපු වියදම්. ඔන්න ඔතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. දැන් එතකොට මෙතුමන්ලා කියන විධියට කෙරිච්ච වැඩ සඳහා වියදම් වුණාය කියන සියයට 27න් වෙලා තිබෙන්නේ පටන් ගැනීමේ කටයුතුවලට අදාළ ලියකියවිලි සකස් කිරීම, උත්සව පැවැත්වීම, බැනර් දැමීම, cut-outs දැමීම, කොඩි වැල් ඇදීම, සෙනඟ කැඳවීම, රැස්වීම් පැවැත්වීම වැනි කටයුතුයි. ඔන්න ඔතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. දැන් ඊ ළඟට ඔබතුමන්ලාට කියන්න පුළුවන් තවත් දෙයක් තිබෙනවා. ඔබතුමන්ලාට ඊ ළඟ මැතිවරණයේදී කියන්න පුළුවන්, "අපි මේවා පටන් ගන්නේ 2010 දී, පටන් ගන්නේ 2011 දී, පටන් ගන්නේ 2012 දී. ඒක නිසා අපට ඡන්දය දෙන්න"ය කියා. ඒක තමයි වැඩේ. අපි කියන්නේ ඒකයි. මුළු රටක් ණය කරලා අන්තිමට ඔබතුමන්ලා කරන්නේ මොකක්ද? අපි ඊ ළඟ අවුරුදු පහේදී පටන් ගන්නවා, අපට ඡන්දය දෙන්නය කියනවා. දැන් හදලා තිබෙන්නේ මොනවාද? දැන් සල්ලි ටික අරගෙන ජාතියත් ණය කරලා ඔබතුමන්ලා ව්‍යාපෘති හදනවා. [බාධා කිරීමක්]

**ගරු ටී. බී. ඒකනායක මහතා (මහාමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. T. B. Ekanayake - Minister of Highways)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ වට රවුම් මාර්ගය ගැන කතා කළා. මේ වන කොට ඒ සම්බන්ධයෙන් ඉඩම් අත් පත් කර ගැනීම තමයි ක්‍රියාත්මක කර ගෙන යන්නේ. කොට්ටාව සිට කඩුවෙල සහ කඩවත දක්වා මාර්ගය අතිසංකීර්ණ නිවාස තිබෙන මාර්ගයක්. මේකේ අත් පත් කර ගැනීම් ක්‍රියාත්මක කළාම තමුන්නාන්සේලාත් දන්නවා, තමුන්නාන්සේලාගේ සමහර වෘත්තීය සමිති අද උසාවි ගිහින් තිබෙන බව. අද වෙනත් ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. සහාය ලබා දීම් කරලා නැහැ. නමුත් ඒක ක්‍රියාත්මක කරන්නට තිබෙන්නේ ලබන අවුරුද්දේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවුරුද්දේ ඉඩම් අත් පත් කර ගැනීමට අදාළව කටයුතු කර තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා දැන් කථා කරන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
ඒ වාගේම ඔබතුමා දකුණු අධිවේගී මාර්ගය ගැන කථා කළා. අපි තුන් වන පියවරට තමයි, ආයෝජකයන් ගැන කථා කරලා තිබෙන්නේ. පළමු වන සහ දෙ වන පියවරේ මේ වන කොට ක්‍රියාත්මක කිරීම් යම් ප්‍රමාණයක් අඩු වෙලා තිබෙනවා නම් එය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමනි -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
"මයික්" දෙකක් පත්තු වන්නට බැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඇමතිතුමාගේ "මයික්" එක "ඕෆ්" කරන්න. [බාධා කිරීමක්]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඇමතිතුමනි, ඇති නේ. මම ඕක ගැන හොඳ කථාවක් කියන්නම්, අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටින නිසා. ඔබතුමා දන්නවාද,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. දැන් හරි. [බාධා කිරීමක්] දැන් මම අහ ගත්තා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, නිශ්ශබ්ද වන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා දන්නවාද, කොට්ටාව, කඩවත, ඔය කියන වට රවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතියට මුල්ගල තැබුවේ කවදාද කියලා.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
මුල්ගල තියලා නැහැ තවම.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඇයි දෙයියනේ! මෙතුමාත් එක්ක ගිහිල්ලා, ඔය ව්‍යාපෘතියට මුල්ගල තැබුවේ -[බාධා කිරීමක්] ඔබතුමා ඔහොම කියන්න එපා. එම ව්‍යාපෘතියට මුල්ගල තැබුවේ එවකට අගමැති, ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මැතිතුමායි. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් ගියා, අපිත් ගියා. මොකද, අපි ඔක්කොම එකට ගිහිල්ලා කොට්ටාවේ "මන්ච්" එක ළඟ මුල්ගල තැබුවේ. ඒ මුල්ගල තබලා තමයි අපි මහරගම රැස්වීමට ආවේ. මතකද? දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට මතකද? මෙතුමා සාක්ෂි. ඒ මුල්ගල තබලා, අපි මහරගම රැස්වීමට ආවා. එම රැස්වීමේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහරගම සිටින පළාත් සභා මන්ත්‍රීතුමා - උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා- කථාවක් කළා. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට මතක ඇති. ඒ කථාව කරද්දී එතුමාට කියැවුණේ කොහොමද දන්නවාද? "මෙතුමා -මේ ජනාධිපතිතුමාව- බලයට ගෙනල්ලා, අපි පටන් ගන්නවා පාරක්. මෙන්න, දැන් මුල්ගල තබලා ආවා. ඒක යන්නේ පොළොව යටින්. කොට්ටාවේ ඉඳලා ගිහිල්ලා මතු වන්නේ බොරැල්ලෙන්" කියලා කිව්වා. එහෙම තමයි කිව්වේ. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට මතකද? [බාධා කිරීමක්] දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට මතකයි. එහෙම තමයි කිව්වේ. එතුමා අධිවේගී මාර්ගය කියලා දැන ගත්තේ -[බාධා කිරීමක්] කොට්ටාවෙන් පොළොව යටින් ගිහිල්ලා බොරැල්ලෙන් මතු වනවා කියලා කිව්වා. ඉතින් මිනිස්සු අත්පුඩි ගැහුවා. ඡන්දය දුන්නා. ඒ 2005 ජනාධිපතිවරණයට කලින් තමයි ඔය අධිවේගී මාර්ගයට මුල්ගල තැබුවේ. හරිද? දැන් ඇමතිතුමා කියනවා මුල්ගල තැබුවෙත් නැහැයි කියලා. ඇමතිතුමා කියනවා, "තවම ව්‍යාපෘතියට මුල්ගල තැබුවේ නැහැ, 2010 දීයි පටන් ගන්නේ" කියලා. හැබැයි දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමන්ලා, අපි ගිහිල්ලා ජනාධිපතිවරණයට කලින් මුල්ගල තැබුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. ජනාධිපතිවරණයට කලින් මුල්ගල තැබුවා. ඊ ළඟ මහ මැතිවරණයටත් දැන් ඒක විකුණන්නයි හදන්නේ. ඔන්න සංවර්ධන ව්‍යාපෘති! [බාධා කිරීමක්] මොකක්ද? [බාධා කිරීමක්] ඔන්න සංවර්ධන ව්‍යාපෘති! සංවර්ධනය කියලා කියන්නේ මොකක්ද අන්තිමට? ජනාධිපතිවරණයට කලින් මුල්ගල තැබූ ව්‍යාපෘති මහා මැතිවරණයටත් අලෙවි කරන්නට තමයි බලා ගෙන සිටින්නේ. ප්‍රශ්නය මේකයි. මේ ව්‍යාපෘති අසාර්ථක වන කොට ඒ සියල්ලට ගෙවන්නට සිදු වන්නේ මේ රටේ ජනතාවටයි. මෙතැන තිබෙන ප්‍රශ්නය ඒකයි. මේ රටේ ජනතාවගේ මුදල්. ඒ නිසා කරුණාකරලා මේ අසාර්ථක ව්‍යාපෘති පිළිබඳව මීට වඩා සැලකිලිමත් වන්නට ඕනෑ. ඒකයි ප්‍රශ්නය. ඔබතුමන්ලාගේ බහුතර බලය පාවිච්චි කරලා, බහුතර ඡන්දයෙන් මේවා සම්මත කර ගන්නට පුළුවන්කම තිබෙයි. හැබැයි මේවාට අවසානයේ වන්දි ගෙවන්නේ; වග කියන්නේ මේ රටේ ජනතාවයි. මොකද, අද තිබෙන හුඟක් ව්‍යාපෘති අත් හැරලා ගිහින් තිබෙනවා. කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියත් එහෙම එකක්. ඒවාට වග කියන්න කෙනෙක් නැහැ. [බාධා කිරීමක්] මොකක්ද?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
කටුනායක-කොළඹ අධිවේගී මාර්ගය දැන් [බාධා කිරීමක්] සමාගමක් ඒකාබද්ධ වෙලා වැඩ ආරම්භ කරලා තිබෙනවා. ඔබතුමා හෙට එනවා නම් මාත් එක්ක යන්න කටුනායක-කොළඹ අධිවේගී මාර්ගය -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දෙදෙනෙකුට කථා කරන්න බැහැ. මමයි කථා කරන්නේ. [බාධා කිරීමක්] එහෙනම් එතුමාට කථා කරන්න කියන්න. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
බාධා කරන්න එපා. ගරු ඇමතිතුමනි, බාධා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම පැහැදිලියි. මේ ඇවිස්සෙන්නේ ඒකයි. කටුනායක කියන කොට කටුස්සෝ වාගේ දඟලනවා. කටුනායක අධිවේගී මාර්ගය කියලා කියන කොට හුමි තෙල් ගැවුණු ගැරඬියෝ වගෙයි. කෑ ගහන්නේ, දඟලන්නේ ඇයි? මේක තමයි හේතුව. මොකද, මේවායින් තමයි කෑම තිබෙන්නේ. ශක්‍යතා අධ්‍යයන වාර්තාව හදන තැන ඉඳලා කනවා; බැනර් එකේ ඉඳලා කනවා; "කටවුට්" එකේ ඉඳලා කනවා; මහ ජනතාවගේ සල්ලි. ඉතින් දඟලනවා ගැරඬි වාගේ දැන්. ඒකයි. [බාධා කිරීමක්] මොකද හේතුව මේ? ඉතින් මෙච්චර මේ කෑගහන්නේ ඇයි? ඔබතුමන්ලා හරියට කළා නම්, අපි වැරදි නම් ඇයි මෙච්චර දඟලන්නේ? දැන් ඔබතුමන්ලා හොඳට කරලා නේ තිබෙන්නේ ඔක්කෝම. හොඳට ඔක්කෝම කරලා, ව්‍යාපෘති ඔක්කෝම කරලා, අමතරව ඕනෑ වෙච්ච ඒවා තමයි දැන් මේ අනුමත කර ගන්න ඇවිල්ලා තිබෙන්නේ. ඇයි ඉතින් දඟලන්නේ? ඇයි ඔච්චර කෑ ගහන්නේ? ප්‍රශ්නය තිබෙන්නේ ඒකයි. මොකද ඔබතුමන්ලා දන්නවා, ඔබතුමන්ලාගේ හිත් දන්නවා, මොකක්ද කරලා තිබෙන්නේ කියා. කල්පනා කරලා බලන්න.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා තවත් කාරණා කිහිපයකට අවධානය යොමු කරවනවා. මාර්ග සංවර්ධන අධිකාරියේ හැම පළාතකටම අදාළ ව්‍යාපෘති සම්බන්ධයෙන්, විශේෂයෙන්ම විදේශ ආධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා, සැලසුම් කරපු දුර ප්‍රමාණයන්ගෙන් අඩක්වත් මේ ක්‍රියාවලිය තුළ ඉටු කරන්න බැරි වෙලා තිබෙනවාය කියලා. අප නොවෙයි මේ කියන්නේ. මා මේ උපුටා දැක්වූයේ මා හදා ගත්තු ඉලක්කම් නොවෙයි. අපේ රටේ තිබෙනවා නේ අඩු තරමේ අමාත්‍යාංශ ඔක්කෝම ටිකේ වාර්තාවක් හදා ගන්න සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයමයි අද මේ විධියට කියන්නේ. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේම තිබෙනවා, ලබා ගත්තු ව්‍යාපෘතිවලින් සියයට 27ක්වත් -තුනෙන් පංගුවක්වත්- සාර්ථක කර ගන්න බැරි වෙලා තිබෙනවාය කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඊයේ විවෘත කරපු පාලම් දෙක කොච්චර වටිනවාද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඊයේ විවෘත කරපු පාලම නේද? කින්නියා පාලම නේද? කින්නියා පාලමට මුදල් ගෙනාවේ කවුද? හිටපු මන්ත්‍රී තව්ෆීක් මැතිතුමා. අඩු තරමින් එතුමාට ආරාධනා කරලාවත් නැහැ.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)
නැහැ, ඒක වැරැදියි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි දන්නවා නේ ඇමතිතුමා.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)
කින්නියා පාලමේ-

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි දන්නවා නේ. හිටපු මන්ත්‍රී තව්ෆීක් මැතිතුමා තානාපති කාර්යාලවලට ගිහිල්ලා, canvass කරලා, තානාපතිවරුන්ගේ සහයෝගය අරගෙනයි ඒ මුදල ගෙනාවේ. [බාධා කිරීමක්] ඔබතුමන්ලාට තිබුණා අඩු තරමින් එතුමාට ආරාධනා කරන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා මට ඒ ගැන කියන්න.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)
ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා මට කියන්න. [බාධා කිරීම්] ඔබතුමා වග කීමෙන් මට කියනවාද තව්ෆීක් මන්ත්‍රීතුමාට ආරාධනා කළාය කියලා.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)
මම වග කීමෙන් කියනවා, මා මහාමාර්ග අමාත්‍යාංශයේ කටයුතු කරපු වෙලාවේ තමයි ඒක initiate කළේ, ඒක පටන් ගත්තේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි, මම කථාව අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කියන්න ඕනෑකම තිබුණේ මේකයි. මේ අය භූමිතෙල් ගැව්ච්ච ගැරඬි වාගේ දඟලන කොට තේරෙනවා මේ ව්‍යාපෘතිවල තත්ත්වය මොකක්ද කියලා. අද අප මේ පරිපූරක ඇස්තමේන්තුව අනුමත කරන වෙලාව වන කොට 2009 අවුරුද්ද ඇතුළත රුපියල් මිලියන 54,627ක පරිපූරක ඇස්තමේන්තු අනුමත කරලා තිබෙනවා. පරිපූරක ඇස්තමේන්තුවලින් අය වැය හිඟය -අය වැය හිඟයෙන් භාගයකට වැඩිය- දැන් වැඩි කරලායි තිබෙන්නේ. කරුණාකර මේ පරිපූරක ඇස්තමේන්තු ක්‍රියාවලිය අද මෙතැනින්වත් නතර කරන්න. මොකද, මේක මේ රටට බරක්; අය වැය හිඟයට බරක්. ඔබතුමන්ලා අය වැය ගෙනෙන්නේත් නැහැ. ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න, 2005 අවුරුද්දේ නොවැම්බර් මාසයේ සරත් අමුණුගම ඇමතිතුමා අය වැය ගෙනාවා. අය වැය ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ වාර අවසාන වෙලා පාර්ලිමේන්තුව අත් හිටෙව්වා. හැබැයි 2005 ජනාධිපතිවරණයෙන් පස්සේ -2005 දෙසැම්බර් මාසයේම- නැවත පාර්ලිමේන්තුව රැස් වන කොට අය වැය ගෙනාවා, මුදල් ඇමතිවරයා හැටියට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. එකම අවුරුද්ද ඇතුළත, මාස කීපයක් ඇතුළත අය වැය දෙකක් ගෙනැල්ලා තිබෙනවා. එහෙම නම් අය වැය ගෙනෙන්න පුළුවන්කම තිබෙනවා. එහෙම බැරිකමක් නැහැ. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද? මෙතැන තිබෙන ප්‍රශ්නය-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අය වැය ගෙනාවා වාගේම අය වැය නොගෙනාපු අවස්ථාත් ඉතිහාසයේ තිබෙනවා නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමාට තේරෙන්නේ නැහැ නේ. ඒක හන්දා වාඩි වෙන්න. මා කියන්නේ මේකයි. ඔබතුමන්ලා අය වැය ගෙනෙන්නේ නැතුව අය වැය හිඟය වැඩි කරන පරිපූරක ඇස්තමේන්තු ගෙනැල්ලා, අතුරු සම්මත ගිණුම් ගෙනැල්ලා අපේ රටේ ජනතාවට, බදු බර ගෙවන ජනතාවට තව බර පටවනවා. ඒ බර පැටවීමම විතරයි මේ අතුරු සම්මත ගිණුම්වලින්, පරිපූරක ඇස්තමේන්තුවලින් සිද්ධ වන්නේ කියන එක අවධාරණය කරමින් මම මගේ කථාව අවසාන කරනවා. බොහොම ස්තුතියි.

** සභාමේසය මත තබන ලද ලැයිස්තුව:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் :*
*List tabled*

**MEGA PROJECTS OVER RS. 3 BILLION-FOREIGN FUNDED PROJECTS-BEHIND SCHEDULE AS AT END OF 2ND QUARTER 2009**

| | Name of the Project | Donor | Implementing Ministry | Total Estimated Cost (Rs. Mn) | Cumulative Expenditure as at end of quarter (Rs. Mn) | % | Allocation 2009 Rs.Mn | Expenditure Rs. Mn | % | Issues |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Dam safety & Water Resources Planning Project (National Water Management Improvement Project) | WB | Agriculture Development & Agrarian Services | 7,739.28 | 125.35 | 1.62 | 1,675.00 | 38.22 | 2.28 | Procurement Delays (Consultancy Services) |
| 2 | Outer Circular Highway Project | JBIC | Highways & Road Development | 81,917.00 | 1,822.00 | 2.22 | 6,085.00 | 88.40 | 1.45 | Inadequate imprest, Procurement Delays |
| 3 | Southern Transport Development Project | ADB, JBIC, Netherlands | Highways & Road Development | 59,915.00 | 29,859.35 | 49.84 | 16,698.00 | 9,858.33 | 59.04 | Earthwork progress is slow. Collapse of metal underpass and public protest |
| 4 | Colombo - Katunayake Expressway | China | Highways & Road Development | 36,300.00 | 8,412.00 | 23.17 | 13,202.00 | 2,309.00 | 17.49 | Loan Agreement not yet signed. Delay in obtaining donor funds. No imprest for land acquisition. |
| 5 | Colombo-Kandy alternative Highway | Govt. of Malaysia | Highways & Road Development | 40,750.00 | 97.86 | 0.24 | 25.00 | 10.73 | 42.92 | Inadequate financial allocation for land acquisition. Identification of suitable land for resettlement activities. |
| 6 | Road Network Improvement Project | ADB | Highways & Road Development | 17,368.71 | 15,855.35 | 91.29 | 485.00 | 189.29 | 39.03 | Inadequate imprest. |
| 7 | Trincomalee Integrated infrastructure Project | FDA | Highways & Road Development | 5,900.00 | 1,787.00 | 30.29 | 2,051.00 | 717.20 | 34.97 | The contractor has not shown sufficient progress |
| 8 | (NHSP) Nuwara Eliya - Badulla Road | ADB | Highways & Road Development | 5,052.00 | 878.58 | 17.39 | 1,610.00 | 425.37 | 26.42 | Delay in land acquisition |
| 9 | Puttalam - Anuradhapura - Trincomalee Road | ADB | Highways & Road Development | 4,757.00 | 240.08 | 5.05 | 660.00 | 185.26 | 28.07 | Tender awarded, work started |
| 10 | Kandy - Mahiyangana Road | ADB | Highways & Road Development | 4,320.00 | 891.54 | 20.64 | 1,410.00 | 454 | 32.20 | Delay in land acquisition |
| 11 | MFAP– Rehabilitation Reconstruction of 32 Bridges & One Bypass Road (Kuwait funded) | Kuwait | Highways & Road Development | 3,055.00 | 2,623.45 | 85.87 | 174.43 | 174.43 | 100.00 | General delays by the contractor (State Development and Construction Corporation) |
| 12 | MFAP Improvements to Padeniya -Anuradhapura Road | KOICA | Highways & Road Development | 8,500.00 | 449.01 | 5.28 | 1,387.00 | 445.34 | 32.11 | Delay in construction work |

| | Name of the Project | Donor | Implementing Ministry | Total Estimated Cost (Rs. Mn) | Cumulative Expenditure as at end of quarter (Rs. Mn) | % | Allocation 2009 Rs.Mn | Expenditure Rs. Mn | % | Issues |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 13 | ADB - Spanish funded Bridges Project | ADB Spanish | Highways & Road Development | 3,834.91 | 3,365.10 | 87.75 | 1,200.00 | 957.24 | 79.77 | - |
| 14 | Pro– Poor Eastern Infrastructure Development Project | JBIC | Highways & Road Development | 6,250.00 | 1,253.49 | 20.06 | 1,150.00 | 258.25 | 22.46 | Delay in obtaining proper quarry licences by the contractor. Non-availability of Technical staff |
| 15 | Chinese Housing Programme | China | Housing & Common Amenities | 3,125.00 | - | - | 500.00 | - | - | Loan Agreement not yet signed |
| 16 | Uma Oya Diversion Project | France | Irrigation & Water Management | 80,000.00 | 147.87 | 0.18 | 6,000.00 | 108.27 | 1.80 | Poor performance of contractors. Delay in fulfilling financial commitment by GOSL |
| 17 | Pro - Poor Economic Advancement and Community Enhancement (Peace) | JBIC | Irrigation & Water Management | 5,039.70 | 1,618.64 | 32.12 | 1,403.00 | 326.79 | 23.29 | Shortage of staff, designs delays and delay in construction work |
| 18 | Conflict - Affected Area Rehabilitation Project (Component A) | ADB | Local Government & Provincial Councils | 7,389.67 | 2,981.79 | 40.35 | 1,325.00 | 604.34 | 45.61 | Delays in executing civil works due to shortage of labour and difficulty in transporting construction materials |
| 19 | Upgrading the disaster response network in WP and selected urban areas | Netherlands | Local Government & Provincial Councils | 5,520.00 | 2,524.50 | 45.73 | 2,476.00 | 554.98 | 22.41 | Delay in construction work and recruiting fire fighters. Now project is completed |
| 20 | Re - Awakening Project (Earlier known as Second North East Irrigated Agriculture Project NEIAP II) | WB | Nation Building & Estate Infrastructure Development | 8,114.00 | 3,044.62 | 37.52 | 1,250.00 | 530.82 | 42.47 | Procurement delays and civil unrest |
| 21 | Small Holder Entrepreneurship Development Programme | USAID/GF/ IFAD | Plantation Industries | 4,469.96 | 109.42 | 2.45 | 308.00 | 65.50 | 21.27 | Delay in establishment of the PMU and appointment of core staff |
| 22 | Galle Port Development Project | JBIC | Ports & Aviation | 13,770.00 | 382.30 | 2.78 | 2,600.00 | - | - | Received bids are much higher than the Engineer's Estimate. Decision on the scope of the project |
| | | | | | | | | | | |

| | Name of the Project | Donor | Implementing Ministry | Total Estimated Cost (Rs.Mn.) | Cumulative expenditure as at end of quarter (Rs.Mn.) | % | Allocation 2009 Rs. Mn. | Expenditure Rs.Mn. | % | Issues |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 23 | Clean Energy and access Development Project (Power Sector \| Construction of Grid Substation) | ADB | Power & Energy | 4,081.00 | - | - | 500.00 | | - | Loan agreement signed. Tender not yet awarded. |
| 24 | Upgrading & Double Tracking Coast Line Railway Colombo-Matara | Indian Credit | Transport | 12,800.00 | 415.40 | 3.25 | 2,800.00 | 27.20 | 0.97 | Delay in finalizing the scope of the work due to revised TEC. Delay in establishment of PMU. |
| 25 | Lunawa Environment Improvement & Community Development Project | JBIC | Urban Development & Sacred Area Development | 11,884.26 | 5,829.10 | 49.05 | 2,300.00 | 1,108.34 | 48.19 | (1) Delay in handing over land for canal construction due to objections by people.<br>(2) Delay in completing the land acquisition process due to delay in surveying the lands by SG.<br>(3) Delay in revising and finalizing technical designs for canal traces in selected locations to accommodate community concerns/objections. |
| 26 | 3K Township Development Project | JBIC | Urban Development & Sacred Area Development | 3,020.00 | 3.61 | 0.12 | 920.00 | 3.07 | 0.33 | Procurement delays |
| 27 | International Conventional Centre Pro. | KOICA | Urban Development & Sacred Area Development | 3,114.72 | 187.93 | 6.03 | 1,389.00 | 480.00 | 34.56 | Slow progress of contractors. |
| 28 | Secondary Towns Rural Community-Based Water Supply & Sanitation Project | ADB | Water Supply & Drainage | 19,272.00 | 12,419.12 | 64.44 | 5,963.50 | 3,313.00 | 55.55 | Inadequate imprest |
| 29 | Greater Colombo Sewerage Rehabilitation Project | ADB | Water Supply & Drainage | 14,300.00 | 12.30 | 0.09 | 56.00 | 3.50 | 6.25 | Agreement not signed. Delay in signing of MOU between NWS & DB and CMC, Delay in finalization of Sanitation Policy and allocation of lands for treatment plant. |
| 30 | Jaffna Peninsula Water Supply & Sanitation Project | ADB | Water Supply & Drainage | 11,800.00 | 0.00 | - | 2.00 | 0.00 | - | Agreement not yet singed. |
| 31 | Towns South of Kandy Water Supply Project | Denmark | Water Supply & Drainage | 9,626.00 | 6,471.26 | 67.23 | 1,820.00 | 906.02 | 49.78 | Inadequate imprest |
| 32 | Assistance for emergency measures and WS Scheme Project | Kfw Germany | Water Supply & Drainage | 4,265.30 | 3,740.60 | 87.70 | 800.00 | 677.00 | 84.63 | Inadequate imprest, Poor performance of Contractor. |
| 33 | Waste Water Disposal System for Rathmalana, Moratuwa, & Ja-ela, Areas | SIDA | Water Supply & Drainage | 12,135.00 | 4,430.97 | 36.51 | 2,839.00 | 1,070.10 | 37.69 | Corrugated polyethylene pipes were rejected due to non conformity to the required standards. Protest against the pipe laying from Seeduwa to Kotugoda Road. |

| | Name of the Project | Donor | Implementing Ministry | Total Esti-mated Cost (Rs.Mn.) | Cumulative expendi-ture as at end of quarter (Rs.Mn.) | % | Allocation 2009 Rs. Mn. | Expenditure Rs.Mn. | % | Issues |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 34 | Transmission System Improvements | IFRC | Water Supply & Drainage | 3,785.00 | 1,205.26 | 31.84 | 710.00 | 501.44 | 70.63 | Delay due to IFRC decision to go for a turnkey contract. |
| 35 | Greater Krurunegala Water Supply Project | DANIDA | Water Supply & Drainage | 3,686.80 | 112.48 | 3.05 | 660.00 | 16.50 | 2.50 | Delay in obtaining donor funds. Procurement delays. |
| 36 | Energy Conservation Project - Ambatale WTP | Germany | Water Supply & Drainage | 6,220.00 | - | - | 210.00 | - | - | Agreement not signed. |
| 37 | Ratnapura Water Supply Development Project | Germany | Water Supply & Drainage | 9,742.00 | - | - | 60.00 | - | - | Delay in evaluation of tender document |
| 38 | Nuwara Eliya District Group Towns Water Sup-ply Project | DANIDA | Water Supply & Drainage | 4,511.00 | 3,284.37 | 72.81 | 1,100.00 | 328.00 | 29.82 | Inadequate imprest |
| | **Total** | | | **547,330.31** | **116,581.70** | **21.30** | **85,803.93** | **26,735.93** | **31.16** | |

**MEGA PROJECTS OVER Rs. 3 BILLION - GOSL FUNDED PROJECTS - BEHIND SCHEDULE AS AT END OF 2ND QUARTER 2009**

| | Name of the Project | GOSL | Implementing Ministry | Total Estimated Cost (Rs. Mn.) | Cumulative expenditure as at end of quarter (Rs. Mn.) | % | Allocation 2009 Rs. Mn. | Expenditure Rs.Mn. | % | Issues |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Moragahakanda Kaluganga Development Project | L | Agriculture Development & Agrarian Services | 64,358.70 | 1,541.67 | 2.40 | 2,388.00 | 419.70 | 17.58 | Delay in obtaining donor funds |
| 2 | Pilisaru Project | L | Environment and Natural Resources | 5,675.00 | 157.00 | 2.77 | 1,050.00 | 92.60 | 8.82 | Inadequate imprest, Public and Political protest against most of the lands selected for the waste management project. |
| 3 | Establishment of Uva Wellassa University | L | Higher Education | 3,420.00 | 1,015.28 | 26.69 | 331.75 | 52.33 | 15.77 | Inadequate financial allocation, Delay in eviction and relocation of industrialists from the university premises. |
| 4 | Maga Neguma Rural Road Development Program | L | Highways & Road Development | 11,500.00 | 8,784.00 | 76.38 | 3,000.00 | 1,266.00 | 42.20 | Inadequate imprest. |
| 5 | Deduru Oya Resevoir Project | L | Irrigation & Water Management | 6,200.00 | 864.51 | 13.94 | 425.00 | 241.27 | 56.77 | Delay in land acquisition, Shortage of technical staff, Inadequate imprest. |
| 6 | Yan Oya Reservoir Project | L | Irrigation & Water Management | 8,700.00 | 3.13 | 0 | 1.60 | - | - | Awaiting approval from Sri Lankan Army (Security reasons) |
| 7 | e NIC Project | L | Internal Administration | 4,830.00 | 295.50 | 6.12 | 637.50 | 5.60 | 0.88 | Delay in submitting cost estimates for site preparation work |
| 8 | Bim Saviya | L | Land & Land Development | 38,284.00 | 900.00 | 2.35 | 500.00 | 87.00 | 17.40 | Delay in approving incentive schemes, delay in recruitment of staff, Amendment to RTA passed by Parliament. |
| 9 | Second International Airport | L | Ports and Aviation | 13,192.00 | 24.56 | 0.19 | 595.00 | 17.80 | 2.99 | Delay in obtaining approval for EIA |
| 10 | Lighting Sri Lanka Hambantota Project (Phase I) C | L | Power & Energy | 4,000.00 | 1,102.69 | 27.57 | 720.00 | 355.54 | 49.38 | Inadequate imprest |
| 11 | Lighting Sri Lanka Ratnapura District (LRDD Project) | L | Power 7 Energy | 5,100.00 | 500.00 | 9.80 | 400.00 | 233.00 | 58.25 | Inadequate imprest |
| 12 | Matara Kataragama Railway Extension Project - Phase I | L | Transport | 30,000.00 | 807.80 | 2.69 | 810.00 | 112.75 | 13.92 | Inadequate imprest |
| 13 | Small Scale Infrastructure Rehabilitation and Upgrading Project | L | Water Supply & Drainage | 14,876.00 | 11,938.90 | 80.26 | 920.00 | 420.18 | 45.67 | Inadequate imprest |
| 14 | Dankotuwa Water Supply | L | Water Supply & Drainage | 4,263.00 | - | - | 250.00 | - | - | Donor to be sought |
| | **Total** | | | **217,398.70** | **27,935.04** | **12.85** | **12,178.85** | **3,303.77** | **27.13** | |

[பி.ப. 1.54]

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா - நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சர்)

(The Hon. A. L. M. Athaullah - Minister of Water Supply and Drainage)

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

நஹ்மதுஹு வனுசல்லி அலா ரஸுூலிஹில் கரீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! பல அமைச்சுக்களுக்கான குறைநிரப்புத்தொகைகளுக்கான பிரேரணைகள் பற்றிய இன்றைய விவாதத்திலே கலந்துகொண்டு உரையாற்றுவதில் நான் மகிழ்ச்சியடைகின்றேன். நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சின் குறைநிரப்புத் தொகையும் இங்கு நிறைவேற்றப்படவிருக்கின்றது. அம்பாந்தோட்டை, அனுராதபுரம், பொலன்னறுவை, மூதூர், மட்டக்களப்பு ஆகிய இடங்களிலே வாழ்கின்ற பல்லின மக்களுக்கும் குடிநீரை வழங்குவதற்கான வேலைகள் ADB இன் கருத்திட்டங்களூடாக முன்னெடுக்கப்பட்டு வருகின்றன. குறித்த வேலைகளை இவ்வருடமே பூர்த்தி செய்யும் வகையில் நாங்கள் இங்கு இந்தக் குறைநிரப்புத் தொகைக்கான பிரேரணையைச் சமர்ப்பித்திருக்கின்றோம். இன்று இங்கு பேசிய சில பாராளுமன்ற உறுப்பினர்கள் இந்தக் குறைநிரப்புத் தொகைகள் பற்றியும் மற்றும் அபிவிருத்தி வேலைகளைப் பற்றியும் பிழையான கண்ணோட்டத்துடன் பேசினார்கள். இன்று மழை குறைவாகவும் பிந்தியும் பெய்த காரணத்தினால்தான் கிராமம் மற்றும் நகரங்களில் வாழ்கின்ற மக்கள் தண்ணீர் இல்லாமல் வீதிக்கு வந்திருக்கின்றார்கள். அதுமட்டுமல்ல, வழக்கமாக மழை பெய்கின்ற இடங்களில்கூட மழை பெய்யாததனால் இன்று மக்கள் தண்ணீர் இல்லாமல் அல்லற்படுகின்றார்கள். இந்தச் சூழ்நிலையிலே நாடு முழுவதிலும் பரிசுத்தமான குழாய்நீரை வழங்குவதற்கான திட்டங்களை அமுல்படுத்துவதற்கு உண்மையிலே எமது அமைச்சும் நீர் வழங்கல், வடிகாலமைப்புச் சபையும் பெரும் திட்டங்களைத் தீட்டிவருகின்றன. அந்த அடிப்படையில் எதிர்காலத்திலே நாடு முழுவதிலும் குடிநீரை வழங்குவதற்கான வேலைகளை நாங்கள் செய்துகொண்டு வருகின்றோம். ஆனால், இதற்காகக் கடன்களைப் பெறக்கூடாது என்றோ, குறைநிரப்புத் தொகைகளை நிறைவேற்றக்கூடாது என்றோ குறித்த பாராளுமன்ற உறுப்பினர்கள் சொல்வார்களேயானால், எப்படி இந்த நாட்டில் குடிநீரை வழங்க முடியும் மற்றும் அபிவிருத்திகளைச் செய்ய முடியும்? என்று நான் கேட்க விரும்புகின்றேன். உண்மையில் குறித்த குறைநிரப்புத்தொகைக்கு அங்கீகாரமளிப்பதன்மூலம்தான் தேவையான இடங்களுக்குச் சுத்தமான குடிநீரை வழங்க முடியும்.

அடுத்து, மேலும் ஒரு முக்கியமான விடயம் பற்றி நான் இங்கு பேச விழைகின்றேன். கடந்த 8ஆந் திகதி இந்தப் பாராளுமன்றத்திலே உரையாற்றிய முஸ்லிம் காங்கிரஸ் தலைவர் ரவூப் ஹக்கீம் அவர்கள் என்னோடு தொடர்பாக சில விஷயங்களைத் திரித்துப் பிழையான முறையிலே கூறியிருக்கின்றார். முஸ்லிம் மக்கள் நோன்பு காலத்திலே நோன்பு துறப்பதற்கான அழைப்புக்களை ஏற்று வெவ்வேறு இடங்களிலே நோன்பு துறக்கப் போவது வழக்கம். அது ஒரு புனிதமான விஷயம் என்பது உங்களுக்கும் தெரியும். அந்த வைபவங்களிலே நாங்கள் ஒரு பொழுதும் அரசியல் செய்வதில்லை. ஏனெனில், நாங்கள் எல்லோரும் எப்பொழுதுமே அதனை ஒரு புனிதமான விடயமாகவே கருதுகின்றோம். அந்த வகையில் 2008ஆம் ஆண்டு அக்கரைப்பற்றிலே நடந்த ஒரு நோன்பு துறத்தல் நிகழ்வுக்கு தனிநபர் ஒருவர் அனுப்பிய அழைப்பை ஏற்று அந்தப் பகுதி மக்கள் சிலர் அங்கு போய் இருந்தார்கள். நோன்பு துறப்பதற்குச் சற்று நேரம் முன்னதாக, அதாவது ஆறு மணியளவில், அங்கே ரவூப் ஹக்கீம் அவர்களும் வந்து சேர்ந்தபோதுதான் மக்களுக்கு விளங்கியது, குறித்த நோன்பு துறக்கும் வைபவத்தை அரசியலாக மாற்றப்போகின்றார்கள் என்பது. அதனால் அவர்கள் மிகவும் வேதனைக்கு மத்தியிலேயே அங்கு நோன்பு துறந்தார்கள். அந்த நிகழ்வுக்குப் பிறகு 2008 செப்ரெம்பர் 28ஆம் திகதிய 'தினக்குரல்' பத்திரிகையிலே "அதாஉல்லாவின் கோட்டையும் ஹக்கீமின் படையெடுப் பும்" என்ற தலைப்பிலே ஓர் அறிக்கை வெளியிடப் பட்டிருந்தது. அந்த அறிக்கை, "ரவூப் ஹக்கீம் அதாஉல்லா வின் கோட்டையை உடைத்து, அவரின் மூக்கைத் தொட்டுவிட்டார்" என்ற அடிப்படை யில் ஓர் அரசியல் செய்தியாக அமைந்திருந்தது. பத்திரிகையில் எழுதுவது என்பது மிகவும் சிறந்ததொரு தொழிலாகும். ஆனால், யதார்த்தவாதிகளாகவும் சிறந்த அடிப்படைவாதிகளாகவும் நிதானமானவர்களாகவும் இருக்கின்ற பத்திரிகையாளர்களே இன்று இந்த நாட்டுக்குத் தேவைப்படுகின்றார்கள். அன்று அங்கு நோன்பு துறந்த கௌரவமான நிகழ்வை, குறித்த அந்தப் பத்திரிகையாளன் அரசியலாக மாற்றி, ஹக்கீம் அவர்கள் அங்குள்ள ஓர் அரசியல்வாதியின் மூக்கைத் தொட்டதாகவும் அந்த அரசியல்வாதியின் கோட்டைக்குள் நுழைந்ததாகவும் எழுதியிருந்த தனால்தான் ரவூப் ஹக்கீம் அவர்கள் இந்தமுறை நோன்பு துறப்பதற்கு அங்கு வரக் கூடாது என்று அந்த ஊர் மக்கள் வரிந்துகட்டிக்கொண்டு நின்று எதிர்ப்புத் தெரிவித்தார்கள்; அவரை அங்கு நோன்பு துறக்க விடாமல் தடுத்தார்கள்.

இது ஒருபுறமிருக்க, இந்த வருடம் செப்ரெம்பர் மாதம் 16ஆம் திகதி, அதே தினம், தேசிய காங்கிரஸ் கட்சியினரான நாங்கள் எமது தலைவர் அஷ்ரஃப் அவர்களை நினைவு கூர்ந்து நாடளாவிய ரீதியில் பல இடங்களில் 'கத்தமுல் குர்ஆன்' ஓதல் நிகழ்வுகளை நடத்தினோம். அதன்படி, கல்முனையிலே நாங்கள் ஆயிரக் கணக்கான மக்களுடன் ஒன்று கூடி 'கத்தமுல் குர்ஆன்' ஓதி அவருக்காகப் பிரார்த்தித்து, அன்னாரை நினைவுகூர்ந்தோம். நாம் தலைவர் அஷ்ரஃப் அவர்களுக்காகப் பிரார்த்தனை செய்த அந்த வைபவத்தை ஓர் அரசியல் கேலிக்கூத்தாக மாற்றுவதற் காக ரவூப் ஹக்கீம் அவர்கள் அக்கரைப்பற்றுக்கு வந்தத னால் தலைவர் அஷ்ரஃப் அவர்களை நினைவுகூரக்கூட அவருக்கு முடியாமற் போய்விட்டது. அதுமாத்திரமல்ல, அக்கரைப்பற்றில் நோன்பு துறக்கும் நிகழ்வை நடத்துவதற்கு அப்பிரதேச மக்கள் அவருக்கு இடமளிக்காததால், அங்கு நோன்பு துறக்க முடியாமற்போன சம்பவத்தை வைத்துக் கொண்டு, நோன்பு நிறைவுற்று பெருநாளும் முடிவடைந்த பின்னர், எனக்குச் சேறு பூசுகின்ற நடவடிக்கையாக ஒரு பத்திரிகையிலே மௌலவி ஒருவரின் பெயரைத் தொடர்பு படுத்தி நான் ஆட்கடத்தல் செய்கின்றவன் என்ற அடிப்படை யிலான செய்தியொன்று வெளியிடப்பட்டது. அந்த நேரத்தி லும் சில பத்திரிகைகளும் பத்திரிகை எழுத்தாளர்களும் எப்படிப்பட்ட பிழைகளை விட்டிருக்கின்றார்கள் என்பதை நீங்கள் சிந்தித்துப் பாருங்கள்!

கடந்த காலங்களில் வடக்கு, கிழக்கு உட்பட இந்த நாட்டின் அனைத்துப் பிரதேசங்களிலும் பல்வேறு ஆயுதக் குழுக்கள் செயற்பட்டு, எத்தனையோ பேரைக் கடத்தியும், கொள்ளை யடித்தும், கொலைசெய்தும் எத்தனையோ பள்ளி வாசல்களில் கப்பம் அறவிட்டுக்கொண்டும் இருந்த வரலாறு களை இந்தப் பத்திரிகைகள் பிரசுரித்தனவா? எல்.ரீ.ரீ.ஈ. யினர் அல்லது பயங்கரவாதிகள் ஒரு பள்ளிவாசலுக்குள் புகுந்து ஒருவரைக் கடத்திய செய்தியை இந்தப் பத்திரிகை கள் எழுதியிருந்தனவா? அல்லது பயங்கரவாதிகள் பள்ளி வாசலுக்குள் நுழைந்து கப்பம் அறவிட்ட அல்லது பயங்கர வாதிகள் பிக்குமார்களைக் கொன்ற செய்திகளைக் குறிப் பிட்டிருக்கின்றனவா? உண்மையிலேயே எல்.ரீ.ரீ.ஈ. யின ரால் கடத்துதல், கப்பம் வாங்குதல், கொலை செய்தல் போன்ற நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்ட பொழுதிலும் "இனந்தெரியாத நபர்களால் கடத்தல் அல்லது இனந் தெரியாதவர்களால் கொலை" என்றவாறே இந்தப் பத்திரிகை கள் செய்தி வெளியிட்டன. இதனை நாங்கள் பத்திரிகா தர்ம மாகவே கருதியிருக்கிறோம். தமிழ் பத்திரிகை களிலே 'தினகரன்', 'வீரகேசரி' ஆகிய பத்திரிகைகள் உண்மை யிலேயே இப்பொழுதும் நிதானமாகவே செயற்பட்டு வருகின்றன. அந்தப் பத்திரிகைகளை நாங்கள் பாராட்ட வேண்டும். ஆனால், சில பத்திரிகைகள் உண்மையான செய்தி களை வெளியிடாமல் 'பயங்கரவாதிகள்' என்று குறிப்பிடுவதற்குப் பதிலாக 'இனந்தெரியாதவர்கள்' என்று குறிப்பிட்டு உண்மைக்குப் புறம்பான செய்திகளையே வெளியிடுகின்றன. பிரபாகரன் உயிருடன் இருந்த காலத்திலேயே நான்தான் கருணாவுக்கு முகாம் அமைத்துக் கொடுத்து ஆயுதப்

பயிற்சிகளை வழங்குவதற்கு வித்திட்டுக் கொடுத்ததாகவும் என்னைக் கருணாவுடன் தொடர்பு படுத்தி என்னுடைய பெயரைக் குறிப்பிட்டும் சில பத்திரிகைகள் அன்று செய்திகளை வெளியிட்டன. அது உண்மையா? அப்படி நடந்ததா? இவை யாவும் பத்திரிகா தர்மத்தை மீறிய விடயங்கள்! நான் கடத்தல் சம்பவத்துடன் தொடர்புபட்டவன் என்று குறிப்பிடு கின்ற இந்தப் பத்திரிகைகள், கடந்த காலங்களில் உண்மை யிலேயே பயங்கரவாதிகளால் மேற்கொள்ளப்பட்ட கடத்தல் சம்பவங்களைப் பற்றிப் பிரசுரிக்கவில்லை என்பதைக் குறிப்பிட விரும்புகின்றேன். பலதடவைகள் மக்கள் ஆதரவுடன் பாராளு மன்றத்துக்குத் தெரிவுசெய்யப்பட்ட, சரியாகவும் உண்மையாகவும் பேசுகின்ற, நடைபெறுகின்ற விடயங்கள் அத்தனையும் சரியாகச் சொல்கின்ற வாய்மைமிக்க அரசியல்வாதி ஒருவரைப்பற்றி இவ்வாறு - கடத்தினார் அல்லது கடத்த முயற்சித்தார் என்று - பத்திரிகைகளில் எழுதுவதாகவிருந்தால், அவர்கள் அந்தக் கடத்தல் சம்பவம் தொடர்பாக முடியுமானவரை தகவலைப்பெற்று உண்மையைத் தெரிந்துகொண்ட பின்னர்தானே எழுதியிருக்க வேண்டும்! நான் இவர்களின் தவறைப் பொருட்படுத்தாது அந்தப் பத்திரிகை அறிக்கைக்கு விளக்கம் அளித்திருந்தேன்.

எப்பொழுது நான் மக்களுக்காக அரசியல் செய்ய வந்தேனோ, கிழக்கு மாகாணம் பிரிக்கப்பட்டு அங்கு வாழ்கின்ற தமிழ், முஸ்லிம் மக்கள் ஒற்றுமையாக வாழவேண்டுமென்றும் பயங்கரவாதம் அழிக் கப்படவேண்டுமென்றும் சொல்லியிருந்தேனோ, அன்றிலிருந்து பயங்கரவாதிகளும் அவர்களுக்கு ஆதரவானவர்களும் சில ஊடகத் தினரும் என்னைத் துரத்தித் துரத்தி அடித்தார்கள். நாங்கள் அச்சப் படவில்லை; பயப்படவில்லை. ஆகவே, இவ்விடயத்திலும் பயங்கர வாதிகள்தான் பின்னால் இருந்து செயற்படுகிறார்கள் என்று எனக்குத் தெரியும். அதனை நான் பின்பு சொல்வேன். என்னுடைய அரசியல் உயர்ச்சியில் காழ்ப்புணர்ச்சி கொண்டவர்களும் பயங்கர வாதத்தோடு தொடர்புடையவர்களும் காலத்துக்குக்காலம் எனக்கு எதிராக இவ்வாறான செய்திகளை வெளியிடுவதும் நான் சொல் வதைத் திரித்துக் கூறுவதும் வழக்கமாக இருந்து வந்திருக்கின்றது. அந்தவகையில், "மற்றுமொரு நாடகமாக நான் இதனைப் பார்க் கின்றேன்" என்று அப்பத்திரிகைக்குச் சரியாகத்தான் எழுதியிருந் தேன். உண்மையில், 'சுடர் ஒளி'யின் chief editor பயங்கர வாதியா, இல்லையா என்பது எனக்குத் தெரியாது. அவர் நல்லவ ராக இருக்கலாம்! ஆனால், அவரைத்தான் 'பயங்கரவாதி' என்று நான் சொன்னதாக எல்லோரும் அவரைத் 'தொப்பி' போட வைத்துவிட்டார்கள்; அவருடைய கல்லைச் சூடாக்கி, எனக்கு எதிராக நிறைய 'தோசை'களைச் சுட வைத்துவிட்டார்கள்; அந்தப் பத்திரிகையில் எனக்கு எதிராக நிறைய எழுத வைத்துவிட்டார்கள். ஆனால், நான் அப்படி அவரைச் சொல்லவில்லை. எனவே, அவர் 'தொப்பி'யைப் போட்டுக்கொள்ள வேண்டிய அவசியமில்லை. அதை வைத்துக்கொண்டு தொடர்ச்சியாக அந்தப் பத்திரிகை எனக்கு எதிரான கட்டுரைகளையும் அறிக்கைகளையும் திட்டமிட்டு எழுதப்பட்ட விடயங்களையும் பிரசுரித்து வந்திருக்கிறது. பத்திரிகையாளர்கள் சரியானமுறையில் அதனைப் பார்க்க வேண்டும்; விடயங்களைச் சரியானமுறையில் அறிந்துகொண்டு எழுதவேண்டும். உண்மையில், 'பயங்கரவாதிகள்' என்று நாங்கள் சொன்னதெல்லாம், சு.ப.தமிழ்ச்செல்வன் கொல்லப்பட்டவுடன் இந்த சபைக்குள் அவருக்காக அனுதாபம் தெரிவித்தவர்கள், பயங்கரவாதிகளுடனும் நோர்வேயுடனும் சேர்ந்து இந்த நாட்டைக் காட்டிக் கொடுக்க முனைந்தவர்கள், 'சமாதானச் செயலகம்' என்ற பெயரிலே வடக்கிலும் கிழக்கிலும் வாழ்கின்ற சிறுபான்மை இன மக்களை ஏமாற்றுவதற்குத் துணிந்துகொண்டிருக்கின்றவர்கள் போன்றவர்களைத்தான். அது உங்கள் எல்லோருக்கும் தெரியும். பயங்கரவாதிகளோடு தொடர்புடையவர்கள் இந்தப் பாராளு மன்றத் திலே இருக்கிறார்கள். அவர்கள்தான் எனக்கு எதிராக இந்த விடயத்திலும் பின்னால் இருந்து செயற்பட்டவர்கள் என்பதற்கு இப்பொழுது சாட்சி கிடைத்திருக்கிறது.

நாங்கள் இந்த நாட்டைக் காட்டிக்கொடுப்பவர்கள் அல்லர்; நாங்கள் இனத்துவேசிகள் அல்லர். முப்பது ஆண்டுகளுக்கு முன்பு இந்த நாட்டில் தமிழர்களும் முஸ்லிம்களும் சிங்கள மக்களும் எவ்வாறு சந்தோசமாக, மகிழ்ச்சியாக வாழ்ந்தார்களோ அந்த வாழ்க்கை எப்போதும் இந்த நாட்டில் இருக்கவேண்டுமென்று எண்ணுகின்றவர்கள். ஆனால், நாங்கள் பேசியதை அந்தப் பத்திரிகை திரித்து எழுதியது மாத்திரமல்ல, தொடர்ச்சியாக எழுதிக்கொண்டும் வந்திருக்கிறது. எங்களுடைய அரசியல் வாழ்க்கைக்குக் குந்தகத்தை ஏற்படுத்தி மானபங்கமேற்படுத்தி யமைக்காக அவர்களிடத்திலே நஷ்டஈடு கோருவோம். அதற்காக நீதிமன்றம் செல்வதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம். எனவே, இவ்வாறு பத்திரிகைகள் எழுதக்கூடாது. எழுத் தாளனுடைய பேனா முனையைப்பற்றி நாங்கள் கேள்விப்பட்டிருக் கிறோம். ஓர் எழுத்தாளன் எப்பொழுதும் நிதானமுள்ளவனாக இருக்கவேண்டும்; அவன் சிறுபிள்ளைத்தனமாக நடந்துகொண்டு இந்த நாட்டைக் குழப்பக் கூடாது; எழுத்திலே உண்மை இருக்கவேண்டும்; யதார்த்தம் இருக்கவேண்டும். சிறுபிள்ளைத் தனமாக நடந்துகொண்டு இப்படியான வேலைகளை அவர்கள் செய்யக்கூடாது. என் தொடர்பான விடயத்தை ஏற்கெனவே பத்திரிகையில் மிகத்தெளிவாகச் சொல்லிவிட்டு என்பாட்டில் நான் இருந்துவிட்டேன். ஆனால், சென்ற 8ஆம் திகதி ரவூப் ஹக்கீம் அவர்கள் இந்தச் சபையிலே அதனைப் பற்றிப் பிரஸ்தாபித்திருக் கிறார். அக்கரைப்பற்றில், மக்கள் அவருக்கு நோன்பு துறக்க இடமளிக்கவில்லை என்பதுதான் அவருடைய பிரச்சினை! அது மாத்திரமல்ல, நோர்வேயின் அனுசரணையில் இருந்து கொண்டு, இந்த நாட்டை எப்படிக் குலைக்கலாம், கிழக்கு மாகாணத்தில் பிரச்சினைகள் ஓர் ஆறாத புண்ணாக தொடர்ந்தும் இருக்கக் கூடாதா? என்ற எண்ணம்தான் அவருக்கு. ஏனெனில், கிழக்கில் யுத்தமும் பிரச்சினையும் இருந்தால்தான் அவரால் தன்னுடைய அரசியலைச் செய்ய முடியும்; பிரச்சினை இருந்தால்தானே அதைத் தீர்ப்பதாகச் சொல்லி மக்கள் மத்தியிலே போய் வாக்குக் கேட்க முடியும். அவருக்கு நாட்டில் வேறெங்கும் தொகுதியும் இல்லை; மக்கள் ஆதரவும் கிடையாது. அவருக்கு இருப்பது 'ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ்' என்ற பெயரும் கிழக்கு மாகாணத்தில் ஒருசிலரது ஆதரவும்தான். அந்தவகையில், அவர் கிழக்கு மாகாணத்திலுள்ள மக்களைக் குழப்புவதற்காக, அங்கு உண்மை யாகவே மக்கள் ஆதரவைப் பெற்றிருக்கின்ற தேசிய காங்கிரஸின் தலைமைத்துவத்துக்குச் சேறு பூசுவதற்காக நான் ஆட்கடத்தலில் ஈடுபட்டதாக இங்கே பாராளுமன்றத்தில், கடந்த 8ஆம் திகதி பேசியிருக்கிறார். 'ஆள் கடத்தல்கள்' அவர்களுக்குத்தான் பழக்கம்; அவர்களுக்கு ஆதரவளிக்கும் ஆட்கள், பயங்கரவாதிகள், விடுதலைப் புலிகள் என்போர்தான் ஆட்களைக் கடத்துபவர்கள்.

அதுமட்டுமன்றி, அந்தச் சம்பவம் தொடர்பாகப் பொலிசார் நடவடிக்கை எடுக்கவில்லையென பொலிசார் மீதும் குற்றஞ் சுமத்தியிருக்கிறார். பொலிசாரும் மற்றவர்களும் தமது கடமையைச் சரிவரச் செய்ததன் காரணத்தினால்தான் நாங்கள் இன்று கிழக்கு மாகாணத்திலே நிம்மதியுடன் வாழ்ந்து கொண்டிருக்கின்றோம். இன்று தமிழர்களும் முஸ்லிம்களும் சிங்களவர்களும் ஒருவரை யொருவர் முகம் பார்த்துப் பேசுகின்ற சுதந்திரம் எங்களுக்குக் கிடைத்திருக்கிறது. ஆனால், இவரோ பொலிசார் தமது கடமை களைச் சரிவரச் செய்யவில்லை எனக் குறிப்பிட்டிருக்கிறார். குமாரி கூரேயின் கொலை தொடர்பாக விசாரணை சரியாக நடக்க வில்லை என்ற எண்ணத்தை வைத்துக்கொண்டு அவர் பேசியிருக் கின்றார் என்றுதான் நான் நினைக்கின்றேன். அதுமாத்திரமல்ல, அவர் மனித உரிமை மீறல் வழக்குத் தாக்கல் செய்யப் போவதாகவும் சொல்லியிருக்கிறார். நல்ல விடயம். மனித உரிமை மீறல் என்று குற்றஞ் சாட்டி வழக்குத் தாக்கல் செய்தால்தான் மனித உரிமைகளை மீறியவர்கள் யார் யார் என்பதை எங்களால் கண்டுபிடிக்க முடியும். மக்களின் உயிர்கள் வாழ்வதற்கான உரிமையைக் கொடுக்க வேண்டும் என்று Supreme Court சொல்லியிருக்கிறது. குமாரி கூரே வாழ்வதற்கான உரிமை அளிக்கப்பட்டிருந்ததா? என்று நான் இந்தச் சபையிலே கேட்க விரும்புகின்றேன். குமாரி கூரேயினுடைய மரணம் தொடர்பாக அவதானிக்கும்பொழுது, அங்கு மனித உரிமை மீறப்பட்டிருக் கின்றது. 'தற்கொலை' என்ற பெயரில் தாங்கள் மறைந்துவிடலாம் என்று யோசிக்கின்றவர்கள்தான் இன்று மனித உரிமையைப் பற்றிப் பேசுகின்றார்கள். தான் அரசியலுக்குள் வரவேண்டும் என்பதற்காக உடத்தலவின்னையில் 11 பிள்ளைகள் கொல்லப் படுவதற்குக் காரணமானவர்கள், 11 பிள்ளைகள் கொல்லப்பட்டு அழிந்தாலும் பரவாயில்லை, தான் பாராளுமன்றத்துக்குள்

[ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා]

பிரவேசிக்க வேண்டும் என்ற எண்ணத்தில் மனித உரிமையை மீறியவர்கள் இன்று மனித உரிமையைப் பற்றிப் பேசுகின்றார்கள். அன்று சாய்ந்தமருதில் ஜாபிர் என்பவர் தங்களுக்கு எதிராக இருக்கின்றார் என்பதற்காக இரவோடு இரவாக அவரைக் கொல்ல வைத்து, அடுத்தநாள் கூட்டத்தை நடத்தப் போனவர்கள்தான் இன்று மனித உரிமையைப்பற்றிப் பேசிக்கொண்டிருக்கின்றார்கள். யார் இவர்கள்? குழப்பம், கடத்தல் என்பவற்றுக்கு முக்கியத்துவம் கொடுக்கின்ற இவர்களால் இந்த நாட்டிலே நீதியான அரசியலும் சுதந்திரமும் இருக்கின்றபொழுது அரசியல் செய்ய முடியாதுள்ளது. உண்மையிலே யோசித்துப் பாருங்கள்! இந்த நாட்டின் எந்தவொரு பாராளுமன்ற உறுப்பினருடைய வீட்டுக்கு முன்னாலாவது பெண்ணொருவர் மரணித்த சம்பவம் நடந்திருக்கிறதா? இந்தச் சபையும் நீதித்துறையும் பாதுகாப்புப் பகுதியும் ஏன் இந்த குமாரி கூரேயின் விடயத்தை ஒரு மனித உரிமைப் பிரச்சினையாக எடுக்கக்கூடாது? இவ்வளவு பிரச்சினைகளையும் தனக்குள்ளே வைத்துக்கொண்டு, நோர்வேயின் கைப்பொம்மையாக பணத்துக்-காக மாத்திரம் அரசியலைச் செய்துகொண்டு, நீதியாகவும் நியாயமாகவும் அரசியலைச் செய்கின்ற, மக்கள் ஆணையையும் மக்கள் செல்வாக்கையும் பெற்ற தேசிய காங்கிரசின் தலைமைக்குச் சவால் விடுத்து, இங்கு மனித உரிமையைப்பற்றிப் பேசுவதற்கு வந்திருக்கிறார். இவர் பின்னால் இருக்கும் அந்த மௌலவியைப் பற்றி நாங்கள் பேசவேண்டியிருக்கின்றது. யார் இவர்கள்? பத்திரிகையாளர்களும் அதனைத் தெரிந்துகொள்ளவேண்டும். எமது பள்ளிவாசல்களைப் பராமரிப்பதற்கு வக்பு சபை இருக்கிறது. கிழக்கு மாகாணத்திலே ஒவ்வொரு மாவட்டத்திலுமுள்ள பள்ளி வாசல் நிர்வாகத்தினரும் சேர்ந்து unofficial ஆக சம்மேளனங்களை அமைப்பது வழக்கம்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

கௌரவ அமைச்சர் அவர்களே, உங்களுக்கென ஒதுக்கப்பட்டுள்ள நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

තව විනාඩි පහක් ඕනෑ. මම කිව්වා, දිනේෂ් ඇමතිතුමාට.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

දැන් එතුමාට කියලා වැඩියෙන් වෙලාව දීලා දැන් ඒවාත් ඉවරයි. ඔබතුමාගේ සම්පූර්ණ වෙලාවත් ඉවරයි. ඇමතිතුමාට දෙන්න.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

ඇමතිතුමා වෙලාව දෙන්න කිව්වා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

වෙලාව නැහැ ඇමතිතුමා. නැහැ නැහැ මම කිව්වා. දිනේෂ් ඇමතිතුමා, පොඩ්ඩක් වෙලාව දෙන්න. ආ, හරිලු.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

இந்தப் பள்ளிவாசல் அமைப்புக்கள் தேவைக்கேற்ப காலத்துக்குக் காலம் கூடி பேசும். கிழக்கு மாகாண அனைத்துப் பள்ளிவாசல்களின் சம்மேளனம் என்ற பெயரிலும் கூட்டங்கள் கூட்டப்பட்டன. உண்மையிலே பள்ளிவாசல்களினுடைய தலைவர் களின் பதவிக்காலம் முடிந்தவுடன் சம்மேளனத்தின் பதவியை விட்டு அவர்கள் நீங்க வேண்டும். பதவி வழியாக அடுத்தவர் பதவிக்கு வருவார். ஆனால், குறிப்பிட்ட இவர்கள் மாத்திரம் அந்தப் பெயரையே வைத்துக்கொண்டு கடந்த வருட Budget விவாதத்தின்பொழுது "அரசாங்கத்துக்கு எதிராக வாக்களியுங்கள்" என்று எழுதுவதற்குக் கூட இந்த மௌலவியையும் இந்த அமைப்பையும் சிலர் –

*[ මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

பாவித்திருக்கிறார்கள்.

மாகாணசபைத் தேர்தலிலும் அரசாங் கத்துக்கு எதிராக வாக்களிக்கும்படி சொல்வதற்காகவும் அவ் வமைப்பைப் பாவித்தார்கள். இவர்களுக்குப் பின்னால் நோர் வேயும் பயங்கரவாதிகளும் இருந்தார்கள் என்பதற்கு அது பெரிய சாட்சியாகும். அதுமாத்திரமல்ல, ஏற்கனவே அந்தச் சம்மேளனத் தில் அங்கத்தவர்களாக இருந்த இரண்டு - மூன்று பேர் மற்றும் பள்ளிவாசல் நிர்வாகிகள் ஆகியோர் இவர்களுக்கு எதிராக முறைப்பாடு செய்ததுடன், அது சம்பந்தமாகப் பாராளுமன்றத்தில் பேசும்படியும் கேட்டிருக்கின்றார்கள். என்ன தெரியுமா? வெளி நாடுகளில் இருந்து பணத்தைப் பெற்று, களவாகத் தங்களுடைய வேலைகளைச் செய்வதற்காக கிழக்கு மாகாண அனைத்துப் பள்ளிவாசல்கள் சம்மேளனம் என்ற அந்தக் கண்ணியமான சபையைக் கம்பனிச் சட்டத்தின்கீழ் பதிவதற்கு ஏற்பாடு செய்ததாகவும் அதற்கு அவர்களை ஏமாற்றிக் கையெழுத்து வாங்கியதாகவும் முறைப்பாடு செய்துள்ளார்கள்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! உங்களுக்குரிய நேரம் முடிவடைந்து விட்டது.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

இது தொடர்பாகப் பள்ளிவாசல்களின் தலைமைகளும் கேள்வி எழுப்புகின்றன. இன்று இப்படியான முடிச்சுமாறிகள் - சங்கங்கள், இயக்கங்கள் என்ற பேரில் மக்களை ஏமாற்றுகின்றவர்கள் - பற்றிப் பள்ளிவாசல்களை இயக்குகின்ற, நடைமுறைப்படுத்துகின்ற, பராமரிக்கின்ற வக்பு சபையிடம் சாதாரண முஸ்லிம் மக்கள்கூட இன்று கேள்வி எழுப்புகின்றார்கள்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! உங்களுக்குரிய நேரம் முடிவடைந்து விட்டது.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

பொதுச் சேவை செய்யும் முகமாகப் பதவி வகிக்கின்ற இவர்கள், பதவியைத் துஷ்பிரயோகம் செய்து, தமது சொந்தத் தேவையைப் பூர்த்தி செய்யும் வகையில், அதனை Companies Act இன் கீழ் பதிவதற்கு முயற்சி செய்துள்ளார்கள். அண்மையில் 'சுடர் ஒளி' பத்திரிகைக்கு ஓர் அறிக்கையை வெளியிட்ட அந்த இயக்கத்தின் செயலாளர் என்பவர் தமது தலைமை பற்றிக் கேள்வியெழுப்புவது யார் என்று கேட்டிருக்கின்றார்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

கௌரவ அமைச்சர் அவர்களே! உங்களுக்குரிய நேரம் முடிவடைந்து விட்டது.

ගරු මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වන්න. මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනට පැමිණෙනවා.

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු පියංකර ජයරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு பியங்கர ஜயரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. PIYANKARA JAYARATNE] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අතාවුල්ලා ඇමතිතුමා.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

கிழக்கிலங்கை பள்ளிவாசல்கள் சம்மேளனத்தின் தலைவர் அந்த மௌலவிதான் என்று சான்றிதழிலே இருக்கின்றது என்றும் அவர் அதில் கூறியிருக்கின்றார். ஆனால், அவர் தனக்குப் பணம் சேர்ப்பதற்காகவே அந்தச் சம்மேளனத்தைப் பாவித்திருக்கின்றார் என்றுதான் நான் இங்கு சொல்ல வேண்டும். அவர் மதீனாவிலே இருந்து மௌலவியாக வந்தவுடன் உலமாக்களுடைய letterhead ஐப் பாவித்து ஐயாயிரம் அமெரிக்க டொலர் பணத்தைப் பெற்றுத் தனது சொந்த வங்கிக் கணக்கில் வைப்பிலிட்டதனால் அக்கரைப்பற்றில் இயங்கிய உலமா சபை விரிசலடைந்தது. இன்னுமே அது ஒட்டாமல் இருக்கின்றது.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

இவ்வாறான சுயநலவாதிகளை வைத்துக்கொண்டுதான் உண்மையான அரசியல்வாதிகளுக்குச் சேறு பூசுகின்ற நடவடிக்கைகளுக்கு இன்று இந்தப் பாராளுமன்றத்தைப் பாவிக்கின்றார்கள். அது மாத்திரமல்ல, நியாயமாக நடந்து கொள்கின்ற பத்திரிகைகளைப் பிழையாக வழிநடத்தி 'பயங்கரவாதி' என்று உங்களைத்தான் குறிப்பிடுகின்றார்கள் என்று சம்பந்தப்பட்ட பத்திரிகையாளர்களிடம் கூறி, அமைச்சர்களுக்கும் மற்றவர்களுக்கும் எதிராக எழுதுவதற்கும் அந்தப் பத்திரிகைகளை அவர்கள் தூண்டுகின்றார்கள்.

பத்திரிகையாளர்களே! உண்மையிலே நீங்கள் பெரும் புண்ணியவான்கள். அரசியல்வாதிகளையும் மற்றும் தலைவர்களையும் விட உங்களுடைய பேனா முனை மிகவும் புனிதமானது. உண்மையிலே அதனை நீங்கள் பாதுகாக்க வேண்டும். யாரோ சொல்கின்றார் என்பதற்காக, யாரோ பொலிசில் complaint செய்தார் என்பதற்காக சரியாக ஆராயாமல் எவருக்கும் எதிராகச் சேறு பூசிப் பத்திரிகைகளிலே எழுதுவதை நீங்கள் தவிர்த்துக் கொள்ளவேண்டும்! அப்படி எழுதுவதை நீங்கள் தர்மம் என்று கருதினால், நான் முன்பு சொன்னதுபோல பிரபாகரன் கடத்திய அத்தனை கடத்தல்கள் பற்றியும் எழுத வேண்டும். அதாவது, "பிரபாகரன்தான் கடத்தினார், பயங்கரவாதிகள்தாம் கடத்தினார்கள், பயங்கரவாதிகள்தாம் கொலை செய்தார்கள், பிரபாகரன்தான் கொள்ளையடித்தான், பிரபாகரன்தான் பள்ளிவாசலுக்குள் சுட்டான்" என்று 'சுடர் ஒளி' பத்திரிகை பிரசுரிக்க வேண்டும்.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Minister, please wind up.

**ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ. எல். எம். அதாஉல்லா)
(The Hon. A. L. M. Athaullah)

இவ்வாறு ஒருநாளும் சொல்லாமல், "இனந் தெரியாதவர்கள்" என்று குறிப்பிட்டுவந்த 'சுடர் ஒளி', தனக்குத் தெரியாத ஒரு விடயம் குறித்து - அதாஉல்லா அமைச்சருக்கு எதிரான ஒரு விடயம் குறித்து - பேசியிருக்கக்கூடாது. ஆகவே, பத்திரிகைகள் நியாயத்தை எழுத வேண்டும். இந்த நாட்டில் மனித உரிமையை மீறியவர்கள் பற்றி -

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

சரியாக எழுத வேண்டும்! அவரது வீட்டிற்கு முன்னால் குமாரி கூரே என்பவர் இறந்து கிடந்தாளே! அவளுடைய உரிமையை மீறியது யார் என்று நீங்கள் எழுத வேண்டும். இவற்றைவிடுத்து, சாதாரணமான, மக்களைப் பற்றியே யோசிக்கின்ற ஓர் அமைச்சரைப் பற்றி எழுதக்கூடாது. இருந்தாலும், நான் இது சம்பந்தமாக நீதிமன்றம் செல்வேன் என்று கூறி விடை பெறுகின்றேன். நன்றி.

[අ. භා. 2.18]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය, මේ ආණ්ඩුව මේ අවුරුද්ද තුළ ඉදිරිපත් කරන ලද 24 වැනි පරිපූරක ඇස්තමේන්තුවයි. 24 වැනි පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධයෙන් කථා කරන්නට ලැබීම ගැන මම ලජ්ජා වනවා; ලජ්ජාවටත් කනගාටුවටත් පත් වනවා. මොකද, රුපියල් කෝටි 5,400ක් මේ පරිපූරක ඇස්තමේන්තු 24 සඳහා මේ ආණ්ඩුවේ වියදම් විධියට දමලා තිබෙනවා. ඇමතිවරුන්ට වාහන ගන්න ඒවා, ඇමතිවරුන්ගේ කාර්යාල අලුත්වැඩියා කරන ඒවා ඒ සියල්ල එකට එකතු කරලා දමලා තිබෙනවා. මේ මුදල් ටික පාස් කරන්න පුළුවන්. ඒ සඳහා ආදායම හම්බ වෙන්නේ කොහෙන්ද කියලා මම අහන්න කැමැතියි. ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා මෙතැන නැති වුණත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉන්න නිසා මම කැමැතියි ඒක අහන්න. කොහෙන්ද මේ සඳහා ආදායම් ලැබිලා තිබෙන්නේ? මේ වන විට බදු ආදායම රුපියල් කෝටි 1,450කින් කඩා වැටිලායි තිබෙන්නේ. අපි අය කර ගන්න හදන බදු ටික අය කර ගන්න බැරුව අද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් කියනවා, එක දවසක් නොමිලයේ වැඩ කරන්න කියලා. මේ ආණ්ඩුවේ බදු ආදායම එතැනට වැටිලායි තිබෙන්නේ. ඒවා එකතු කර ගන්න බැරි තත්ත්වයකයි තිබෙන්නේ. මුලින්ම පටන් ගන්න කොට බදු ආදායම මෙච්චරයි කියලා ලොකු ගණන් දෙනවා. ඇමතිවරු පිනවන්න, ජනාධිපතිතුමා පිනවන්න නිලධාරින් වාර්තා ගෙනැල්ලා දෙනවා. අන්තිමට බදු ටික එකතු කර ගන්න බැහැ. අවසාන වන විට ආණ්ඩුවට සල්ලි නැහැ. දැන් මොකක්ද කරන්නේ? උදේ ඉඳන් රෑ වන තෙක් රේගු දෙපාර්තමේන්තුවට - Sri Lanka Customs එකට - කථා කරනවා; මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට කථා කරනවා. ආදායම් බදු ගන්න තිබෙන සියලු ආයතනවලට කථා කරමින් පුළුවන් තරම් බදු ටික එකතු කර ගන්න අවශ්‍ය කටයුතු ටික තමයි ලැහැස්ති කරන්නේ. රටේ බදු ආදායම නැතිව, තමන්ගේ pocket එකේ සල්ලි නැතිව අනුන්ගේ pocketsවලින් වියදම් කරන ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලායි තිබෙන්නේ. ජනතාවගෙන් බදු මුදල් අර ගෙන ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ සුඛ විහරණය සඳහා පාවිච්චි කරන ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. මම ඒකයි කිව්වේ. අය වැයක් ඉදිරිපත් කරනවාය කියපු ආණ්ඩුව; ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා පාර්ලිමේන්තුවේ විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවෙන් පිටතත් හැම තැනකම කථා කරමින් ගියා, "අය වැයක් ඉදිරිපත් කරනවා. ඒ සඳහා ඔක්කොම ලැහැස්ති වෙලායි ඉන්නේ. ඒ සියල්ලටම අපි සූදානම්" කියලා. අවසාන වශයෙන් සියඹලාපිටිය ඇමතිතුමාගෙන් සියඹලා ටොෆියක්වත් ලැබෙන්නේ නැති තැනකට තමයි වැටිලා තිබෙන්නේ. දැන් එතුමාගෙන් සියඹලා ටොෆියක් තමයි ඉල්ලා ගන්න තිබෙන්නේ. එතැනටයි වැටිලා තිබෙන්නේ.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

මෙවර අය වැය ඉදිරිපත් නොකර ඉන්නේ ඇයි? අය වැය ඉදිරිපත් කරන්නේ නැත්තේ වෙනත් හේතුවක් නිසා නොවෙයි; ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි එකින් එක, එකින් එක ඉෂ්ට කරන්න සිද්ධ වන නිසයි. අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීම තුළින් අන්තිමට සිද්ධ වන්නේ වියදම් ටික විතරක් දමන එකයි. තමුන්නාන්සේලාට ආදායම් සොයා ගන්නා විධි, ක්‍රම ගැන කිසිම වැඩ පිළිවෙළක් නැහැ. තමුන්නාන්සේලාට වියදම් ටික දමන්න පුළුවන්, වියදම් ඕනෑ තරම් තිබෙන නිසා. ආදායම් මාර්ග සොයා ගන්නා විධි, ක්‍රම නැහැ. අය වැය හිඟය පියවන්නේ කොහොමද කියන එක ගැන කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ලබන ජනවාරි, පෙබරවාරි, මාර්තු වන තෙක් මේක ඇද ගෙන යන්න තමයි තමුන්නාන්සේලා බලන්නේ. රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා මේ අතුරු සම්මත ගිණුම පිළිබඳව කරුණු පැහැදිලි කරන කථාවේ දී බොහොම පැහැදිලිව කිව්වා, ඉදිරියේ දී පත් වන පාර්ලිමේන්තුවට ගෞරවණීය විධියට අය වැය හදන්න තිබෙනවාය කියලා. හොඳයි. අපි දැන් ඒකට සූදානම් වෙලායි ඉන්නේ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් යටතේ නියම අය වැයක් අපි ලබන අවුරුද්දේ ජනවාරි, පෙබරවාරි වන විට ඉදිරිපත් කරන්න අවශ්‍ය වැඩ කටයුතු ලැහැස්ති කරලායි තිබෙන්නේ.

අද මේ ඉදිරිපත් කර තිබෙන පරිපූරක ඇස්තමේන්තුවලින් රුපියල් කෝටි 5,400ක් වියදම් සඳහා යොමු කර තිබෙනවා. මේ සම්බන්ධව අද ඉදිරිපත් වෙලා තිබෙන ආයතන එකින් එක ගත්තොත්, අපේ ටී.බී. ඒකනායක ඇමතිතුමාත් ඉන්න නිසා "මඟ නැගුම" ආයතනය පිළිබඳව ඉස්සරවෙලාම පොඩි කථාවක් කරන්න මම කැමැතියි. මොකද? පසු ගිය සති කිහිපය තුළ ගරු පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමියත්, -එතුමිය මෙතැන ඉන්නවා.- ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාත් දෙන්නම එකතු වෙලා ඒක රාජ්‍ය ආයතනයක්ය කියන්නේ කොහොමද කියන එක ගැන විවිධ කාරණා ඉදිරිපත් කළා. ඒ කාරණා ඉදිරිපත් කළේ නිකම් තමන්ගේ හිතූ මනාපෙටයි.

මම ඉස්සර වෙලාම ගන්නවා, ටී.බී. ඒකනායක ඇමතිතුමාට ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා එවපු ලිපිය.

"2007.04.09

ගරු මහාමාර්ග අමාත්‍ය,
ටී.බී. ඒකනායක මැතිතුමා.

හිතවත් අමාත්‍යතුමනි,

<u>රාජකාරි සහ වගකීම්</u>

"..මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතෙහි ඇති මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ සහ මගනැගුම සමාගම් තුනෙහි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හැර අනිකුත් සියළුම කටයුතු පාලනය සහ අධීක්ෂණය ඔබ වෙත පවරමි.

මේ අනුව මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය ඇතුළු අනිකුත් අදාල ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු ද පරිපාලන, මූල්‍ය පාලන හා අධීක්ෂණ කටයුතු ද ඔබට අයත් වනු ඇත."

ඒ කියන්නේ පරිපාලනයත් අයිතියි; මූල්‍යමය කටයුතුත් අයිතියි. ඒ සම්බන්ධව තිබෙන පරිපාලන කටයුතු සියල්ල ටී.බී. ඒකනායක ඇමතිතුමාට පවරමින් ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා විසින් එවන ලද ලිපියයි ඒ. ඕනෑ නම් පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමියටත් මේක බලා ගන්න පුළුවන්. "මේක රාජ්‍ය ආයතනයක් නොවෙයි, මේක රාජ්‍ය ආයතනයක් නොවෙයි" කියලා නිකම් කෑගැහුවාට හරි යන්නේ නැහැ. මේ පළමු වන ලිපිය. මේක හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. මා එම ලිපිය **සභාගත*** කරනවා. [බාධා කිරීමක්]

ඊ ළඟට 2007.08.20 ජයන්ත ධනපාල මහතාට- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. අහ ගන්නකෝ. කලු මල්ලි, පොඩ්ඩක් අහ ගන්න. [බාධා කිරීමක්] කලු මල්ලි, අහ ගන්නකෝ. [බාධා කිරීමක්] කලු මල්ලි, අහ ගන්නකෝ.
එම ලිපිය මෙසේයි:

**<u>"ප්‍රගති සමාලෝචන රැස්වීම - මග නැගුම ආයතනය.</u>**

ඔබ විසින් මා වෙත එවා ඇති 2007-08-14 දිනැති ලිපිය හා බැඳේ.

ගරු මහාමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ඔබ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමග, සමාගමේ වර්ථමාන ගැටළු පිළිබඳ සාකච්ඡාවක් 2007-08-22 දින ප.ව. 3.00 ට මෙම අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පැවැත් වීමට තීරණය කර ඇත.
කරුණාකර ඉහත සාකච්ඡාවට ඔබ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමග සහභාගිවන්න.
අ/කළේ
එස්.ඒ.ඩී.එස්. සුබසිංහ,
අතිරේක ලේකම් (මග නැගුම අංශය),
මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය,
ලේකම් වෙනුවට. "

මේ ලිපියත් මම හැන්සාඩ්ගත කිරීම සඳහා **සභගත*** කරනවා.

තවත් කාරණා මට ඉදිරිපත් කරන්න තිබෙනවා. මග නැඟුම ආයතනය කියන්නේ බොහොම පැහැදිලිව රාජ්‍ය ආයතනයක්. ඒකට බිලියන 10ක වත්කම් සහිත ලබා දුන්න ලිපිය මේ. 2007.01.25 දින දරන ලිපිය මම ඉදිරිපත් කරනවා. මේ සම්බන්ධ විස්තර එහි තිබෙනවා. ගරු ඇමතිතුමන්ලාගේ දැන ගැනීම සඳහා මම මේ ලිපියත් හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

මෙතැන බොහොම පැහැදිලි වනවා, ලංකාවේ රාජ්‍ය ආයතන ගණනාවක් ගැන. විශේෂයෙන් පළමු වන එක වශයෙන් මම කියන්න කැමතියි, ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම ගැන; මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා හරියට කෑ ගහන සමාගම ගැන. ඒ ගොල්ලෝ ඔක්කොම දැන් මේ ගරු සභාවෙන් යනවා. පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමියත් යනවා. පොඩ්ඩක් මෙහාට එන්න. මේ ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ආයතනය, මග නැගුම යන්ත්‍රෝපකරණ ආදි වශයෙන් ඒ ආයතන තුන රාජ්‍ය ආයතන. ටී.බී. ඒකනායක ඇමතිතුමා මේ ගැන දන්නා නිසා කථා කර විස්තරයක් කරයි කියා මා හිතනවා, රාජ්‍ය ආයතනයක්ද නැද්ද කියා. ඊට අමතරව ලංකා ලොජිස්ටික්ස් ආයතනය, ඊට අමතරව එයාර් ලංකා කියන මේ ආයතන සියල්ල රාජ්‍ය ආයතන විධියට තමයි කොටස් ලබා දීලා හදා තිබෙන්නේ. දැන් මේ ඉදිරිපත් කරන අලුත් තර්කය අනුව තමුන්නාන්සේලා මේ මග නැගුම ආයතනයට දෙන කොන්ත්‍රාත් ටික -මේ කොන්ත්‍රාත් දෙන කොට- තමුන්නාන්සේලා දෙන්නේ ටෙන්ඩර් පටිපාටියකින් තොරවයි. ටෙන්ඩර් පටිපාටියකින් තොරව දෙනවා නම් බොහොම පැහැදිලියි ඒක රාජ්‍ය ආයතනයක් කියා. රාජ්‍ය ආයතනයක් නොවන ආයතනයකට ටෙන්ඩර් පටිපාටියක් නැතිව කෝටි ගණන්වල මාර්ග ඉදි කිරීමට අනුමැතිය දෙන්නේ කොහොමද කියා මෙතැන ටී.බී. ඒකනායක ඇමතිතුමාත් සිටින නිසා මා අහන්න කැමතියි. මා හිතනවා එතුමාත් එකඟ වෙලා තිබෙනවාය කියා. එතුමා එකඟයි. ඒ විතරක් නොවෙයි. 2008.02.08 වන දින "ලංකාදීප" පත්‍රයේ මෙහෙම වාර්තාවක් තිබෙනවා:

---

**** * * කථාව අවසානයේ පළ කර ඇත.***
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

**"මග නැගුම යන්ත්‍රෝපකරණ සමාගමේ සභාපතිට ඇමතිගෙන් ලිපියක්**

මග නැගුම යන්ත්‍රෝපකරණ සමාගම තමාගේ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් නිසා එහි විධායක නිලධාරින්පත් කිරීමේදී තමාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බව ද ඇමතිවරයා වශයෙන් සමාගමේ වැඩ කටයුතු ගැන පාර්ලිමේන්තුවට සහ ජනාධිපතිවරයාට වගකීමට තමා බැඳී සිටින බව ද සඳහන්කරන ඒකනායකමහතා ඒඅනුව සභාපතිවරයා තමාටත් ඇමතිවරයාටත් අමාත්‍යාංශයටත් වගකිව යුතු පුද්ගලයකු බව පෙන්වා දීමට සිදු වීම ගැන කනගාටු වන්නේ යැයි ද වැඩි දුරටත් සඳහන් කර තිබේ."

මේ අපේ ටී.බී. ඒකනායක ඇමැතිතුමා මග නැගුම සභාපතිවරයාගේ ප්‍රශ්න සම්බන්ධයෙන් යවන ලද ලිපිය සම්බන්ධයෙන් 2008.02.08 වන දින "ලංකාදීප" පුවත් පත පළ කර තිබෙන විස්තරයක්. මා එම විස්තරය **සභාගත*** කරනවා. මේ ලේඛනයත් හැන්සාඩ් වාර්තාවට එකතු කරන්න කියා මා ඉල්ලනවා.

මොකද, තමන්ගේ ගජමිතුරු යහළුවෝ හොරකම් කරන විට, තමන්ගේ ගෙවල්වල පාරවල් හදලා දෙන කොට, තමන්ගේ ගෙවල්වලට යන පාරවල් හදන්න කොන්ත්‍රාත් ටික තමන්ගේ යහළුවන්ට දෙන විට විවිධ ඇමතිවරු ඇවිල්ලා මේ සභාව ඇතුළේ ඒ අය ආරක්ෂා කරනවා. හැබැයි අනික් පැත්තට සභාපතිවරු හොරකම්, දූෂණ කරන විට, මේවා ගහ ගෙන කන විට ඇවිල්ලා මේ සභාව ඇතුළේ ඒ අය ආරක්ෂා කරනවා. ඒකයි මා මේ පෙන්වූයේ. ඒ විතරක් නොවෙයි. තවත් තිබෙනවා. මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ටී.කේ.පී. මහානාම මහතා, අතිරේක සාමාන්‍යාධිකාරී-

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
මම පැහැදිලි කිරීමක් කරන්නද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එපා. මම කථා කළාට පස්සේ කථා කරන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
නිවැරදි වන්න ඕනෑ. ඒකයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. ඔබතුමා පසුව නිවැරදි කරන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
කාලය ගන්නද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එපා. පසු වෙලා කථා කරන්න. බොහොම ස්තුතියි. මා මේ කියන්නේ ඔබතුමාටත් හොඳට. [බාධා කිරීමක්] නැහැ. මට ඉතාම හොඳයි. තමුන්නාන්සේට ඊටත් වැඩිය හොඳයි. මොකද, ඇමතිතුමා දන්නවා, දැන් RDA එකේ කොටසක් පැලියගොඩට අර ගෙන යන්න හදනවා.

ඒකේ ගොඩනැඟිල්ලක් ඉදි කරලා තිබෙනවා, කෝටි ගණනක් වියදම් කරලා. ඊට අමතරව, දැන් ඉන්න ආරක්ෂක අංශයේ නිලධාරි සියලු දෙනාම මාරු කරලා, ආරක්ෂක අංශයට අලුත් කට්ටියක් ඇවන්ට් ගාර්ඩ් සෙකියුරිටි එකෙන් අරන් තිබෙනවා, පෞද්ගලික security එකක් දමන්න. මේ සියලු දෙනා ජනාධිපතිතුමාගේ බෙලිඅත්ත ආසනයේ වැඩ කරපු අය.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තව විනාඩි දෙකක් මට තිබෙනවා නේ.

මම ගිය සතියේ check කළා. හිල්ටන් එකේ 1901 කාමරයේ තමයි එතුමා සිටියේ. එතුමාගේ බිල ඩොලර් 1,800යි. මඟ නැගුම සභාපතිවරයාගේ එක දවසක වියදම 1,80,000යි. මේවා අපි කථා කරන්නේ වෙන කාරණයක් හින්දා නොවෙයි. අඩුම තරමින් මේ රටේ හොරකම් කරන එක, දූෂණය කරන එක, මං කොල්ල කන එක නතර වෙයි කියලායි.

තව විනාඩි දෙක තුනක් තිබෙන නිසා මම කියන්නම්. ඊ ළඟට තවත් ඉන්නවා සභාපතිවරු. මම කියන්න කැමැතියි, මේ පාර්ලිමේන්තුවේ අපි ඉල්ලීමක් කළා, අපේ UDA එකේ සභාපතිවරයාට තිබෙන දූෂණ චෝදනා සම්බන්ධව කමිටුවක් පත් කරන්න කියලා, එම ආයතනයේ -නාගරික සංවර්ධන අධිකාරියේ- තිබෙන ප්‍රශ්න සම්බන්ධව කථා කරන්න. මේ වන තුරු ඒ ෆයිල් ටික දුන්නේ නැහැ. ෆයිල් ටික හංගා ගෙන ඉන්නවා. ඇමතිවරයා එකක් කියනවා. සභාපතිවරයා තව එකක් කියනවා. මව් පාර්ශ්වයේ හෝ පිය පාර්ශ්වයේ ඥාතියෙක් හින්දා මේක ආරක්ෂා කරනවාද කියලා මම දන්නේ නැහැ. මේ සභාපතිවරයා වාහන පහක් පාවිච්චි කරනවා. ළඟදී වාහනයක් ගත්තා, රුපියල් ලක්ෂ හැටකට වැඩියි ඒ වාහනයේ වටිනාකම. මේ කාගේ සල්ලිද? තමුන්නාන්සේලා මේ පරිපූරක ඇස්තමේන්තු දමනවා, මේ රටේ දුප්පත් මිනිසුන්ගේ බදු ටික අරගන්නවා. අනෙක් පැත්තෙන් බලපුවාම මිනිසුන්ට ජීවත් වන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ඉන්න ගෝලයෝයි, ඉත්තෝයි, කුඩ අල්ලන අයයි, ප්‍රශස්ති ගී ගායනා කරන අයයි මේ කට්ටිය තමයි අද මේ රටේ අහිංසක දුප්පත් මිනිසුන්ගේ බදු ආදායමෙන් ජීවත් වන්නේ. ඒ නිසා මම කියන්න කැමැතියි, ඒ සම්බන්ධයෙන් වහාම මැදිහත් වන්න කියලා.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම අනෙක් කාරණය තමයි නාගරික සංවර්ධන අධිකාරියේ ඇති වෙලා තිබෙන දූෂණ. දැන් අමාත්‍යවරයා දන්නේ නැහැ, සභාපතිවරයා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැඩ තහනම් කරලා. ඒ පත් කිරීමේ බලය තිබෙන්නේත් අස් කිරීමේ බලය තිබෙන්නේත් අමාත්‍යවරයාට; දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට. හැබැයි දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට ඉහළින් සභාපතිවරයා වැඩ කරනවා; සභාපතිවරයා අධ්‍යක්ෂ ජනරාල්වරයාව අයින් කරනවා, පහු වෙනි දා උදේ ලියුමක් ගහලා. ඒ කියන්නේ ආපහු ඇමතිතුමා ලියුමක් ගහනවා, "මේක වැරදියි, මේකට විරුද්ධව මම පියවර ගන්නවා, වහාම ඔහුව නැවත සේවයේ පිහිටුවන්න" කියලා. දැන් එහාටත් නැහැ, මෙහාටත් නැහැ. එහෙම පිටින්ම නාගරික සංවර්ධන අධිකාරිය වැඩ කෙරෙන්නේ නැති එහාට මෙහාට අදින වැඩ පිළිවෙළක් බවට පත් වෙලායි තිබෙන්නේ.

මම හිතන්නේ රජ්ජුරුවන්ගේ ගෝලයෝ මේ ආයතනවලට එන කොට අනෙක් කට්ටිය එක්කෝ භය වෙලා ඉන්න ඕනෑ, නැත්නම් ඇමතිවරු ශබ්ද නැතුව නිකම් ඉන්නවා. මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට අද තිබෙන්නේ පෙට්‍රල් ටිකයි, වාහනයයි විතරයි. ඇමතිවරුන්ට කිසි බලයක් නැහැ. ඇමතිවරුන්ගේ තීන්දු තීරණ ගන්නේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන්. උපදේශකවරුන්

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

[ගරු දයාසිරි ජයසේකර මහතා]

තමයි තීන්දු ගන්නේ. කැබිනට් පේපර් එකක් දමන්න අයිතියක් ඇමතිවරුන්ට නැහැ. කිසිම බලයක් නැති, නිකම් නිකම් ඉත්තෝ ටිකක් බවට පත් කරලා තිබෙනවා, මෙතැන ඇවිත් කථා කරන්න. මේ රටේ දූප්පත් අහිංසක මිනිසුන්ගෙන් ඡන්දයෙන් පත් වෙලා එන මන්ත්‍රීවරුන් තමයි රජයේ ඇමතිවරුන් බවට පත් කරන්නේ. අද මේ ජනාධිපති ක්‍රමය තුළ ඔවුන්ගේ බලය හීන වෙලා; ඔවුන්ට බලයක් නැති තැනකට පත් වෙලා; ඔවුන්ට සභාපති කෙනෙක් පත් කර ගන්න බැහැ; ලේකම්වරයෙක් පත් කර ගන්න බැහැ; විධායක අධ්‍යක්ෂ කෙනෙක් පත් කර ගන්න බැහැ. අඩුම තරමින් සංස්ථාවකට අධ්‍යක්ෂවරුන් කීප දෙනකුව දමා ගන්න බැහැ. අඩුම තරමින් කැබිනට් ඇමතිවරයෙකුට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ගන්න බැරි තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. අපි ලජ්ජා වනවා. මේකටද අපි මේ රටේ ඇමතිවරුන්ව පත් කරලා දුන්නේ? දැන් තොණ්ඩමන් ඇමතිතුමා ඉන්නවා. එතුමා තමන්ගේ අමාත්‍යාංශයේ රජෙක් වාගේ අපිත් එක්ක හිටියේ. අපිත් එක්ක රජෙක් වාගේ හිටපු ඇමතිතුමා, -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමාගේ කාලය අවසානයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තව විනාඩියක් දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තව විනාඩියක් දෙන්න බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා අර -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එහෙම නම් මේ අනෙක් ඇමතිවරුන්ගෙන්- [බාධා කිරීමක්] අඩු කරන්න වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එක විනාඩියක් මම ගන්නවා.

එතුමා අපේ පක්ෂයේ හිටියේ "king maker" කියලා. දැන් එතුමා "king" නොවෙයි, "king maker" නොවෙයි. දැන් එතුමාව ඉවර කරලායි තිබෙන්නේ. දැන් "making" වෙලා තිබෙන්නේ. ඇයි, එතුමාවත් තමන්ගේ තත්ත්වය විනාශ කරලා, නිකම් නිකම් රොඩ්ඩක් බවට පත් කරලා, මේ ආණ්ඩුව යටතේ. ඇත්තටම ලජ්ජයි. වතු කම්කරුවන් වෙනුවෙන් ඔබතුමාගේ සීයා, ඔබතුමන්ලා කරපු සේවය ගැන එක්සත් ජාතික පක්ෂයේ අපට ගෞරවයක් තිබුණා. අද තමුන්නාන්සේ ඔන්න ගිහිල්ලා රොඩ්ඩක් බවට පත් වෙලා ඉන්නවා. ඒ නිසා මම කියන්න කැමැතියි, අද මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට බලය නැති බව. බලය නැති ආණ්ඩුවේ වැඩ පිළිවෙළවල්වලට පරිපූරක ඇස්තමේන්තුවලින් දවසින් දවස සල්ලි අරගන්නවා. හැබැයි ඒවාට කරන වැඩ පිළිවෙළක් නැහැ. අන්තිමට ප්‍රාග්ධන වියදම් ඉතුරුයි. වැඩ පිළිවෙළක් නැතුව පසු ගිය කාලවල අමාත්‍යාංශ ඇතුළත සල්ලි ඉතුරු වුණා.

අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සම්බන්ධව ගන්නා පියවර ගැන මා ඔබතුමාට ඉතාම ගෞරව කරන්න කැමැතියි. ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***සභාමේසය මත තබන ලද ලියවිලි :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள் :*
*Documents tabled:*


ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ (පා.ම.)
මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍ය
සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක

2007.04.

ගරු මහාමාර්ග අමාත්‍ය,
ටී.බී.ඒකනායක මැතිතුමා.

හිතවත් අමාත්‍යතුමනි,

රාජකාරි සහ වගකීම්

මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතෙහි ඇති මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ සහ මගනැගුම සමාගම් තුනෙහි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හැර අනිකුත් සියළුම කටයුතු පාලනය සහ අධීක්ෂණය ඔබ වෙත පවරමි.

මේ අනුව මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු ජාතික ගොඩනැගීමේ අමාත්‍යාංශය ඇතුළු අනිකුත් අදාල ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු ද පරිපාලන, මූල්‍ය පාලන හා අධීක්ෂණ කටයුතු ද ඔබට අයත් වනු ඇත. එසේම අදාල සමාගම් තුනෙහි ද පරිපාලන කටයුතු, අධීක්ෂණය මෙන්ම මූල්‍ය සහ තාක්ෂණ කටයුතු අධීක්ෂණය ද ඔබගේ වගකීමට යටත් වනු ඇත.

කරුණාකර මේ අනුව කටයුතු කරන්න.

මෙයට,
හිතවත්,

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ
මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍ය.

පිටපත්:- 1. අතිගරු ජනාධිපතිතුමා - දැන ගැනීම සඳහා.


Secretary +94 (0)11 2887462
Fax No. +94 (0)11 2862705
General Office + 94 (0)11 2871821-30
මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය
நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சு
MINISTRY OF HIGHWAYS AND ROAD DEVELOPMENT
E-mail hiwaysec@sltnet.lk
My No. MRD/AG/1/13(01)
Your No.
Date 2007-08-20

ජයන්ත ධනපාල මහතා,
මග නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම,

ප්‍රගති සමාලෝචන රැස්වීම - මග නැගුම ආයතනය.

ඔබ විසින් මා වෙත එවා ඇති 2007-08-14 දිනැති ලිපිය හා බැඳේ.

ගරු මහාමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ඔබ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ, සමාගමේ වර්තමාන ගැටළු පිළිබඳ සාකච්ඡාවක් 2007-08-22 දින ප.ව. 3.00 ට මෙම අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට තීරණය කර ඇත.

කරුණාකර ඉහත සාකච්ඡාවට ඔබ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සහභාගිවන්න.

එස්.ඒ.ඩී.එස්. සුබසිංහ,
අතිරේක ලේකම්, (මග නැගුම අංශය),
මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය,
ලේකම් වෙනුවට.

9th Floor, Sethsiripaya, Battaramulla, Sri Lanka.

[ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා]

ඇමතිවරයාට යොමු කරන බව. ඇමතිවරු පත් කරලා ඉන්නේ ඒකට, ඒ ඇමතිවරුත් එක්ක ඒක බලා ගන්න කියලායි එතුමා අපට නම් ප්‍රකාශ කරන්නේ. තමුන්නාන්සේලා ඔහොම කියන්නේ කොහොමද කියා මම දන්නේ නැහැ.

මෙම පරිපූරක ඇස්තමේන්තු ගෙනෙන්නේ ඇයි? අවුරුදු තිස් ගණනක් පැවැති යුද්ධය නිසා විනාශ වුණු මේ රට නැවත ගොඩ නඟන්න යන කොට, මහාමාර්ග ගොඩ නඟන්න යන කොට, මාර්ග සංවර්ධනය කරන්න යන කොට, ජනතාවට ජල පහසුකම් ලබා දෙන කොට, ඒ වාගේම ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යාංශය හැටියට යටිතල පහසුකම් ලබා දෙන්න යන කොට අපිට විශාල මුදලක් අවශ්‍ය වනවා. අද උතුරට නැඟෙනහිරට ගිහින් බැලුවාම මේ රජයේ සංවර්ධන කටයුතු කොහොමද කියන එක කාටත් බලා ගන්න පුළුවන්. ඊයේ කින්නියා පාලම විවෘත කිරීමම රජයකට අවුරුදු ගණනකට ඇති. ඒ ගෞරවය ලැබෙන්න ඕනෑ. අද නැඟෙනහිර ජනතාව ඒ ගෞරවය ලබා දෙනවා. අප මෙතැනින් එහාට ගිහින් නැඟෙනහිර වාගේම උතුරේ යාපනය, කිලිනොච්චිය, මන්නාරම, වවුනියා, මුලතිව් දිස්ත්‍රික්කවල දැනට කෙරෙන සංවර්ධන කටයුතු දිහා බැලුවාම අපිට තවත් පරිපූරක ඇස්තමේන්තු ගෙනෙන්න වෙයි. මොකද, අවුරුදු තිස් ගණනක් තිස්සේ විනාශ කරපු උතුර නැවත ගොඩ නඟන්න, උතුරේ ජනතාවට යටිතල පහසුකම් ලබා දෙන්න, වතුර ටිකක් දෙන්න, පාරවල් ටික හදලා දෙන්න, කෘෂිකාර්මික කටයුතු කරන්න, ඒ වාගේම අවුරුදු ගණනක් විනාශ වෙලා වල් බිහි වෙලා තිබුණු වැව් අමුණු දහස් ගණනක් හදන්න විශාල මුදලක් ඕනෑ. අද අපේ රටේ අනෙක් තැන්වලට විදුලිය ලැබෙන කොට උතුරට විදුලිය පහසුකම් නැහැ. ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ උපදේශකත්වය යටතේ උතුරු වසන්තය වැඩ පිළිවෙළ තුළින් අද රුපියල් කෝටි ගණන් වියදම් කරලා උතුරේ විදුලි මාර්ග යනවා. ඒ වාගේම උතුරේ සංවර්ධන කටයුතු කෙරෙනවා. අවුරුදු ගණනක් තිස්සේ සංවර්ධනය නොවුණු යෝධ වැව වාගේ මහා ජලාශ, ඒ වාගේම ඇන්ටන් බාලසිංහම් උන්නැහේ seaplane එකෙන් ඇවිත් බැහැපු ඉරණමඩු වැව පවා හදන්න අද ලැහැස්ති වෙලා තිබෙනවා. මේවා තමයි සංවර්ධන කටයුතු කියන්නේ. උතුරු නැඟෙනහිර මුළු මුහුදු සීමාවේ ධීවර කටයුතු අවුරුදු තිස් ගණනකින් කරන්න බැරි වුණු ධීවරයන්ට ඒ යටිතල පහසුකම් ලබා දෙන්න, නැව්, බෝට්ටු, ධීවර උපකරණ ලබා දීමේ සියලුම කටයුතු අද කෙරී ගෙන යනවා. උතුරට ගිහින් බැලුවාම උතුරේ ජනතාවගේ විශාල ප්‍රසාදයක් අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම රජයටත් ලැබෙනවා. අපි ඒ ක්ෂේත්‍රයේ යන නිසා, මේ කටයුතුවලට සම්බන්ධ වන නිසා අපි දකිනවා.

හැම දාම හැම දේටම විරුද්ධ වන අපේ විරුද්ධ පක්ෂයේ අය මොන තරම් විරුද්ධකම් ගැන කථා කළත් සෙට්ටිකුලම, මැණික් ෆාම් ප්‍රදේශවල තිබෙන අවතැන් කඳවුරු, සරණාගත කඳවුරු නැත්නම් ශුභසාධන කඳවුරු නිරීක්ෂණය කරන්න එන, බලන්න එන විදේශිකයෝ කියනවා, ලෝකයේ කොහේවත් අසරණ වූ අයට මේ වාගේ පහසුකම් ලැබිලා නැහැ කියා. පහසුකම් මෙච්චර ලැබෙනවා. ඊයේ පෙරේදා ඉන්දියාවේ තමිල්නාඩුවේ මන්ත්‍රීවරු පිරිසක් ආවා. ගරු තොණ්ඩමන් ඇමතිතුමාත් එක්කයි ඒ කණ්ඩායම ඒ ප්‍රදේශයට ගියේ. කරුණානිධි මහ ඇමතිතුමාගේ දියණියත් ආවා. ඒ ගොල්ලෝ ගිහින් බැලුවා. ඒ ගොල්ලෝ ඉතාම සතුටු වුණා. මේ වාගේ පහසුකම් කොහෙන්වත් දෙන්නේ නැහැයි කිව්වා. සරණාගත කඳවුරක්, ශුභසාධන කඳවුරක් ගත්තාම එහි බැංකු ඇරලා තිබෙනවා; සමුපකාර ඇරලා තිබෙනවා; ඒ වාගේම අධ්‍යාපන පහසුකම් තිබෙනවා; ළදරු පාසල් තිබෙනවා. ඉන්දියානු රජය රුපියල් මිලියන 5,000ක් දෙන්න ලෑස්ති වෙලා තිබෙනවා. ඒ මුදල් දෙන්න ලෑස්ති වුණේ සරණාගත කඳවුරු බලා සතුටු වුණු නිසායි. නමුත් සමහරු බලා ගෙන සිටියා, ඉන්දියාවේ තමිල්නාඩුවෙන් ඇවිල්ලා ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න, එහෙම නැත්නම් ජාත්‍යන්තර වශයෙන් අපකීර්තියට පත් කරන්න පුළුවන් කියලා. නමුත් අපි දන්නවා, සත්‍යය ජය ගන්නවාය කියලා. සත්‍යවාදී වැඩ කරන කොට ඒවාට කාටවත් අකුල් හෙළන්න බැහැ. අතිගරු ජනාධිපතිතුමා මේ රටේ රාජ්‍ය නායකයා වශයෙන්, මුළු රටේම ජනතාවගේ පියා වශයෙන් මේ රටේ ජනතාව දකින්නේ තමන්ගේ දරුවන් හැටියටයි. ඒ හැටියට තමයි කටයුතු කරන්නේ. සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් කියන මේ සියලුම ජාතීන්ට එක හා සමානව සලකනවා. ඊයේ කින්නියා පාලම විවෘත කිරීමේ උත්සවයේදීත් එතුමා කිව්වේ ඒකයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ். எம். சந்திரசேன)
(The Hon. S. M. Chandrasena)
අපි දන්නවා, මෙච්චර කාලයක් ජාතිවාදය වපුරලා තමයි සමහරු බලයට ආවේ කියලා. නමුත් දැන් ඒ ජාතිවාදය වපුරන්න හම්බ වන්නේ නැහැ. මීට පස්සේ ජාතිවාදය වපුරලා මේ රටේ බලයට එන්න කවුරුන් හෝ උත්සාහ කරනවා නම් ඒක හීනයක් විතරයි. සමානාත්මතාව අගයන, ජාතිවාදය නොසලකන අපේ ජනාධිපතිතුමා රාජ්‍ය නායකයා හැටියට ඒ අශුභ කාලය අපෙන් ඉවත් වෙලා යන්න කටයුතු කිරීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි.

**ගරු මොහොමඩ් ෂෆීක් රාජබ්දීන් මහතා**
(மாண்புமிகு மொகமட் ஷபீக் ரஜாப்தீன்)
(The Hon. Mohamed Shafeek Rajabdeen)

Mr. Deputy Speaker, I rise to a point of Order. During the course of the speech of the Hon. A.L.M. Athaullah, various allegations were made against the Hon. Rauff Hakeem, in his absence, with regard to his personal conduct. I would request you, Sir, to expunge all that was said on the Floor of this House regarding his personal conduct as they are not relevant to the Debate or the subject in question. Therefore, I appeal to you to kindly expunge all that was spoken regarding his personal conduct.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝගවලට පටහැනි යමක් තිබෙනවා නම් ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන මෙන් නියෝග කරනවා.

ඊ ළඟට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

[අ. භා. 2.42]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා බොහොම අගය කරනවා, අද මේ පරිපූරක ඇස්තමේන්තු සම්මත කරන අවස්ථාවේදී ඔබතුමා ඉදිරියේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ කථා කරන අවස්ථාවේදී, සුපුරුදු පරිදි සුමාන දෙක, තුනකින් ඉදිරිපත් කරන්නට තිබෙන අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්නේ නැති බව කියන්නට ඕනෑ. අය වැය ලේඛනය තුළින් කොතරම් බොරු කළත්, ඕනෑම ආණ්ඩුවක් ඉතාමත් ආඩම්බරයෙන් අය වැය

ලේඛනයක් ඉදිරිපත් කරනවා. අද මේ ආණ්ඩුවට ඒ ශක්තිය නැති නිසා ඒ තුළින් ජනතාවට දෙන්න පුළුවන් ප්‍රතිලාභ දෙන්නේ නැතුව ඒක අතුරු සම්මත ගිණුමකට මාරු කරන්න කටයුතු කරනවා. එහෙම කරන ගමන්ම මීට පෙර කථා කරපු ඇමති කියනවා, මේ පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම ගැන බොහොම ආඩම්බර වෙනවාය කියලා. එතුමා පෞද්ගලිකව ගෙවනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. මේ පරිපූරක ඇස්තමේන්තුවලට අහිංසක ජනතාව ගෙවන්නේ තමන්ගේ කටයුතු කර ගන්න නොවෙයි; ඇමතිවරු හැටහුටහමාරක් තබා ගන්නයි; ඒ මදිවාට ඒ තිබෙන දූෂණය, නාස්තිය ඉදිරියට ක්‍රියාත්මක කර ගෙන යන්නයි.

2009 වර්ෂයේ අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් කිව්වා, රුපියල් බිලියන 855ක ආදායමක් ලැබෙනවාය කියලා. දැන් ආදායම රුපියල් බිලියන 709ට අඩු වනවාලු. එහෙම අඩු වනවා නම් ඒත් රුපියල් බිලියන 160ක් අඩු වනවා. මොනවාද ඒ සම්බන්ධයෙන් කරන්නේ? වියදම ඇස්තමේන්තු කළේ රුපියල් බිලියන 1,505කටයි. ඒ කියන්නේ රුපියල් කෝටි 15,050යි. රුපියල් කෝටි 16,060කට වැඩි වනවාලු. ඒ ඉතුරු ප්‍රමාණය ලබා ගන්නේ කොයි ආකාරයෙන්ද? බදු ආදායම් තුළින්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි මේ ආණ්ඩුව මේ වන විට ලබා ඇති පරිපූරක ඇස්තමේන්තුවල විස්තර ඇතුළත් මේ ලේඛනය Annex 1 වශයෙන් හැන්සාඩ් එකේ මුද්‍රණය කරන්න අවසරය ලබා ගනිමින් **සභාගත*** කරනවා.

මේ ලේඛනයේ රුපියල් මිලියන 1,18,452ක් තිබෙනවා. ඒකත් එක්ක අද උදේ තවත් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා, රුපියල් මිලියන 10,600කට -රුපියල් කෝටි 1,060කට- . දැන් මේ දෙක එකතු කළාම, රුපියල් බිලියන 129යි. දැන් මේකට කවුද ගෙවන්නේ? ආදායමක් අවශ්‍යයි. ආදායම ලැබෙන්නේ බදු තුළින් හෝ ආදායම් තුළින්. මේක ඔබතුමන්ලා කොයි ආකාරයෙන්ද ජනතාවගෙන් ලබා ගන්නේ? ඒ නිසා තමයි අද අය වැයක් ඉදිරිපත් කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තියෙන්නේ. රට සංවර්ධනය කරනවා කියන්නේ බෝක්කු හදනවා, පාලම් හදනවා, පොඩි පාරකට සිමෙන්ති ටිකක් දමනවා කියන එක නොවෙයි. ආර්ථික සංවර්ධනයක් ඇති කරන්න අවශ්‍යයි. ආයෝජකයින්ගේ පැමිණීම අවශ්‍යයි. යටිතල පහසුකම් ඇති කරන්න අවශ්‍යයි. මේවා තමයි අපි කියන්නේ. මීට පෙර ගරු ඇමතිතුමා කින්නියා පාලම ගැන කිව්වා. බොහොම ආඩම්බරයි. අපි සතුටුයි ඒ ගැන. කවුද, ඒකට සල්ලි වෙන් කළේ? කවුද, ඒක පටන් ගත්තේ? එක්සත් ජාතික පක්ෂ රජය කාලයේයි. [බාධා කිරීමක්] ඇයි හිනා වෙන්නේ? ඔබතුමා ඒක නැහැයි කියනවා ද? අපට බැන්නා අරක කළේ නැහැ, මේක කළේ නැහැ කියා. ඒ ඉතිරි කරපු සල්ලිවලින් තමයි පාලම් හැදුවේ. ඒක අරින්න ඔබතුමාටයි luck එක තිබුණේ. ඇයි? චන්ද්‍රිකා කුමාරතුංග අවුරුදු හයකට තිබෙන බලය අවුරුදු දෙකකට සීමා කළා. ඔබතුමන්ලා කටුනායක ගුවන් තොටු පොළ, බණ්ඩාරනායක ගුවන් තොටු පොළ කළාට බණ්ඩාරනායක අගමැතිතුමා ද හැදුවේ? නැහැ. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේයි. ඉතින් නම් මාරු කරනවා. ඒක තමයි ඔය ගොල්ලන් කරන්නේ. හැබැයි ඇත්ත වශයෙන්ම මුදල් වෙන් කරලා වැඩ කටයුතු පටන් ගත්තේ එක්සත් ජාතික පක්ෂ රජය කාලයේයි. දැන් ඒ කාරණාව පැත්තකින් තියමු. ඒක නොවෙයි අද තිබෙන අවශ්‍යතාව. [බාධා කිරීමක්]

**ගරු කුමාර වෙල්ගම මහතා (කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - கைத்தொழில் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Industrial Development)
පාලමට මුදල් වෙන් කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේද?

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පටන් ගත්තෙත් එක්සත් ජාතික පක්ෂ රජය කාලයේයි. [බාධා කිරීමක්] සල්ලිත් වෙන් කළා. හදන්න පටන් ගත්තෙත් එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
වග කීමක් ඇතිවද ඔබතුමා කියන්නේ? [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තුළින්- [බාධා කිරීමක්] මේ අය වැයක් ඉදිරිපත් කරන්න බැරි ආණ්ඩුවක්. දැන් අනෙක් අය කරපු වැඩවලින් එල්ලී ගෙන යනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒක තුළින් අපට පෙන්වන්න පුළුවන් වන්නේ,- [බාධා කිරීමක්]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔබතුමාට ගරු කිරීමක් වශයෙන් අපි ඒ පාලම "රවි කරුණානායක පාලම" හැටියට නම් කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ අපට අවශ්‍ය නැහැ. ඒකට කින්නියා පාලම කියන්න. [බාධා කිරීමක්] අපි සතුටුයි. අපි කුහක නැහැ. අපි ඔබතුමන්ලා වාගේ- [බාධා කිරීමක්] අපි හැදුවා නම් හැදුවා කියනවා. නැත්නම් නැහැයි කියනවා. මේ රටේ සංවර්ධනයක් ඇති වුණා නම් ඇති වුණේ එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ දී තමයි. ඒක නැහැයි කියන්න බැහැ. අය වැයක් ඉදිරිපත් කරන්න බැරි ආණ්ඩුවක් ගැන අද තවත් අහන්න අවශ්‍ය වන්නේ මොනවාද?

මේ රටේ අහිංසක රණ විරුවන්ට ණයක් දෙන්න ඕනෑය කිව්වා. මේක අවුරුදු තුනක් ඇද ගෙන ආවා. ඒක නැවතුණා. මා පසු ගිය වතාවේ උපදේශක කාරක සභාවේදී මේ ගැන මතක් කළා. පාර්ලිමේන්තුවේදීත් මතක් කළා. ඊට පස්සේ ආයෙත් file ටික අරින්න පටන් ගත්තා. මොකද? ඡන්දය ළඟයි නේ. මේක අවුරුදු 4ක් ඇද ගෙන ගිහිල්ලා තිබෙනවා. ලක්ෂ පහක් දෙනවා කියා තිබෙනවා සියයට හතරේ පොලියට. කවුද දෙන්නේ? නිකම් බොරුවට යුද්ධය කාලයේ පෙන්න පෙන්නා ගියා. දැන් ඔක්කෝම file නැවතිලා. අපි අහනවා, ඇයි මේවා කරන්නේ නැත්තේ කියා. ඒ වාගේම තමයි පඩි වැඩි කිරීම. [බාධා කිරීමක්]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක බැංකුවෙන් දෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බැංකුවෙන් මොන දීමක් ද? මේක අවුරුදු දෙකහමාරකට නවත්වලා තිබෙනවා. දෙනවා නම් ඡන්දවලට ඉස්සෙල්ලා ඒ අහිංසක රණ විරුවන් සියලු දෙනාටම දෙන්න. [බාධා කිරීමක්] අන්න ඒක තමයි. [බාධා කිරීමක්] ඉතින් ආණ්ඩුවට එන්න ඕනෑද ණයක් ගන්න? ඕනෑ කෙනකුට සියයට විස්සේ පොලියට ණයක් ගන්න පුළුවන්. සියයට දෙකේ, තුනේ පොලියට ණය දෙනවාය කියාපු ආණ්ඩුව. ඒකයි කියන්නේ. පඩි වැඩි කරනවා කිව්වා. කෝ වැඩි කළා ද? රුපියල් 1,000 නෝට්ටුවේ වටිනාකම අද රුපියල් 100ට අඩු කරලා තිබෙනවා ඔබතුමන්ලාගේ ආණ්ඩුව

[ගරු රවි කරුණානායක මහතා]

තුළින්. පඩි වැඩි කළාද? නැහැ. පෞද්ගලික අංශයේ, වතුකරයේ ඒවායේ වැඩි කර කර යන්න හදනවා. කෝ? එක පැත්තකින් වතුකරයේ අයගේ වැටුප වැඩි කරන්න පුළුවන් අවස්ථාවේ, රුපියල් 500ක් ගන්න පුළුවන් අවස්ථාවේදී ඔබතුමන්ලාගේ ඇමතිවරුන්ම ඒක නැති කළා. ඒකයි වුණු අපරාධය. ඒත් ඒක යථා තත්ත්වයෙන් ඇද ගෙන යනවා.

ඒ වාගේම ගෙවල් දෙනවා කිව්වා. ඊට පස්සේ රක්ෂා ලබා දෙනවා කිව්වා. ජීවන වියදම් අංකය ගෙවනවා ද? සමෘද්ධිලාභීන්ට දෙන දීමනාව වැඩි කරනවා කියා කිව්වා. කෝ? එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ 2,500ක් දුන්නු එක දැන් 200ට අඩු කරලායි තිබෙන්නේ. අපි කියලා තිබෙනවා අපි ඒක 5,000කට වැඩි කරනවාය කියලා. අපි කරලා දෙනවා. අපේ රණ විරුවන්ට අපි කිව්වා රුපියල් 35,000ක් අපි විකල්ප අය වැයකින් ලබා දෙනවාය කියා. අපි ලබා දෙනවා. අපි ආණ්ඩුවට අභියෝග කරනවා මේවා කරන්නේ කොහොම ද කියා.

ඒ වාගේම තමයි පෝෂණ මල්ල. කොහේද, තිබෙන්නේ? ආණ්ඩුව ලොකුවට කිව්වා GSP එක ලබා දෙනවාය කියා. ලබා දීලා තිබෙනවාද? දැන් තිබෙන තත්ත්වය හෙළිදරවු වෙලා තිබෙනවා යුරෝපයේ ඊයේ ගත්ත තීන්දුව තුළින්. අපි කිව්වා අහිංසක තරුණ තරුණියන් වෙනුවෙන් අපි එකට වැඩ කරමුය කියලා. මේක එක්සත් ජාතික පක්ෂයට ලැබෙන වරප්‍රසාදයක් නොවෙයි. අපි මහන්සියෙන් ලබා දුන්නා. අපි දැන් වුණත් එකට වැඩ කරමු, මේක ආරක්ෂා කරන්න. කාටත් ගුණ නැහැ, මේක නැති වීම තුළින්. ඇයි, අපට එකට වැඩ කරන්න තිබෙන මේ අවස්ථාව නැති කර ගන්නේ? බොරුවට ගිහිල්ලා එක්සත් ජාතික පක්ෂයට බණිනවා. අපේ නායකතුමා පිට රට ගිහිල්ලා මේවා කළාය කියා බොරුවට කියනවා. අපි ආරක්ෂා කරන්න හදන එකත් නැති කරන්නේ ඇයි? එකට වැඩ කරමු. මේක නැති කරන්න දෙන්න එපා. ඒකයි කියන්නේ. අද උදේ පාන්දර රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමා ඇවිල්ලා ප්‍රකාශයක් කර තිබෙනවා. ආයෙත් නොමඟ යවන ප්‍රකාශයක්. එහෙම කතා කරන්නේ නැතිව අපි එකතු වෙලා මේක ආරක්ෂා කරමු. අපි සූදානම්. නමුත් බොරු කරන්න එපා. රටේ ස්වෛරීභාවය නැති වෙනවා කියනවා. මොකක්ද? කොහේද ඒක තිබෙන්නේ? බොහොම සෘජුව කියනවා මාධ්‍ය නිදහසක් නැහැය කියලා. ඒකේ කොහේද ස්වෛරීභාවයක් නැති වෙන්නේ? මේකේ තිබෙනවා මානව අයිතිවාසිකම්. තමන්ගේ මානව අයිතිවාසිකම්. අද ඇමතිවරුන්ට, - [බාධා කිරීමක්] ඒකත් එන්නේ මානව අයිතිවාසිකම් යටතේ. ඒවා ගැන තමයි කථා කරලා තිබෙන්නේ. අපි එකට එකතු වෙලා මේක ආරක්ෂා කරමු. මේ අවස්ථාවේදී රටේ ආර්ථිකයත් එක්ක සෙල්ලම් කරන්න එපා. ඒක තමයි තිබෙන වැදගත්කම.

කල්පනා කරලා බලන්න, සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන. අද රුබෙල්ලා එන්නතත් දෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඩෙංගු රට පුරාම පැතිරිලා. අද සෞඛ්‍ය ඇමතිවරයා කියනවා මදුරුවන් නැති කරන්න බැහැ කියලා. හැබැයි අහිංසක දරුවන් නැති කර කර යනවා. දැන් නුවර තවත් රෝගයක් ඇති වේගෙන යනවා. රෝහල්වල බෙහෙත් නැහැ. එන්නත දෙන්න බැහැ. ගෙනාවොත් ඒ පරණ ඒවා. ඒකේ දැන් බෝතල් කටු තිබෙනවා. මේ වාගේ සෞඛ්‍ය අමාත්‍යාංශයක් ගැනද අපි කථා කරන්නේ?

අධ්‍යාපන අමාත්‍යාංශය ගැන බලන්න? අද පළමු වෙනි ශ්‍රේණියට ළමයෙක් ඇතුළු කරන්න බැහැ. විදුහල්පතිවරයෙක් පත් කරන්න බැහැ. ගුරුවරු පත් කරන්න බැහැ. වාර විභාගය අවසන්. ඒ තිබෙන විභාගයවත් පවත්වන්න අවස්ථාවක් ඇති කරන්න බැරි ආණ්ඩුවක්. තමන් මේ උසස් පෙළ ගැන කථා කරන්න ඉස්සර වෙලා පළමු වන ශ්‍රේණියට ළමයෙක් දමන්න බැරි එක ගැන හිතන්න. අද පාසල් 8,800ක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය කාලයේ - තමුන්නාන්සේලාට රට භාර දෙන විට - පාසල් 10,800ක් තිබුණු රටක්. දැන් ඒක 8,800කට අඩු වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි මේකත්. දැන් බලන්න නවක වදය අද පේරාදෙණිය සහ අනුරාධපුරයේ ඉතාමත් කැත මට්ටමට යනවා. ඇයි මේවා ගැන නීති ගෙන එන්න බැරි වන්නේ? ඒ අහිංසක දරු දැරියෝ ඉතාමත් අමාරුවෙන් තමන්ගේ පාසල් අධ්‍යාපනය අවසාන කරලා විශ්වවිද්‍යාලයට ගියාම - සාමාන්‍යයෙන් පිට රට ශිෂ්‍යයෙක් උපාධියක් ලබලා එළියට එන කොට එයාට වයස අවුරුදු 22යි. ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය පටන් ගන්නේ වයස අවුරුදු විසිදෙකෙන්, විසිතුනෙන් - මොකක්ද මේ කරන අපරාධය? දේශපාලන අපරාධයක් කරනවා නම් ඒක නවත්වමු. ඇයි මේ වාගේ වැඩ කරන්නේ? ආණ්ඩුව මෙන්න මේ වාගේ වෙලාවට තමයි හරියට වැඩ කටයුතු කරන්න අවශ්‍ය වන්නේ.

බලන්න, විදේශ අමාත්‍යාංශයේ තත්ත්වය. ගන්න දෙයක් නැහැ. එක රටක් එක්ක යහළු වන කොට තවත් රටවල් දහයක් එක්ක තරහ වනවා. දැන් මේ එක රටකට කථා කරන්න ගිහින් පාකිස්තානයත් එක්ක අනා ගෙන තිබෙනවා. ඒ ගොල්ලෝ තරහා වෙලා. බලන්න යුරෝපා සංගමයේ ඉතාමත් අමාරු තත්ත්වයක් තිබෙන බව මේ GSP Plus බදු සහනය යටතේ පෙනෙනවා. ජපානය අනික් පැත්තෙන් අමනාප වෙලා තිබෙනවා. ඇමෙරිකාව මේ පැත්තෙන්. පුළුවන්ද ඉරානය, උතුරු කොරියාව, කියුබාව, සිම්බාබ්වේ වාගේ රටවල් එක්ක යන්න? යන්න පුළුවන්. ඒවා තියා ගන්න. නමුත් රටකින් උදවුවක් ගන්න පුළුවන් මාර්ගයට අපි වැඩ කටයුතු කරන්න අවශ්‍යයි නේද? අපි කියන්නේ සියලු දෙනා එක්කම මිත්‍රශීලීව ගමන් කරමුය කියලායි. මේ පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබෙන වෙලාවේ මේකයි අපි මතක් කරන්නේ. අහිංසක ජනතාව වෙනුවෙන් ලබා ගන්න තිබෙන සල්ලි ප්‍රමාණය අද ගන්නේ නැතිව හෙටට මේක කල් දමලායි තිබෙන්නේ. ඒ නිසා තමයි අය වැයක් ඉදිරිපත් කරන්නේ නැත්තේ. ඉතින් මේ පරිපූරක ඇස්තමේන්තු ගැන කථා කරන කොට අපි මේවා මතක් කරන්න අවශ්‍යයි.

මේවා අපි මතක් කළේ නැත්නම් මේ ආණ්ඩුව කියන්න පුළුවන් ඇයි මතක් කළේ නැත්තේ කියලා. අපි අවුරුදු තුන හතරක් තිස්සේ පෙන්වා දීලා තිබෙනවා, "මෙන්න මේක තමයි තිබෙන අපරාධය" කියලා. මා දන්නවා, සමහර මන්ත්‍රීවරුන්ට මෙතැන දී කථා කරන්න බැරි බව. සමහර විට ඒ අයට කථා කරන්න වෙන්නේ ආණ්ඩුව ආරක්ෂා කිරීමටයි. ඒ සම්බන්ධයෙන් අද ඇමතිවරු නිහඬවයි සිටින්නේ. අද දෙන්නෙක්, තුන් දෙනෙක් හැර අනික් අය කථා කරන්නේ නැත්තේ මෙවැනි තත්ත්වයක් තිබෙන නිසායි.

ඒ වාගේම තමයි මුදල් අමාත්‍යාංශය. අපේ චමල් රාජපක්ෂ ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමාට නම් මම එක විධියකින් ගරු කරනවා. එතුමා කියන දෙයක් කරනවා. මොකද මිහින් එයාර් ආයතනය ගැන අපි එක්ක යම් දෙයක් කිව්වොත් එතුමා ඒක කරලා තිබෙනවා. ඒත් මම දුන්න අභියෝගය මොකක්ද? මේ මිහින් එයාර් ආයතනය අලාභයෙන් යනවා කියලා 2008 දෙසැම්බර් මාසයේ දී මම කිව්වා. ඔබතුමා කිව්වා, "ඒක එහෙම වනවා නම් මම මාස තුනෙන් නවත්වනවා"යි කියලා. දැන් අලාභයක් වනවා. මොනවාද වෙලා තිබෙන්නේ? ශ්‍රීලන්කන් -

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
දැන් ඔක්කොම හරි. මම දෙන්නම් ඒකට උත්තරයක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමා මට එහෙම කියන්න එපා. මම දන්නවා. ඔබතුමාට කවුරු හෝ ගෙනැවිත් දෙයි. මේ අවස්ථාවේදී මිහින් එයාර් ආයතනය, ඛනිජ තෙල් සංස්ථාවට මිලියන 550ක් ණයයි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
Break even point එකක් ඇවිල්ලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Break even point එකක් නැහැ. ඉස්සර වෙලා පියාසර කරන්න ඕනෑ break even වෙන්න. එක අහස් යානයක් තියා ගෙන කොහොමද ඒක වන්නේ? එතැන 308 දෙනෙක් වැඩ කරනවා. කොහේ ඒවා කරන්නද? Wet-lease aircraft කීයක් තිබෙනවාද? ඒක ඔබතුමාටම කියා ගන්න පුළුවන්. මට කියන්න එපා. ඔබතුමාගේ ගරුත්වය රකින්න තමයි මම එහෙම ප්‍රකාශ කළේ. මම එදාත් කිව්වේ ඔබතුමාට ප්‍රශ්නයක් ඇති කරන්න නොවෙයි. නමුත් ජනතා සල්ලිත් එක්ක සෙල්ලම් කරන්න එපාය කියන එකයි කියන්නේ. අද ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් ආයතනය මිලියන 9,800ක් අලාභ ලබා තිබෙනවා. කාට කියන්නද? [බාධා කිරීමක්] ඔව්, කියන්න කවුද ඒක අනා ගෙන තිබෙන්නේ? ඔබතුමා දැන් දන්නවා ආයෙත් අලාභයට යන බව. පසු ගිය උපදේශක කාරක සභාවේ දී අපි ඇහුවා. දැන් ඒ වැඩ කරන අය කියනවා, "අනේ, අපට කරපු අපරාධය නිසා තමයි මෙහෙම වෙන්නේ" කියලා. ඒක තමයි තිබෙන තත්ත්වය. හොඳට වැඩ කරපු එකක්. දේශපාලන කුහකභාවය නිසා නැති කළා. කෝ, ඒ කෑ ගහන මන්ත්‍රීවරු. එක් කෙනෙක් සමාව ඉල්ලනවා. දෙන්නෙක් නිහඬව සිටිනවා. මොකද, ඒ ගොල්ලන් දැන් දන්නවා, අපි කරපු දේ හරි කියලා.

ඒ වාගේම ඇමතිවරුන්ගේ කාර්වලට 2,65,000ක් ගෙවා ගෙන කොහොමද රටක් ඉදිරියට ගෙන යන්නේ? රටේ මහාමාර්ග සම්බන්ධයෙනුත් මේ අවස්ථාවේ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. මහාමාර්ග සංවර්ධනය ගැන කථා කරන කොට මා මේ කාරණයත් කියන්න ඕනෑ. කෝට්ටේ තීරු හයක පාරක් හදනවා කියලා බෝඩ් ගහලා තිබෙනවා. ඒ තියෙන පාරම පෙන්නලා විළි ලජ්ජාවක් නැතිව කියනවා, තීරු හයක පාරක් හදා ගෙන යනවා කියලා. කාටද මේ බොරු කරන්න හදන්නේ? ඒ පාරේ තිබෙන මැද කොටස ගලවනවා. ඊට පස්සේ තීරු හයක් කරනවා. ඒ තිබුණු පාර එහෙමම තියනවා. මේ බෝඩ් දෙපැත්තේ දමා ගෙන කාට පෙන්වන්න හදනවාද? ඒක හැදුවා නම් කමක් නැහැ. මේ වැඩ කරන ඇමතිවරු ඉන්නවා. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට වැඩ කරන්න ඕනෑ. උඩින් සභාපතිවරයෙක් දමලා වැඩේ knock- out කරනවා. මම ඒක පස්සේ කියන්නම්. [බාධා කිරීමක්] ඔව්. නිකවැරටියෙන් කෝට්ටෙට පැන්නා කියලා පාරේ තීරු හයක් ඇති වනවාද? මේ ආණ්ඩුව අවුරුදු 18ක් වැඩ කරලා තිබෙනවා. මොනවාද කරලා තිබෙන්නේ? මෙලෝ දෙයක් නැහැ. බෝඩ් දැම්මාට සංවර්ධනයක් ඇති වනවාද? අර නුගේගොඩ පාරක් හැදුවා. ඒකට බිලියන කීයක් ගියාද? [බාධා කිරීමක්] පාරක් තියෙනවා. රුපියල් 100කින් හදන්න පුළුවන් පාරකට රුපියල් ලක්ෂ 10ක් යනවා කියනවා නම් ඒකෙන් පාරක් හදනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාරවල් හැදුවේ Mabey and Johnson කියන British company එකකින්. ඒ ගොල්ලන්ගේ local agents ලා තමයි හදන්නේ. මෙන්න, ඒ ගොල්ලන් ගැන ගිය සුමානයේ වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමාගේ අවසරය පරිදි මම ඒක ***table**** කරනවා.

මම ඒක කියවන්නම්.

It states, I quote:

"British firm Mabey and Johnson convicted of bribing foreign politicians

A string of foreign politicians and officials were named as having received corrupt payments from a British firm today, as the company admitted it had systematically paid bribes around the world to win contracts.

The bridge-building firm, Mabey and Johnson, is the first major British company to be convicted of foreign bribery. Many of its contracts were financially supported by the British taxpayer.

The conviction by the Serious Fraud Office comes as the fraud agency turns its attention to a bigger target, BAE, Britain's biggest arms firm."

In this article there are 12 names of overseas politicians and officials who had been given bribes by this company.

මම වෙළෙඳ ඇමති වශයෙන් ඉන්න කොට මේ පාලම් ටිකම හදන්න British aid ලංකාවට ආවා. අපි කිව්වා, "කරුණාකර ත්‍යාගයක් වශයෙන් දෙනවා නම් දෙන්න. නැත්නම් අපට අවශ්‍ය නැහැ." කියලා. මේවා අවුරුදු 20ක කාලයක් තමයි පාවිච්චි කරන්න පුළුවන් වන්නේ. මේවා ක්වේට් යුද්ධයේදී හදන්න ගත්ත ඒවා. ඒවා එදා තිබුණු මිල ප්‍රමාණයට වැඩිය සියයට 300 ගුණයකටත් වැඩියෙන් තමයි අද පාවිච්චි කරන්නේ. ඉස්සෙල්ලා අපේ ඇමතිතුමා මේකට බොහොම පැහැදිලි උත්තරයක් දුන්න නිසා ඒක නැවතත් මතක් කරන්න අවශ්‍ය නැහැ. මම ඒ අවස්ථාවේදී පෙන්නා දුන්නා, පාරක එක මීටරයකට කොච්චර වියදමක් යනවාද කියලා. මම හිතන හැටියට රත්තරන්වලින් හැදුවත් ඊට වඩා අඩුවෙන් හදන්න පුළුවන්.

ඒ වාගේම නාගරික සංවර්ධන සහ පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශයටත් පරිපූරක ඇස්තමේන්තුවකින් මුදල් වෙන් කරන්න යෝජනා කර තිබෙනවා. මේ අවස්ථාවේදී අපට පෙන්වන්න අවශ්‍ය වන්නේ මෙයින් කොතරම් ප්‍රමාණයක් අපතේ යනවාද කියන එකයි. මා ඉස්සෙල්ලාම මේ කාරණය පෙන්වා දෙන්න කැමැතියි. සාක් සමුළුව පැවැත් වෙන නිසා මාර්ග සංවර්ධන අධිකාරියෙන් කොම්පඤ්ඤ වීදියේ ගෙවල් 864ක් ඉවත් කළා. ආරක්ෂක හේතු නිසා එසේ ඉවත් කරනවා කිව්වා. ආරක්ෂාවට බාධාවක් වනවා නම් රජයකට ඒක කරන්න පුළුවන්. නමුත් ඒ අවස්ථාවේදී අපි ඇහැව්වා, මේක කරන්න අවශ්‍යද කියලා. "ඔව්, අවශ්‍යයි." කියලා කිව්වා. එදා කිව්වා, ඒ අයට අවුරුද්දක් ඇතුළත ගෙවල් ලබා දෙනවා කියලා. අදට අවුරුද්දකුත් මාසයක් ගිහිල්ලා තිබෙනවා. ඒ අහිංසක ජනතාවගේ ගෙවල් කඩලා - ගෙවල් 864ක් කඩලා - අද ඔවුන් මහ පාරට තල්ලු කර තිබෙනවා. ඔවුන්ට තිබුණු ගෙවලුත් නැති කර තිබෙනවා. ඒ කාට පෙන්වන්නද? විදේශ ඇමතිවරු 20කට පෙන්වන්නද ඒ වැඩේ කළේ? අන්තිමට වුණේ මොකක්ද? අන්තිමට ඒ ගෙවල් 864ත් නැහැ. ඒ අහිංසක අසරණ ගෙවල් හිමිකරුවන් Supreme Court එකට පෙත්සමක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ petition එක Annex 3 යටතේ හැන්සාඩ් වාර්තාවේ ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා. මේ අවස්ථාවේදී අපේ ඇමතිතුමාත් සභාවට එනවා. ඒ අයට මේ ගෙවල් ලබා දෙන්නේ කවදාද කියන එකත් මා ඇමතිතුමාගෙන් අහනවා. [බාධා කිරීමක්] ගෙවල් ඉවරයි. දෙන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

තව සුමාන දෙකක් ඇතුළත පදිංචියට යවනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපි බලමු, නිවාස ලබා දෙනවාද කියා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අපි කළොත් ඔබතුමා මොකද කියන්නේ? Within the next two weeks they will start moving into these houses.

---

** පුස්තකාලයේ තබා ඇත.*
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

** කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි ඒකට ස්තුතිවන්ත වනවා. මොකද, මේ අහිංසක මිනිසුන්ගේ ගෙවල් කැඩුවේ ඔබතුමන්ලායි. ඉතින් ඒ අයට ගෙවල් හදන්න ඕනෑත් ඔබතුමන්ලාම නේ. අපි හදලා දෙන ගෙවල් ඔබතුමන්ලා කඩනවා. ඊට පස්සේ ආයෙත් දෙනවා. ඊට පස්සේ කියනවා ඔන්න අලුත් ගෙයක් හදා දුන්නා කියලා. මහ ලොකු දෙයක් කරලා තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට තිබෙන කනගාටුව මේකයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ ඇමතිතුමනි, ඔබතුමාගේ වෙලාවේ කථා කරනවා නම් කමක් නැහැ. මගේ වෙලාවෙන් නේ ගන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට තිබෙන කනගාටුව මගේ classmate අර ගෙන ගිහින් රේල් පාරේ ඉන්දවපු එක ගැනයි. ජීවිතේට එහෙම ඉඳ ගත්තේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බය වන්න එපා. ඔබතුමන්ලාට දැන් පුදුම shock එකක් ඇති වෙලා තිබෙන්නේ, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා. ඉදිරියට තවත් ඒවා වේවි. එකක්, දෙකක්, තුනක් වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට මිනිත්තු 21ක් තිබුණා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මිනිත්තු 21ම දැන් හරි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නිකම් වාෂ්ප වෙලා ගිහින් වාගෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මිත්‍ර ඔබතුමා මූලාසනයේ ඉන්න නිසා අඩු ගණනේ තව ටික වෙලාවක් දෙන්න.

මේ අවස්ථාවේදී UDA එකේ සභාපති ගැන කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්. මම අහන්නේ ඔබතුමාට එතැනට security guard කෙනෙක් දමන්න පුළුවන්ද, clerk කෙනෙක් දමන්න පුළුවන්ද? ඔබතුමන්ලා පත් කළ ප්‍රසන්න සිල්වා මහතා වැඩ කරන්න පුළුවන් වැදගත් කෙනෙක්. ඔහු ගෙදර යැව්වා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට කොන්දක් තිබුණේ නැහැ, ඔහුව ගෙන්වා ගන්න. කවුද ඔහු ගෙදර යැව්වේ? සභාපති. ඒ සභාපති කාර් පහක් පාවිච්චි කරනවා. මා ඒවා නම් කරන්නම්. KL-0763 හොණ්ඩා කාර් එක. KE- 9892 ලාන්සර් කාර් එක, 15 - 8430 ෆෝඩ් කාර් එක, 57-5168 ඩබල් කැබ් එක, පස් වන එක තමයි 19 - 9969 ටොයොටා වාහනය. ඇමතිතුමනි, ඔබතුමාටවත් කාර් පහක් තිබෙනවාද? නැහැ. ඔබතුමා මේ ගැන අහලා තිබෙනවා. රාමනුජන් ලේකම්තුමා අහලා තිබෙනවා. උත්තරයක් නැහැ. ලේකම්තුමා වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමාගේ අමාත්‍යාංශයට සල්ලි වෙන් කරන්න කියලා ඔබතුමා පාර්ලිමේන්තුවෙන් ඉල්ලනවා. නමුත් ඔබතුමාගේ ඒ සභාපති කාර් පහක් පාවිච්චි කරනවා. කිසිම පරීක්ෂණයක් නැතුව දුරකථන බිල් ඔහේ ගෙවනවා. මේ අවස්ථාවේදී රාමනුජම් ලේකම්තුමාගේ ලිපිය Annex 4 වශයෙන් මා හැන්සාඩ් වාර්තාවේ මුද්‍රණය කිරීම සඳහා **සභාගත*** කරනවා.

මේකෙන් කියනවා වැරැද්දක් කරනවා කියලා. ගරු ඇමතිතුමනි, ඇයි මේ වාගේ සභාපතිවරු තියා ගන්න අවශ්‍ය වන්නේ? මෙවැනි අය තමයි ඔබතුමන්ලාගේ රජය මේ වාගේ තත්ත්වයකට ගෙනැල්ලා තිබෙන්නේ. ඒ වාගේ අය පත් කර තිබීම අප ඉතාමත් අගය කරනවා. මොකද, ඒ නිසා තමයි අපට මෙවැනි දේවල් කතා කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. හැම අමාත්‍යාංශයකම මේ වාගේ තමයි. දූෂණය පිරිලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමාගේ කතාව අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ කතාව පටන් ගත්තේ 2.55ට. මට මිනිත්තු 21ක් තිබෙනවා. අනේ ඔහොම කරන්න එපා නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා පටන් ගත්තේ 2.40ට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි කියන දේවල් ආණ්ඩුවට අමාරු වන්න පුළුවන්.

**ගරු රේණුකා හේරත් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரேணுகா ஹேரத்)
(The Hon. (Mrs.) Renuka Herath)
මගේ වෙලාවෙන් ගන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමියගේ වෙලාවත් දුන්නා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම් ඔබතුමාගේ වෙලාවෙන් මම පාවිච්චි කරන්නම්. මෙතැන නිශ්ශබ්දව සිටින හුඟක් දෙනා වෙනුවෙන් මා කතා කරනවා. මම කියන්නේ නැහැ මේවා කිව්වේ කවුද, මොකක්ද කිව්වේ කියලා.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කතාව අවසන් කරන්න. එහෙම නම් ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් ගන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ විතරක් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සේවක සංගමය වෙනුවෙන් මා කතා කරනවා. දැන් බලන්න අපි එක්සත් ජාතික පක්ෂය ඔබතුමන්ලාගේ පක්ෂය වෙනුවෙන් කතා කරනවා. ගරු ඇමතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරියේ ඉන්න ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ අය ඔබතුමාට ලියනවා. ඒ ලිව්වාට මොකුත් කරන්න බැහැ. කොතරම් අසරණද? ගරු ඇමතිතුමනි, කරුණාකරලා මේවා ගැන සෝදිසි කරලා බලන්න. ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවෙන් සල්ලි ඉල්ලන්නේ මේ වාගේ නාස්ති වැඩවලටද? ගෙවල් හදනවා නම් කමක් නැහැ. පාරවල් හදනවා නම් කමක් නැහැ. නමුත් මොකක්ද මේ කරන්නේ? සභාපතිවරු හදන්නද? [බාධා කිරීමක්] ඔය හැටහුටහමාරක් ඇමතිවරුන්ගේ ප්‍රශ්නත් අපට කියන්න තිබෙනවා. ඒ නිසා තමයි අපට වැඩියෙන් වෙලාව දෙන්න අවශ්‍ය වන්නේ. ඒ වාගේම තමයි - [බාධා කිරීමක්] අනේ මේ, කැගල්ල ගැන කතා කරන්න ඕනෑ නැහැ, මේ වාගේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු ඉඳිද්දී. මුස්ලිම් පල්ලි කඩන අය ගැන කතා කරන්න ඕනෑ නැහැ.

සභාපතිවරයා රුපියල් 40,000ක් අර ගෙන තිබෙනවා. මේ සඳහා රිසිට් පත් දෙන්න අවශ්‍යයි. මම මේ අහන්නේ කිසිම පෞද්ගලික කරුණක් නිසා නොවෙයි. නමුත් මා දන්නවා, දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා වැඩ කරන්න ඕනෑ ඇමතිවරයෙක් වුණත් එතුමාට වැඩ කරන්න බැරි අවස්ථාවක් ඇති කර තිබෙනවා. අපි ඒ ගැන සටන් කරන්න අවශ්‍යයි. පාර්ලිමේන්තුවේදී උදේ පාන්දර සිංහ පැටියා වාගේ කෑ ගැහුවත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ සභාපතිවරයා මෙල්ල කරන්න බැරි නම් මොකටද ගරු ඇමතිතුමනි, බොරුවට කෑ ගහන්නේ මා ඔබතුමා වෙනුවෙන් මේ කථා කරන්නේ. දැන් බලන්න, මෙතැන තිබෙනවා, රුපියල් මිලියන 20,000ක්. ඊට පසුව දවසේ ගන්නවා, රුපියල් මිලියන 14,000ක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සිංහයා නිදා ගෙන ඉන්නවා වාගේ තමයි නැඟිටින්නෙත්. අන්න ඒකයි වැඩේ. සිංහයා නැඟිට්ට වෙලාවට කොහොම හිටියිද දන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අන්න, අලියා වාගේ තමයි. අලියා මෙතෙක් දුරක් ඔහේ එක විධියකට හිටියේ. හොඬවැල උස්සා ගෙන දැන් තමයි වැඩේට බැහැලා තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට ස්තුතියි, ඉතිරි කොටස table කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මේ අවස්ථාවේ දී නැවතත් ඔබතුමාගෙන් අවසරය ඉල්ලනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, අපේ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීතුමාගේ -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ වෙලාවත් ඔබතුමා දැන් අර ගෙන තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. ඔන්න ඉතින් මේක මං කොල්ල කෑමක්. මේක ඔබතුමන්ලාගේ පළාත් සභා ඡන්දය වාගේ. පෙට්ටියට ඡන්ද දාහක් දැම්මාට පසුව වාර්තා වන්නේ සීයක් කියලායි. ඒක හරි යන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට දෙන්න තිබෙන්නේ, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමාගේ වෙලාව. එතුමාට කථා කරන්න අවශ්‍යයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ! නැහැ. එතුමා අපේ සභාපතිතුමා. එතුමාට අවස්ථාව දෙන්න ඕනෑ. දුන්නේ නැත්නම් මටත් ලෙඩේ එයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර අවසන් කරන්න. අවසාන වශයෙන් ඔබතුමාට මිනිත්තු දෙකක් දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තු දෙකක්?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔව්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම හොඳයි. එච්චරද දෙන්නේ discount එක? [බාධා කිරීමක්] අගනුවරදී අපි ඔබතුමන්ලා වෙනුවෙන් කථා කරන්නට අවශ්‍යයි නේ කුමාර වෙල්ගම ඇමතිතුමනි. [බාධා කිරීමක්] අපට සරමටත් බහින්න පුළුවන්, කිසි ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] ඕක තමයි තිබෙන්නේ. හැබැයි අපි ටයි කෝට් ඇන්දත් ඒ වැඩ කරන අයගේ මහන්සිය, දුක දන්නවා. ඒ නිසා තමයි අපි කථා කරන්නේ. ධීවරයන්ට ප්‍රශ්නයක් තිබෙනවා නම් අපියි කථා කරන්නේ. නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රශ්නයක් තිබෙනවා නම් අපියි කථා කරන්නේ. අහිංසක විශ්වවිද්‍යාල ළමයින්ගේ ප්‍රශ්න ගැන කථා කරන්නේ අපියි. කොම්පඤ්ඤ වීදියේ ගෙවල් කඩද්දී කථා කළේ අපියි. කෝ, ඔබතුමන්ලා? සරම, බැනියම, අරක මේක ඇන්දයි කියලා මොනවාද රට වෙනුවෙන් කරලා තිබෙන්නේ? ඒක තමයි තිබෙන ප්‍රශ්නය. [බාධා කිරීමක්] මා දන්නවා, වෙල්ගම ඇමතිතුමනි. ඉතින් මේ අවස්ථාවේ දී ඒක නොවෙයි මා අහන්නේ. මා අහන්නේ මේ පරිපූරක- [බාධා කිරීමක්]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - தொழில் உறவுகள், மனிதவலு அமைச்சர்)
(The Hon. Athauda Seneviratne - Minister of Labour Relations and Manpower)

නම කියැවිලා තිබෙනවා, රාජරත්නම් කියන කොටි- [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔන්න ඕක තමයි. ඉතා පහත් මට්ටමේ- [බාධා කිරීමක්] රාජරත්නම් කියන එක් කෙනා රටට අවුරුදු 20ක් සල්ලි එවලා තිබෙනවා කියා ඒ ඇමතිවරයා හැම කෙනාත් එක්කම කියනවා, [බාධා කිරීමක්] ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග ගිහින් සල්ලි අරගෙන තිබෙනවා, Treasury Billsවල දමන්නය කියලා. පෞද්ගලිකව නොවෙයි. ඉතින් මේ වාගේ ඔහේ නිකම් - ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් මට අවුරුදු දෙකක් හිරිහැර කරලා, මේක money laundering ද, නැද්ද කියන එක කියලා, ඊට පසුව CID එක "ඔක්කොම හරි, ප්‍රශ්නයක් නැහැ" යි කියලා කිව්වාම- [බාධා කිරීමක්] නිකම් බොරුවට කෑ ගහන්න එපා. ඉතින් ඒවාට අපට ශක්තිය තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඇත්ත තත්ත්වය, මේ පරිපූරක ඇස්තමේන්තුවට සල්ලි ලබා ගන්නේ කාගෙන්ද? මේක බදු තුළින් ලබා ගන්නවාද? නැත්නම් අය වැයක් ඉදිරිපත් කරන්නේ නැත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉදිරියේ දණ ගහලා, ඒ සල්ලි දැන් පාවිච්චි කරන්නට බැරි නිසාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා- [බාධා කිරීමක්] මට දැන් මගේ සභාපති කියනවා, කට වහන්න කියලා. ඒ නිසා මට එය කරන්නම සිදු වනවා. නැත්නම් එතුමාට කථා කරන්න බැරි වෙයි.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல்:*
*Annexes tabled:*

**Schedule of Supplementary Estimates 2009**
**presented up to 09.10.2009**

| **Ministry** | | **Particulars** | **Amount** |
|---|---|---|---|
| 1 | Ministry of Plantation Industries | Rubber Development—for payment of a subsidy | Rs. 450,000,000 |
| 2 | Ministry of Transport | Providing financial assistance to the SLTB | Rs. 2,299,083,000 |
| 3 | Ministry of Industrial Development | For development activities—economic stimulus package for local manufacture of tyres | Rs. 200,000,000 |
| 4 | Ministry of Export Development and International Trade | For economic stimulus package | Rs. 8,016,400,000 |
| 5 | Ministry of Finance | Economic stimulus package | Rs. 350,000,000 |
| 6 | Ministry of Finance | For payment bonus interest on RFC and NRFC | Rs. 10,745,400,000 |
| 7 | Ministry of Agricultural Development | Development subsidy for tea | Rs. 2,500,000,000 |
| 8 | Ministry of Finance & Planning | Building, Rehabilitating & Improvement | Rs. 1,079,280,000 |
| 9 | Ministry of Sports & Public Recreation | To establish a Lion Safari Park at Ridigama, Hambandtota | Rs. 50,000,000 |
| 10 | Ministry of Power & Energy | To provide funds for the “Wadukkin Wasantham” project in the North | Rs. 2,400,000,000 |
| 11 | Ministry of Agricultural Development & Agrarian Services | To write off the losses under the Advance Account of certified seed and planting materials form 1976 to 2003 | Rs. 685,393,937 |
| 12 | Ministry of Nation Building & Estate Infrastructure | To make provision for the fuel subsidy for three-wheelers | Rs. 900,000,000 |
| 13 | Ministry of Resettlement & Rehabilitation | For resettlement and rehabilitation of the IDPs | Rs. 350,000,000 |
| 14 | Ministry of Urban Development and Sacred Area Development | For the Lunawa Environment and Community Development Programme | Rs. 1,715,000,000 |
| 15 | Ministry of Nation Building | Fro Recurrent and Capital Expenditure | Rs. 7,877,500,000 |
| 16 to 21 | Ministry of Defence —(06 Estimates) | For Recurrent and Capital Expenditure | Rs. 33,846,100,000 |
| 22 | Ministry of Water Supply and Drainage | To provide water and sanitation facilities to the rural sector | Rs. 2,145,000,000 |
| 23 | Ministry of Highways | To provide for Highways and Tsunami reconstruction activities | Rs. 10,645,000,000 |
| **Total** | | | **Rs. 118,452,795,000** |

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය
நகர அபிவிருத்தி, புனித பிரதேச அபிவிருத்தி அமைச்சு
**Ministry of Urban Development & Sacred Area Development**

3 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල.
3ம் மாடி "செத்சிறிபாய", பத்தரமுல்லை.
3rd Floor, "Sethsiripaya", Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. MUDSAD/S/UDA
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date June 3, 2009

**Confidential**

Secretary,
Committee on High Posts,
Parliament of Sri Lanka,
Sri Jayawardenapura Kotte

COMMITTEE OFFICE 04 JUN 2009 PARLIAMENT OF SRI LANKA

COMMITTEE ON HIGH POSTS TO EXAMINE THE SUITABILITY OF CANDIDATES FOR APPOINTMENTS FOR APPOINTMENT TO STATE SERVICES AND STATE CORPORATIONS

I refer to your letter No.COM/HP dated 28th May 2009, on the above matter.

Since the information contained in the letter sent by the President and Secretary of the Sri Lanka Nidahas Sewaka Sangamaya of the Urban Development Authority (UDA) was given to me prior to your letter, I had already directed the Director (Internal Audit) of the Ministry of Urban Development and Sacred Area Development to investigate the issues raised in the memorandum.

A copy of the report Ref. No.IAM /2009/24 dated 1st June 2009 addressed to me by the Director (Internal Audit) of this Ministry is enclosed for the information of the Committee.

In this report, it is clearly indicated that the Chairman, UDA, Mr Sanath Weerakoon had violated all the circulars in respect of the appointments, fuel expenditure, telephone expenditure etc. issued from time to time by the Presidential Secretariat, Treasury, Ministry of Public Administration and Home Affairs and by me as Secretary of the Ministry of Urban Development and Sacred Area Development.

Furthermore, he has directed the officials of the UDA that implementation of the directions given in the above circulars should be done with his consultation and not strictly implemented as directed in the circulars.

Submitted for the kind information of the High Post Committee.

Dr P Ramanujam
Secretary
Ministry of Urban Development &
Sacred Area Development

c.c. Hon Minister of Urban Development and Sacred Area Development

PR/lh

දුරකථන / தொலைபேசி / Telephones
අමාත්‍ය / அமைச்சர் / Minister 2862368 ඊ මේල් / ஈ மெயில் / E Mail minister@urbanlanka.lk ෆැක්ස් / பெக்ஸ் / Fax 2866447 ලේකම් / செயலாளர் / Secretary 2862412 ඊ මේල් / ஈ மெயில் / E mail drpraman@sltnet.lk ෆැක්ස් / பெக்ஸ் / Fax 2875600
Web site :- www.urbanlanka.lk කාර්යාලය / அலுவலகம் / Office 2864770 2862530 ෆැක්ස් / பெக்ஸ் / Fax 2871835

IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

SCFR 277/2008

1. A.A. Rahuman Beebee,
S 90/62, Glennie Passage, Colombo 2.

A. LARIFF
S. 90/60
Glennie Passage
Colombo 2

and 30 others.

Petitioners

Vs.

1. G. Rajapakshe,
Defence Secretary,
Ministry of Defence, Public Security, Law and Order, No.15/5,
Baladaksha Mawatha,
Colombo 03.

and 9 others.

Respondentys

SCFR 277/2008

BEFORE: J.A.N. DE SILVA, J.
BALAPATABENDI, J. &
P.A. RATNAYAKE, J.

COUNSEL: Upul Jayasuriya with P. Radhakrishnan for the Petitioners.
Mrs. M. Silva for 9th Respondent.
K.A.P. Ranasinghe, SSC for 1st,2nd,7th,8th and 10th Respondents.

ARGUED &
DECIDED ON: 19th August, 2008

J.A.N. DE SILVA, J.

On the directions of this Court the Registrar has sent a letter to the Inspector General of Police calling for a report on a complaint made by an Attorney-at-Law regarding an incident which took place near his office. Even though this letter has been dispatched on the 31st July 2008 so far there has been no

SCFR 277/2008

response from the Inspector General of Police. Inspector General of Police is directed to send a reply to this letter within one week from today.

Both Counsel inform Court that the matter is almost settled. All the Petitioners have agreed and entered into an agreement with the Urban Development Authority {Real Estate Exchange Pvt. Ltd. ,(REEL), the 5th Respondent}. Counsel for the Petitioner states that since this is the Ramazan month most of the Petitioners being Muslims that they be allowed to stay and perform their religious functions at the place where they are at present Mr. Musthapha appearing as amicus inform Court that he has made representations to the Senior Legal Advisor of the President and the President to resolve this matter and there is a likelihood that this matter could be resolved at that level. Hence this Court does not make any order in relation to that. Counsel for the Petitioner, Mr. Jayasuriya states that since the parties have entered into an agreement, the terms of the agreement should be implemented no sooner the houses are completed. Both parties

SCFR 277/2008

agree to comply with the terms and conditions imposed by the U.D.A. Subject to this, the proceedings are terminated.

Same terms will apply to Case No SCFR. 302/2008.

Sgd./-
JUDGE OF THE SUPREME COURT

BALAPATABENDI, J.
I agree.

Sgd./-
JUDGE OF THE SUPREME COURT

P. A. RATNAYAKE, J.
I agree.

Sgd./-
JUDGE OF THE SUPREME COURT

CF/-

I do hereby certify that the foregoing is a true copy of the judgment dated 19.8.2008, in Case No.SCFR 277/2008, filed of record in this Court.

Chief Clerk/Supreme Court
DHARMASRI MANATHUNGA
JUDICIAL REGISTRAR II
SUPREME COURT

Typed by:

Compared with:

SUPREME COURT
10 SEP 2008
SRI LANKA

IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

In the matter of an application under Article 126 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

SCFR 302/2008

1. Fathima Husna,
S 90/60, Glennie Passange,
Colombo 2.
and 163 others.
Petitioner

Vs.

1. Gotabe Rajapakshe,
Defence Secretary,
Ministry of Defence,
Public Security Law and Order,
No.15/5, Baladaksha Mawatha,
Colombo 01.

And 09 others.
Respondents

19.8.2008

Before: J.A.N. de Silva, J.
Balapatabendi, J. &
P.A. Ratnayake, J.

CERTIFIED COPIES SUPREME COURT
19 SEP 2008
SRI LANKA

SCFR 302/2008

Upul Jayasuriya with P. Radhakrishnan for the Petitioners.
K.A.P.Ranasinghe, SSC for 1st, 2nd and 10th Respondents.

The proceedings are terminated.
Judgment in Case No.SCFR 277/2008 will apply to this case.
(No.SCFR 302/2008.)

Sgd./-

************

I do hereby certify that the foregoing is a true copy of the journal entry dated 19.8.2008, in Case No.SCFR 302/2008, filed of record in this Court.

Chief Clerk/Supreme Court
DHARMASRI MANATHUNGA
JUDICIAL REGISTRAR II
SUPREME COURT

Typed by:
Compared with:

19 SEP 2008

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි. ගරු ටී.බී.ඒකනායක ඇමතිතුමා.

[අ. භා. 3.07]

**ගරු ටී. බී. ඒකනායක මහතා (මහාමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. T. B. Ekanayake - Minister of Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පරිපූරක ඇස්තමේන්තු කිහිපයක් සම්බන්ධව විවාද කරන මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන 10,641ක මෙම පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කරද්දී අපි දැක්කා, ජනතාව ඉතාමත් නොමඟ යවන, රට නොමඟ යවන කාරණා රාශියක් ඉදිරිපත් කරමින්, කථා කළ යුතු අවස්ථාවේ දී කථා කරන්නට කාරණා නොමැතිභාවය පෙන්නුම් කිරීමක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ලා පසුගිය හැම මැතිවරණයකදීම ජනතාව විසින් ප්‍රතික්ෂේප වෙච්, දවසින් දවස ජනතාවගේ පිළිකන්නට විසි වන දේශපාලන පක්ෂයක් බවට පත් වෙලා තිබෙනවා. එවැනි මොහොතක රවි කරුණානායක මන්ත්‍රීතුමාම දැන් කියනවා, ඊයේ අපි විවෘත කළ පාලමට මුදල් ලබා දුන්නේ එතුමා ලු. මේ වාගේ කතන්දර තමුන්නාන්සේලා හැම තැනම කියනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම නොවෙයි. එක්සත් ජාතික පක්ෂය. [බාධා කිරීමක්]

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)

එක්සත් ජාතික පක්ෂය තමයි- [බාධා කිරීමක්] සෞදි අරාබියේ තානාපතිතුමා ඊයේ ඇවිල්ලා පැහැදිලි කළා, අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීම මත මේ මුදල් ලබා දීම විතරක් නොවෙයි, ඉදිරියේ දීත් කරනු ලබන සියලු ඉල්ලීම් සලකා බැලීමටත්, මුදල් ලබා දීමටත් සෞදි අරාබි රජය එකඟ වනවාය කියලා. තමුන්නාන්සේලා දැන් මොකක්ද කියන්නේ? දැන් මේ එක්සත් ජාතික පක්ෂයේ කතන්දර සෞදි අරාබි තානාපතිතුමාට යැව්වොත් එහෙම පැහැදිලි වෙයි, තමුන්නාන්සේලා මේ වරප්‍රසාදවලට මුවා වෙලා ක්‍රියා කරන ආකාරය. තමුන්නාන්සේගේ ගෙදරට අපි RDA එකේ ලොරියක ගෙනැල්ලා තියන්නම්, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ තබපු මුල් ගල්. 18 වතාවක් මුල් ගල් තබා තිබෙනවා. මුල් ගල් 18ක් තිබෙනවා. ඒ මුල් ගල් අදත් ඒ ස්ථානවල තිබෙනවා. ඉරක්කණ්ඩි පාලමට මුල් ගල් තැබුවා. ඉතිහාසයේ ඒ මාර්ගය කිසි දවසක හදලා තිබුණේ නැහැ. අද නැඟෙනහිර පළාතට යන්න, උතුරු පළාතට යන්න, දකුණු පළාතට යන්න, අද නගරයට සීමා වෙච්ච සංවර්ධනය ගමට ගිහිල්ලා තිබෙනවා. එදා නගරයට කිරි - ගමට කැකිරි කිව්ව එක වෙනුවට අද ගමට කිරි ලැබෙන ඒ සංවර්ධනාත්මක සංග්‍රාමය නිසා තමයි මාතලේ නගරාධිපති අලුවිහාරේ මැතිතුමාත් අද කියන්නේ, මහින්ද චින්තනය අනුව වැඩ කළොත් රටේ සෞභාග්‍යය ඇති වනවාය කියලා. අද ඒක තමයි නිවැරැදි තත්ත්වය. එක්සත් ජාතික පක්ෂයේ නගරාධිපතියි එහෙම කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රංජිත් අලුවිහාරේ මැතිතුමාත් බුද්ධි සම්පන්න දේශපාලන තීන්දුවක ඉන්නවා, මේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන්.

ඒ වාගේම පඩුවස්නුවර මන්ත්‍රීතුමා පැහැදිලි කළා, අපේ "මග නැඟුම" ගැන. කතන්දර ගොඩක් කියන්න තියෙද්දීත් අහපු ප්‍රශ්නවලට උත්තර දිය යුතු නිසයි මා මේ කාරණා කියන්නේ. "මග නැඟුම" පිළිබඳව නොවෙයි, එතුමාට තිබෙන්නේ

[ගරු ටී. බී. ඒකනායක මහතා]

පඩුවස්නුවර පිළිබඳ ප්‍රශ්නයක්. මග නැඟුම සභාපතිතුමා ගැන දැන් කථා කළා. මග නැඟුම සමාගම හදන්න සිද්ධ වුණේ ඇයි? ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා ඒ ගැන දන්නවා. RC & DC ආයතනය එක්සත් ජාතික පක්ෂය විසින් පැය 24ක් තුළ වහලා දැම්මා. ගේට්ටුවේ ගහපු බෝඩ් එකේ තිබුණේ, "මේ ආයතනය ඇවර කර ඇත" කියලායි. සේවකයන්ට යන එන මං නැහැ. සේවකයන් කොහේද ඉන්නේ කියා දන්නේ නැහැ. යන්ත්‍ර සූත්‍ර අදත් අතුරුදහන්. සමහර වාහන අද එක්සත් ජාතික පක්ෂයේ ගජ මිතුරන් ගාව තිබෙනවා. රහස් පොලිසිය අද ඒ පිළිබඳව පරීක්ෂණ පවත්වා ගෙන යනවා. එහෙම තමයි එක්සත් ජාතික පක්ෂය ආයතන විනාශ කළේ, ආයතන අයාලේ යැව්වේ. අතිගරු ජනාධිපතිතුමා මහාමාර්ග ඇමතිවරයා විධියටත්, අග්‍රාමාත්‍යවරයා විධියටත් පත් වුණාට පස්සේ, එදා පැය 24ක් තුළ වසා දමපු ඒ ආයතනය, අයාලේ ගිය ඒ ආයතනය යන්ත්‍රසූත්‍ර එක්ක ඒකාබද්ධ කරලා මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ සමාගම් තුනක් පිහිටෙව්වා. ඒ සමාගම් තුන යටතේ තමයි මේ සමාගම් ක්‍රියාත්මක වුණේ. සමහර ආයතන විකුණුවා; ගොඩනැඟිලි විකුණුවා; භූමිය විකුණුවා. ඒ වාගේම වෙනත් ආයතන විකුණුවා. අද කවුරුවත් ඒ ගැන කථා කරන්නේ නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඇයි තමුන්නාන්සේ යන්නේ? ඇයි යන්නේ?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
ඒ ආයතනවල වාහන විකුණපු අයගේ ලේඛනය ඉදිරියේදී ඉදිරිපත් කරන්න අපි කැමැතියි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සතොස

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
අපේ පඩුවස්නුවර මන්ත්‍රීතුමා කිව්වා, මග නැඟුමේ සභාපතිතුමාගේ බිලක් - හිල්ටන් හෝටලයේ බිලක් - ගැන. ඕනෑ කෙනකුට හෝටලයට ගිහිල්ලා, කෑම කාලා, සංග්‍රහයන් බුක්ති විඳලා යන්න පුළුවන්. හැබැයි එතුමා මග නැඟුමෙන් වැටුප් ගන්නේ නැති සභාපතිවරයෙක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා අපට වග කීමෙන් ඒ ගැන කියන්න පුළුවන්. වැඩ කරන කොට මෙවැනි ප්‍රශ්න මතු වනවා. මේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට යට වෙලා, මේ ආයතන පිළිබඳව, වැඩ කිරීම පිළිබඳව අසත්‍ය ප්‍රකාශ කරනවා. මහාමාර්ග අමාත්‍යාංශය අද රටේ අතිවිශාල වැඩ කරන ආයතනයක්. උතුර නැඟෙනහිර ගත්තාම, ඒ-9 මාර්ගය, ඒ-32 මාර්ගය, සිලාවතුර-මුරුන්ගන් මාර්ගය, පුත්තලම-මන්නාරම-තලෙයිමන්නාරම මාර්ගය වාගේ අතිවිශාල ව්‍යාපෘති ක්‍රියාත්මක වනවා.

අද උදේ පාන්දර 5.45ට අතිගරු ජනාධිපතිතුමා දෙහිවල ගුවන් පාලම විවෘත කළා, ජනතා අයිතියට. රුපියල් මිලියන 800ක් දෙහිවල ගුවන් පාලමට වියදම් කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැඟුවා. මීටර් 337ක් දිගයි ඒ ගුවන් පාලම. එක්සත් ජාතික පක්ෂය ඉතිහාසයේ කවදාවත් ගුවන් පාලම් හැදුවේ නැහැ. Mabey and Johnson සමාගම ගැන කථා කළා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
හැබැයි Mabey and Johnson සමාගම අයිති බ්‍රිතාන්‍යයේ මහ කොමසාරිස්වරයා තමයි අද දෙහිවල ගුවන් පාලම විවෘත කිරීමේ අවස්ථාවට ආවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
ඒ ආයතනය බංකොලොත් නම් ඒ වෙනුවෙන් පෙනී සිටින්න ඒ රටේ නියෝජිත මහකොමසාරිස්වරයා එනවාද කියන එක මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඒ නිසා සභාව නොමඟ යවලා, රට නොමඟ යවලා, බංකොලොත් දේශපාලන ව්‍යාපාරයේ තමන්ට හිමි වෙච්ච ඒ අන්ත අසරණ දේශපාලන තත්ත්වයෙන් මේ වැඩ කරන දේශපාලන ව්‍යාපාරයට මඩ ගහන්න එපා. මොකද, අතිගරු ජනාධිපතිතුමා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඉතාම සක්‍රිය, ශක්තිමත් වැඩ පිළිවෙළක් රට තුළ ක්‍රියාත්මක කරන්න විදේශ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. අද දකුණේ යන අය, බස්නාහිර යන අය, උතුරේ යන අය, නැඟෙනහිර පළාතේ යන අය දන්නවා, මාර්ග සංවර්ධනය වෙලා තිබෙන හැටි අම්පාර ප්‍රදේශයේ, මඩකලපුව ප්‍රදේශයේ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ එදා තිබුණු තත්ත්වය මොකක්ද කියලා තමුන්නාන්සේලාට මතක ඇති. අද තිබෙන තත්ත්වය මොකක්ද කියලා තමුන්නාන්සේලාට පැහැදිලි වනවා ඇති. අද මඩකලපුව ප්‍රදේශයෙන් එන, ත්‍රිකුණාමලය ප්‍රදේශයෙන් එන මන්ත්‍රීවරු අපට ස්තුතිවන්ත වනවා, පැය හතරක් තුළ කොළඹට එන්න පුළුවන් වාතාවරණය සකස් කරන්න, මාර්ග කාපට් කරලා ඉතාම හොඳ තත්ත්වයක් ඇති කරන්න පුළුවන් වෙලා තිබෙනවාය කියලා. එහෙම නම් මේ තත්ත්වය නිර්මාණය කරන්න අප ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ සඳහා ගිය අවුරුද්දේ වියදම් කළ මුදලට අමතරව තවත් වියදම් කරන්න අවශ්‍ය මුදල් ලබා ගැනීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතු වනවා. මේ රටේ තමුන්නාන්සේලා වෙනුවෙන් මහාමාර්ග හදන්න, තමුන්නාන්සේලා වෙනුවෙන් පාලම් හදන්න, තමුන්නාන්සේලා වෙනුවෙන් ගුවන් පාලම් ඉදි කරන්න, තමුන්නාන්සේලා වෙනුවෙන් යටිතල පහසුකම් නිර්මාණය කරන්න මුදල් අවශ්‍ය වනවා. ඒ නිසා ඒ කාර්යය සඳහා තමුන්නාන්සේලාගේ සහාය ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි.
ඊළඟට ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක් තිබෙනවා.

[අ. භා. 3.15]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු මොහොමඩ් ෂෆීක් රාජබ්දීන් මහතා**
(மாண்புமிகு மொகமட் ஷபீக் ரஜாப்தீன்)
(The Hon. Mohamed Shafeek Rajabdeen)
Hon. Deputy Speaker, the Kinniya Bridge was started during the UNP regime.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මමයි වාරිමාර්ග ඇමති විධියට ත්‍රිකුණාමලයේ ගිහිල්ලා ඒ පාලම සෑදීම සඳහා ගිවිසුම අත්සන් කළේ. මුදල් අනුමත වුණේ යූඑන්පී රජය - රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ රජය - වෙලාවේ. ඒ නිසා ඒ ගැන- [බාධා කිරීමක්] මගේ කාලය දෙන්න බැහැ. [බාධා කිරීමක්]

**ගරු මනෝ විජයරත්න මහතා (ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனோ விஜயரத்ன - தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Mano Wijeyeratne-Minister of Enterprise Development)
අලිමංකඩ, පාමංකඩ, කිලිනොච්චිය, මැදවච්චිය පාරවල් හදා ඉවර කරන්න-

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී මහාමාර්ග ගැන කථා කරද්දී මම ඇමතිතුමාගෙන් එක කාරණයක් අහනවා. මම ප්‍රධාන ඇමති වෙලා සිටි කාලයේ පාදෙණිය පාරේ හිටවූ ගස් ගැලවීමක් දැන් තිබෙනවා. ප්‍රශ්නයක් නැහැ. ඇමතිතුමා කියන්න, මේ ගස් ගලවා වෙන්දේසි කරන්නේ කවුද? ගන්නේ කවුද? රාජ්‍ය දැව සංස්ථාව ගන්නවාද?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
ගරු මන්ත්‍රීතුමා, මේ පාර කිලෝමීටර් 82යි. මිලියන 6,000ක් වියදම් කර -

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මට ඒවායින් වැඩක් නැහැ. ගස් ගැන මම ඇහුවේ.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
මේ පාරේ ඉතාමත් පොඩි ගස් ටික අපි ඒ විධියටම ගලවා නැවත සිටුවීම ක්‍රියාත්මක කරනවා. ලොකු ගස් සියල්ලම ගලවා දැව සංස්ථාවට භාර දීම මේ වන විටත් ක්‍රියාත්මක වනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඊළඟට ජනාධිපතිතුමා අනුමත කළ පල්ලේගම - කොටදෙණියාව පාර බලන්න. ලේකම් ලියලා ලියලා දැන් ඒකට අවුරුදු තුනක් වනවා. ඇමතිතුමා ඒ වැඩ පටන් ගන්නේ නැත්තේ ඇයි?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ උනන්දුව පිළිබඳව ස්තුතිවන්ත වනවා. කොටදෙණියාව පාරට අදාළ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර පටන් ගැනීමට අවශ්‍ය නියෝග ලබා දීලා ඉවරයි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
කවදාද පටන් ගන්නේ?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
පටන් ගන්න අවශ්‍ය- [බාධා කිරීමක්] කුරුණෑගල පළාත් අධ්‍යක්ෂතුමියට අවශ්‍ය නියෝගය දීලා ඉවරයි, වැඩ ආරම්භ කිරීමට.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මේ අවස්ථාවේ අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමාත් ඉන්නවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
භාගයක් කරලා ඉවරයි. තව පොඩ්ඩයි කරන්න තිබෙන්නේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හොඳයි. ඇමතිතුමා පාරවල් හැදීම කරන්න ඕනෑ. සුද්දන්ගේ කාලයේත් පාරවල් හැදීම කෙරුණා. අවශ්‍ය පාරවල් හැදීමත් එක්ක දක්ෂිණ ලංකා වැනි පාලම් කඩා වැටෙන ගිවිසුම් ගැන කවදා හරි එක්සත් ජාතික පක්ෂ රජයටත්-[බාධා කිරීමක්] මහාමාර්ග කියන්නේ හොඳ තැනීම්. හොඳට ගහන්න පුළුවන්. මෙන්න මේවා ගැන පරීක්ෂණ කවදා හරි වනවා. මොකද, මේ වාගේ බරපතළ සිද්ධීන් ඇති වෙලා ජනතාවට- [බාධා කිරීමක්] හරි. හරි. ඒක බලා ගනිමු. අපි ඒක බලා ගනිමු. විශේෂයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ දෙදරුම් කෑම්- [බාධා කිරීම්] අපේ නොවෙයි, ඔබතුමන්ලාගේ- [බාධා කිරීමක්] තිබෙන්නේ. එහෙම ස්ථිර දෙයක් නැහැ මේ ලෝකයේ. 1993 දී ඔබතුමන්ලා සිටියේ කොහොමද? ආවේ කොහොමද? ඒ නිසා ඒවා ගැන වැඩිය අනාවැකි කථා කරන්න එපා. මෙතැන චමල් රාජපක්ෂ ඇමතිතුමාත් ඉන්නවා. කතරගම පූජා නගරය ගැන කියන්න ඕනෑ. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා මෙතැන නැහැ. ඔබතුමන්ලාගේ කතරගම පූජා නගරය හම්බන්තොට ප්‍රදේශයේ තිබෙන්නේ. දිවංගත ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා කළාට පස්සේ ප්‍රතිසංස්කරණයක් වෙලා නැහැ. හරි කනගාටුයි. 1994 ඉඳලා හරි වැඩක් හරියට කර නැහැ. ඒ ගැන මම කනගාටු වනවා. මුන්නේශ්වරම් කෝවිල සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ මහතාගේ රජය සාකච්ඡා කර සැලසුම් හැදුවා. අද ඒ ප්‍රදේශය පූජනීය නගරයක් කිරීමේ සාකච්ඡාවන් එක්තරා මට්ටමකින් ක්‍රියාත්මක වනවා. මම ඇමතිතුමාට කිව්වා, දැන් භය නැතිව යමු, ත්‍රස්තවාදයක් නැහැනේ, එන්න කියලා. එතකොට එතැන ඒ කටයුතු ටික කෙරෙන්න ඕනෑ.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

රෝහණ ඇමතිතුමා සෝමාවතියට ගියා. සෝමාවතියට ගිහිල්ලා සාකච්ඡාවල් කරලා සැලසුම් හැදුවා. නමුත් ඊට පස්සේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමායි, පශු සම්පත් සංවර්ධන ඇමතිතුමායි සෝමාවතියට ගිහින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාත්‍රියක් ගත කෙරුවා. පාන්දර හතරහමාරට බෙර ශබ්දයක් ඇහිලා. නැගිටලා, පූජාව කියලා හිතලා; උදේ හයට තියන බුද්ධ පූජාව කියලා හිතලා. අනෙක් අයට ඇහෙන්නේ නැතිලු. මේ දෙන්නා නැඟිටලා ලෑහැස්ති වෙලා බලද්දී වේලාව උදේ හතරහමාරයිලු. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමායි, පශු සම්පත් සංවර්ධන අමාත්‍ය රත්නායක ඇමතිතුමයි හයහමාරට ගිහිල්ලා හාමුදුරුවන්ගෙන් ඇහැව්වාලු, "හාමුදුරුවනේ, අර ඇහුණු බෙර ශබ්දය මොකක්ද?" කියලා. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තනිකම් දෝෂය වෙන්න ඇති.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
තනිකම් දෝෂය ඔබතුමාට හැදෙයි. ඔබතුමා ශාප ගන්න එන්න එපා. කට වැඩියි. නහින මහක ලකුණක්. මතක තියා ගන්න. දන්ත ධාතූන් වහන්සේත් වැඩ ඉන්න තැනක්. අහන්න දිනේෂ් ඇමතිතුමාගෙනුයි, රත්නායක ඇමතිතුමාගෙනුයි, එතැන බලය. [බාධා කිරීමක්] තමුන්නාන්සේ කට වහ ගෙන ඉන්න. අපහාස කරලා තනිකම් දෝෂය කටටත් වදියි. නහින්න හදනවා. ඒක ඒ දෙන්නාගෙන් අහ ගන්න. මම වමල් ඇමතිතුමාටත් කියනවා, සෝමාවතී පූජා භූමිය වටා බැම්මක් බඳින්න කියලා, වතුර එන හින්දා. කරුණාකරලා ඔබතුමන්ලා ඒක සිදු කරන්න. ඒක ඉතා වැදගත් වනවා.

විශේෂයෙන් අවුරුදු පණහක් ඉස්සරහ බලලා මේ පාරවල් විතරක් නොවෙයි, සැලසුම් ද හැදෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ භූමිය, නගරය විනාශ වනවා. මොකද, නගරය ආයෙත් අවුරුදු දහයකින් හදන්න බැහැ; පාරවල් කඩන්න බැහැ. කෙටි කාලයක් ගැන හිතලා නොවෙයි අවුරුදු පණහක් ගැන හිතලා හදන සැලසුමක් අනුව කෙරෙන වැඩ පිළිවෙළකට බැහැලා ක්‍රියා කරන්න ඕනෑ. විශේෂයෙන් මම මේ කරුණත් කියන්න ඕනෑ. අද ඇමතිතුමා කිව්වා, වතුර ගලන නිසා ඇළවල් ශුද්ධ කරන්න මුදල් වියදම් කරනවායි කියලා. අපේ වමල් ඇමතිතුමාට මම කියනවා, මාතර සිට පුත්තලමට තිබෙන ඇළ ලන්දේසි ඇළයි. ඔය ලන්දේසි ඇළ සම්බන්ධයෙන් මම වාරිමාර්ග ඇමති වෙලාවේ සැලසුම් හැදුවා. මොකද, කොළඹ දිස්ත්‍රික්කයේ අක්කර තිස් දාහක් වගා කරන්න බැහැ, අද ගංවතුර ගලනවා. ඉස්සර ලන්දේසි කාලයේ අලි ඇතුන් ගෙන ගියේ ඔය ඇළයි. එහෙම නම් ඒ ඇළවල් ප්‍රතිසංස්කරණය කරන්න අවශ්‍යයි. අපි ලන්දේසි රජයෙන් හෝ මුදල් අරගෙන,-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා කියන දෙය තේරෙන්නේ නැහැ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
තේරෙන්නේ නැහැ. තමුන්නාන්සේට තේරෙයි, ඒක මම දන්නවා. මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාට මම කියනවා, ඒ ලන්දේසි ඇළ ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍යයි. ඒ නිසා විදේශ ආධාර අරගෙන හෝ එවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ ගරු ඇමතිතුමනි. මොකද, ඒ ඇළ ජල ගැලීම්, සංචාරක ව්‍යාපාරය, කෘෂිකර්මය ආදී සෑම දෙයකටම බලපානවා. ඒ නිසා එය ප්‍රතිසංස්කරණය කිරීම ඉතා වැදගත් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩි කීයක්ද තිබෙන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තව විනාඩි දෙකක්.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
අපේ ගරු ධීවර ඇමතිතුමා, අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා- [බාධා කිරීම්] ඔය කට්ටියට මාව අඩවන්න බැහැ. ඔය කට්ටියට ඇඬෙයි. තේරුණාද? අඩන්න සිදු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, මම විශේෂයෙන් අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ -

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T. B. Ekanayake)
ඔබතුමාට පැහැදිලි කිරීමක්. දක්ෂිණ අධිවේගී මාර්ගයේ යකඩ පාලම් ගැන කථා කළා. මෙන්න ඒ ගිවිසුම් පත්‍රය. ඒක ඔබතුමාට දෙන්න පුළුවන්. මේ ගිවිසුම් පත්‍රය අනුව 2002 බ්‍රිසීල සමාගමක් තමයි ගෙනැවිත් තිබෙන්නේ. මේ බ්‍රිසීල සමාගමෙන් ඉදි කරපු යකඩ පාලම්වලින් එකක් තමයි ගාල්ලේ, පෝද්දල කඩා වැටුණේ. ඒ පිළිබඳව මොරටුව විශ්වවිද්‍යාලයෙන් අපි දැන් නිරීක්ෂණ ලබා ගෙන තිබෙනවා. මේ පිළිබඳව වගකීම භාර ගන්න තමුන්නාන්සේලා. මොකද, මේ මුදල්වල වගකීම තමුන්නාන්සේලා භාර ගන්න ඕනෑ. අපට මේ බෝල්ලේ පාස් කරන්න එපා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
නැහැ, ඔය කියන ලේඛන මම පිළිගන්නේ නැහැ. මේ කටයුත්ත- [බාධා කිරීම්] ගහන්න දෙයක් නැහැ. බොරුවට කඩදහි දික් කර ගෙන. ඒවා තිබෙනවා නම් සභාගත කරලා ඒ විධියට ඉදිරිපත් කරන්න. මම පිළිගන්නේ නැහැ. මම දන්නවා, ඒ වෙලාවේත් සාකච්ඡා විතරයි කෙරුවේ. ඒ වෙලාවේ ගිවිසුම් ගැහුවේ නැහැ; වංචාවක් කළේ නැහැ. [බාධා කිරීම්]

**ගරු ජයතිස්ස රණවීර මහතා (වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர - நீர்ப்பாசனத்துறை அமைச்சர்)
(The Hon. Jayatissa Ranaweera - Minister of Irrigation )

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නිශ්ශබ්ද වන්න. ගරු ජයතිස්ස රණවීර ඇමතිතුමා. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වන්න. ගරු ජයතිස්ස රණවීර ඇමතිතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක.

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
ඔබතුමාට බුදු රැස් පෙනෙනවාද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මටද?

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
ඔව්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒක point of Order එකක් නොවෙයි, මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔව්, මට පෙනෙනවා.

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඔබතුමාට බුදු රැස් පෙනෙයිද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
තමුන්නාන්සේට ඒ ශාපය වැදෙයි.

**ගරු ජයතිස්ස රණවීර මහතා**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர)
(The Hon. Jayatissa Ranaweera)
බුද්ධාගමට අපහාස කරන්න එපා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒක බලා ගන්න පුළුවන්. අහ ගන්න, දිනේෂ් ඇමතිතුමාගෙන්. ඔය ශාපය තමුන්නාන්සේට වදියි. [බාධා කිරීම්] අනේ! ඇමතිතුමා, තමන්ගේ තිබෙන පාප කර්මය තමන්ට එයි, තමන් මතක තියා ගන්න. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියනවා, කට හැකරකම නතින්න හේතු වෙලා. කටහැකරකම නින්දා ක්ලින්ටන් ගැන කියන්න ගිහිල්ලා, ලෙවින්ස්කි ගැන කියන්න ගිහිල්ලා ජාත්‍යන්තර ප්‍රජාව තරහ කර ගෙන.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි. ස්තූතියි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
අද බ්‍රිතාන්‍ය අධිකරණය කියනවා අර එක්දහස් නවසිය අසූ ගණන්වල වාගේ දෙමළ තරුණයන්ට නැවතත් දේශපාලන රැකවරණය දෙන වාතාවරණයක් තිබෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියා. විදේශ කටයුතු ඇමතිත් ඉන්නවා. අද තමුන්නාන්සේලා කටවල් නිසා නහින තත්ත්වයට පත් වෙලා. අද මේ රටේ -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
GSP Plus අහිමි වීමේ අවදානම යටතේ අද මේ රටේ ෆැක්ටරි වැහිලා. ඒ විතරක් නොවෙයි රැකියා ලක්ෂ තුන, හතරක් නැති වන තත්ත්වයට පත් වෙලා. විශාල ශාපයක් ඇති වනවා. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න. ස්තූතියි. ඊළඟට, ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා. [බාධා කිරීමක්] මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න. ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා කථා කරන්න. [බාධා කිරීම්]

[අ. භා. 3.25]

**ගරු මහින්ද අමරවීර මහතා (ජලසම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Water Supply)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීම්] එතුමා හඬනවා. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා එතුමාගේ හැඬීම නවත්වලා අපට විනාඩි පහක්වත් කථා කරන්න ඉඩ ලබා දෙන්න කියලා.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමා.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)

The Hon. Member raised a matter connected with international affairs. We could not hear it properly. Therefore, I would like the Hon. Member to repeat it. If he wants some response from me, as the Minister of Foreign Affairs, I would like him to be clear. මන්ත්‍රීතුමා ඒක පැහැදිලි කළොත් මට උත්තරයක් දෙන්න පුළුවන්. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් වෙලාවක් නැහැ. ගරු මහින්ද අමරවීර ඇමතිතුමා. [බාධා කිරීම්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ දේවල් කථා කරන්න තිබුණත් වෙලාවක් නැති බව පෙනෙනවා. කොහොම

[ගරු මහින්ද අමරවීර මහතා]

වුණත් ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා මොනවා කිව්වාද කියලා ඇහුණෙත් නැහැ. හඬා වැටීමක් විතරයි, අඳෝනාවක් විතරයි අහන්න ලැබුණේ. ඒ වාගේම තමයි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු දිගින් දිගටම මර බියෙන් කෑ ගහනවා වාගේ තමයි මම දැක්කේ. මැතිවරණයක් කිට්ටු වන වෙලාවේ අතිගරු ජනාධිපතිතුමාට මඩ ගහන්න, ආණ්ඩුවට මඩ ගහන්න මේ වෙලාව පාවිච්චි කළා මිසක් රජයට හරි යෝජනාවක්, හරි අදහසක් ඉදිරිපත් කළේ නැහැ.

අද මේ පරිපූරක ඇස්තමේන්තුවලිනුත් මුදල් ඉල්ලා සිටින්නේ මේ රටේ සංවර්ධනය වෙනුවෙනුයි. අපි ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විධියට ගත්තොත් රුපියල් මිලියන 850ක මුදලක් ඉල්ලා සිටිනවා. ඒ ඉල්ලා සිටින්නේ ද්විතීය ජල යෝජනා ක්‍රමවල වැඩ අවසාන කරන්නටයි. අපි බලාපොරොත්තු වුණාටත් වඩා ඒකට මුදල් වැය වුණා. රජයේ මුදල් යොදවලා හරි ඒවා අවසාන කිරීම තමයි අපේ කාර්ය භාරය වන්නේ. එක්සත් ජාතික පක්ෂය පසු ගිය කාලය පුරාවටම ව්‍යාපෘති ආරම්භ කරපු ඒවා ඉස්සරහට ගෙන යන්නවත් කටයුතු කළේ නැහැ. රජයේ මුදල් ශත පහක් වියදම් කළේ නැහැ. විදේශ ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කළේ නැහැ. නමුත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මේ රජය, රජයක් විධියට ත්‍රස්තවාදය අවසාන කිරීමේ වැඩ පිළිවෙළටත් දැවැන්ත මුදලක් වෙන් කරන ගමන්, ඒ වෙනුවෙන් පූර්ණ කැප කිරීම කරන ගමන් රටේ සංවර්ධනය වෙනුවෙනුත් එඩිතරව ගත්තා වූ තීන්දු එකක්වත් ආපස්සට හැරෙව්වේ නැහැ. නගර විතරක් නොවෙයි. අද හැම ගමකටම ගිහිල්ලා, ඒ ගම්වල මිනිසුන්ගෙන් අහලා බැලුවොත් ඒ අය මොනවාද කියන්නේ කියලා එතුමන්ලාට පෙනේවි. යූඑන්පී අය. අපේ පක්ෂයේ කට්ටිය පැත්තකින් තියමු. යූඑන්පී එකේ අය පවා කියනවා මේ ආණ්ඩුව ආවාට පස්සේ වැඩ කරන්න පටන් ගත්තා කියලා. හැම ගමකටම ගිහිල්ලා බැලුවොත් පාරවල්වල ලයිට් කණු සිටු වනවා; වතුර බට දමනවා; පාරවල් හදනවා. විශාල සංවර්ධනයක් මේ රජය තුළින් සිදු වන බව හෘදය සාක්ෂියට එකඟව එතුමන්ලා පිළිගන්නවා ඇති කියලා මා විශ්වාස කරනවා. මම හිතන විධියට එතුමන්ලාට තිබෙන ප්‍රශ්නය වැඩ කරන කොට අඩු පාඩු සොයන එකයි. ඒක හොඳයි. අඩු පාඩු සොයලා දෙන්න. හැබැයි ඒවා සද්භාවයෙන් පෙන්වලා දෙන්න. අඬ ඇඬියා නොවෙයි. අවලාද නොවෙයි. පෙන්වලා දෙනවා නම් රජයක් විධියට අපි ඒවා භාර ගන්න සූදානම්. රට තුළ දැවැන්ත සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන විට යම් යම් අතපසු වීම්, අඩුපාඩු ඇති වන්න පුළුවන්. නමුත් ඒවා එකක්වත් පෙන්වලා දුන්නේ නැහැ. මෙතැන මරු විකාරයෙන් කෑ ගහනවා විතරයි අපි දැක්කේ. එක්සත් ජාතික පක්ෂයේත්, ජනතා විමුක්ති පෙරමුණේ අපේ හිතවත් මන්ත්‍රීවරුන්ගෙනුත් අපට ඒ තත්ත්වය හොඳට පැහැදිලිව පෙනෙන්න තිබුණා. මොකද? දැන් ළඟ එන මැතිවරණවලට ඔවුන් බය වෙලා තිබෙනවා. කට පණ ගහ ගෙන ආවත් හරි දේ කියැවෙන්නේ නැහැ. ගොරෝද්දේ ඇදෙන්නේ. [බාධා කිරීමක්] ඔව්. මහා වේගයෙන් කථා කර ගෙන ගියාට ගොරෝද්දේ ඇදෙන්නේ. නමුත් අපි කියනවා එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය, ඒ වාගේම අපේ අතිගරු ජනාධිපතිතුමා ඊ ළඟට එන මැතිවරණවලිනුත් ජය ගන්නා බව. එතුමා තුනෙන් දෙකකට වැඩි බලයක් සහිතව නැවත මේ රටේ ජනාධිපති වනවා විතරක් නොවෙයි, තුනෙන් දෙකකට වැඩි බලයක් සහිත පාර්ලිමේන්තුවකුත් අපි ලබා ගන්න සූදානම් බව සිහිපත් කරමින් මා නවතිනවා. ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල : විදේශාධාර ව්‍යාපෘති

### குறைநிரப்புத் தொகை : வெளிநாட்டுதவி கருத்திட்டங்கள்

SUPPLEMENTARY SUPPLY : FOREIGN-FUNDED PROJECTS

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හත්සිය අසූහත් කෝටි හැත්තෑ පන් ලක්ෂයකට (රු. 7,877,500,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | |
|---|---|
| ශීර්ෂය | 105 - ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 - සංවර්ධන කාර්යයන් |
| ව්‍යාපෘතිය | 10 - විදේශාධාර සංවර්ධන ව්‍යාපෘති |
| ප්‍රාග්ධන වියදම් | රු.7,877,500,000 |
| | රු.7,877,500,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල : ද්විතීයික නගර හා ග්‍රාමීය ප්‍රජාමූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය

### குறைநிரப்புத் தொகை : இரண்டாந்தர நகரங்கள் மற்றும் கிராமிய சமூக அடிப்படையிலான நீர் வழங்கல் மற்றும் துப்பரவேற்பாட்டுச் செயற்றிட்டம்

SUPPLEMENTARY SUPPLY: SECONDARY TOWNS AND RURAL COMMUNITY-BASED WATER SUPPLY AND SANITATION PROJECT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දෙදහස් එකසිය හතලිස් පහකට (රු. 2,145,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

ශීර්ෂය 166 - ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය
වැඩ සටහන 02 - සංවර්ධන ක්‍රියාකාරකම්
ව්‍යාපෘතිය 05 - මහා පරිමාණ ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය
උප ව්‍යාපෘතිය 15 - ද්විතීයික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය
මූල්‍යකරණ අංක 12
(විදේශාධාර ණය)
ප්‍රාග්ධන වියදම් රු. 1,295,000,000
මූල්‍යකරණ අංක 17
(විදේශාධාර සබැඳි දේශීය අරමුදල්)
ප්‍රාග්ධන වියදම් රු.850,000,000
එකතුව රු.2,145,000,000
==========

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල : ප්‍රවාහන හා ගමනාගමන අවශ්‍යතා සපුරාලීම සහ දියුණු කිරීම

### குறைநிரப்புத் தொகை : கொண்டுசெல்லல் மற்றும் போக்குவரத்துத் தேவைகளின் ஈடேற்றலும் விருத்தியும்

### SUPPLEMENTARY SUPPLY: FULFILMENT AND DEVELOPMENT OF TRANSPORTATION AND MOBILITY REQUIREMENTS

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දස දහස් හයසිය හතලිස් එකකට (රු. 10,641,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

ශීර්ෂය 117 - මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය
වැඩ සටහන 02 - සංවර්ධන කාර්යයන්
ව්‍යාපෘතිය 03 - අධිවේගී මාර්ග සංවර්ධනය - (දේශීය අරමුදල්) රු. 408,000,000
04- මහාමාර්ග සංවර්ධනය- (දේශීය හා විදේශීය අරමුදල්) රු. 819,000,000
05- මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම- (දේශීය හා විදේශීය අරමුදල්) රු. 1,610,000,000
06- පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම - (දේශීය හා විදේශීය අරමුදල්) රු.5,584,000,000
07 සුනාමියෙන් විපතට පත් මාර්ග පුනරුත්ථාපනය කිරීම - (දේශීය හා විදේශීය අරමුදල්) රු. 2,005,000,000
08- ආයතනික සහාය- (දේශීය අරමුදල්) රු. 215,000,000
එකතුව රු.10,641,000,000

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම

### ஒத்திவைப்பு

### ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගරු එන්.ඩී. නිමල් ප්‍රේමවංශ ජයසිංහ මහතා.

## තඹ සහ පිත්තල හිඟය නිසා දේශීය වාත්තු කර්මාන්තකරුවන් මුහුණ දී ඇති ගැටලු

### செம்பு, பித்தளை என்பவற்றின் தட்டுப்பாட்டினால் உள்நாட்டு வார்ப்புக் கைத்தொழிலாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்

### PROBLEMS FACED BY LOCAL MOULDING CRAFTSMEN DUE TO SHORTAGE OF COPPER AND BRASS

**ගරු එන්.ඩී. නිමල් ප්‍රේමවංශ ජයසිංහ මහතා**
(மாண்புமிகு என். டி. நிமல் பிரேமவன்ச ஜயசிங்க)
(The Hon. N. D. Nimal Premawansa Jayasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම සම්බන්ධව ඔබතුමාට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. කල් තැබීමේ යෝජනාව මෙසේයි:

"තඹ සහ පිත්තල ආශ්‍රිත දේශීය කර්මාන්තය සියවස් ගණනාවක් ඉපැරණි කර්මාන්තයක් මෙන්ම ශ්‍රී ලාංකීය නිර්මාණ හැකියාව ලොවට කියා පෑ අභිමානවත් කර්මාන්තයකි. එහෙත් අද වන විට එම කර්මාන්තය සහ ඒ හා බැඳි අභිමානය අපේ රටට අහිමි වන තත්ත්වයක් උදා වී තිබේ. කර්මාන්තයට අවශ්‍ය තඹ සහ පිත්තල අවශ්‍ය ප්‍රමාණයෙන් නොලැබීමත්, ලැබෙන

[ගරු එන්.ඩී. නිමල් ප්‍රේමවංශ ජයසිංහ මහතා]

ප්‍රමාණයේ මිල ඉතා ඉහළ මට්ටමක පැවතීමත් එම තත්ත්වය දරා ගත නොහැකි කර්මාන්තකරුවන් කර්මාන්තය අත් හැර දමමින් සිටීමත්, ඒ සඳහා බලපා තිබේ. එබැවින් රජයේ කඩිනම් අවධානය මේ සඳහා යොමු කර මෙම කර්මාන්තය ආරක්ෂා කර ගැනීම පිණිස මැදිහත් වන ලෙසට ඉල්ලා සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 30ක වාගේ කාලයක් අපේ රටේ දැවෙන සෙසු ප්‍රශ්න සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න තිබුණා. බෙදුම්වාදය ක්‍රියාත්මක වූ වකවානුව තුළ මේ රටේ පුරවැසියන්ට විශේෂයෙන් අවධානය යොමු කරන්න වුණේ තමන්ගේ සෙසු අවශ්‍යතා නොව තමන්ගේ ජීවිතය කොහොමද සුරක්ෂිත කර ගන්නේ කියන කාරණය සම්බන්ධවයි. මේ නිසාම පසු ගිය අවුරුදු 30දී මේ රටේ ජනතාව ප්‍රභාකරන් කේන්ද්‍රයේ තියා ගෙන ඒ කරපු සාකච්ඡාවන් සියල්ල නිමා වෙලා අද වන විට අපිට පෙනෙන්න තිබෙනවා, මේ රටේ සෙසු මාතෘකා සම්බන්ධව මේ වේදිකාව නිර්මාණය වෙමින් පවතින බව. විශේෂයෙන්ම අද උදෑසන සිට මේ පාර්ලිමේන්තුවේ කරන ලද වාද විවාද දෙස බැලුවත්, මේ දිනවල මේ රටේ සාකච්ඡාවට ලක් වෙන කරුණු දෙස බැලුවත් අවුරුදු ගණනාවක් පුරා සාකච්ඡා කරන්න තිබුණු ප්‍රශ්නවලට ඉඩකඩත්, සාකච්ඡා කිරීමේ අවස්ථාවත් මේ වන විට නිර්මාණය වෙලා තිබෙනවා. ඒකට විශේෂ හේතුව, අවුරුදු 30ක් පැවැති මහා යුද්ධය අවසන් වීම නිසා රටේ ආර්ථිකය කේන්ද්‍ර කර ගත් ප්‍රශ්න ප්‍රමාණය මේ වන විට සමාජ කරලියට, එහෙම නැත්නම් සාකච්ඡාවට ලක් වෙලා තිබීමයි. අද වන විට අපේ රටේ ඒ මාතෘකා සියල්ල කේන්ද්‍රගත වෙලා තිබෙන්නේ රටේ ආර්ථිකය හා බැඳිලායි. විශේෂයෙන්ම රටේ භාණ්ඩාගාරය සමඟ සම්බන්ධ වුණු කරුණු කාරණා විශාල ප්‍රමාණයක් තමයි මේ වන විට සාකච්ඡා වෙමින් තිබෙන්නේ. වත්මන් ජනාධිපතිතුමා ඇතුළු එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය, පසු ගිය අවුරුදු තුනක හතරක වාගේ කාලය ඇතුළත, අවුරුදු 30ක් තිස්සේ මේ රටේ පැවැති විසඳිය නොහැකියි, මුහුණ දිය නොහැකියි, පරාජයට පත් කළ නොහැකියි කියලා මතවාදයක් නිර්මාණය කර තිබුණු ත්‍රස්තවාදයෙන් රට නිදහස් කර ගත්තා. මේ රටේ රණ විරුවාගේ, මේ රටේ පාලකයින්ගේ, මේ රටේ ජනතාවගේ ශක්තිය ලොවට කියා පෑ අවස්ථාවක් තමයි එය. ඒ අවස්ථාවම අපේ රටේ ඊ ළඟ අභියෝග ජයග්‍රහණය කිරීම සඳහා පාවිච්චි කළ යුතුයි කියා අපි විශ්වාස කරනවා. ත්‍රස්තවාදයෙන් රට නිදහස් කර ගත්තේ මේ රටේ රණ විරුවන් නම්, ඒ භයානක තත්ත්වයෙන් රට නිදහස් කර ගැනීම සඳහා මේ රටේ වීරෝදාර දේශ ප්‍රේමී ජනතාව කැප කිරීම් කළා නම්, මේ තියෙන අභියෝගවලට මුහුණ දීම සඳහා විශේෂයෙන්ම ආර්ථිකමය කාරණාවලට මුහුණ දීලා රට ආර්ථිකමය පුනරුදයක් කරා ගෙන යාමේ ක්‍රියාවලියත් අපේ රටේ ජනතාවට කළ හැකියි කියන විශ්වාසය තුළ ඉඳිමින් තමයි අද දවසේ මා මේ කාරණය සම්බන්ධව සාකච්ඡා කරන්න බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මාතෘකාව මා විශේෂයෙන් අවධාරණය කරන්න ඕනෑ. මේ රටේ තඹ හා පිත්තල ආශ්‍රිත වාත්තු කර්මාන්තයේ යෙදුණු කර්මාන්තකරුවන් අතිවිශාල ප්‍රමාණයක් හිටියා. මේක මෑත ඉතිහාසයේ නිර්මාණය වුණු කර්මාන්තයක් නොවෙයි. අවුරුදු දහස් ගණනාවක් පුරාවටම ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කළ ලෝකය ඉදිරියේ මේ රටට අභිමානයක් නිර්මාණය කළ කර්මාන්තයක්. පිත්තල සහ තඹ ආශ්‍රිත වාත්තු කර්මාන්තකරුවන් ගත වුණු අවුරුදු දහස් ගණන පුරාවටම රජ මාළිගාවලට, විශේෂයෙන්ම ආගමික මධ්‍යස්ථානවලට ඔවුන්ගේ නිර්මාණයන් ඉදිරිපත් කළා. වර්තමානය වන විට මේ රටේ ගෘහ උපකරණ නිර්මාණය කරන අවස්ථාව දක්වාම ඉදිරියට ආ කර්මාන්තයක් මේක. මේ කර්මාන්තය තුළ අපේ රටට විශේෂ අභිමානයක් ගෙනැවිත් දුන්නු මහා කැටයම් කලාවක් තිබෙන්නේ මේක සංස්කෘතිකමය දායාදයක්; ජාතික උරුමයක්. මේ කර්මාන්තකරුවන් ඒ කැටයම් කලාව අවුරුදු දහස් ගණනක් පුරා ඉදිරියට පවත්වා ගෙන ආවා. හැබැයි අපේ රටේ අවාසනාවට, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව 1978 දී ගෙනාපු විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ඇතුළේ අපේ රටේ සමස්ත කර්මාන්ත ප්‍රමාණය කඩා ගෙන වැටුණු බව අපි දන්නවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මුළුමනින්ම රාජ්‍යය දිය කර හැරීමේ, රාජ්‍යය දුර්වල කිරීමේ ප්‍රතිපත්තිය තුළින් රාජ්‍ය ආයතන සියල්ල පෞද්ගලීකරණය කරමින්, ඒ සඳහා ක්‍රියාමාර්ග ගනිමින් රාජ්‍ය ආයතන සියල්ල විකුණපු ආකාරය අපි දන්නවා. අපි දන්නවා, විශේෂයෙන් 1978 දී -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, නිශ්ශබ්ද වන්න. මෙම අවස්ථාවේදී ගරු ජිනදාස කිතුලගොඩ මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු එස්. බී. නාවින්න මහතා (ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன - கிராமியக் கைத்தொழில், சுயதொழில் ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. S. B. Nawinne - Minister of Rural Industries and Self-employment Promotion)

"ගරු ජිනදාස කිතුලගොඩ මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ජිනදාස කිතුලගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜினதாஸ கிதுலகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. JINADASA KITULAGODA *took the Chair.*

**ගරු එන්.ඩී. නිමල් ප්‍රේමවංශ ජයසිංහ මහතා**
(மாண்புமிகு என். டி. நிமல் பிரேமவன்ச ஜயசிங்க)
(The Hon. N. D. Nimal Premawansa Jayasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂ රජය රාජ්‍යය දිය කර හැරීමේ ක්‍රියාදාමය තුළ සිටිමින්, මේ රටේ රාජ්‍ය සම්පත්, මේ රටේ කර්මාන්ත අභාවයට යවමින්, ඒ වෙනුවට ආනයනය මත යැපෙන ආර්ථිකයක් කරා ගමන් කිරීමේ ප්‍රතිඵලයක් විධියට මේ රටේ මේ කර්මාන්තයත් ක්‍රමානුකූලව විනාශ වුණු ආකාරයක් තමයි පසු ගිය ඉතිහාසය තුළ අපි දැක්කේ. මේ රටේ මේ කර්මාන්තයේ නියුක්ත වෙලා ඉන්න ජනතාව අද වන කොට එහි ප්‍රතිඵල අත් විඳිමින් ඉන්නවා.

මා විශේෂයෙන් කියන්න ඕනෑ, මේ මොහොත වෙද්දී ශ්‍රී ලංකාව තුළ පවුල් 1,50,000කට වැඩි සංඛ්‍යාවක් සෘජුවම මේ කර්මාන්තයේ නියුක්ත වෙලා සිටින බව. ඒ වාගේම ඒ කර්මාන්තය ආශ්‍රිතව සෘජුව හා වක්‍රව රැකියා කරන ලක්ෂ 5කට වඩා ජනගහනයක් මේ රටේ ඉන්නවා. ඔවුන්ගේ සමස්ත ජීවනෝපාය නිර්මාණය වෙලා තිබෙන්නේ මේ කර්මාන්තය ආශ්‍රයෙනුයි. මෙන්න මේ ලක්ෂ පහේ ජනගහනයෙන් අතිබහුතරයක් නියෝජනය කරන්නේ මධ්‍යම පළාතයි. මධ්‍යම පළාතේත් මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය එහෙම නැත්නම් උඩුනුවර ප්‍රදේශයයි. ඒ බහුතරයක් වූ උඩුනුවර ප්‍රදේශය එහෙම නැත්නම් මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන ජනතාව අද වන කොට මේ කර්මාන්තය ඉදිරියට පවත්වා ගෙන යැමට නොහැකි ආකාරයේ අතිවිශාල ගැටලු රාශියකට මුහුණ දී සිටිනවා. ඔවුන්ගෙන් විමසා බලද්දී ඔවුන් කියනවා, මේ වන කොට කරමින් සිටින නිෂ්පාදනයන් කර ගෙන යැම සඳහා ඔවුන්ට මාසයකට පිත්තල ටොන් 450ක් පමණ, එහෙම නැත්නම් කිලෝග්‍රෑම් 45,000ක් පමණ ප්‍රමාණයක් අවශ්‍යයි කියලා. සමස්තයක් විධියට රටේම අවශ්‍යතාව ගත්තොත් මාසයකට ටොන් 750කට වැඩි ප්‍රමාණයක අවශ්‍යතාවක් තිබෙනවා. එහෙම අවශ්‍ය වන්නේ දේශීය වෙළෙඳ පොළ ඉලක්ක කර ගෙන පිත්තල සහ තඹ ආශ්‍රිත නිෂ්පාදනයන්ට ඔවුන් ප්‍රවේශයන් ගත්තොත් තමයි.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන් කියන්න ඕනෑ, යුද්ධය අවසන් වීම නිසා වර්තමානයේ තඹ හා පිත්තල කර්මාන්තයට වෙළෙඳ පොළ නිර්මාණය වීමේ දී වෙන දාට වඩා අලුත් වෙළෙඳ පොළක් නිර්මාණය වෙලා තිබෙන බව. උතුරු සහ නැඟෙනහිර ප්‍රදේශ නිදහස් කර ගත්තාට පස්සේ ඒ ප්‍රදේශවල ජනතාව තමයි තඹ ආශ්‍රිත, පිත්තල ආශ්‍රිත ගෘහ භාණ්ඩ වැඩිපුර පාවිච්චි කරන්නේ. ඒ නිසාම වෙළෙඳ පොළක් නිර්මාණය වෙලා තිබෙන අවස්ථාවක්, එක පැත්තකින්. ඒ විතරක් නොවෙයි. පිත්තල කර්මාන්තකරුවන්ට විශේෂයෙන්ම තමන්ගේ සරණේරු ආදී ගෘහාශ්‍රිත නිෂ්පාදන -මේ රටේ මුහුදු බඩ ප්‍රදේශවල වැඩියෙන් පාවිච්චි කරන්නේත්, යොදා ගන්නේත් ඒ වාගේ නිෂ්පාදනයන් නිසා- වෙළෙඳ පොළට ගෙනෙන්න අවස්ථාව ලැබී තිබෙනවා.

මේ වන කොට ඒ පැත්තෙන් වෙළෙඳ පොළ නිර්මාණය වෙලා තිබුණාට කනගාටුදායක තත්ත්වයකුත් ඇති වී තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රදේශයේ කර්මාන්තකරුවන්ට පමණක් මාසයකට පිත්තල ටොන් 450ක් විතර අවශ්‍යයි. ඒ වාගේම රටේම කර්මාන්තකරුවන්ට පිත්තල ටොන් 750කට වඩා වැඩි ප්‍රමාණයක් අවශ්‍යයි. නමුත් 2006 වසර තුළ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය මැදිහත් වීමෙන් ඔවුන්ට ලබා දී තිබෙන්නේ ටොන් 40ක වාගේ ඉතාම සුළු ප්‍රමාණයක්. ඒ වාගේම 2007 අවුරුද්ද තුළ ඔවුන්ට සපයා තිබෙන්නේ ටොන් 50ක වාගේ ප්‍රමාණයක්. 2008 දී ටොන් 56යි. 2009 අවුරුද්දේ - මේ ගත වන අවුරුද්ද තුළ - අද වන කොට ටොන් 11ක වාගේ ප්‍රමාණයක් තමයි, කාර්මික සංවර්ධන මණ්ඩලය - IDB එක - හරහා ඒ කර්මාන්තකරුවන්ට සපයා තිබෙන්නේ. ටොන් 750ක් ඕනෑ තැනට ඒ, වාගේම ටොන් 450ක් ඕනෑ මහනුවර ප්‍රදේශයටවත් ප්‍රමාණවත් නැහැ, මේ සපයන ලද ප්‍රමාණයන්. ටොන් 750ක් අවශ්‍ය වන විට සපයන්නේ ටොන් 50යි නම්, ටොන් 56යි නම්, ටොන් 11යි නම් තමුන්නාන්සේලාට කල්පනා කරන්න පුළුවන් මේ කර්මාන්තය මෙතැනින් ඉස්සරහට පවත්වා ගෙන යන්න පුළුවන්ද කියන එක ගැන.

එක පැත්තකින් මේ රටේ යුද්ධය අවසන් වුණු නිසාම අද වන විට එමඟින් අබලි ද්‍රව්‍ය විධියට ඉතිරි වුණු පිත්තල මේ රටේ ඒ ආශ්‍රිත නිෂ්පාදනයන්ට දිරි දීමක්, උදවු කිරීමක් හැටියට පාවිච්චි කරන්න පුළුවන්. ඒකට හේතුව අපි දන්නවා. පසු ගිය කාලයේ ත්‍රිවිධ හමුදාව ත්‍රස්තවාදය අවසන් කිරීමේ මෙහෙයුම් කටයුතු කිරීමේ දී බර අවි පාවිච්චි කළා. ඒ බර අවි පාවිච්චි කිරීමේදී පාවිච්චි කළ වෙඩි උණ්ඩවල අතිවිශාල ප්‍රමාණයක් පිත්තල කොපු අන්තර්ගත වුණා. අපට දැන ගන්න ලැබී තිබෙනවා ඒ පිත්තල කොපු අතිවිශාල ප්‍රමාණයක් -ටොන් හැත්තෑපන්දහසකට ආසන්න ප්‍රමාණයක් - රජය සන්තකයේම - ආරක්ෂක අමාත්‍යාංශය සතුව- තිබෙනවාය කියන කාරණය. ඒ පැත්තෙන් ඒවා ටොන් දහස් ගණනක් තිබෙනවා වාගේම සමහර විට විදුලිබල මණ්ඩලය ඉවත් කරන ද්‍රව්‍ය, උපකරණවල, ඒ වාගේම විදුලි සංදේශ දෙපාර්තමේන්තුවෙන් ඉවත් කරන ලද ද්‍රව්‍ය ගත්තාමත් ඒවා තුළත් තඹ සහ පිත්තල තිබෙනවා. ඒවා අපද්‍රව්‍ය විධියට ඉවත් වෙලා නම් අන්න ඒවා පාවිච්චියට ගන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි ඒ අවස්ථාව එහෙම තිබුණත් අද වන කොට මේ කර්මාන්තකරුවෝ මුහුණ පා තිබෙන තත්ත්වය හරිම භයානකයි. ශෝචනීය තත්ත්වයක් තිබෙන්නේ. ඒකට හේතුව ඒ නොයෙක් ආකාරයෙන් ලැබෙන්න තිබෙන දේවල් ඒ පිත්තල කර්මාන්තකරුවන්ට ලැබෙනවා වෙනුවට ඔවුන්ට වෙනත් තැන්වලින් ඒවා වැඩි මිලට මිල දී ගැනීමට මේ වන විට සිදු වී තිබීමයි. මේ නිසාම අද වන කොට මේ පිත්තල කර්මාන්තයේ යෙදෙන ජනතාවගේ එම කර්මාන්තය ඉතාම දුෂ්කර අඩියකට වැටිලා තිබෙනවා. එක පැත්තකින් කර්මාන්ත වැසී යමින් පවතිනවා.

ඒ වාගේම පසු ගිය කාලයේ ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේ මේ කර්මාන්ත පවත්වා ගෙන යාම සඳහා ඔවුන් බැංකු ණය අරගෙන තිබෙනවා. එම බැංකු ණයවල පොලී ගෙවා ගත නොහැකිව, ණය වාරික ගෙවා ගත නොහැකිව අද වන කොට ඔවුන් ඒ සඳහා ඇපයට තිබ්බ වෙනත් ඔවුන්ගේ දේපොළ පවා බැංකුවලට සින්න වන තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම ඇතැමුන් තමන්ගේ කර්මාන්තය සඳහා යොදාගත්ත ආයුධ, ඒ සඳහා යොදා ගත්ත මැෂින් විකුණා දමමින් එයින් ලැබූ මුදල්වලිනුයි මේ බැංකු ණය වාරිකය ගෙවමින් ඉන්නේ. ඒ නිසාම අද වන කොට ඇති වී තිබෙන තත්ත්වය තමයි මේ කර්මාන්තය අත් හරින විශාල ප්‍රමාණයක් සිටීම. කර්මාන්තය සුපුරුදු විධියට කර ගෙන ගිය වැඩිහිටියන් කිහිප දෙනකු තුළ හැරුණාම අවුරුදු දහස් ගණනක් පුරා තමන්ගේ පරම්පරාවෙන් පැවත ගෙන ආපු මේ කර්මාන්තය ගැන තිබුණු විශ්වාසය තරුණ පිරිස් අතරින් අද බිඳ වැටී තිබෙනවා; පළුදු වෙලා තිබෙනවා. ඒ විශ්වාසය බිඳ වැටීම නිසාම ඔවුන් ඒ කර්මාන්තය අත් හරිමින් වෙනත් කර්මාන්ත, එහෙම නැත්නම් වෙනත් රැකියා හොයන තත්ත්වයකට ගමන් කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කර්මාන්තය තුළ කාන්තාවන්ගේ නියෝජනය ඉතාම ඉහළ මට්ටමක පැවතුණා. අද වන විට ඒ කාන්තාවන්ට පවා මේ කර්මාන්තයෙන් ඉවත් වෙමින් පිට රට රැකියාවලට යාමට, එහෙම නැත්නම් අකැමැත්තෙන් වුණත් වෙනත් ජීවනෝපායන් හොයන තැනකට තමන්ගේ වෙනස්වීම් සිද්ධ කර ගන්න වෙලා තිබෙනවා. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, තමුන්නාන්සේලාගේ විශේෂ අවධානය මේ සඳහා යොමු කරන්නය කියා අපි ඉල්ලා සිටිනවා. මේ යථාර්ථය තේරුම් අරගෙන මේ කර්මාන්තකරුවන්ට අවශ්‍ය ඒ සුවිශේෂී අවස්ථාවන් නිර්මාණය කරලා දෙන්න අමාත්‍යාංශය මොන තරම් මැදිහත් වුණාද කියන කාරණය සම්බන්ධව තිබෙන්නේ ඉතාම කනගාටුදායක තත්ත්වයක්. විශේෂයෙන්ම මේ වන කොට පිත්තල සහ තඹ ආශ්‍රිතව අබලි ද්‍රව්‍ය ටොන් දහස් ගණනක් තිබිය දී අපට ආරංචි වී තිබෙන්නේ, දැන ගන්න ලැබී තිබෙන්නේ, ආයතනයේ ඇතැම් බලධාරින් මේ සඳහා මැදිහත් වෙලා ඒවා කර්මාන්තකරුවන්ට ලබා දෙනවා වෙනුවට වෙනත් ව්‍යාපාරිකයින්ට විශේෂයෙන්ම නාඩාර්වරු කියන ඒ භාණ්ඩ එකතු කරන මහා පරිමාණ ජාවාරම්කරුවන්ට මේ තඹ සහ පිත්තල අයථා ක්‍රමවලට ලබා දීම සිද්ධ කරනවා කියායි. මේ නිසාම කිලෝ එක රුපියල් 140ක් වාගේ ඉතාම සුළු මුදලකට කාර්මික සංවර්ධන මණ්ඩලය - IDB එක - සතුව තිබෙන මේ පිත්තල සහ තඹ අලෙවි කරද්දී ඔවුන් ඒවා අරගෙන නැවත මේ පිත්තලකරුවන් සඳහා රුපියල් 500 ක වාගේ වැඩි මිලකට තමයි අලෙවි කරමින් ඉන්නේ. එක පැත්තකින් ඉතාම අඩු මුදලකට රජයෙන් මිල දී ගන්න මේවා අනෙක් පැත්තෙන් රුපියල් 500ක් වාගේ වැඩි මුදලකට නැවත මිල කිරීමක් කරනවා ඒ කර්මාන්තකරුවන් සඳහාම. පැහැදිලිවම පේනවා මේක ඇතුළේ විශාල ජාවාරමක් සිද්ධ වන බව; විශාල අකටයුත්තක් සිද්ධ වන බව. මේක ඇතුළේ කවුරු හෝ විශාල ලෙස කොමිස් උපයන, එහෙම නැත්නම් මේ රාජ්‍ය දේපළවලින් අයථා විධියට මුදල් උපයන ආකාරයක් අපට පේන්න තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන් අවධාරණය කරන්න ඕනෑ මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා වරායේ දී ඒ තඹ සහ පිත්තල අපනයනය කරන්න සූදානම් කර තිබිය දී අත් අඩංගුවට ගත්ත කාරණය. ඒ කාරණය සටහන් වුණා, 2009 අගෝස්තු මාසයේ 26 වැනි දා "දිවයින" පුවත් පතේ. ඒකේ සඳහන් වෙනවා "ගැසට් නිවේදනයට මුවා වී ඇමැතිතුමා යසට ගරයි" කියා. ගරු ඇමතිතුමනි, මේකට ඔබතුමාගේ සම්බන්ධය මොන තරමින් තිබෙනවා ද කියා මා දන්නේ නැහැ. හැබැයි අපි දන්නවා තමුන්නාන්සේ නියෝජනය කරන ආයතනය තුළ ඇතැම් බලධාරින් මේකට සම්බන්ධයි කියන කාරණය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රවෘත්තියේ මෙසේ සඳහන් වනවා:

"රාජ්‍ය අංශයේ අබිලි ද්‍රව්‍ය මෙරට කුඩා කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා ලබා දීමේ අරමුණින් ගෙන ආ ගැසට් නිවේදනයකට මුවා වී රජයේ ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයකු ඇමැති බලතල යොදා ගනිමින් අයථා ලෙස රුපියල් කෝටි ගණනින් මුදල් ගසා කන බව අභ්‍යන්තර ආරංචි මාර්ග සඳහන් කරයි.

විශේෂයෙන් ශ්‍රී ලංකා යුද හමුදාව සතු පිත්තල, යකඩ, තඹ, ටයර් ආදී වශයෙන් වූ අබිලි ද්‍රව්‍ය කුඩා කර්මාන්තකරුවන්ට ලබා දීමට යැයි පවසමින් ඒවා ටොන් ගණනින් කුණු කොල්ලයට ගෙන පිටස්තර පුද්ගලයන්ට වැඩි මිල ගණන්වලට අලෙවි කරමින් ඇමැතිවරයා මෙම ජාවාරම කරගෙන යන බවද කියති.

දීර්ඝ කාලයක සිට සිය ලේකම්වරයකු ද සම්බන්ධ කර ගෙන ඇමැතිවරයා මෙම ජාවාරම කර ගෙන යනු ලබන අතර ඉන් ලැබෙන අතිවිශාල ධනස්කන්ධය හේතුවෙන් මේ වන විට ඇමැතිවරයා හා එම ලේකම්වරයා අතර විරසකයක් ගොඩ නැඟී ඇතැයි ඉහත ආරංචි මාර්ග පවසයි.

[ගරු එන්.ඩී. නිමල් ප්‍රේමවංශ ජයසිංහ මහතා]

මොවුන් යුද හමුදාවෙන් ලබා ගන්නා එක් ටයරයක් රුපියල් 300 ට ගෙන රුපියල් 5000 ටද, රුපියල් 8 ට ගන්නා යකඩ කිලෝවක් රුපියල් 40 කට හා රුපියල් 100 ට ගන්නා පිත්තල කිලෝවක් රුපියල් 250 -350 අතර මිල ගණන්වලට ද අලෙවි කරමින් රටේ කුඩා කර්මාන්තකරුවන්ට විකුණා මෙලෙස අයථා අන්දමින් මුදල් ලබා ගන්නා බවද පැවසේ.

පසුගිය දිනවල ඉහත ඇමැතිවරයා සිය ගෝලයන් ලවා මල්වාන ප්‍රදේශයේ ව්‍යාපාරිකයකුට අලෙවි කළ පිත්තල තොගයක් විදේශගත කිරිමට ගත් උත්සාහයකදී රේගු නිලධාරීන්ට හසුව ව්‍යාපාරිකයාගෙන් ගෝලයන් සිව් දෙනකුට බන්ධනාගාර ගත වන්නට ද සිදුව තිබිණි.

ග්‍රාමීය කර්මාන්ත වළ පල්ලට යවමින් මෙලෙස එක් පුද්ගලයකුට තරවන්නට ඉඩ නොදී ත්‍රිවිධ හමුදාව ඇතුළු රජයේ ආයතනවල අබිලි ද්‍රව්‍ය නියමිත ටෙන්ඩර් පටිපාටියකට අලෙවිකර රට වෙනුවෙන් කැපවූ රණ විරුවන් වෙනුවෙන් වත් යමක් කිරීමට රජයේ බලධාරින් වහා අවධානය යොමු කළ යුතු බවද මේ පිළිබඳ තතු දත් පිරිස් පවසති."

ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රවෘත්තියේ ඔබතුමාගේ නම සඳහන් නොවුණත් මේ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ කියන විශ්වාසය මා තුළ තිබෙනවා. ඒ වාගේම අපි අවධාරණය කරන්න ඕනෑ තඹ සහ පිත්තල අපනයනය තහනම් කරලා තිබියදී තමයි මේ වාගේ ප්‍රමාණයක් අත් අඩංගුවට ගත්තේ කියන එක. විශේෂයෙන්ම කර්මාන්ත සංවර්ධන අමාත්‍ය කුමාර වෙල්ගම මැතිතුමා 2008 නොවැම්බර් මාසයේ හය වැනි දා කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම 2008 නොවැම්බර් මාසයේ 10 වැනි දා අමාත්‍යවරු ගත්ත තීරණයක් අනුව යකඩ හා යකඩ නොවන ලෝහ සුන්බුන් සහ කුට්ටි අපනයනය තහනම් කරපු කැබිනට් සන්දේශයක් තිබියදී තමයි මේ වාගේ අයථා ක්‍රම සිද්ධ වන්නේ. ඒ හන්දා ගරු අමාත්‍යතුමනි, මේ කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා, විශේෂයෙන්ම මේ රටේ තඹ හා පිත්තල ආශ්‍රිත වාත්තු කම්කරුවන්ගේ ඒ ජීවනෝපාය මාර්ගය සුරක්ෂිත කිරීම සඳහා තමුන්නාන්සේ විසින් ක්‍රියාමාර්ග ගණනාවක් ගත යුතුය කියන යෝජනාවත් මම මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා. ත්‍රිවිධ හමුදාව සතු තඹ සහ පිත්තල ආශ්‍රිත ඒ අබලි ද්‍රව්‍ය තමුන්නාන්සේගේ ආයතනයට ගන්නවා වාගේම විනිවිදභාවයකින් යුතුව ඒ කර්මාන්තයේ යෙදෙන ජනතාවට ඒවා ලබා දෙන්න කියන කාරණයත් මම මතක් කරනවා. එහිදී යම් යම් නිලධාරින් මැදිහත් වෙලා අයථා කටයුතු සිද්ධ කරනවා නම් ඒ කටයුතු වහාම නැවැත්වීම සඳහා මැදිහත් වන ලෙසත්, විශේෂයෙන්ම දැනට වරාය අත් අඩංගුවේ තිබෙන ඒ ප්‍රමාණය නැවත තමුන්නාන්සේලාගේ ආයතනවලට අර ගෙන කර්මාන්තකරුවන්ට ඒවා ලබා දෙන්න කියන ඉල්ලීමත් කරනවා. දැනට රුපියල් 500ක් වාගේ මිලකට විකුණන තඹ සහ පිත්තල කිලෝ එකකට රුපියල් 150ක් වාගේ නිශ්චිත, නියමිත මිලක් නියම කරලා ඒ කර්මාන්තකරුවන්ට ලබා දෙන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ කර්මාන්තකරුවන්ට අවශ්‍ය ඒ පිත්තල ප්‍රමාණය තමුන්නාන්සේ මාසිකව ලබා දෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු එන්. ඩී. නිමල් ප්‍රේමවංශ ජයසිංහ මහතා**
(மாண்புமிகு என். டி. நிமல் பிரேமவன்ச ஜயசிங்க)
(The Hon. N. D. Nimal Premawansa Jayasinghe)
අද යුද්ධය අවසන් වෙලා තිබෙන අවස්ථාවේදී සෙසු ප්‍රශ්න බොහොමයක් ගැට ගැහිලා තිබෙන්නේ මේ රටේ ආර්ථිකය සමඟ. විශේෂයෙන්ම රජයේ භාණ්ඩාගාරය සමඟ බද්ද වෙච්ච ගැටලු. ඒ ගැටලුවලින් මේ රට නිදහස් කර ගැනීමට තබන මේ පියවරේදී අපි තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්නේ කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ, තමුන්නාන්සේගේ දායකත්වය මේ කර්මාන්තය ගොඩ නඟන්න ලබා දෙන්න කියලායි. මේ රජය ආර්ථික පුනරුදයකට වුවමනා ඒ ක්‍රියාමාර්ග ගනිද්දී තමුන්නාන්සේලාගේ ඒ දායකත්වය උපරිමයෙන් ලබා දෙන්න කියලා අවසාන වශයෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වනවා. ස්තුතියි.

**ගරු මුසම්මිල් මොහොමඩ් මහතා**
(மாண்புமிகு முஸம்மில் மொஹமட் )
(The Hon. Mussammil Mohamed)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු නිමල් ප්‍රේමවංශ ජයසිංහ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරමින් ඒ සම්බන්ධයෙන් වචන කීපයක් කථා කරන්න මම කැමැතියි.

විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර සහ කුණ්ඩසාලේ ආසනවල ඉතාමත් දුක් විඳිමින් කටයුතු කරන මේ කර්මාන්තයේ යෙදී සිටින ඒ පිරිසට සාධාරණය ඉෂ්ට කිරීම සඳහා ඇමතිතුමා මැදිහත් වීමක් කරයි කියලා අපි බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම ඔවුන් ඉල්ලා සිටින්නේ අලුත් රැකියාවන් නොවෙයි. ඔවුන් ඉල්ලා සිටින්නේ තමන්ගේ ජීවිතය පවත්වා ගැනීම සඳහා ඒ වාගේම රටට ආදායමක් ලබා දීම සඳහා ඒ පිත්තල කර්මාන්තය ශක්තිමත් කර ගැනීමට අවශ්‍ය දායකත්වය ලබා දෙන ලෙසයි. ඒ වාගේම අද මේ කර්මාන්තය සඳහා ඉතාමත් විශාල වෙළෙඳ පොළක් නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන් නැඟෙනහිර පළාතේ, උතුරු පළාතේ යාපනයේ දෙමළ ජනතාව අතර මෙම පිත්තල භාණ්ඩ ඉතාමත් ප්‍රචලිතයි. ඒ නිසා මේ නිර්මාණකරුවන්ට විශේෂ අවස්ථාවක් උදා වෙලා තිබෙනවා. පිත්තල කර්මාන්තය කර ගෙන යෑම සඳහා හොඳ වෙළෙඳ පොළක් නිර්මාණය වෙලා තිබෙන මොහොතක, ඒ අමාත්‍යාංශය පැත්තෙන් ඒකට අවශ්‍ය නියමිත වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවීමේ බාධාව නිසා තමයි ඒ කටයුතු ඇණ හිටලා තිබෙන්නේ. අමාත්‍යවරයා මේ සම්බන්ධයෙන් තමන්ගේ දැඩි සැලකිල්ල දක්වලා අවශ්‍ය මැදිහත් වීම කරයි කියන විශ්වාසය පළ කරමින් මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තයක් හැටියට දීර්ඝ ඉතිහාසයක් තිබෙන තඹ හා පිත්තල කර්මාන්තයට අදාළව, සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද මෙම යෝජනාවේදී ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි කරුණු කාරණා කිහිපයක් ආණ්ඩුවේ අවධානයට, රජයේ අවධානයට යොමු කරන්නට බලාපොරොත්තු වනවා.

ගරු අමාත්‍යතුමනි, මේ ක්ෂේත්‍රයේ නියැලිලා ඉන්න කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්න කෙටි කරලා, සාරාංශ කරලා ගත්තොත් විශේෂයෙන් අවධාරණය කරන්නට තිබෙන්නේ මේකයි. මේ කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධානතම ප්‍රශ්නය තමයි ඔවුන්ගේ නිෂ්පාදනයට වුවමනා කරන අමු ද්‍රව්‍ය ප්‍රමාණය සාධාරණ මිලකට දේශීය වෙළෙඳ පොළෙන් ලබා ගැනීමට තිබෙන නොහැකියාව. ඒ අමු ද්‍රව්‍ය සඳහා විශාල වියදමක් දරන්නට සිද්ධ වීමත් ඒ කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වනවා. මේ සියලු වුවමනාවන් අමාරුවෙන් හරි සපයා ගනිමින් භාණ්ඩ නිෂ්පාදනය කළත් ඒ භාණ්ඩවලට නියමිත වෙළෙඳ පොළක් නොමැතිකම මේ කර්මාන්තකරුවන් මුහුණ දෙන තවත් ප්‍රධාන ගැටලුවක් වනවා. මේ මූලික ගැටලුවලට අමතරව බැඳුණු තවත් අවශේෂ ගැටලු රාශියක් තිබෙනවා. ඒවා ඉතා කෙටියෙන් කථාව කරන අතරතුරේ ඔබතුමාගේ අවධානයට යොමු කරන්නට මා බලාපොරොත්තු වනවා.

ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන් මේ කර්මාන්තයේ නියැලිලා ඉන්න පිරිස වැඩි වශයෙන් මධ්‍යම පළාතට සම්බන්ධ උදවිය. මහනුවර දිස්ත්‍රික්කයේ දෙනුවර කලාපයේ, උඩුනුවර මැතිවරණ කොට්ඨාසයේ කිරිවවුල, පමුණුව, දැලිවල, මාත්ගමුව සහ ගඩලාදෙනිය යන ගම්මාන විශාල වශයෙන් පිත්තල කර්මාන්තයේ යෙදෙන උදවිය ජීවත් වන කර්මාන්ත ගම්මාන. ඒ වාගේම මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල මැතිවරණ කොට්ඨාසයේ -මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ- කලාපුරය කියන ගම්මානය පිත්තල කර්මාන්තය සඳහාම වෙන් කරපු, වාත්තු කර්මාන්තය සඳහාම වෙන් කරපු විශේෂිත ගම්මානයක්. මේ දිස්ත්‍රික්කයේ මේ ප්‍රදේශවල මේ කර්මාන්තයේ නියැලිලා ඉන්න

විශාල පිරිසක් මා මුලින් සඳහන් කරපු ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. ඊට අමතරව රට පුරා තවත් දිස්ත්‍රික්කවල විවිධ ප්‍රමාණයන්ගෙන් පිත්තල හා තඹ කර්මාන්තයේ, වාත්තු කර්මාන්තයේ යෙදෙන කර්මාන්තකරුවන් ඉන්නවා. විශේෂයෙන්ම මේ ආණ්ඩුවේ ප්‍රධානියා වන, රජයේ ප්‍රධානියා වන ජනාධිපතිතුමා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ආසනයේ පිත්තල හා තඹ කර්මාන්තයට මූලිකත්වය දෙන අඟුල්මඩුව, ඉහළ බෙලිගල්ල වැනි ගම්මාන කිහිපයක් තිබෙනවා. ඒ පැත්තෙන් බැලුවත් මේ කාරණාවට වැඩි අවධානයක් යොමු කරන්නට ගරු ඇමතිතුමාට පුළුවන්කම ලැබේවි.

මේ මූලික කරුණු කාරණා පිළිබඳව, මේ ප්‍රශ්නය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ ඇති තරම් කථා කරලා තිබෙනවා. මේ මාතෘකාව පිළිබඳව විවිධ අවස්ථාවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ප්‍රශ්න මතු කරලා තිබෙනවා. ඒවාට ආණ්ඩුව පැත්තෙන් අමාත්‍යවරුන් දීපු පිළිතුරු තිබෙනවා. විශේෂයෙන්ම 2004 සන්ධාන ආණ්ඩුව ආරම්භ කළාට පසුව සන්ධාන ආණ්ඩුවේ කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යවරයා හැටියට කේ.ඩී. ලාල් කාන්ත මන්ත්‍රීතුමා එදා කැබිනට් මණ්ඩලයට සන්දේශයක් ඉදිරිපත් කරමින් - කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරමින් - කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවාගේ, විශේෂයෙන්ම තඹ හා පිත්තල කර්මාන්තයේ යෙදෙන කර්මාන්තකරුවාගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා, දේශීය කර්මාන්තයක් හැටියට දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් එතුමා ආරම්භ කරපු "ගුරු පැහැයෙන් රන් පැහැයට" කියන සංකල්පය මත හිඳිමින් මේ කර්මාන්ත නඟා සිටුවීම සඳහා විශාල දායකත්වයක් ලබා දුන්නා. ආණ්ඩුව ඇතුළේ කැබිනට් මණ්ඩලයේ හිඳිමින් අවශ්‍ය නීති ප්‍රතිපාදන මේ වන විටත් සකස් කර තිබෙනවා. ඒ අනුව මේ කර්මාන්තකරුවා මුහුණ දෙන ප්‍රශ්නවලට අදාළ නෛතික පදනම දැනටමත් සකස් කරලා හමාරයි. අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් හැටියට ගරු අමාත්‍යතුමා මේක දන්නවා. මේ කැබිනට් සංදේශ හරහා අදාළ අමාත්‍යවරයාට පුළුවන්කම ලැබුණා, එතෙක් විවිධ ජාවාරම්කරුවන්, බෝර්කාරයන් මැදිහත් කර ගෙන අපේ රටේ පිත්තල හා තඹ කර්මාන්තකරුවාට හිමි විය යුතු අමු ද්‍රව්‍ය හොර රහසේ පිට මං කරන එක නතර කරලා ඒ අමු ද්‍රව්‍ය අපේ රටේ දේශීය නිෂ්පාදකයාට ලබා දෙන්න. ඒ වුවමනා කරන මූල්‍ය ප්‍රතිපාදන, නෛතික පදනම, විධිවිධාන අදාළ අමාත්‍යවරයා ඒ කාලය තුළ සම්මත කර ගත්තා. ඒ නිසා මේ පිළිබඳව වුවමනා තරම් නීති තිබෙනවා. වුවමනාකම තිබෙන්නේ මෙන්න මේ සම්මත කර ගත්තු නීති ක්‍රියාත්මක කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන එකයි. අපි දන්නවා, කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබුණු කාර්මික සංවර්ධන මණ්ඩලය - IDB - හරහා විශාල වශයෙන් මේ අමු ද්‍රව්‍ය එකතු කර ගෙන නිෂ්පාදකයාට වුවමනා කරන ප්‍රමාණය සාධාරණ මිලට කඩිනමින් ලබා දෙන්නට මැදිහත් වුණු බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නැවතත් ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරනවා. පල්ලෙකැලේ තිබෙන කාර්මික ජනපදයේ මේ ව්‍යාපාරිකයන්ගේ වුවමනාවන් ඉටු කරන්නට රට පුරා තිබෙන අනික් කාර්මික ජනපදත් අමාත්‍යාංශය මැදිහත් කර ගෙන මේ කාර්යය ඉටු කළා. ඒ විතරක් නොවෙයි, ජාතික ශිල්ප සභාව වැනි ආයතන, කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්තකරුවන් සඳහා වුවමනා කරන විශේෂඥ දැනුම දුන්නා; පුහුණුව දුන්නා; වුවමනා කරන ආයුධ කට්ටල ලබා දුන්නා. මේ ආදී වශයෙන් අර මා කලින් සඳහන් කළ "ගුරු පැහැයෙන් රන් පැහැයට" කියන සංකල්පය යටතේ මේ පිත්තල හා තඹ කර්මාන්තයේ යෙදී සිටින කර්මාන්තකරුවන්ගේ නැඟී සිටීම, ඔවුන් මේ රටේ ආදායමේ කොටස්කරුවන් හැටියට ඉතිහාසය පුරාවට තමන්ගේ දහඩිය, ශ්‍රමය, කඳුළ මේ රටේ හෙට දවස වෙනුවෙන් යොදවපු උදවිය හැටියට හොඳින් තේරුම් අර ගෙන මේ වෙනුවෙන් තමන්ගේ දායකත්වය ලබා දුන්නා.

ගරු අමාත්‍යතුමනි, දැන් මෙන්න මේ විශේෂිත කාරණාව සඳහන් කළ යුතුව තිබෙනවා. මුලින් සඳහන් කරපු අමු ද්‍රව්‍ය හිඟයට දැන් විසඳුමක් තිබෙනවා. මේ කාරණය ගැන විශේෂයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. පැවතුණු යුද්ධමය තත්ත්වය යටතේ කොටි ත්‍රස්තවාදය පරාජයට පත් කිරීම සඳහා ආරක්ෂක හමුදා පාවිච්චි කරපු බර අවිවලින් ඉවත් කළ -විශේෂයෙන් කාල තුවක්කු කොපු- පිත්තල කොපු මේ වන විට විශාල වශයෙන් එකතු කර ගෙන තිබෙනවා. ඒ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 75,000ක්, 80,000ක් පමණ තිබෙනවාය කියනවා. Sino Asia International (Pvt.) Limited කියන ආයතනයෙන් නිකුත් කළ වාර්තාවක් මා සතුව තිබෙනවා. ඒක පෞද්ගලික සමාගමක්. ඒ වාර්තාව කෙරේ ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවන්නට මා බලාපොරොත්තු වනවා. මේ කාල තුවක්කු උණ්ඩ, හිස් කොපු එකතු කරලා විදේශීය සමාගමකට -සිංගප්පූරු සමාගමකට- ඉතාම සොච්චම් මුදලකට විකුණා දැමීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා; ජාවාරමක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. වෙන කිසිම උත්සාහයක් නොගෙන මෙන්න මේ මහා පරිමාණ ජාවාරම නතර කර ගන්න පුළුවන් නම් හොඳයි. අපිත් විශ්වාස කරනවා, ඔබතුමා මේකට මැදිහත් වේවිය කියා. නමුත් ඔබතුමාට ඒක කරන්න පුළුවන් වෙයිද කියන සැකයක් තිබෙනවා. මොකද, මේ පිටු පසින් ඉන්නේ ආණ්ඩුවේ හිතවත්තුයි. රජයේ වගකීම් දරන ප්‍රධානීන් තමයි මේ පිටු පස ඉන්නේ. ඒක මා ඉතා වග කීමෙන් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඔබතුමාගේ අවසරය පරිදි මේ ලියවිල්ල **සභාගත*** කරනවා. ගරු අමාත්‍යතුමනි, සියලු කරුණු කාරණා මේකේ තිබෙනවා. පිත්තල කිලෝවක් රුපියල් 150කට තමයි මේ විකුණන්න යන්නේ. පිත්තල කිලෝ එක අද දේශීය වෙළෙඳ පොළේ අපේ කර්මාන්තකරුවා මිලදී ගන්නේ රුපියල් 340ට, රුපියල් 350ටයි. එහෙම වටිනාකමක් තිබෙන, දේශීය වෙළෙඳ පොළේ රුපියල් 350ට අලෙවි කරන පිත්තල කිලෝ එක මේ කියන ආණ්ඩුවේ ප්‍රධානීන්, බලධාරීන් මේ ලියවිල්ල හරහා උත්සාහ කරනවා, සිංගප්පූරු සමාගමකට රුපියල් 150 ගණනේ විකුණන්නට. අපි අහනවා, මේකද දේශ ප්‍රේමී ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කියලා. යුද සෙබළා, රණ විරුවා, ආරක්ෂක හමුදා ප්‍රධානීන් නායකත්වය දීලා, දිවි පුදලා, ඇස් කන් නාස අහිමි කර ගෙන මාතෘ භූමිය මුදා ගැනීමේ සටනේ දී පාවිච්චි කරපු කාල තුවක්කු, හිස් පිත්තල කොපුවත් අද පාවිච්චි කරන්නේ දේශ ද්‍රෝහී වුවමනාවන් වෙනුවෙනුයි. මේ පිළිබඳවයි අපි අමාත්‍යවරයාගේ අවධානය යොමු කරවන්නේ. මේක බරපතළ කාරණාවක්. මේක මේ රුපියල් 150ක් වැනි සොච්චම් මුදලකට විකුණන්නට ඕනෑකම තිබෙන්නේත් මෙහෙමයි. මේ එකතුවල තිබෙනවා, ඇසුරුම් කරන්නට ඕනෑ, කෑලි හයකට කපලා. මේ සියල්ල කරන්නත් විශාල වියදමක් යනවා. එහෙම කරලත් පිත්තල කිලෝග්‍රෑම් එකක් විකුණන්නට යන්නේ රුපියල් 150 ගණනෙයි. දේශීය වෙළෙඳ පොළේ පිත්තල කිලෝ එකක් රුපියල් 350ක් වනවා. ඒ මිලට ගන්නත් නිෂ්පාදකයා, කර්මාන්තකරුවා විශාල වෙහෙසක් දරනවා. ඒ නිසා මෙන්න මේ පිළිබඳව විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ඒ වාගේම පසු ගිය කාලයේ වෙළෙඳ පොළ ආශ්‍රිතව ගැටලු තිබුණා. අපිට මතකයි 2004, 2005 කාලයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට මේ දේශීය නිෂ්පාදකයන් ගෙන්වූවා, ඔවුන්ගේ නිෂ්පාදනත් එක්ක. දවස් හතරක විශාල ප්‍රදර්ශනයක් පැවැත්වූවා. ඔවුන් දවස් තුනක් ඇතුළත රුපියල් ලක්ෂ ගණනින් තමන්ගේ ආදායම් උපයා ගත්තා. ඉතා සන්තෝෂයෙන් තමන්ගේ දෑතෙන් කරන කර්මාන්තයේ නිෂ්පාදන දෙස්, විදෙස් නියෝජිතයන්ට, ව්‍යාපාරිකයන්ට, මිලදී ගන්නන්ට, සංචාරකයන්ට අලෙවි කරලා විශාල ආදායමක් සොයා ගන්නට සමත් වුණා. අන්න ඒ තත්ත්වය ඇති කරලා මේ තිබෙන අමු ද්‍රව්‍ය ටික නිසි ආකාරයෙන් දේශීය තඹ හා පිත්තල කර්මාන්තකරුවන් වෙත බෙදා දෙන්නට වුවමනා කරන සැලසුම සකස් කරන්නය කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම ඒ කර්මාන්තකරුවන්ගේ පැත්තෙන් හිතලා, රට ගැන හිතලා, දේශීය කර්මාන්තයක් ගැන හිතලා, ඒ උත්සාහය ගන්නවා නම් පක්ෂයක් හැටියට අපෙන් වෙන්නට ඕනෑ උපරිම සහයෝගය ඒ සඳහා ලබා දෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා]

ගරු අමාත්‍යතුමනි, මේ කාරණාව - 2009 අගෝස්තු 26 "දිවයින" පත්තරේ පළවූ මේ කාරණාව - මීට කලින් යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා හරහා ඉදිරිපත් වුණා. අපි දන්නේ නැහැ, මෙහි සඳහන් ඇමතිවරයා කවුද කියලා කියන්න. ඔබතුමාද දන්නේ නැහැ, වෙනත් ඇමති කෙනෙක්ද දන්නේ නැහැ. ඒක මේ ආණ්ඩුව ඇතුළෙන්ම මතු වුණු ප්‍රශ්නයක්. රජයේ පාර්ශ්වයක් තමයි මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. ඒ පැත්තෙන්මයි මේ චෝදනාව එල්ල වන්නේ. මේක පත්තරෙත් තිබෙනවා. මේක ආණ්ඩුව ඇතුළේ කථා කර ගත්තා නම් වඩාත් ලේසියි. කොහොම හරි දැන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. ඔබතුමාගේ පිළිතුරු කථාවේ දී විශේෂයෙන්ම මේ "ගැසට් නිවේදනයට මුවා වී ඇමතිතුමා යසට ගරයි." කියන ශීර්ෂ පාඨය -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න. මේ කාරණාව ඇමතිතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා. ඒ තුළ ගම්‍යමාන වනවා, ඇමතිතුමා තමයි මේ කාරණයට වග කිව යුත්තේ කියන හැඟීමක්. ඒ නිසා ඒකට අදාළ පිළිතුරත් ඔබතුමාගෙන් බලාපොරොත්තු වනවා. ඒ වාගේම මේ හරහා මතු වෙමින් තිබෙන විවිධ ජාවාරම් නතර කරලා, පෙර තිබුණු කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරුණු ආකාරයට මේ සහන ලබා දෙන්න, අමු ද්‍රව්‍ය ලබා දෙන්නය කියන මැදිහත් වීම කරනවා. ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, මීට කලින් විපක්ෂයේ විවිධ මන්ත්‍රීවරුන් මේ පිළිබඳව අවධානය යොමු කරද්දී, ඔබතුමාම දීපු පිළිතුරුවල තිබෙනවා, මේ වන විට - එතකොට 2005, 2006 අවුරුදුවල - විදේශගත කිරීම, නැත්නම් අපනයනය කිරීම තහනම් කරලා තිබෙනවා, නැවත අවුරුදු දෙකහමාරකට දීර්ඝ කළා කියා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව එක විනාඩියක් දෙන්න, මේ කාරණාව මතු කරන්නට. නමුත් අපි දන්නා තරමට ඒ අවුරුදු දෙකහමාරක කාල සීමාව දැන් ගෙවිලා හමාරයි. ඒ නිසා නැවත මේක දීර්ඝ කරන්නට ඕනෑ, තහනම් කරන්නට ඕනෑ. එහෙම නොකළොත් අර මම කියපු ජාවාරම් කාරයන් මේක ක්‍රියාත්මක කරලා රටට ලැබෙන්නට තිබෙන විශාල සම්පතක් අහිමි කරමින් යනවා.

මා අවසාන වශයෙන් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, මහින්ද චින්තන වැඩ පිළිවෙළ ගැන. මේක ඔබතුමා ළඟ තිබෙනවාද නැද්ද දන්නේ නැහැ. බොහෝ ආණ්ඩුවේ උදවිය ළඟ මේක දැන් නැහැ. නමුත් අපි තවමත් තියා ගෙන ඉන්නවා. මේකේ 49 වන පිටුවේ තිබෙනවා, සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත ගැන. මේකෙන් පැහැදිලි කරනවා, අපේ ආර්ථිකයේ කොඳු නාරටිය බවට සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත ව්‍යවසායකත්වයන් පත් කරනවාය කියලා. හැබැයි කොඳු නාරටිය හැටියට සලකන කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත විනාශ කරමින් යනවා. මේක ආරක්ෂා කර ගෙන ඒ දේශීය කර්මාන්තකරුවාට අත හිත දෙන්න පුළුවන්. මේ සම්පත ආරක්ෂා කර ගන්න ඔබතුමාගේ දායකත්වය ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින් කාල වේලාව හමාර වූ නිසා මගේ කථාව අවසන් කරනවා. මූලාසනයට බෙහෙවින්ම ස්තුතියි මට ඉඩ කඩ ලබා දීම සම්බන්ධව.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාට බොහොම ස්තුතියි. පිළිතුරු කථාව, ගරු එස්.බී. නාවින්න ඇමතිතුමා.

**ගරු එස්. බී. නාවින්න මහතා (ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன - கிராமியக் கைத்தொழில், சுயதொழில் ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. S. B. Nawinne - Minister of Rural Industries and Self-employment Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිමල් ප්‍රේමවංශ ජයසිංහ මන්ත්‍රීතුමාත්, ඒ වාගේම නවරත්න බණ්ඩා මන්ත්‍රීතුමා ඇතුළු මේ යෝජනාව ගැන කරුණු දක්වපු සියලු දෙනාටම මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, පසු ගිය කාලය තුළ කුඩා කර්මාන්තය පිළිබඳව අපේ අමාත්‍යාංශයට නොයෙක් අවලාද "දිවයින" පත්‍රයේ පළ වෙලා තිබුණු බව. ඒ කිසි තැනක මගේ නම සඳහන් නොකරපු නිසා මට මේ සම්බන්ධව ක්‍රියා කිරීමට හැකියාවක් නොමැති බව මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අබලි ද්‍රව්‍ය ලබා ගැනීම සම්බන්ධයෙන් එදා තිබුණු තත්ත්වයට වඩා අද තිබෙන තත්ත්වය බොහෝ සෙයින් වෙනස්. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. දැන් මෙතැනදී අබලි ගැන කථා කළා. අප අබලි තඹ අලෙවි කරන්නේ කිලෝ එකක් රුපියල් 140.77ටයි. නමුත් අද පිට - මාර්කට් එකේ - තිබෙනවා, රුපියල් 400යි. ඒ වාගේම අප අබලි පිත්තල කිලෝ එකක් රුපියල් 140.77ට අලෙවි කරන කොට රුපියල් 275යි අද පවතින වර්තමාන වටිනාකම. පසු ගිය අවුරුදු කීපය තුළ අබලි විශාල ප්‍රමාණයක් අපට ලැබුණා. අද අපට ලංගමයෙන් අබලි එක කිලෝවක්වත් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම අද අපට දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අබලි ලැබෙන්නේ නැහැ. තඹ ටිකක් හරි ලැබුණේ අපේ National Water Supply and Drainage Board එකෙනුයි. නමුත් අද තඹ වෙනුවට National Water Supply and Drainage Board එකේ බොහෝ තැන්වල පාවිච්චි කරන්නේ ප්ලාස්ටික් ඒවායි. ඒ නිසා එහෙනුත් අබලි පිත්තල, අබලි තඹ බොහොම අඩුවෙන් තමයි, බොහොම සොච්චමක් තමයි ලැබෙන්නේ. අපේ නිමල් ප්‍රේමවංශ ජයසිංහ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා යම් කාරණයක්. එදා සිට මේ දක්වා මේ ආකාරයට බොහොම අඩු වීමක් තමයි ඇති වෙලා තිබෙන්නේ.

පසු ගිය කාලය තුළ අපට මේ අබලි ද්‍රව්‍ය ටෙලිකොම් එකෙන් ලැබුණා. දැනට අවුරුදු එකහමාරක් විතර ඒ අවශ්‍ය- [බාධා කිරීමක්] වයර් බොහොම හීනි වයර් නිසා, ඒවා උණු කිරීමේදී ලැබෙන ප්‍රමාණයේ මඳකම නිසා, අපේ කර්මාන්තකරුවන්ට ඒවා පාවිච්චි කිරීමෙන් වැඩි ප්‍රයෝජනයක් නැති නිසා ඒවා අලෙවියක් වන්නේ නැහැ.

අබලි තඹ සහ අබලි පිත්තල බොහොම අඩුවෙන් තමයි පහු ගිය කාලයේ අපට ලැබුණේ. ඒ වාගේම ලැබිච්ච දේවල් අප කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් නියම මිලට-[බාධා කිරීමක්] තමුන්නාන්සේ ඔය කියපු වැඩි හරියක් අපි දුන්නේ මධ්‍යම පළාතටයි. මොකද මට මතකයි පහු ගිය කාලය තුළ අපට ලැබිච්ච හිස් පතරොම් කොපු වැඩි හරියක්ම දුන්නේ මහනුවර ප්‍රදේශයේ ඔය කියපු ගම්මානවලටයි. ඒ වාගේම කාර්මික සංවර්ධන මණ්ඩලයේ අපේ කාර්යාලයක් තිබෙනවා. ඒ කාර්යාලය මඟින් තමයි පසු ගිය කාලයේදී බෙදුවේ. නමුත් පෙබරවාරි මාසයෙන් පස්සේ ඔය කියන පතරොම් කොපු කිලෝ එකක්වත් අපට ලැබිලා නැහැ. පෙබරවාරි මාසයෙන් පස්සේ අපට ලබා ගන්න පුළුවන්කමක් ඇති වුණේත් නැහැ; අපට ලැබුණේත් නැහැ. ඒ නිසා මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ ලැබෙන ප්‍රමාණයේ

ක්‍රමානුකූල අඩු වීමක් තිබෙන බව. නමුත් අනෙක් පැත්තෙන් එදා සිට මේ දක්වා අපි අමාත්‍යාංශයක් වශයෙන් දෙන සම්පත් ප්‍රමාණය අඩු කරලා නැහැ. ඒ කියන්නේ අවශ්‍ය ගොඩනැඟිලි පහසුකම් ලබා දෙනවා. මැටි කර්මාන්තයේ වෙන්න පුළුවන්, යකඩ කර්මාන්තයේ වෙන්න පුළුවන්, පිත්තල කර්මාන්තයේ වෙන්න පුළුවන් ඕනෑම කර්මාන්තයකට අවශ්‍ය දේවල් එදා සිට මේ දක්වා අපි ලබා දෙමින් යනවා. ඒවායේ අඩුවක් නැහැ.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි එක කාරණයක් සම්බන්ධයෙන් මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ගරු අමාත්‍යතුමාගේ පැහැදිලි කිරීම තුළ තිබෙන්නේ පෙබරවාරි මාසයෙන් පස්සේ ලැබුණේ නැහැ කියන එකයි.

**ගරු එස්. බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன)
(The Hon. S. B. Nawinne)

නැහැ, නැහැ.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

දැන් ඔබතුමා පිළිගන්නවා, විශ්වාස කරනවා විශාල ප්‍රමාණයක් තිබෙනවාය කියලා. යුද්ධය හමාර වෙලාත් මාස හතරක්, පහක් ගෙවුණා ඇමතිතුමනි. උත්සාහයක් ගත්තේ නැද්ද අප අර කලින් සඳහන් කරපු මහා පරිමාණ පිත්තල ප්‍රමාණය අමාත්‍යාංශයට නැවත ගන්න?

**ගරු එස්. බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன)
(The Hon. S. B. Nawinne)

මම ඒකටත් උත්තරයක් දෙන්නම්.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

තවත් එක කාරණයක්. ඔබතුමාගේ නම ඍජුව සඳහන් කරලා නැහැ කිව්වාට මෙන්න මේ කාරණාව ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා ගරු අමාත්‍යතුමනි. නව වැනි මාසයේ 9 වැනි දා "රාවය" පුවත් පතේ තිබෙනවා, පිත්තල කන්ටේනර දෙකක් පිට කිරීම පිළිබඳව ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යවරයාගේ සමීපතම හිතවතුන් පිරිසක් සම්බන්ධ බවට හෙළිදරවු වී ඇත කියලා. ඉතින් අපි විශ්වාස කරනවා ඒ ඇමතිතුමා ඔබතුමාය කියලා. ඔබතුමාට අපහාසයකට නොවෙයි මේ කියන්නේ. ඒ මාධ්‍යයේ එහෙම වාර්තා කරලා තිබුණා. "දිවයින" පුවත් පතේ තිබුණේ නැහැ. "රාවය" පුවත් පතේ තිබෙනවා.

**ගරු එස්. බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன)
(The Hon. S. B. Nawinne)

මන්ත්‍රීතුමනි, පත්තරවල තිබෙන ඒවාට උත්තර දෙන්න ගියොත් එහෙම, මා හිතන්නේ-[බාධා කිරීමක්] ඒ ගොල්ලන් අපට විරුද්ධව ලියන ඒවා අනන්තයි, අප්‍රමාණයි.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

නැහැ. මෙහෙම එකක් තිබෙනවා. ගරු ඇමතිතුමා, විපක්ෂයේ අපි චෝදනා කරනවා නම් ටිකක් එහෙම සැලකිලිමත් වන්න පුළුවන්. ආණ්ඩුවේ පාර්ශ්වයක්මයි ප්‍රධාන වශයෙන් මේ චෝදනාව ඉදිරිපත් කරන්නේ.

**ගරු එස්. බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன)
(The Hon. S. B. Nawinne)

ඒ ගැන මගේ කථාවෙන් කියන්නම්. මා කියා ගෙන ආවේ ඇත්ත වශයෙන්ම කිසිම අඩුවක් නැතිව දැන් අපි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් සියල්ලක්ම ලබා දෙනවා කියලායි. නමුත් අද පවතින තත්ත්වය දිහා බැලුවාම පිත්තල සහ තඹ මිල ඉතාම අධිකයි. මිල අධික වන්න හේතු රාශියක් තිබෙනවා. අබලි වශයෙන් අපට ලැබෙන ප්‍රමාණය අඩු නිසා ඕනෑම කෙනකුට පිට ස්ථානවලින් තමයි ගන්න තිබෙන්නේ. මේ ලංකාවේ සාමාන්‍යයෙන් බෝතල් කඩ විතරක් 8,000ක් විතර තිබෙනවා. ඒ කියන්නේ තඹ පිත්තල එකතු කරන ස්ථාන 8,000ක් විතර තිබෙනවා. සාමාන්‍යයෙන් දවසකට මේවා ටොන් 10ක් විතර අලෙවියට කොළඹට එනවා. මොකද, හැම පළාතකම එකතු කළාම ටොන් 10ක් පමණ ප්‍රමාණයක් කොළඹ නගරයට අලෙවියට එනවා. මම අහ ගෙන සිටියා, තමුන්නාන්සේලා කිව්වා කවුද මුස්ලිම් එක් කෙනකුගේ කන්ටේනර් දෙකක් අල්ලා තිබෙනවා කියා. "රාවය" පත්තර බැලීමක් මගේ වැඩිය නැහැ. [බාධා කිරීමක්] මම සාමාන්‍යයෙන් "රාවය" පත්තරය බලන්නේ නැහැ. නමුත් ඔය කියන මුස්ලිම් එක් කෙනා අපත් එක්ක නම් කිසිම සම්බන්ධතාවක් නැහැ. වෙනත් කෙනකු එක්ක සම්බන්ධතාවක් තිබෙනවාද මම දන්නේ නැහැ. කාර්මික සංවර්ධන මණ්ඩලයත් මමත් එක්ක කිසිම සම්බන්ධයක් නැහැ. මන්ත්‍රීතුමා කිව්ව නිසා තමයි දැන ගත්තේ. මල්වාන ප්‍රදේශයේ ව්‍යාපාරිකයකු කියා පත්තරයේ තිබුණා කියා කිව්වා. නමුත් අපේ කිසි සම්බන්ධයක් නැහැ. නමුත් අපි දන්නවා, මේ බඩු ඇත්ත වශයෙන්ම Customs එකෙන් බොහෝ දුරට පිටට යන බව. මොකද, මම දෙවතාවක් නැවැත්වූවාට පස්සේ ඒ Customs එකෙන් ගන්න බඩුවලට අපට ලියුමක් එවා තිබෙනවා, 412කට දෙන්න කැමැතියි කියා. ඒකයි මා මේ කියන්නේ. රුපියල් 140.77ට අපි අලෙවි කළ දේ. මම Customs එකට දන්වා Customs එකෙන් ඇල්ලුවා. ඇල්ලුවාට පස්සේ අපි ලිව්ව එකට උත්තර එවා තිබෙනවා, අබලි තඹ කිලෝ එකක් රුපියල් 412 බැගින් සියලු බදු ඇතුළත්ව මිල දී ගැනීමට එකඟ බව දැනුම් දෙනවාය කියලා. වෙනත් ලෝහ වර්ග වේ නම් ඒවා අබලි තඹ මිල ගණන්වලට ගත නොහැකි බව ද කාරුණිකව දැනුම් දෙමි කියාත් තිබෙනවා. අපි රුපියල් 140.77කට අලෙවි කළ දේ. මේගොල්ලෝ duty ආදී සියල්ල දමා රුපියල් 412ට තමයි අපට Customs එකෙන් දෙන්න කැමති වුණේ. ඔය ගණනට අරගෙන අපට විකුණන්න පුළුවන්කමක් ඇති වන්නේ නැහැ. ඔය ඇල්លූ තඹවලට තමයි මේ මිල සඳහන් කර තිබුණේ. මේ ගණන්වලට අපට ගන්න බැරි නිසා ඔය කියන කට්ටියම තමයි ඔය තඹ ටිකත් නැවත වරක් ගන්නේ. ඒ එක පැත්තක්.

දෙ වනුව, පෙබරවාරි මාසයෙන් පස්සේ අපට නොලැබුණා කියන එකත් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. දැනට අප දන්නවා, අපේ මිලට කවුරුවත් බඩු දෙන්න කැමැති වන්නේ නැහැ කියා. අපි බොහොම අඩු මිලකට අරගෙන අඩු මිලකට තමයි සුළු කර්මාන්තකරුවන්ට ලබා දෙන්නේ. මම රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට ලිව්වාට පස්සේ ඒ අමාත්‍යාංශයෙන් එවා තිබෙන ලියුමේ තිබෙනවා, "දැනටමත් පෞද්ගලික අංශය මගින් මෙම භාණ්ඩ වැඩිපුර මිලකට ලබා ගැනීමට කැමැත්ත පළ කර ඇත. එම නිසා මිල දී ගනු ලබන භාණ්ඩවල මිල සංශෝධනය කිරීමට අත්‍යවශ්‍ය බව අපට පෙනී ඇත. එම නිසා copper, aluminium, brass, cast iron වැනි ද්‍රව්‍ය ඔබ විසින් මිලයට ගැනීමට බලාපොරොත්තු වන වැඩිම මිල ගණන් මේ ලිපිය ලැබී සතියක් තුළදී දැනුම් දෙන ලෙස කාරුණිකව දැනුම් දෙමි." කියා. අද පවතින market එකට තමයි මේ ගොල්ලෝ අපට දෙන්න සූදානම් වන්නේ.

ඒ නිසා අපට ඒ ගණන්වලට අරගෙන විකිණීමට නොහැකි නිසා තමයි අපි විශේෂයෙන්ම ලියුමකින් ඉල්ලුවේ දැන් පවතින මිල කීයද කියන්නය කියලා.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

ගරු ඇමතිතුමනි, මම කලින් ඔබතුමාට ඉදිරිපත් කළ "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ තුළ සඳහන්ව තිබෙනවා, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවා රටේ කොඳු නාරටිය හැටියට පිළිගන්නවා, ඒ අය වෙනුවෙන් සහන ලබා දෙනවායි කියලා. එතකොට ඔබතුමාට පුළුවන් කැබිනට් මණ්ඩලයට මේ පිළිබඳව කරුණු උපුටා දක්වලා, කලින් මම කියපු ලාල් කාන්ත හිටපු ඇමතිවරයා ඉදිරිපත් කරලා සම්මත කර ගත්තු කැබිනට් සංදේශයත් පාවිච්චි කරලා මේ ජනතාවට, මේ ව්‍යාපාරිකයන්ට, කර්මාන්තකරුවන්ට සහන මිලකට මේවා ලබා දෙන්න. ඒ සඳහා මැදිහත් වීමක් වන්නේ නැත්තේ ඇයි?

**ගරු එස්. බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன)
(The Hon. S. B. Nawinne)

ගරු මන්ත්‍රීතුමා, මේකයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ සියලු බඩුවල මිලෙහි එදා සහ අද අතර විශාල වෙනසක් තිබෙනවා. එදා අපි යකඩ කිලෝ එකක් ගත්තේ රුපියල් අටට, දහයට. අද රුපියල් තිස්දෙකට, හතළිහට මිලට ගන්න සිද්ධ වෙලා තිබෙනවා. බොහෝ බඩුවල මිල වැඩි වෙලා තිබෙනවා. මොකද, ඒ අද පවතින තත්ත්වයත් සමඟ.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

ඒක ඇත්ත ඇමතිතුමා. දේශීය කර්මාන්තකරුවාට සහනයක් දෙන්න ඕනෑ කියන එක රටේ ප්‍රතිපත්තිය. අනෙත් එක, ඔය වාගේම අනෙක් හැම භාණ්ඩයකමත් මිල වැඩියි. පරිප්පු කිලෝ එකක් රුපියල් දෙසිය ගණනක්, සීනි රුපියල් එකසිය අටයි. එතකොට ඒවාත් ගණන් ගිහිල්ලා තිබෙනවා. හැම එකක්ම ගණන් යන එක වළක්වන්න බැහැ. අර ප්‍රතිපත්තියයි ක්‍රියාත්මක කරන්න ඕනෑ.

**ගරු එස්. බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன)
(The Hon. S. B. Nawinne)

ගරු මන්ත්‍රීතුමා, ගණන් යෑම ගැන නොවෙයි මගේ ප්‍රශ්නය තිබෙන්නේ, මිල වැඩි වීම ගැනයි. එදා සහ අද මිල දිහා බලපුවාම විශාල වෙනසක් තිබෙනවා. ඒ වාගේම බඩු අලෙවි කරන එකෙත්, භාණ්ඩයේ මිලත් වැඩියි. එදාට වඩා අද මිල වැඩියි. ඒ නිසා අඩුවට තිබුණු මිල වැඩි වුණු නිසා අද භාණ්ඩ නිෂ්පාදන මිලත් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මිලේ යම් කිසි වෙනසක් ඇති වෙලා තිබෙන බව අපි පිළිගන්නවා.

දෙ වන කරුණ, සිනෝජ්ෂියා ඉන්ටර්නැෂනල් කියන සමාගමක් ගැන ඔබතුමන්ලා මතක් කළා.

**ගරු එන්. ඩී. නිමල් ප්‍රේමවංශ ජයසිංහ මහතා**
(மாண்புமிகு என். டி. நிமல் பிரேமவன்ச ஜயசிங்க)
(The Hon. N. D. Nimal Premawansa Jayasinghe)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් කාරණාවක් පැහැදිලි කර ගන්න අවශ්‍යයි. මේ කාරණයට අදාළ කැබිනට් සංදේශයේ කාලය ඒ කියන්නේ අබලි ද්‍රව්‍ය අපනයනය කිරීම තහනම් කරමින් කර්මාන්ත අමාත්‍යාංශයෙන් ගෙනා කැබිනට් සංදේශයේ කාලය නොවැම්බර් 19 වන දා වන කොට අවසන් වනවා. ඒ නිසා ඒක එතැනින් එහාට නැවත අවුරුද්දකට හෝ දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීමට ඔබතුමා අපේක්ෂා කරනවාද කියන කාරණය දැන ගන්න අවශ්‍යයි.

ඒ වාගේම මෙම යෝජනාව ගෙනාව නිසාම ඔබතුමාට මේක මම පැහැදිලි කරන්න ඕනෑ. ආණ්ඩුව ඇතුළේ ඉඳිමින් අපි මේ යෝජනාව ගෙනෙන්නේ මේකෙන් පිටස්තර වෙනත් ආකාරයේ යම් යම් මතවාදයන් සමාජගත වන නිසායි. එහෙම නැතිව වෙන පක්ෂවල වාගේ ප්‍රශ්න වචා ගෙන කෑම සඳහා, උද්ඝෝෂණවලට කට්ටිය එළියට ගෙන ඒම සඳහා නොවෙයි. විශේෂයෙන්ම මේ වන කොටත් ආරංචියි, මධ්‍යම පළාතේ මේ පිත්තල කර්මාන්තකරුවන්ව පාරට ගෙනල්ලා, උද්ඝෝෂණ කරවලා, ඒක ආණ්ඩු විරෝධී ක්‍රියාවලියකට පරිවර්තනය කර ගන්න ඇතැම් දේශපාලන පක්ෂ උත්සාහ කරනවායි කියලා. අපි කියන්නේ ඒක නොවෙයි. ඒ විධියට හිතලා මේ ප්‍රශ්න, ශිෂ්‍ය ප්‍රශ්න, රැකියා ප්‍රශ්න සියල්ලක්ම වචා ගෙන කන අයට ඉඩ නොදී ආණ්ඩුවක් විධියට අපි මේ සඳහා ඍජුව මැදිහත් වීමක් වන්න ඕනෑයි කියන ධනාත්මක සහ සහෝදරාත්මක යෝජනාවක් විධියටයි අපි මෙම යෝජනාව ගෙනාවේ.

**ගරු එස්. බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன)
(The Hon. S. B. Nawinne)

ඔව්, මන්ත්‍රීතුමා. නොවැම්බර් මාසය වන කොට මේ කාලය අවසන් වනවා. ආයෙත් වතාවක් මෙය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයට ඉදිරිපත් කරලා නැවත වතාවක් මේ කාලය දීර්ඝ කිරීමට අපි කටයුතු කරනවා.

ඊ ළඟට මන්ත්‍රීතුමා සිනෝජ්ෂියා ඉන්ටර්නැෂනල් සමාගම ගැන කිව්වා. ඇත්ත වශයෙන්ම ඒකට කිසිම සම්බන්ධතාවක් අපේ අමාත්‍යාංශයේ නැහැ. මොකද, මීට පෙර පාර්ලිමේන්තුවේදී කරන ලද තමුන්නාන්සේලාගේ කථාවකින් කවුද එක් කෙනෙක් මටත් ප්‍රශ්නයක් දැම්මා. නමුත් ඒක මට අදාළ නැති නිසා මම ඒ ගැන උනන්දුවක් දැක් වූයේ නැහැ. නමුත් මෙහෙම කිසි දෙයක් අද මේ වන කොටත් export කරලා නැති බව විතරක් මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මොකද, මෙච්චර ලොකු ප්‍රමාණයක් ගියා නම් මෙච්චර ප්‍රමාණයක් ගියා කියලා සමහර විට මේ රටේ ආන්දෝලනයක් ඇති වනවා. දැන් ඔය කියන ප්‍රමාණය තිබෙන බවත් අපි දන්නවා. පිත්තල කොපු විශාල ප්‍රමාණයක් ලංකාවේ තිබෙනවා.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

මේවා මෙම කර්මාන්තකරුවන්ට දීමේ වුවමනාවයි අපි අවධාරණය කරන්නේ. තවම ගිහිල්ලාද නැද්ද කියන එක හොයා බලන්නත් ඕනෑ. මම හැන්සාඩ්ගත කළ ලේඛනයේ කොපියක් ඔබතුමාටත් දෙන්නම්. ඔබතුමා මේ පිළිබඳව මැදිහත් වීම කරන බව අපි දන්නවා. ඔබතුමාට පාලනය කරන්න බැරි දෙන්නෙක්, තුන් දෙනෙක් තමයි මේ කාරණයේ ඉහළින් ඉන්නේ කියලාත් අපි දන්නවා. මේකට විෂය භාර ඇමතිවරයා හැටියට ඔබතුමා මැදිහත් වන්න වුවමනායි. ඔබතුමාට ධෛර්ය දෙන්න ඕනෑ. මේ කාරණය මහ පාරට ගෙනෙනවා නම් අපි ගෙනෙනවා, කවුරු එපා කිව්වත්. නැත්නම් මේවා වෙන කොහේ හරි කථා කර ගන්න ඕනෑ. පාර්ලිමේන්තුවට කාරණය ගෙනාවාම අපිට අහන්න තිබෙන ප්‍රශ්න අපි අහනවා. කැබිනට් එක ඇතුළේ හෝ ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායමේ හරි ඇහැව්වා නම් අපි අහන්නේ නැහැ. මේක අපි හැමෝටම ඉදිරිපත් වන්න පුළුවන් අවස්ථාවක්. අපි අහනවා, විමසනවා. මෙතැන අහලා විසඳා ගන්න බැරි වුණොත් ඊ ළඟට ගන්න ඕනෑ ක්‍රියාමාර්ගත් අපි ගන්නවා

**ගරු එස්. බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன)
(The Hon. S. B. Nawinne)

හරි, මන්ත්‍රීතුමනි.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை. எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

මේ කථා කරන්නේ ඔබතුමා මේකට හොඳ මට්ටමින් මැදිහත් වෙයි කියලා අපි බලාපොරොත්තු වන නිසායි. ඔබතුමාට අදාළව සමහරු ප්‍රශ්න මතු කරලා නිකම් ලිස්සලා යද්දිත් මේ පුවත් පත උපුටා දැක්වූවේ හරියට කියන්නයි. ඒ නිසා මේකට මැදිහත් වන්න ඕනෑ. මේ තරම් විශාල ප්‍රමාණයක්; මෙට්‍රික් ටොන්

40,000ක් නිශ්චිතවම අර ලියවිල්ලේ තිබෙනවා. ඔබතුමා අපහසුතාවට පත් කරන්නේ අපි නොවෙයි. ඒක ආණ්ඩුව ඇතුළෙන්ම සිදු වන වැඩක්. කාගේ හරි වැඩක්.

**ගරු එස්. බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ். பி. நாவின்ன)
(The Hon. S. B. Nawinne)

තවම මේ දක්වා එහෙම දෙයක් රටින් පිට වෙලා නැහැ ගරු මන්ත්‍රීතුමනි. මොකද, එහෙම නම් මේ වාගේ ප්‍රමාණයක් තඹ පිට රටට යවනවා කියලා අඩු වශයෙන් කැබිනට් එකට දමලා අපෙන් අවසරයක් ගන්න ඕනෑ, අපේ කැමැත්ත ගන්න ඕනෑ. තවම එහෙම එකක් සිදු වෙලා නැහැ. ඔබතුමා ගෙනාපු කඩදාසියේ වලංගුභාවය කොහොමද කියලා මම දන්නේ නැහැ. ඒ කෙසේ වෙතත් මෙතෙක් ඒ කාරණය සිද්ධ වෙලා නැහැ. නමුත් අනිවාර්යයෙන්ම මේ තඹ කොපු පිට රටට විකුණනවා නම්, ඒ කියන ගණන්වලට අපිත් ගන්න සූදානම් කියන එක අපි ඒ අවස්ථාවේ මතක් කළා. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය ඒවා විකුණන්නේ කීයටද, ඒ කියන ඕනෑම ගණනකට කාර්මික සංවර්ධන මණ්ඩලයට ගන්න අපට හැකියාවක් තිබෙනවා. ඒ ගණන්වලට වඩා අඩුවෙන් ගන්නත් අපට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම රටේ පවතින මිලට විකිණීමටත් හැකියාව තිබෙනවා. ඒ නිසා මමත් බොහොම ඕනෑකමින් ඒ ගැන බලා ගෙන ඉන්නවා. මොකද, මේ තරම් ලොකු ප්‍රමාණයක් අපේ කුඩා කර්මාන්තවලට අහිමි වෙලා යනවා නම් ඒක අපේ අවාසනාවක් කියලා මා විශ්වාස කරනවා. ඒ නිසා ඒ කාරණය ගැනත් විශේෂයෙන් මතක් කරනවා. පසු ගිය කාලය තුළ නොයෙක් පත්තරවල පළ කර තිබෙන ඒවායේ අන්තිම ඉලක්කය වන්නේ මේ බඩු ටික පිට රට යැවීමයි. ඒ පත්තරවල තිබෙන ඒවා බැලුවාම මට තේරෙන්නේ ඒකයි. ඒ කියන්නේ මේවා වැඩි මිලට විකුණා ගැනීම සඳහා අපේ අමාත්‍යාංශය කටයුතු කරනවාය කියන එකයි. ඒවා පිට රටවලට යැවීම සඳහා වැඩ පිළිවෙළක් තිබෙන බව ඒ පත්තර කියවීමෙන් මට තේරුම් ගියා. ඒ නිසා අපි ඒ ගැන බොහොම අවදියෙන් තමයි හිටියේ. එය කාගේ හරි අවශ්‍යතාවක් බවත් මට තේරුණා. කාගේ අවශ්‍යතාවක් ද දන්නේ නැහැ. ඒ කෙසේ වෙතත් මෙච්චර විශාල තඹ ප්‍රමාණයක් තිබෙද්දී අනිවාර්යයෙන්ම ඒවා ලංකාවේ කුඩා කර්මාන්ත හිමියන්ට ලබා දිය යුතුය කියන එක මා විශ්වාස කරනවා. පත්තරවල ඕනෑම දෙයක් පළ කරන්න පුළුවන්කම තිබෙනවා. හුඟක් දේවල් නිර්නාමික විධියට පළ කර තිබෙන නිසා පසු ගිය කාලය තුළ මම ඒ ගැන එච්චර උනන්දුවක් දැක්වුවේ නැහැ. නමුත් ඔය කියන විධියට සතියකට වරක් කස්ටම් එකෙන් සාමාන්‍යයෙන් කන්ටේනර් එකක් විතර යන බව මට හොඳට තේරුම් ගන්නට පුළුවන්කම තිබෙනවා. මොකද, දවසකට තඹ, පිත්තල ටොන් දහයක් විතර එකතු කර ගෙන කොළඹට ගෙනැල්ලා තිබෙනවා. නමුත් ඒවා මේ රටේ නිෂ්පාදකයන්ට යනවාද, එහෙම නැත්නම් පිට රටවලට යනවාද කියන එක කස්ටම් එකෙන් තමයි දැන ගන්න පුළුවන්කම තිබෙන්නේ.

මේ කර්මාන්තය වැළලී යන්න මම ඉඩ තියන්නේ නැහැ. මොකද, අපේ පළාත්වලත් මැටි කර්මාන්තය, යකඩ කර්මාන්තය ආදී වශයෙන් තමුන්නාන්සේලා කියන කුඩා කර්මාන්ත තිබෙනවා. මමත් පිටිසර පළාතක ඉන්න නිසා අපිත් ඕනෑකමින් ඒ කර්මාන්ත දියුණු කිරීමට කටයුතු කරනවා. එක ප්‍රශ්නයක් තිබෙන්නේ දැනට අබලි වශයෙන් අපට ලැබෙන ප්‍රමාණයන් අඩුකම නිසාත්, අපේ මිල අඩු නිසාත්, රටේ පවතින මිල වැඩි නිසාත් ඒ කර්මාන්තකරුවන්ට නිෂ්පාදන ගැන ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන එකයි. අපි රුපියල් 140ට විකුණන ඒවා සාමාන්‍යයෙන් රුපියල් 400ට තමයි පිට තිබෙන්නේ. ඒ නිසා විශාල වෙනසක් තිබෙනවා. කොයිම අවස්ථාවකවත් කාර්මික සංවර්ධන මණ්ඩලයට වැඩි ගණන්වලට බඩු විකුණන්න මම ඉඩ තියන්නේ නැහැ. ඒ වාගේම කාර්මික සංවර්ධන මණ්ඩලයට හොරෙන් බඩු විකුණන්නත් මම ඉඩ තියන්නේ නැහැ. ඒ කාරණා දෙක ගැනම මම හොඳ අවදියකින් බලා ගෙන ඉන්නවා. ඒ වාගේම යම් කිසි දෙයක් අපට ලැබුණාම ඒ ලැබෙන ප්‍රමාණයන් ගැන, "මේ තරම් ප්‍රමාණයක් ලැබී තිබෙනවා, ඔබ ඇවිල්ලා ගෙන යන්න" කියලා තමුන්නාන්සේලාගේ ප්‍රදේශවලට; විශේෂයෙන්ම නුවර පළාතට අපි ලියුම් මඟින් දන්වනවා. ඒ සියල්ලම ලිඛිතව මා ළඟ තිබෙන නිසා මම දන්නවා.

මේ කර්මාන්තය දියුණු කිරීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු තුන් දෙනකු කථා කරමින් මේ සම්බන්ධයෙන් අපට අවබෝධයක් ලබා දීම ගැන මා සන්තෝෂ වනවා. කුඩා කර්මාන්ත අමාත්‍යාංශයට, එහෙම නැත්නම් අපේ කාර්මික සංවර්ධන මණ්ඩලයට කවුරු අවලාද නැඟුවත් එක තඹ ශතයක්වත් වංචා කිරීමට මා මේ අමාත්‍යාංශයේ ඉන්න තුරු ඉඩ තියන්නේ නැහැ. තමුන්නාන්සේලා ඉදිරිපත් කරපු කරුණු ගැන නැවතත් මගේ අවධානය යොමු කරමින්, මේ සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීම ගැන තමුන්නාන්සේලාට ස්තුතිවන්ත වෙමින් මා මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.24ට, 2009 ඔක්තෝබර් 22 වන බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 4.24 மணிக்கு பாராளுமன்றம், 2009 ஒக்ரோபர் 22, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 4.24 p.m. until 9.30 a.m. on Thursday, 22nd October, 2009.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

**ප්‍රශ්න අංක :** 1

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් අංක 0022/'09 දරන උක්ත ප්‍රශ්නයට පිළිතුර දීමට වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍ය සහ වරාය හා ගුවන් සේවා අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මහතා කල් ඉල්ලා ඇත.

**ප්‍රශ්න අංක :** 2

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු රංජිත් අලුවිහාරේ මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් අංක 0440/'09 දරන උක්ත ප්‍රශ්නයට පිළිතුර දීමට අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු රත්නසිරි වික්‍රමනායක මහතා මාස තුනක් කල් ඉල්ලා ඇත.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---


| | | |
|---|---|---|
| **Contents of Proceedings** | **:** | **From 9.30 a.m. to 4.24 p.m. on 21.10.2009** |
| **Final set of manuscripts Received from Parliament** | **:** | **5.00 p.m. on 28.10.2009** |
| **Printed copies dispatched** | **:** | **01.11.2009 Morning** |

දායක මුදල්: පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු.2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 5, කිරුළපන, මායා මාවත. අංක 132 රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30දා ට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 132, மாயா அவெனியு, கிருளப்பனை, கொழும்பு 5** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப் பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 132, Maya Avenue, Kirulapone, Colombo 5. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.